

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා 2019.11.16 වන දින පවත්වන ලද ඡන්ද විමසීම පිළිබඳ වාර්තාව

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා
2019.11.16 වන දින පවත්වන ලද
ඡන්ද විමසීම පිළිබඳ වාර්තාව

මැතිවරණ කොමිෂන් සභාව

පෙරවදන

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට ජනාධිපතිධුරය ප්‍රථමයෙන් හඳුන්වා දෙන ලද්දේ 1972 වර්ෂයේ සම්මත කොට ක්‍රියාත්මක කරන ලද 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. එම ව්‍යවස්ථාවේ VII පරිච්ඡේදයේ 19 වන ව්‍යවස්ථාවෙහි "ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේය. ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයා වන්නේය." යනුවෙන් සඳහන් වේ. ඒ අනුව මෙතෙක් නොතිබූ ජනාධිපතිධුරය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට අලුතින් එක්විය.

එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 25 වන ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා නම් කරනුයේ අග්‍රාමාත්‍යවරයා විසිනි. එම ජනාධිපතිවරයා නාමමාත්‍ර ජනාධිපතිවරයෙකි. ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර හතරකි. මෙම ව්‍යවස්ථාමය විධිවිධාන යටතේ එවකට අග්‍රාමාත්‍යවරිය වූ සිරිමා ආර්.ඩී.බණ්ඩාරනායක මැතිනිය විසින් විලියම් ගොපල්ලව මහතා ප්‍රථම නාමමාත්‍ර ජනාධිපතිවරයා වශයෙන් පත් කරන ලදී. ලකිසුරු විලියම් ගොපල්ලව මහතා 1978 වර්ෂයේ දී එම ධුරයෙන් ඉවත්වීමෙන් පසුව 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව එවකට අග්‍රාමාත්‍යධුරය දරමින් සිටි ජේ.ආර්.ජයවර්ධන මහතා ජනාධිපතිවරයා වශයෙන් පත් විය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 වර්ෂයේ එවකට බලයේ සිටි ආණ්ඩුව විසින් හඳුන්වා දෙන ලද අතර, එම ව්‍යවස්ථාව මගින් විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. එම ව්‍යවස්ථාවේ 30(1) ව්‍යවස්ථාව අනුව "ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේය. ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයා ද, විධායකයේ ප්‍රධානයා ද, ආණ්ඩුවේ ප්‍රධානයා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේය." යනුවෙන් විධායක ජනාධිපතිධුරය සඳහා වූ නෛතික විධිවිධාන සලසා ඇත. 30(2) ව්‍යවස්ථාව අනුව "ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත්කර ගත යුත්තේය. ජනාධිපතිවරයා සාවුරුදු කාලයක් ධුරය දරන්නේය." යනුවෙන් දක්වා ඇති ව්‍යවස්ථාමය විධිවිධාන අනුව ජනාධිපතිවරයා තෝරා පත් කර ගත යුතු ආකාරය සහ ජනාධිපති ධුර කාලය ව්‍යවස්ථාව මගින් නියම කරන ලදී. 1978 ජනරජ ව්‍යවස්ථාවේ XXI පරිච්ඡේදයේ 160 වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති අන්තර් කාලීන විධිවිධාන යටතේ ඒ වන විට ජනාධිපතිධුරය දරන තැනැත්තා විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් කිරීමට අවශ්‍ය නෛතික විධිවිධාන සලසා තිබිණි. එම විධිවිධාන යටතේ ජේ.ආර්.ජයවර්ධන මහතා 1978 පෙබරවාරි 04 දින විධායක ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දෙන ලදී.

"ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත්කර ගත යුත්තේය." යන ව්‍යවස්ථාවේ නියමයට අනුව ජනාධිපතිවරයකු ඡන්ද විමසීමක් මගින් තෝරා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය වන්නේ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සම්මත කිරීමෙන් පසුවය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා ඉහත සඳහන් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ නියමයන් අනුව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා වූ ප්‍රථම ඡන්ද විමසීම 1982 ඔක්තෝබර් මස 20 වන දින පවත්වන ලදී. ඉන් අනතුරුව පිළිවෙලින් 1988 දෙසැම්බර් 19, 1994 නොවැම්බර් 09, 1999 දෙසැම්බර් 21, 2005 නොවැම්බර් 17, 2010 ජනවාරි 10 සහ 2015 ජනවාරි 08 යන දිනයන් හි මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිණිස වූ ඡන්ද විමසීම් 07ක් පවත්වා ඇත.

ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා සම්මත කරන ලද දාහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කර පෙර පැවැති මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය එම කොමිෂන් සභාව වෙත පැවරීමට අවශ්‍ය විධිවිධාන සලසනු ලැබීය. එහෙත් දාහත් වන සංශෝධනය මගින් හෝ ඉන් අනතුරුව සම්මත කරන ලද දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සිදු නොවීය.

කෙසේ වුවද ඉන් අනතුරුව 2015 වර්ෂයේ සම්මත කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළුව සාමාජිකයින් 2015 නොවැම්බර් මස 13 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය අනුව ජනාධිපතිවරයා විසින් පත් කරන ලද අතර, එලෙස පත්කරන ලද සාමාජිකයින් 2015 නොවැම්බර් 17 වන දින රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක තත්ත්වයට පත් විය. එලෙස පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපතිවරයා ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. නිල කාලය වසර පහකි. 103(2) ව්‍යවස්ථාවට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම සහ ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු බව සඳහන් වේ. මේ අනුව මෙතෙක් මැතිවරණ කොමසාරිස්වරයා සතුව පැවැති ඡන්ද විමසීම් පැවැත්වීම ඇතුළුව ඊට ආනුෂංගික ව්‍යවස්ථාපිත කටයුතු සඳහා වූ බලය හා අධිකාරය මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරිණි. මෙම බලතල පැවරීමට අනුව ප්‍රථම මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද උපදෙස්, නියමයන් හා මහපෙන්වීම් යටතේ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ඇතුළු සමස්ත කොමිෂන් සභා කාර්ය මණ්ඩලය විසින් 2018 වර්ෂයේදී පළාත් පාලන ඡන්ද විමසීම් පැවැත්වීමට ක්‍රියා කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලද 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පිළිබඳ වාර්තාව මෙමගින් ඉදිරිපත් කරනු ලැබේ. 2019.11.16 වන දින පවත්වන ලද එම ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ සියලු තොරතුරු, කරුණු, සටහන් හා ප්‍රතිඵල ලේඛන ආදිය ඇතුළත් කර මෙම වාර්තාව ප්‍රකාශයට පත් කෙරේ. ජාතික මට්ටමින් ඡන්ද විමසීමක් පැවැත්වීම භාරදූර කාර්යයකි. නිදහස්, සාධාරණ හා විශ්වසනීයත්වයෙන් යුත් ඡන්ද විමසීමක් පැවැත්වීමේ බරපතල වගකීම නීත්‍යානුකූලව හා අපක්ෂපාතීව ද අධිකරණයට හා ජනතාවට පිළිගත හැකි වන පරිදි විනිවිදභාවයෙන් යුතුව ඉටු කිරීම ද මැතිවරණ කොමිෂන් සභාවේ අරමුණ විය.

ඡන්ද විමසීමක් පැවැත්වීමෙන් අනතුරුව එයට ආනුෂංගික සියලු කරුණු, තොරතුරු, සටහන්, ඡන්ද විමසීමේ ප්‍රතිඵල ලේඛන, අදාළ වෙනත් දත්ත හා සංඛ්‍යාලේඛන අධ්‍යයනය කර විධිමත් පරිදි සකස් කරනු ලබන වාර්තාවක් පිළියෙල කිරීම හා මහජනතාවගේ පරිශීලනය සඳහා එම වාර්තාව නිකුත් කිරීමට ක්‍රියා කිරීම ද මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යභාරය හා වගකීමක් වේ. ඒ අනුව 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීමෙන් අනතුරුව නිකුත් කරනු ලබන මෙම වාර්තාව මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශවකරුවන් වන දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්, ඡන්ද හිමියන්, පුරවැසියන්, නිරීක්ෂණ සංවිධාන ඇතුළු සමස්ත ජනතාවගේ එකී අපේක්ෂාවන් සම්පූර්ණ කිරීමක් මෙන්ම ඒ සියලු දෙනාට පහසුවෙන් පරිශීලනය කිරීමට හැකි වන පරිදි අංග සම්පූර්ණ වාර්තාවක් ලෙස ඉදිරිපත් කිරීම ද කොමිෂන් සභාවේ අපේක්ෂාව විය. එමෙන්ම දේශපාලන කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන සියලු දෙනාට ද මෙම වාර්තාව වැදගත් වන බව විශේෂයෙන් සඳහන් කළ යුතු නොවේ. ඡන්ද විමසීමට අදාළ තොරතුරු ලබා ගැනීමට පමණක් නොව ඡන්ද විමසීමේ ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂණ කටයුතුවලට ද, විශේෂයෙන් අධ්‍යයන කටයුතුවල නිමග්නව සිටින ශිෂ්‍ය ප්‍රජාවට, පර්යේෂකයින්ට හා විද්‍යාර්ථීන්ටද ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා මෙන්ම ඔවුන්ගේ ශාස්ත්‍රීය කටයුතුවලට මෙමගින් ලැබෙන පිටිවහල ඉමහත්ය. එහෙයින් මෙම වාර්තාව අදාළ වන පරිදි ව්‍යවස්ථාපිත කරුණු, ඡන්ද විමසීම් ක්‍රියාවලිය, නීතිරීති, විධාන, උපමාන හා ආචාර ධර්ම ද, ඡන්ද විමසීමේ ප්‍රතිඵල හා මැතිවරණ ආරවුල් කළමනාකරණය පිළිබඳ තොරතුරු ද ඇතුළත් කර පරිපූර්ණ වාර්තාවක් වශයෙන් පිළියෙල කිරීමට කටයුතු කරන ලදී.

මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ කාර්යය හා කර්තව්‍යයන් සංවිධානය කිරීම මැතිවරණ කොමිෂන් සභාවට සහ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය වෙත පැවරුන ද එය සත්‍ය වශයෙන්ම සමස්ත රාජ්‍ය සේවයේ සාමූහික ක්‍රියාවලියක් යැයි කීම වඩා උචිත වේ.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම හා සහසම්බන්ධවන සමස්ත රාජ්‍ය නිලධාරීන්ගේ හා මැතිවරණ කොමිෂන් සභාවේ අනෙකුත් සියලු පාර්ශවකරුවන්ගේ මහඟු කැපවීමත්, අප්‍රතිහත ධෛර්යත්, පවරන ලද රාජකාරි හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම සඳහා දරනු ලැබූ උත්සහයත් යන සියල්ලෙහි සමස්ත ප්‍රතිඵලය වේ. එකී සාමූහික ක්‍රියාවලියේ දී සහාය දැක්වූ ආරක්ෂක අංශ ඇතුළු සියලු පාර්ශ්වවලට මෙන්ම මෙම වාර්තාව පිළියෙල කිරීමේ වගකීම ඉටුකළ මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් එච්.එම්.ටී.ඩී.හේරත් මහතා සහ එහි අධීක්ෂණ කටයුතු සිදු කළ මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ විවිධ අංශයන් හි කාර්ය මණ්ඩලය හා දිස්ත්‍රික් ලේකම්වරු නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයන්හි සමස්ත කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද විශේෂ සහයෝගය පිළිබඳව කොමිෂන් සභාවේ ස්තූතිය පළකර සිටිමි.

නිමල් ජී. පුංචිහේවා,

සභාපති,

මැතිවරණ කොමිෂන් සභාව.

පටුන

පළමුවන පරිච්ඡේදය

හැඳින්වීම හා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ නෛතික විධිවිධාන

1. හැඳින්වීම

1.1 ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා වූ නෛතික විධිවිධාන

1.1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1.1.2 1981 අංක 15 දරන ජනාධිපතිවරණ තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත

1.2 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් 1982 – 2015 දක්වා පවත්වන ලද ජනාධිපතිවරණ

1.3 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම—2019

දෙවන පරිච්ඡේදය

නාමයෝජනා

2. නාමයෝජනා

2.1 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමය

2.2 එක් එක් දිස්ත්‍රික්කය සඳහා තේරීම්භාර නිලධාරීන් පත්කිරීම

2.2.1 මැතිවරණ කොට්ඨාස සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් පත්කිරීම

2.2.2 මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර තේරීම්භාර නිලධාරීන් පත්කිරීම

2.3 පිළිගත් දේශපාලන පක්ෂ

2.4 ජනාධිපතිධුර අපේක්ෂකයෙකු වීම සඳහා සුදුසුකම්

2.5 ඇප මුදල් තැන්පත් කිරීම

2.6 නාමයෝජනා භාර ගැනීම

2.7 නාමයෝජනා පිළිබඳ විරෝධතා දැක්වීම

2.8. නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම්දීම

2.9 පිළිගත් නාමයෝජනා අනුව අපේක්ෂක අනුපිළිවෙල

2.10 අපේක්ෂකයින්ගේ ඡන්ද නියෝජිතයින් පත්කිරීම

තුන්වන පරිච්ඡේදය

ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සංවිධානය කිරීම

3. ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු

3.1 ඡන්ද විමසීම සඳහා වලංගු ඡන්දභිමි නාමලේඛනය

3.2 2013 අංක 27 දරන ඡන්ද භිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

3.3 ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම

3.4 මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීම

3.5 ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස

3.6 ඡන්ද මධ්‍යස්ථාන (ඡන්ද පොළ)

3.7 ඡන්ද පෙට්ටි සැපයීම

3.8 ආරක්ෂක කටයුතු

හතරවන පරිච්ඡේදය

කාර්ය මණ්ඩල අවශ්‍යතා හා ප්‍රවාහන පහසුකම්

4. කාර්ය මණ්ඩල අවශ්‍යතා
   - 4.1 ඡන්ද විමසීම් කාර්ය මණ්ඩල පත් කිරීම
   - 4.2 කාර්ය මණ්ඩල සංචිත පවත්වා ගැනීම
   - 4.3 ප්‍රවාහන පහසුකම්
   - 4.4 පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම

පස්වන පරිච්ඡේදය

තැපැල් ඡන්ද පහසුකම් සැලසීම

5. තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම
   - 5.1 තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්
   - 5.2 තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම
   - 5.3 තැපැල් ඡන්ද අයදුම්පත් පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීම
   - 5.4 තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්
   - 5.5 තැපැල් ඡන්දභිමි නාමලේඛනය පිළියෙල කිරීම
   - 5.6 තැපැල් ඡන්ද නිකුත් කිරීම
   - 5.7 තැපැල් ඡන්ද සලකුණු කිරීම
   - 5.8 තැපැල් ඡන්ද නිරීක්ෂණ කටයුතු
   - 5.9 සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද

හයවන පරිච්ඡේදය

ප්‍රචාරණ කටයුතු හා මාධ්‍ය

6. ප්‍රචාරණ කටයුතු
   - 6.1 නීති විරෝධී ප්‍රචාරණ කටයුතු පිළිබඳව ක්‍රියා කිරීම
   - 6.2 ප්‍රචාරක රැලි සඳහා ස්ථාන වෙන් කරදීම
   - 6.3 විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා මාධ්‍ය උපමාන
   - 6.4 මාධ්‍ය වගකීම හා මාධ්‍ය නියාමනය
   - 6.5 මාධ්‍ය දැන්වීම් හා නිවේදන
   - 6.6 ගුවන් ප්‍රචාර සඳහා රූපවාහිනී සහ ගුවන්විදුලි පහසුකම් ලබාදීම
   - 6.7 ඡන්ද භිමියන් වෙත ගාස්තුවකින් තොරව තැපෑලෙන් සංදේශයක් යැවීමට අපේක්ෂකයින්ට ලබාදෙන පහසුකම
   - 6.8 නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

හත්වන පරිච්ඡේදය

ඡන්ද විමසීම් පනතේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම

7. ඡන්ද විමසීම් පනතේ දැක්වෙන විධිවිධාන
   - 7.1 නිල ඡන්ද දැන්වීම් පත්
   - 7.2 ඡන්ද දායකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම
   - 7.3 මැකිය නොහැකි තීන්ත මගින් ඡන්ද දායකයා සලකුණු කිරීම නැතහොත් උචිත ලකුණින් සලකුණු කිරීම
   - 7.4 මියගිය හෝ විදේශගත ඡන්ද හිමියන් පිළිබඳව ක්‍රියා කිරීම
   - 7.5 නිල සලකුණ - 35 වන වගන්තිය
   - 7.6 ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන ඡන්ද හිමියන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සැලසීම
   - 7.7 සේවා නියුක්තිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබා දීම - 110 වන වගන්තිය

අටවන පරිච්ඡේදය

ඡන්ද විමසීම් පැවැත්වීම

8. ඡන්ද විමසීමේ දිනට පෙර දින ඉටුකළ යුතු කටයුතු
   - 8.1 ඡන්ද මධ්‍යස්ථානය වෙත රැගෙන යායුතු ද්‍රව්‍ය නිකුත් කිරීම
   - 8.2 ඡන්ද පොළ සහායකයින් හා ආරක්ෂක නිලධාරීන් යෙදවීම
   - 8.3 ඡන්ද මධ්‍යස්ථානයේ පහසුකම් සැලසීම
   - 8.4 ඡන්ද විමසීම් කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය
   - 8.5 ඡන්ද විමසීම් දිනට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ක්‍රියා කළයුතු ආකාරය
   - 8.6 ඡන්ද විමසීම් දින රාජකාරී කටයුතු
   - 8.7 ඡන්ද විමසීම පැවැත්වීම
   - 8.8 ඡන්ද විමසීම අවසන් කිරීම, ඡන්ද පෙට්ටි හා සෙසු ව්‍යවස්ථාපිත ලේඛන භාරදීම
   - 8.9 මැතිවරණ ආරවුල් කළමනාකරණය
   - 8.10 මැතිවරණ පැමිණිලි වාර්තා කිරීම
   - 8.11 ජාතික හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තර
   - 8.12 ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා වූ පැමිණිලි
   - 8.13 මැතිවරණ පැමිණිලි වර්ගීකරණය
     - 8.13.1 ප්‍රචණ්ඩ ක්‍රියා
     - 8.13.2 නීති උල්ලංඝනය කිරීම
     - 8.13.3 විමසීම්
     - 8.13.4 අනුමැතිය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම්
   - 8.14 රාජ්‍ය සම්පත් අවභාවිතය වැළැක්වීම
   - 8.15 ඡන්ද විමසීම හා සම්බන්ධ අධිකරණ කටයුතු
   - 8.16 ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීම
     - 8.16.1 දේශීය නිරීක්ෂණ සංවිධාන
     - 8.16.2 විදේශීය නිරීක්ෂණ සංවිධාන

නවවන පරිච්ඡේදය

ඡන්ද පත්‍රිකා ගණන් කිරීම හා ප්‍රතිඵල වගුගත කිරීම

9. ඡන්ද පත්‍රිකා ගණන් කිරීම
   - 9.1 ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන
   - 9.2 ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා නියෝජිතයින් පත් කිරීම
   - 9.3 ඡන්ද ගණන් කිරීම සඳහා කාර්ය මණ්ඩලය
   - 9.4 ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ විය යුතු කොන්දේසි
   - 9.5 ඡන්ද ගණන් කිරීම
   - 9.6 ප්‍රතිඵල ගණනය කිරීම හා දිස්ත්‍රික් ප්‍රතිඵල ප්‍රකාශ කිරීම
   - 9.7 ප්‍රතිඵල වගුගත කිරීම
   - 9.8 අවසන් ප්‍රතිඵලය ගණනය කිරීම
   - 9.9 අවසන් ප්‍රතිඵලය සැකසීම හා පරීක්ෂා කිරීම
   - 9.10 නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම

දහවන පරිච්ඡේදය

ඡන්ද විමසීම් සඳහා වියදම් දැරීම

10. ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසිම සඳහා වියදම්
   - 10.1 ඡන්ද විමසීම සඳහා වියදම් දැරීම
   - 10.2 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා දරන ලද සමස්ත වියදමේ වර්ගීකරණය
   - 10.3 වෙනත් ආයතන වෙත පවරා දෙන ලද ප්‍රතිපාදන

එකොළොස්වන පරිච්ඡේදය

නිරීක්ෂණ හා නිර්දේශ

11. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ
   - 11.1 රාජ්‍ය නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීම
   - 11.2 අපේක්ෂක ඇප මුදල්
   - 11.3 තැපැල් ඡන්ද පහසුකම්
   - 11.4 විද්‍යුත් තාක්ෂණය යොදා ගැනීම
   - 11.5 මැතිවරණ නීති සංශෝධන
   - 11.6 නිල ඡන්ද දැන්වීම්පත් බෙදීම
   - 11.7 රාජ්‍ය දේපළ අවභාවිතය
   - 11.8 මාධ්‍ය භාවිතය කළමනාකරණය කිරීම
   - 11.9 සමාජ මාධ්‍ය ජාල
   - 11.10 ආගමික සිද්ධස්ථාන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම
   - 11.11 මැතිවරණ ප්‍රචාරණ වියදම් පාලනය
   - 11.12 අපේක්ෂකයින් සඳහා ගුවන් විදුලි හා රූපවාහිනී ප්‍රචාරණය සඳහා කාලය ලබාදීම

දොළොස්වන පරිච්ඡේදය

ඇගයීම හා සමාප්තිය

12. ඇගයීම
   - 12.1 සමාප්තිය

ඇමුණුම් හා සංඛ්‍යා සටහන්

- ඇමුණුම් ලේඛනය
- සංඛ්‍යා සටහන් ලේඛනය

පළමුවන පරිච්ඡේදය

හැඳින්වීම හා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ නෛතික විධිවිධාන

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයා මෙන්ම ව්‍යවස්ථාදායකය සඳහා මහජන නියෝජිතයින් ද පළාත් සභා සම්බන්ධයෙන් ගත්කළ පළාත් සභා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම ද පළාත් පාලන ආයතන සඳහා වූ සභිකයන් තෝරා පත්කර ගැනීම ද සිදු කරනුයේ ඒ වෙනුවෙන් පවත්වනු ලබන ඡන්ද විමසීම් මගිනි. මේ එක් එක් ඡන්ද විමසීමට අදාළ වූ පනත් පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඇත. ඊට අමතරව මේ සියල්ලෙහි මූලික නීතිය වශයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දී තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ මූලික නීතියවේ. මෙම මූලික නීතිය නිදහස ලැබීමට පෙර බ්‍රිතාන්‍ය රාජාණ්ඩුව විසින් පනවන ලද රාජාඥා මගින් සපුරා දී තිබිණි. අනතුරුව ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඉන්පසුව සෝල්බරි ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන ලද මූලික නීතිය නිදහස ලැබීමෙන් පසුව ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවට පළමුව, දේශීය වශයෙන් සම්පාදනය කර සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙනු ලබන්නේ 1972 වර්ෂයේදීය. එම ව්‍යවස්ථාව "ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" නමින් හැඳින්විය. එමගින් මෙරට රජය නාමමාත්‍ර ජනාධිපතිවරයෙකු ගෙන් සහ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයකින් ද මහජන නියෝජිතයින් ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාව ද යන අංශවලින් සමන්විත විය. 1972 - 1978 දක්වා ක්‍රියාත්මකව පැවැති මෙම ප්‍රථම දේශීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 වසරේ සම්මත කරන ලද “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව” සම්මත කිරීමෙන් පසුව අහෝසි විය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එතෙක් පැවති නාමමාත්‍ර ජනාධිපතිධුරය, විධායක ජනාධිපතිධුරයක් බවට පත් කරන ලදී. පාර්ලිමේන්තුව මහජන නියෝජිතයින්ගෙන් සමන්විත වූ ව්‍යවස්ථාදායකය විය.

මීට අමතරව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් ඉදිරිපත් කරන ලද දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදෙන ලද පළාත් සභා ක්‍රමය ද මහජන නියෝජිතයින්ගෙන් සමන්විත ආයතනයක් වූ බැවින්, ඒ සඳහා ද නියෝජිතයින් පත් කිරීම පිණිස ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා නව නීති සම්පාදනය කරන ලදී.

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමටත්, පාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයින් පත් කිරීම සඳහාත් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද එක් එක් මැතිවරණය හෝ ඡන්ද විමසීම සඳහා අවශ්‍ය නීති ව්‍යවස්ථාදායකය විසින් විශේෂ පනත් මගින් ද සම්පාදනය කරන ලදී. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණ පැවැත්වීමේ ක්‍රමවේදය ද හඳුන්වා දී ඇත. එම මැතිවරණ හා ඡන්ද විමසීම් සඳහා අදාළ පනත් පහත සඳහන් වේ.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත.

1981 අංක 2 දරන ජනමතවිචාරණ පනත.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත.

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 අධිකාරය) (සංශෝධන).

මැතිවරණ නීති අනුව නියමිත කාලවල දී ඡන්ද විමසීම් පැවැත්වීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ වගකීම විය. එමෙන්ම එක් එක් මැතිවරණය හෝ ඡන්ද විමසීම් පවත්වා අවසන් වූ පසුව ඒ පිළිබඳව වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය විය. ඒ අනුව ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම් වාර්තා, පාර්ලිමේන්තු මැතිවරණ වාර්තා, පළාත් සභා ඡන්ද විමසීම් වාර්තා

හා පළාත් පාලන ඡන්ද විමසීම් වාර්තා මෙන් ම 1982 පවත්වන ලද එකම ජනමත විචාරණය වෙනුවෙන් ජනමත විචාරණ වාර්තාව එවකට සේවයේ නියුතුව සිටි මැතිවරණ කොමසාරිස්වරුන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. යම් ඡන්ද විමසීමකට හෝ මැතිවරණයකට අදාළව වාර්තාවක් වෙනම නිකුත් නොකරන ලද අවස්ථාවල දී ඒ පිළිබඳව අතුරු වාර්තාවක් නිකුත් කිරීම හෝ මැතිවරණය හෝ ඡන්ද විමසීම පවත්වන ලද වර්ෂයේ, "වාර්ෂික වාර්තාවේ" කොටසක් වශයෙන් එම මැතිවරණය හෝ ඡන්ද විමසීම පිළිබඳව තොරතුරු ඇතුළත් කර ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථා ද ඇත.

මැතිවරණ කොමිෂන් සභාව 2015 වර්ෂයේ නොවැම්බර් මස ස්ථාපිත කිරීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103(2) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම්, මැතිවරණ සහ ජනමත විචාරණ පැවැත්වීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරා දී ඇත.

1.1 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ නෛතික විධිවිධාන

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වනු ලබන නෛතික මූලාශ්‍ර වනුයේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතයි.

1.1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

වසර 1978 දි සම්මත කරන ලද ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව 2019 ජනාධිපතිවරණ අවස්ථාව වන විට දහනව වතාවක් සංශෝධනය වී ඇති බැවින් එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලට යටත්ව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳව දක්වා ඇති විධිවිධාන සලකා බැලිය යුතුවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇති බවත්, එකී පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඇතුළත් වන බවත් සඳහන් වේ. ව්‍යවස්ථාවේ හතරවන ව්‍යවස්ථාව අනුව ජනතාව සතු පරමාධිපත්‍ය ක්‍රියාත්මක වීම හා භුක්ති විඳීම සිදුවන ආකාරය පැහැදිලි කර ඇත. 4(ආ) ව්‍යවස්ථාවට අනුව රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු බවත්, 4(ඉ) ව්‍යවස්ථාව අනුව නියමිත සුදුසුකම් සපුරාලන ලද ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිව සිටින සෑම පුරවැසියෙකු විසින්ම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක දී තමන් සතු ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි බවත් සඳහන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII පරිච්ඡේදයේ 30 සිට 41 දක්වා වූ ව්‍යවස්ථා මගින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම, ධුර කාලය, ජනාධිපති ධුරය හිස් කිරීම, ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ වලංගුභාවය, අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත් කිරීම පිළිබඳව විධිවිධාන සලසා ඇත.

එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIV වන පරිච්ඡේදයේ 88 සිට 102 දක්වා වූ ව්‍යවස්ථා මගින් ඡන්ද හිමියකුවීමේ සුදුසුකම්, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගැනීමට නුසුදුසුකම් හා ජනාධිපතිවරයා තෝරා පත් කිරීම පිළිබඳ විධිවිධාන පැහැදිලි කර ඇත. XIV අ පරිච්ඡේදයේ ඡන්ද විමසීම් පිළිබඳ බලය හිමිවන මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීම හා එහි බලතල කාර්ය හා කර්තව්‍ය අංක 103 සිට 104 දක්වා වූ ව්‍යවස්ථා මගින් දක්වා ඇත.

1.1.2 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත

වසර 1978 ජනරජ ව්‍යවස්ථාවෙන් 1978 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත මගින් පනවා ඇත. මෙම පනත නම් කර ඇත්තේ "ජනතාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි." යනුවෙනි. මෙම පනතට මතු දැක්වෙන සංශෝධන පනත් මගින් නව විධිවිධාන ඇතුළත් කරන ලදි.

- 1988 අංක 16 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ (සංශෝධන) පනත.
- 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත.

- 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත.
- 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත.

ඉහත සංශෝධනවලින් සංශෝධිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත කොටස් VII කින් සමන්විත වේ. ඒ මෙසේය.

- I වන කොටස "ප්‍රාරම්භය".
- II වන කොටස "නාම යෝජනා පිළිබඳ විධිවිධාන".
- III වන කොටස "ඡන්ද විමසීමට අදාළ විධිවිධාන".
- IV වන කොටස "ඡන්ද ගණන් කිරීම".
- V වන කොටස "වැරදි, දූෂණ ක්‍රියා, නීති විරෝධී ක්‍රියා හා දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා සඳහා ක්ෂමාව".
- VI වන කොටස "ඡන්ද පෙත්සම් පිළිබඳ විධිවිධාන".
- VII වන කොටස "සාමාන්‍ය කරුණු".

ඉහත විධිවිධාන සම්බන්ධයෙන් උපලේඛන පහක් මගින් අදාළ ආකෘති පත්‍ර හා එම විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස උපයෝගී කරගත යුතු කරුණු පිළිබඳ විස්තර සඳහන් කර ඇත.

1.2 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් 1982 – 2015 දක්වා පවත්වන ලද ඡන්ද විමසීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ප්‍රථම ඡන්ද විමසීම 1982 ඔක්තෝබර් මස 20 වන දින පවත්වන ලදී. ඉන් අනතුරුව මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් 1988 දෙසැම්බර් 19, 1994 නොවැම්බර් 09, 1999 දෙසැම්බර් 21, 2005 නොවැම්බර් 17, 2010 ජනවාරි 10 සහ 2015 ජනවාරි 08 යන දිනවලදී ජනාධිපතිවරණ ඡන්ද විමසීම් හතක් (7) පවත්වා ඇත. එම ඡන්ද විමසීම්වලදී පහත දැක්වෙන පරිදි ඡන්දදායකයින් විසින් ජනාධිපතිවරුන් තෝරා පත්කර ගැනීමට කටයුතු කර ඇත.

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම පවත්වන ලද දිනය	ජයග්‍රහණය කරන ලද අපේක්ෂකයා	ලබා ගත් ඡන්ද සංඛ්‍යාව	ලබා ගත් ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය
1982.10.20	ගරු ජේ.ආර්.ජයවර්ධන මහතා	3,450,811	52.91%
1988.12.19	ගරු රණසිංහ ප්‍රේමදාස මහතා	2,569,199	50.43%
1994.11.09	ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය	4,709,205	62.28%
1999.12.21	ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය	4,312,157	51.12%
2005.11.17	ගරු මහින්ද රාජපක්ෂ මහතා	4,887,152	50.29%
2010.01.10	ගරු මහින්ද රාජපක්ෂ මහතා	6,015,934	57.88%
2015.01.08	ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා	6,217,162	51.28%

මූලාශ්‍රය - මැතිවරණ කොමිෂන් සභාව,
ජාතික මැතිවරණ අංශය

1.3 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් 2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනය අනුව මැතිවරණ කොමිෂන් සභාව 2015 නොවැම්බර් 13 දින ස්ථාපිත කිරීමෙන් අනතුරුව එම කොමිෂන් සභාව විසින් පළමුවරට මෙහෙයවන ලද ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම 2019 නොවැම්බර් 16 වන දින පවත්වන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවන වගන්තිය යටතේ 2019.09.18 වන දින ඊට අදාළ දැන්වීම පළකරන ලදී. එම දැන්වීමට අනුව 2019.10.17 වන දින නාමයෝජනා භාරගන්නා ලද අතර අපේක්ෂකයින් 35 දෙනෙකු නාමයෝජනා භාරදෙන ලදී. 2019.11.16 වන දින පවත්වන ලද ඡන්ද විමසීමේ දී ප්‍රකාශිත මුළු වලංගු ඡන්ද සංඛ්‍යාව 13,252,499 ක් වූ අතර ගරු ගෝඨාභය රාජපක්ෂ මහතා ඡන්ද 6,924,255 (52.25%) ක් ලබා ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්විය.

දෙවන පරිච්ඡේදය

නාමයෝජනා

02. නාමයෝජනා

ඕනෑම ඡන්ද විමසීමක දී ඒ සඳහා අදාළ ඡන්ද විමසීමේ නිවේදනය නිකුත් කිරීමෙන් පසුව නාමයෝජනා භාර ගැනීම එම ක්‍රියාවලියෙහි ආරම්භක ප්‍රධානතම කාර්යයකි. ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක දී නාමයෝජනා භාර ගැනීම මැතිවරණ දෙපාර්තමේන්තුව පැවති අවධියෙහි මැතිවරණ කොමසාරිස්වරයා විසින් ද මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් ද භාරගැනීම සිදු කළ යුතුය. ඒ සඳහා නියමිත දිනයක්, නිශ්චිත වේලාවක් හා ස්ථානයක් ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2.1 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමය

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර මාසයකට අඩු නොවන හා මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළදී පැවැත්විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කළයුතු වූ දැන්වීම නියමිත පරිදි 2019.09.18 වන දින අංක 2141/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. නාමයෝජනා භාර ගැනීමේ දිනය 2019.10.07 වශයෙන් ද, නාමයෝජනා භාර ගැනීමේ කාලය එදින පෙරවරු 09.00 සිට 11.00 වශයෙන් ද, නාමයෝජනා භාර ගැනීමේ ස්ථානය රාජගිරිය සරණ මාවතේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලය වශයෙන් ද ඊට අදාළ ඡන්ද විමසීම පැවැත්වීමේ දිනය 2019.11.16 වශයෙන් ද එකී දැන්වීම මගින් නියම කරන ලදී. මීට අදාළ ගැසට් නිවේදනය **ඇමුණුම 01** වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත. මේ පිළිබඳව 2019.09.18 දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය මගින් ද අදාළ විස්තර ප්‍රසිද්ධියට පත් කරන ලදී.

2.2 එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තේරීම්භාර නිලධාරීන් පත්කිරීම

එක් එක් **මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද** විමසීම් ක්‍රියාවලිය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්, මගපෙන්වීම් හා නියමයන් අනුව ක්‍රියාත්මක කිරීමේ වගකීම තේරීම්භාර නිලධාරීන් වෙත පැවරේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඊ(1) සහ එම ව්‍යවස්ථාවේ 104ඊ(2)(1) ව්‍යවස්ථා අනුව හා ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනතේ 07(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තේරීම්භාර නිලධාරීන් පත් කිරීමට ක්‍රියා කළ යුතුය. මෙම පත් කිරීම් නමින් හෝ දරනු ලබන නිල තනතුරින් කිරීම සිදු කෙරේ. මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා අංක 2141/26 හා 2019.09.18 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් මැතිවරණ කොට්ඨාස 22 සඳහා තේරීම්භාර නිලධාරීන් විසිදෙදෙනෙකු (22) නෙකු පත් කරන ලදි. මීට අදාළ ගැසට් නිවේදනය (අංක 2141/26 හා 2019.09.18) **ඇමුණුම 02** වශයෙන් දක්වා ඇත. යාපනය හා වන්නි මැතිවරණ කොට්ඨාස හැර සෙසු මැතිවරණ කොට්ඨාස සඳහා එම එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් එම මැතිවරණ කොට්ඨාසවල තේරීම්භාර නිලධාරි වශයෙන් පත් කරන ලදී. යාපනය හා කිලිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත යාපනය මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරි ලෙස යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ද වන්නි මැතිවරණ කොට්ඨාසය වවුනියාව, මන්නාරම හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වන අතර එහි තේරීම්භාර නිලධාරි ලෙස වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ද දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරි වශයෙන්

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ද මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලදී.

2.2.1 මැතිවරණ කොට්ඨාස සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම

සෑම ඡන්ද විමසීමකදීම තේරීම්භාර නිලධාරී වෙත පැවරෙන මැතිවරණ රාජකාරී ක්‍රියාත්මක කිරීම සඳහා සහායවීම හා එම වගකීම් ඉටු කිරීම පිණිස සහකාර තේරීම්භාර නිලධාරීන් පත්කිරීම සිදු කෙරේ. ඒ සඳහා 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 7(1) වගන්තිය අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව යටතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කවල සේවයේ නියුතු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන් හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ද ඔවුන් දරන්නා වූ තනතුරු නාමයෙන් අංක 2141/27 හා 2019.09.18 දින දරන ගැසට් නිවේදනය මගින් පත් කරන ලද අතර එය **ඇමුණුම 03** වශයෙන් දක්වා ඇත.

2.2.2 මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම

ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් පත් කරන ලද දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු විසින් ඡන්ද විමසීමේ කාර්යයන් ආම්භ කිරීමත් සමග පත්කර මූලික කටයුතුවලට තමාට සහායවීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයේ විවිධ රජයේ ආයතනවල සේවයේ නියුතු සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් ඡන්ද විමසීමේ කාර්යයන් ආරම්භ කිරීමත් සමග පත්කර ගනු ලැබේ. ඉන් අනතුරුව සමස්ත දිවයිනම ආවරණය වන අන්දමින් ඡන්ද විමසීම් රාජකාරී කටයුතුවල නිරත කරවීමට හැකිවන පරිදි සුදුසුකම්ලත් මාණ්ඩලික නිලධාරීන් නමින් හා නිලයෙන් සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නිලධාරීන් එක් එක් දිස්ත්‍රික්කවල අවශ්‍යතාව අනුව අනුයුක්ත කිරීමෙන් විශේෂයෙන් මැතිවරණ දිනයේ දී ඡන්ද විමසීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ලේඛන නිකුත් කිරීම්, භාරගැනීම්, කලාප අධීක්ෂණය, ඡන්ද ගණන් කිරීමේ කටයුතු සහ අවශ්‍යතාව පරිදි සම්බන්ධීකරණ රාජකාරී හා පැමිණිලි විමර්ශන ආදී මැතිවරණ ක්‍රියාවලියේ විවිධ අවස්ථා ක්‍රියාත්මක කිරීම සඳහාත් යොදවා ගන්නා ලදී. එසේම මෙම සහකාර තේරීම්භාර නිලධාරීන් අතුරින් ඡන්ද විමසීම් පිළිබඳ අත්දැකීම් ඇති සහ මැතිවරණ කොමිෂන් සභාව සමග සමීප සම්බන්ධතා පවත්වා ගනිමින් කටයුතු කරන නිලධාරීන් පිරිසක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පවරනු ලබන විශේෂ රාජකාරී කටයුතුවල නිරත කරවීම සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයට අනුයුක්තව සේවයේ යොදවා ගැනීමට ද ක්‍රියා කරන ලදී.

2.3 පිළිගත් දේශපාලන පක්ෂ

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ ද පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් සලකා ක්‍රියා කරනු ලැබේ. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවන වගන්තිය යටතේ වූ නියමය 2019.09.18 වන දින පළ කරන ලද අවස්ථාවේ දී පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව 70 කි. ඒ අනුව පිළිගත් දේශපාලන පක්ෂ නාම ලේඛනය ප්‍රකාශයට පත් කරන ලද අංක 2108/41 හා 2019.01.31 දිනැති ගැසට් නිවේදනය **ඇමුණුම 04** යටතේ දක්වා ඇත.

2.4 ජනාධිපතිධුර අපේක්ෂකයෙකු වීම සඳහා සුදුසුකම්

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගැනීමට අවශ්‍ය සුදුසුකම් දක්වා ඇත. ඒ අනුව ඡන්ද භිමියෙකුවීමට සුදුසුකම් ලත් සෑම තැනැත්තෙකුම ඒ තැනැත්තා ;

(අ). වයස අවුරුදු 35 සම්පූර්ණ කර නොසිටීම.

(ආ). 91(1) වන ව්‍යවස්ථාවේ (ඇ)(ඉ)(ඊ) හෝ (උ) ව්‍යවස්ථා යටතේ ජනාධිපතිවරයෙකු වශයෙන් තෝරා පත්කර ගැනීමට නුසුදුස්සෙකු වීම.

(ඇ). ජනතාව විසින් ඔහු දෙවරක් ජනාධිපතිධුරයට තෝරා පත් කරගෙන තිබීම.

(ඈ). 38 වන ව්‍යවස්ථාවේ (2) අනු ව්‍යවස්ථාවේ (ඉ) යටතේ දැක්වෙන විධිවිධාන යටතේ ජනාධිපති ධුරයෙන් ඉවත් කරනු ලැබ සිටීම.

(ඉ). වෙනත් රටක ද පුරවැසියෙකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු.

යන නුසුදුසුකම් වලින් කවර හෝ නුසුදුසුකමකට යටත්ව සිටී නම් මිස ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුස්සෙකු වන්නේය.

2.5 ඇප මුදල් තැන්පත් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 8 වන වගන්තිය යටතේ ඇප මුදල් තැන්පත් කිරීමට අදාළ නීතිය දක්වා ඇත. ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ පනතේ විධිවිධාන අනුව තරග කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් 2019.10.06 වන දින මධ්‍යාහ්න 12.00ට පෙර ඇප මුදල් තැන්පත් කළ යුතු විය. පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වෙනුවෙන් රුපියල් 50,000/-ක මුදලක් ද, අනෙකුත් අපේක්ෂකයකු වෙනුවෙන් රුපියල් 75,000/-ක මුදලක් ද වශයෙන් ඇප තැන්පත් කළ යුතුය. ඇප මුදල් භාරගැනීම මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් සිදු කරනු ලබන බව දැනුම් දී තිබිණි. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාමයෝජනා කරනු ලබන අපේක්ෂකයින් හැර අනෙකුත් අපේක්ෂකයින් ඇප මුදල් භාරදීමේ දී ඔහු හෝ ඇය ව්‍යවස්ථාදායකය මගින් තෝරා පත්කර ගන්නා ලද මන්ත්‍රීවරයෙකු බව හෝ මන්ත්‍රීවරයකුව සිටි බව පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් මගින් සනාථ කිරීම අනිවාර්ය නීතිමය අවශ්‍යතාවකි. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 8(1) (ආ) (1) වගන්තිය අනුව ඊට අදාළ නිවේදනය අංක 2141/92 හා 2019.09.22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එය **ඇමුණුම 05** වශයෙන් මෙයට යා කොට ඇත. එමෙන්ම මේ පිළිබඳව 2019.09.18 දිනැති මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය නිවේදන අංක 01 මගින් ද ප්‍රසිද්ධ කරන ලදී. මෙම දැනුම්දීම අනුව නියමිත කාලසීමාවේදී එනම්, 2019.10.06 වන දින මධ්‍යයන 12.00 වන විට පිළිගත් දේශපාලන පක්ෂවලින් අපේක්ෂකයින් 19 දෙනෙකු ද වෙනත් දේශපාලන පක්ෂවලින් අපේක්ෂකයින් 3 දෙනෙකු ද, අනෙකුත් අපේක්ෂකයින් 19 දෙනෙකු ද වශයෙන් 2019.11.16 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා භාරදීමේ අපේක්ෂාවෙන් 41 දෙනෙකු වෙනුවෙන් ඇප මුදල් තැන්පත් කරන ලදී. එලෙස ඇප මුදල් තැන්පත් කරන ලද අයගේ ලේඛනය **ඇමුණුම 06** හි දක්වා ඇත.

නියමිත පරිදි මෙම ඇප තැන්පතු භාරගැනීම සනාථ කිරීම පිණිස පනතේ දක්වා ඇති ආකාරයට මුදල් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරන ලද අතර ඇප තැන්පත් කළ පසු සෑම ඇප තැන්පත්කරුවකු වෙත පහත සඳහන් ලියකියවිලි භාරදෙන ලදී.

- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ අට වන වගන්තිය යටතේ වූ කුවිතාන්සිය
- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් යුත් නාමයෝජනා කට්ටල 6ක්
- අපේක්ෂක වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ ආකෘතිය
- නාමයෝජනා මධ්‍යස්ථානයට ඇතුළුවීම පිළිබඳ උපදෙස්
- නාමයෝජනා මධ්‍යස්ථානයට ඇතුළුවීමේ අවසරපත්‍ර සහ වාහන ඇතුළු කිරීමේ අවසරපත්‍ර
- නුසුදුසු කමකට යටත් නොවූ බවට සිදුකරනු ලැබිය යුතු දිවුරුම් හෝ ප්‍රතිඥාව

2.6 නාම යෝජනා භාර ගැනීම

නාමයෝජනා භාර ගැනීම ඡන්ද විමසීම් ක්‍රියාවලියේ ඉතා වැදගත් හා ප්‍රධානතම අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. මෙම ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා භාරගැනීම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා, සාමාජික ජනාධිපති නීතීඥ එන්.ජේ.අබේසේකර මහතා සහ සාමාජික මහාචාර්ය එස්.ආර්.එච්.හූල් මහතා විසින්

සිදු කරන ලදී. භාර ගන්නා ලද නාමයෝජනා පත්‍ර පරීක්ෂා කිරීම ඇතුළු ඊට අදාළ අනෙකුත් කටයුතු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා, කොමිෂන් සභාවේ ලේකම් හා අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් ඇතුළු ඒ සඳහා පත්කරන ලද කාර්ය මණ්ඩලය විසින් ඉටු කරන ලදී.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 12, 13 හා 14 වන වගන්තිවලට අනුව ක්‍රියා කරමින් නාමයෝජනා භාරගැනීමේ කටයුතු මනා ලෙස සංවිධානාත්මකව සිදු කිරීමට කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. නාමයෝජනා භාරගැනීමේ වැඩ පිළිවෙල පිළිබඳව අදාළ පක්ෂ ලේකම්වරුන් හා අපේක්ෂකයින් දැනුම්වත් කිරීමේ සාකච්ඡාවක් පවත්වන ලදී. මීට අමතරව නාම යෝජනා භාරදීමට පැමිණෙන අපේක්ෂකයින් ඇතුළු අවසරලත් තැනැත්තන්ගේ ආරක්ෂාව, ප්‍රවාහන වැඩ පිළිවෙල හා නාම යෝජනා භාරදීමට අවශ්‍ය පහසුකම් මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පොලිසියේ ද සහාය ඇතිව සංවිධානය කරන ලදී. නාමයෝජනා භාරගැනීමේ ස්ථානයට ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ විධිවිධාන පරිදි අපේක්ෂකයාට, අපේක්ෂකයාගේ නාමයෝජනා අත්සන් කළ තැනැත්තාට සහ තවත් අමතර එක් අයෙකුට පැමිණීමට අවසර ලබාදෙන ලදී. වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත්ව සිටි බැවින් නාමයෝජනා භාරගන්නා ශාලාව තුළ සියල්ලන්ටම පහසුකම් සැලසීමේ දී විවිධ අපහසුතාවන්ට මුහුණදීමට සිදුවිය.

නියමිත කාලය තුළ ජනාධිපති අපේක්ෂකත්වය සඳහා 41 දෙනෙකු වෙනුවෙන් ඇප මුදල් තැන්පත් කර තිබුණ ද ඇප මුදල් තැන්පත් කරන ලද සියලුම තැනැත්තන් විසින් නාම යෝජනා භාර නොදීම විශේෂත්වයකි. ඇප මුදල් තැන්පත් කර තිබුණ ද පහත නම් සඳහන් තැනැත්තන් හයදෙනා ජනාධිපති අපේක්ෂකත්වය සඳහා නාමයෝජනා භාර නොදෙන ලදී.

- බෂීර් සේගුදාවුද් මහතා - අංක 8, එරාවුර් 2, එරාවුර්
- ජයන්ත ලියනගේ මහතා - 14/5A ධර්මපාල මාවත, පොල්ලත්තාපිටිය, කුරුණෑගල
- ශාන්ත කුමාර ආනන්ද වෙල්ගම මහතා - ඩැනිස්ටන් වත්ත හොරවල, වැලිපැන්න
- චමල් ජයන්ත රාජපක්ෂ මහතා - මැදමුලන, වීරකැටිය
- ගුණපාල තිස්සකුට්ටිආරච්චි මහතා - අංක 90, ජය පාර, උඩහමුල්ල, නුගේගොඩ
- ගනේආරච්චිගේ මහීපාල හේරත් මහතා - අංක 76, ගංගොඩ පාර, කෑගල්ල

අපේක්ෂකයින් වශයෙන් නාම යෝජනා භාර දෙන ලද්දේ 35 දෙනෙකු විසින් පමණකි. පිළිගත් දේශපාලන පක්ෂ වලින් අපේක්ෂකයින් 18 දෙනෙක් ද, වෙනත් දේශපාලන පක්ෂවලින් අපේක්ෂකයින් දෙදෙනෙක් ද, අනෙකුත් අපේක්ෂකයින් 15 දෙනෙක් ද සිය නාම යෝජනා භාර දෙන ලදී. නාම යෝජනා භාරගැනීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් එම නාම යෝජනා පත්‍ර පරීක්ෂා කර බලා ඒවා පිළිගන්නේ ද ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න ප්‍රකාශ කිරීම කළයුතු විය.

2.7 නාම යෝජනා පිළිබඳ විරෝධතා දැක්වීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 14 වන වගන්තියේ දැක්වෙන පරිදි ඉදිරිපත්වන නාමයෝජනා පිළිබඳව විරෝධතා ඉදිරිපත් කිරීමට 2019.10.07 වන දින පෙ.ව 09.00 සිට පෙ.ව 11.30 දක්වා අවස්ථාව ලබා දෙන ලදී. පනතේ 13(2) උප වගන්තිය ප්‍රකාරව භාරගන්නා ලද එක් එක් නාමයෝජනා පත්‍රයක පිටපතක් සකස් කොට හැකි ඉක්මනින් එම පිටපත ප්‍රදර්ශනය කළ යුතුය. ඒ අනුව නාමයෝජනා ශාලාවෙන් පිටත එහෙත් ඒ ආසන්නයේම ඒ සඳහාම ස්ථාපනය කරන ලද දැන්වීම් පුවරුවේ භාරගන්නා ලද නාමයෝජනා පත්‍රවල පිටපත් සියල්ල ප්‍රදර්ශනය කරන ලදී. මේ අනුව 14(1) වගන්තිය යටතේ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයකු විසින් හෝ එම ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් විරෝධතා දැක්වීම කළ හැකිය. විරෝධතා දැක්වීමේ අවස්ථාවේදී නියමිත කාලය තුළ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයින් වෙනුවෙන් විරෝධතා දෙක (02)ක් ඉදිරිපත් කරන ලදී. එම විරෝධතා පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

2.8 නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම්දීම

මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව අපේක්ෂකයින් 41ක් දෙනෙකු සඳහා ඇප මුදල් තැන්පත් කරන ලද

අනු අංක	විරෝධතා ඉදිරිපත් කළ අය	විරෝධතාව ඉදිරිපත් කරන ලද්දේ කුමන අපේක්ෂකයා වෙනුවෙන් ද යන වග	විරෝධතාවට හේතුව	විරෝධතාව පිළිබඳ තීරණ
01	සරත් මනමේන්ද්‍ර මහතා	එම්.කේ. සිවාජිලිංගම් මහතා	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම.	යටපත් කරන ලදී.
02	බත්තරමුල්ලේ සිලරතන හිමි	එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම.	යටපත් කරන ලදී.

නමුත් භාරදෙන ලද මුළු නාමයෝජනා ප්‍රමාණය 35කි. ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 15 වන වගන්තිය මගින් නියම කර ඇති විධිවිධාන අනුව සුදුසුකම් සපුරා නොමැති අපේක්ෂකයින්ගේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය පැවරී තිබුණි. එහෙත් ඉදිරිපත් කරන ලද නාමයෝජනා තිස්පහ (35)ම නියමිත ආකාරයට හා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත ප්‍රකාරව සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතට අනුකූලව හා විධිමත්ව ඉදිරිපත් කර තිබූ බවට කොමිෂන් සභාව සෑහීමට පත්වීම අනුව ඉදිරිපත් කරන ලද විරෝධතා පිළිගත නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද අතර, භාර දෙන ලද නාමයෝජනා සියල්ල එනම්, අපේක්ෂක නාමයෝජනා තිස්පහ (35)ම පිළිගන්නා ලදී. පිළිගත් නාම යෝජනා පිළිබඳ තීරණ දැනුම් දීම 2019.10.07 දින නාමයෝජනා ලබාදුන් අපේක්ෂකයින් අභිමුඛයෙහිදී මැතිවරණ මහලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ පැවැති රැස්වීමේ දී ප්‍රකාශයට පත්කරන ලදි.

2.9 පිළිගත් නාමයෝජනා අනුව අපේක්ෂක අනුපිළිවෙල

ඡන්ද පත්‍රිකාව සඳහා අපේක්ෂක අනුපිළිවෙල සකස් කිරීම සිදු කරනුයේ පිළිගත් නාමයෝජනා භාර දුන් අපේක්ෂකයින්ගේ නම්වල සිංහල අකාරාදීයට අනුවය. මෙහි දී නාමයෝජනාවේ සඳහන් අයුරින්ම හෝ අපේක්ෂකයා විසින් තම කැමැත්ත පරිදි ඉදිරිපත් කරනු ලබන නම භාවිත කිරීමට හැකියාව තිබේ. ඒ අනුව භාවිත කරන නම පිළිබඳ අපේක්ෂකයාගේ කැමැත්ත විමසීමට කටයුතු කරන ලදී. එහිදී අපේක්ෂකයින් විසින් ලබා දෙන ලද නම්, යෙදී ඇති ආකාරය සැලකිල්ලට ගෙන අකාරාදී අනුපිළිවෙල අනුව සකස් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. අනතුරුව පනතේ 20 වන වගන්තිය යටතේ 20(1)(අ) වගන්තියෙහි දැක්වෙන විධිවිධාන අනුව අපේක්ෂකයින්ට අදාළ ලකුණු වෙන් කර දීම සිදු කිරීමේ දී පිළිගත් දේශපාලන පක්ෂ මගින් නම් කරන ලද අපේක්ෂකයින් සඳහා එම පක්ෂයේ ලකුණ ලබා දීමට ක්‍රියාකරන ලද අතර, වෙනත් අපේක්ෂකයින් සම්බන්ධයෙන් 20(1)(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කිරීමට ද මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

මෙහිදී අපරාක්කේ පුඥානන්ද හිමි සහ එම්.කේ.සිවාජිලිංගම් මහතා විසින් තම ලකුණ වශයෙන් මාළුවා ලකුණ ද, අනුර කුමාර දිසානායක මහතා සහ සමන්සිරි හේරත් මහතා විසින් තම ලකුණ වශයෙන් මාළිමා යන්ත්‍රය ලකුණ ද ඉල්ලා සිටි බැවින්, එම අපේක්ෂකයින් අතර ලකුණ ලබාදීම කුසපත් ඇදීම මගින් තීරණය කරන ලදී. ඒ අනුව පහත සඳහන් පරිදි එකී අපේක්ෂකයින් සිව් දෙනා සඳහා පහත සඳහන් ලකුණු වෙන්කරදීමට ක්‍රියා කරන ලදී.

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනතේ 21 වන වගන්තිය අනුව ජනාධිපතිවරයා තෝරා ගැනීමට තරගයක් පවත්වනු ලබන බවත් එයට අදාළ ඡන්ද විමසීම 2019.11.16 වන දින පෙ. ව. 7.00 සිට ප. ව. 4.00 දක්වා පවත්වනු ලබන බවත් එම ඡන්ද විමසීමේ ඡන්ද පත්‍රිකාවල අපේක්ෂකයින්ගේ සිංහල අකාරාදිය අනුව නම් සඳහන් වන අනුපිළිවෙල හා එක් එක්

අපේක්ෂකයාගේ නම	අපේක්ෂකයා විසින් ඉල්ලා සිටි ඡන්ද සලකුණ	කුසපත් ඇදීමෙන් පසුව වෙන් කර දෙන ලද ඡන්ද සලකුණ
අපරාක්කේ පුඥානන්ද හිමි	මාළුවා	බල්ලා
එම්.කේ.සිවාජිලිංගම් මහතා	මාළුවා	මාළුවා
අනුර කුමාර දිසානායක මහතා	මාළිමා යන්ත්‍රය	මාළිමා යන්ත්‍රය
සමන්සිරි හේරත් මහතා	මාළිමා යන්ත්‍රය	ක්‍රිකට් පිත්ත

අපේක්ෂකයාට වෙන් කරන ලද ලකුණ ද අපේක්ෂකයාගේ නම යෝජනා කරනු ලැබූ පිළිගත් දේශපාලන පක්ෂයේ නම/වෙනත් දේශපාලන පක්ෂයේ නම හෝ ඡන්දභිමියාගේ නම අංක 2144/06 හා 2019.10.07 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදි. එය **ඇමුණුම 07** වශයෙන් වාර්තාවට ඇතුළත් කර ඇත.

2.10 අපේක්ෂකයින්ගේ ඡන්ද නියෝජිතයින් පත් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ 31 වගන්තිය යටතේ ඡන්ද නියෝජිතයින් පත් කිරීම සඳහා අවස්ථාව සලසා ඇත. මේ අනුව තරග කරනු ලබන අපේක්ෂකයෙකුට ඡන්ද නියෝජිතයා වශයෙන් එක් තැනැත්තෙකු පත් කරගත හැකිය. ඡන්ද නියෝජිතයෙකු පත් නොකර අපේක්ෂකයාට තමාම ඡන්ද නියෝජිතයා වශයෙන් පත් කරගනු ලැබිය හැකිය. එවැනි අවස්ථාවක දී අපේක්ෂකයාද ඡන්ද නියෝජිතයාද වන්නේ එකම අයෙකුය. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 31(3)(1) වගන්තිය අනුව පත් කරනු ලබන ඡන්ද නියෝජිතයා පිළිබඳ විස්තර කොමිෂන් සභාව වෙත ලබාදිය යුතු වේ.

ඡන්ද විමසීම් පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඡන්ද නියෝජිතයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් එක් බලයලත් නියෝජිතයෙකු පත් කළ හැකි වේ. එමෙන්ම බලයලත් නියෝජිතයාට එක් එක් ඡන්ද ප්‍රදේශයක් වෙනුවෙන් ප්‍රාදේශීය නියෝජිතයකු පත් කළ හැකි වේ. මෙම අපේක්ෂකයින් විසින් එසේ පත්කරනු ලබන බලයලත් නියෝජිතයාගේ හා ප්‍රාදේශීය නියෝජිතයාගේ විස්තර මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී වෙත ලබාදිය යුතුය. ඒ අනුව පත් කරන ලද එක් එක් අපේක්ෂකයාගේ නියෝජිත ලැයිස්තුව **ඇමුණුම 08** වශයෙන් දක්වා ඇත.

තුන්වන පරිච්ඡේදය

ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සංවිධානය කිරීම

3. ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ විධිවිධාන අනුව ඡන්ද විමසීම සීමිත කාලයක් තුළ පවත්වා අවසන් කිරීමට නියමකර ඇති බැවින් මෙම ඡන්ද විමසීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේ භාරදූර කර්තව්‍ය, කඩිනමින් ඉටු කිරීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරේ. ඡන්ද විමසීම් කටයුතුවල දී තේරීම්භාර නිලධාරීන් වශයෙන් ක්‍රියා කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරු සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු කැඳවා මූලික කටයුතු සංවිධානය කිරීම පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදීම මෙහි පළමු පියවර වේ. එහෙයින් තේරීම්භාර නිලධාරීන් හා මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් 2019.08.06 සහ 2019.08.23 යන දිනවල මැතිවරණ මහලේකම් කාර්යාලයට කැඳවා මූලික සංවිධාන කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා වාර දෙකක් පවත්වන ලදී. මීට අමතරව මූලික සංවිධාන කටයුතු හා ඒ වනවිට මතුව තිබූ ගැටලු පිළිබඳව වීඩියෝ තාක්ෂණය මගින් සාකච්ඡා කොට අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට ලබාදෙන ලදී.

ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීම ප්‍රසිද්ධ කළ වහාම, එනම් ඡන්ද විමසීමේ ආරම්භක අවස්ථාවේ සිට මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය සේවා සපයන ආයතන අතර රජයේ මුද්‍රණාලයට සහ තැපැල් දෙපාර්තමේන්තුවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. ඒ අනුව ඡන්ද විමසීමේ දැන්වීම ප්‍රකාශයට පත්කළ වහාම රජයේ මුද්‍රණාලයාධිපති සහ තැපැල්පති සමඟ සාකච්ඡා කර එම ආයතනවලින් ලබා ගැනීමට අපේක්ෂා කරන සේවා පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී.

ඡන්ද පත්‍රිකා ඇතුළු ව්‍යවස්ථාපිත ලිපි ලේඛන සහ වෙනත් ලිපි ලේඛන විශාල ප්‍රමාණයක් නියමිත කාල සීමාව තුළ මුද්‍රණය කර මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදීමේ භාරදූර කාර්යභාරය රජයේ මුද්‍රණාලය වෙත පැවරිණි. එමෙන්ම ඡන්ද විමසීම පිළිබඳ දැන්වීමේ සිට ඡන්ද විමසීම් ප්‍රතිඵල ප්‍රකාශය කිරීමේ නිවේදනය දක්වා තොරතුරු හා අදාළ නිවේදන ගැසට් පත්‍රවල පළ කිරීම රජයේ මුද්‍රණාලයෙන් ඉටු කරන තවත් වැදගත් කාර්යයකි.

මැතිවරණ කොමිෂන් සභාවට හා ඒ ඒ තේරීම්භාර නිලධාරීන්ට ඡන්ද විමසීමට සම්බන්ධ ලිපි ලේඛන යොමු කිරීමට හා ලැබෙන ලිපි ගෙන්වා ගැනීමට ප්‍රමුඛ සේවාවක් වශයෙන් සලකා ක්‍රියා කිරීමට තැපැල් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. ඡන්ද විමසීමක දී වැදගත්ම අංගයක් වන තැපැල් ඡන්ද පහසුකම් ලබා දීමේ දී තැපැල් දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ. තවද ඡන්ද හිමියන් වෙත සිය නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීමේ කාර්යය ද තැපැල් දෙපාර්තමේන්තුව වෙත පැවැරෙන වගකීමකි. එසේම එම ආයතන විසින් සපයනු ලබන එකී සේවා සඳහා වන වියදම් ඇස්තමේන්තු මැතිවරණ කොමිෂන් සභාව වෙත කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ද එම ආයතන ප්‍රධානීන්ට උපදෙස් දෙන ලදී.

ඡන්ද විමසීමේ කාර්ය සඳහා අවශ්‍ය පොදු පහසුකම් සැපයීමේ දී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතනවලින් විශේෂ කාර්ය භාරයක් ඉටු කරවා ගනු ලැබේ. එම කාර්යයන් විධිමත්ව හා අරපිරිමැස්මෙන් යුතුව සම්පාදනය කරවා ගැනීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන්ගේ නියෝජිතයින් සමඟ සාකච්ඡා පවත්වා සපයනු ලබන සේවා සඳහා ගෙවිය යුතු මිල ගණන් පිළිබඳව ද එකඟතාවලට එළඹීමට කටයුතු කරන ලදී.

ඡන්ද විමසීම් රාජකාරී සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමන මණ්ඩලයේ නිලධාරීන් සමග සහ පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගම්වල නිලධාරීන් සමග සාකච්ඡා කර ඔවුන්ගේ සේවා ලබා ගැනීමේ කටයුතු පිළිබඳ අවශ්‍ය තීරණ ගන්නා ලදී. එසේම දිස්ත්‍රික් මට්ටමින් කුලීරථ සංගම්වල සාමාජිකයින් කැඳවා ඔවුන්ගේ සහාය ද ලබා ගැනීමට ක්‍රියා කරන ලදී.

3.1 ඡන්ද විමසීම සඳහා වලංගු ඡන්දහිමි නාමලේඛනය

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම් පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයට අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019.09.18 වන දින ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම ප්‍රකාශයට පත්කරන ලද අවස්ථාව වන විට 2019 වර්ෂයට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ ප්‍රතිශෝධන කටයුතු අවසන්ව නොතිබීම නිසා එම ඡන්දහිමි නාමලේඛනය සහතික කර නොතිබිණි. දෙවන වගන්තිය යටතේ වූ නියමය පළකරනු ලබන දිනයේ දී ක්‍රියාත්මකව තිබූ ඡන්දහිමි නාමලේඛනය ඡන්ද විමසීම සඳහා භාවිත කළ යුතු බව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 5 වන වගන්තියෙහි සඳහන් වේ. මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව ඡන්දය ප්‍රකාශ කිරීමට යම්කිසි තැනැත්තෙකුට හිමිකම් තිබේ ද නැද්ද යන්න පිළිබඳ තීරණාත්මක සාක්ෂි වන්නේ පස්වන වගන්තියේ සඳහන් පරිදි වලංගු ඡන්දහිමි නාමලේඛනය බවද පනතේ 6 වන වගන්තියෙහි දක්වා ඇත. මේ අනුව 2018 ඔක්තෝම්බර් මස 25 වන දින සහතික කළ එවකට ක්‍රියාත්මකව පැවති 2018 ඡන්දහිමි නාමලේඛනය මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා යොදා ගැනීම ට කටයුතු කරන ලද අතර ඒ අනුව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අවශ්‍ය 2018 ඡන්දහිමි නාමලේඛනයේ පිටපත් සංඛ්‍යාව මුද්‍රණය කරවන ලදි. 2018 ඡන්දහිමි නාමලේඛනයට අනුව සුදුසුකම් ලබන ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව 15,992,096 ක් විය.

3.2 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ විධිවිධානවලට අමතරව 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ නියමයන් අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ පවුල්වල සුදුසුකම්ලත් අයට 2013 අංක 27 දරන විශේෂ විධිවිධාන පනත මඟින් එසේ අවතැන්වීමට පෙර ඔවුන්ගේ ස්ථිර වාසස්ථාන පිහිටි මැතිවරණ කොට්ඨාසයට අදාළව ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමට ක්‍රියා කරනු ලැබේ. පනතේ විධිවිධාන අනුව 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අදාළව සහතික කරන ලද පරිපූරක නාමලේඛනයෙහි ලියාපදිංචි තැනැත්තන්ට වෙනත් ඡන්ද පොළකදී ඡන්දය ප්‍රකාශ කිරීමට ඉල්ලුම් කිරීම සඳහා අවස්ථාව ලබා දිය යුතු අතර ඒ සඳහා සුදුසුකම් ලැබූ දෙදෙනෙකුට පමණක් මෙම අවස්ථාව හිමිවිය.

3.3 ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම

නාමයෝජනා භාර ගැනීම අවසන් වූ වහාම ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා අපේක්ෂකයින්ගේ නම් අනුපිළිවෙල හා එක් එක් අපේක්ෂකයා සඳහා වෙන්කර දෙන ලද ඡන්ද ලකුණු ඇතුළත් ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් රජයේ මුද්‍රණාලයාධිපති වෙත භාරදෙන ලදී. ඒ අනුව මුද්‍රණය කරන ලද ඡන්ද පත්‍රිකාවේ සෝදුපත් පරීක්ෂා කර බලා කොමිෂන් සභාව විසින් එය අනුමත කිරීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. සෑම මැතිවරණ කොට්ඨාසයක් සඳහාම පොදු ඡන්ද පත්‍රිකාවක් මුද්‍රණය කිරීම හේතුවෙන් පාර්ලිමේන්තු මැතිවරණයකට අදාළ ඡන්ද පත්‍රිකා මුද්‍රණයට වඩා එය පහසු කාර්යයක් වුව ද ඉතා කෙටි කාලයක් තුළ මුද්‍රණ කටයුතු අවසන් කිරීමට සිදුවීම නිසා රජයේ මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලයට ඒ සඳහා දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු විය. තැපැල් ඡන්ද දායකයන් සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා ප්‍රමාණය පළමුව මුද්‍රණය කිරීමටත්, ඒ ඒ දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව අනුව

ඉතිරි ඡන්ද පත්‍රිකා පසුව මුද්‍රණය කිරීමටත් රජයේ මුද්‍රණාලයට උපදෙස් දෙන ලදී. විවිධ බාධක හමුවේ වුව ද රජයේ මුද්‍රණාලයාධිපතිනිය හා එහි කාර්ය මණ්ඩලය මුද්‍රණ කටයුතු නිසි කාල සීමාවේදී නිමකර දීම සඳහා දරන ලද ප්‍රයත්නය අතිශයින්ම ප්‍රසංශනීය වේ.

ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර අවසන් වූ වහාම එම ඡන්ද පත්‍රිකා දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් විසින් පොලිස් ආරක්ෂාව යටතේ රැගෙන ගොස් සුරක්ෂිතාගාරවල තැන්පත් කර ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත භාර දෙන තෙක් විශේෂ පොලිස් ආරක්ෂාවක් යටතේ සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු සංවිධානය කරන ලදී. ඡන්ද විමසීම් දිනට පෙර දින වන විට එම ඡන්ද පත්‍රිකා එක් එක් ඡන්ද මධ්‍යස්ථානයට අවශ්‍ය වන සංඛ්‍යාව අනුව මිටි වශයෙන් සකස් කර නිකුත් කිරීමේ ශාලා අනුව වෙන් කර පහසුවෙන් නිකුත් කිරීමට හැකි වන පරිදි නැවත සුරක්ෂිතාගාරවල තැන්පත් කර පොලිස් ආරක්ෂාව යටතේ තැබීමට උපදෙස් දෙනු ලැබිණි.

3.4 මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීම

ශ්‍රී ලංකාව ඡන්ද විමසීම් පැවැත්වීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාස විසිදෙක (22)කට බෙදා වෙන් කර ඇත. 1978 පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් මෙම මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කරන ලදී. එකී සීමා නිර්ණය කොමිෂන් සභාවේ නිර්දේශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පළ කරවන ලද 1981 ජනවාරි මස 15 වන දිනැති අංක 1233 දරන ඇති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් වන අතර මෙම නියමය අනුව ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාස විසි දෙක (22)කට බෙදා වෙන් කිරීම සිදුකර ඇත. මන්නාරම, වවුනියාව හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක වලින් සමන්විත වන්නි මැතිවරණ කොට්ඨාසය ද 1984 පෙබරවාරි මස කිලිනොච්චිය නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් පිහිටුවීමෙන් පසු යාපනය හා කිලිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක එක්කොට යාපනය මැතිවරණ කොට්ඨාසය ද පිහිටුවන ලදී. මේ හැර ඉතිරි පරිපාලන දිස්ත්‍රික්ක 19, ඒවායේ නම්වලින්ම වූ මැතිවරණ කොට්ඨාස වශයෙන් නම් කරන ලද අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවන ලද මැතිවරණ කොට්ඨාසය නම් කරනු ලැබ ඇත්තේ දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙනි. මෙම මැතිවරණ කොට්ඨාස 22ක ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිණිස පවත්වනු ලබන ඡන්ද විමසීම් සඳහා ද මැතිවරණ කොට්ඨාස වශයෙන් පිළිගනු ලැබිය.

3.5 ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස

මැතිවරණ කොට්ඨාස විසිදෙක (22)ක ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස වශයෙන් තවදුරටත් බෙදා වෙන්කර ඇත. මෙම බෙදා වෙන්කිරීම් 1978 ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාවට අනුව සහ 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9 වන වගන්තිය යටතේ සිදු කරන ලදී. එසේ බෙදා වෙන් කරන ලද ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව 160 කි. එම ඡන්ද ප්‍රදේශ තුළ පිහිටි ඡන්ද කොට්ඨාසවලට අදාළ විස්තර 1981.02.03 දින සිට 1981.02.13 වන දින දක්වා වූ කාලය තුළ අතිවිශේෂ ගැසට් පත්‍ර 9 ක් මගින් ප්‍රකාශයට පත් කර තිබේ. ඡන්ද ප්‍රදේශයක් තුළ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානයන්ට යටත්ව සිදු කිරීම එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ වගකීමකි. ඒ ඒ ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ අඩු වැඩිවීම්, ඡන්ද මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශවීමේ පහසුකම් වැනි භෞතික කරුණු සැලකිල්ලට ගෙන ඡන්ද විමසීමේ කාර්යය හා ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ කටයුතු පහසුවන අන්දමට එම ඡන්ද ප්‍රදේශ තුළ පිහිටි ඡන්ද කොට්ඨාස සංයුතියේ හා සංඛ්‍යාවේ වෙනස්කම් සිදු කර ගැනීමට කටයුතු කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත මගින් සලසා ඇත. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම ජාතික මට්ටමින් එක් ඡන්ද කොට්ඨාසයක් වශයෙන් සලකා ක්‍රියා කරනු ලැබුවේ වූවද සංවිධාන පහසුව, කරුණු එක් රැස් කිරීමේ පහසුව හා ප්‍රතිඵල ගණනය කිරීමේ පහසුව ආදී කරුණු සැලකිල්ලට ගෙන මැතිවරණ කොට්ඨාශ ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස යන

බෙදා වෙන්කිරීම් අනුව ක්‍රියා කරන ලදී. මැතිවරණ කොට්ඨාස 22 හා ඡන්ද ප්‍රදේශ ඇතුළත් සිතියම **ඇමුණුම 09** වශයෙන් දක්වා ඇත.

3.6 ඡන්ද මධ්‍යස්ථාන (ඡන්ද පොළ)

ඡන්ද මධ්‍යස්ථාන හෙවත් ඡන්ද පොළ යනු ලියාපදිංචි ඡන්ද හිමියන්ට ස්වකීය ඡන්දය පහසුවෙන් නිදහස්ව හා නොබියව ප්‍රකාශ කිරීම සඳහා පිහිටුවන ස්ථානයයි. සාමාන්‍යයෙන් මේ සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් හෝ එසේ නොමැති නම් තාවකාලිකව ඉදි කරනු ලබන ගොඩනැගිල්ලක් (මඩුවක්) යොදා ගත හැකිය. නාමයෝජනා කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙම ස්ථාන හඳුනා ගැනීමත්, ඒවා ඡන්ද විමසීමේ දී යොදාගැනීමට හැකි වන පරිදි අවශ්‍ය අලුත්වැඩියාවන් කර සුදුසු තත්ත්වයට පත්කර තැබීමත් අත්‍යවශ්‍ය වේ. ඡන්ද කොට්ඨාසයක් පදනම් කර ගනිමින් එම මධ්‍යස්ථානයට කැඳවීමට අපේක්ෂිත ඡන්ද දායකයින් සංඛ්‍යාව ද සැලකිල්ලට ගනු ලබන අතර ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමේදී විවිධ සමාජීය කරුණු ද සැලකිල්ලට ගෙන එම මධ්‍යස්ථාන මිශ්‍ර ඡන්ද මධ්‍යස්ථාන (ගැහැණු, පිරිමි) හෝ ඡන්ද දායිකාවන් (ගැහැණු) සඳහා පමණක් සීමා වූ ඡන්ද මධ්‍යස්ථාන ආදී වශයෙන් පිහිටුවීමට ක්‍රියා කරනු ලැබේ. මෙම ඡන්ද මධ්‍යස්ථාන නිශ්චය කිරීමෙන් පසුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් එක් ඡන්ද ප්‍රදේශයේ එක් එක් ඡන්ද කොට්ඨාසයට අදාළව පිහිටුවනු ලබන ඡන්ද මධ්‍යස්ථානය හෝ ඡන්ද මධ්‍යස්ථාන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ. මෙම ඡන්ද විමසීමට අදාළ ඡන්ද මධ්‍යස්ථාන 12,845 ඇතුළත් ලැයිස්තුව අංක 2144/08 හා 2019.10.07 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු **ඇමුණුම 10** වශයෙන් වාර්තාවට ඇතුළත් කර ඇත.

ඡන්ද මධ්‍යස්ථානයක් පිහිටුවීමට ගොඩනැගිලි තෝරා ගැනීමේ දී විශේෂයෙන්ම එය පිහිටි ස්ථානයෙහි යෝග්‍යතාව ද පහසුකම් ද සැලකිල්ලට ගනු ලැබේ. ඒ අතර පහත සඳහන් කාරණා ද වැදගත් වේ.

(i). ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට නියමිත ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව

(ii). ඡන්ද දායකයකු විසින් පයින් ගමන් කළයුතු දුර ප්‍රමාණය අවම කිරීම

(iii). ඡන්ද කොට්ඨාසය තුළ හැකි තරම් මධ්‍යගත ස්ථානයක පිහිටුවීම

(iv). ආරක්ෂිත කාමරයක් සහිත ස්ථිර ගොඩනැගිල්ලක් වීම

(v). පහසුවෙන් ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව

(vi). ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය නවාතැන්, සනීපාරක්ෂක පහසුකම්, ජලය හා විදුලිය ආදී මූලික අවශ්‍යතා තිබීම

(vii). ආබාධිත ඡන්ද දායකයන්ට බාධාවකින් තොරව ප්‍රවේශවීමේ හැකියාව

(viii). ස්වාභාවික ආපදාවලින් විය හැකි හානි අවම ස්ථානයක් වීම

3.7 ඡන්ද පෙට්ටි සැපයීම

ඡන්ද විමසීමක දී සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා රජයේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදිත දැවමය ඡන්ද පෙට්ටි භාවිතය සම්ප්‍රදායිකව සිදු කළ ක්‍රමවේදය විය. එසේ වුවද ලීයෙන් නිම කරන ඡන්ද පෙට්ටි සමග මිශ්‍රව ෆයිබර් ඡන්ද පෙට්ටි මෙන්ම ඇලුමිනියම් තහඩුවලින් නිම කරන ලද ඡන්ද පෙට්ටි ඡන්ද විමසීම්වල දී භාවිතයට ගන්නා ලද අවස්ථා තිබේ. තැපැල් ඡන්ද බහාලීම සඳහා සාමාන්‍ය ඡන්ද මධ්‍යස්ථානවලදී භාවිතයට ගනු ලබන ඡන්ද පෙට්ටිවලට වඩා විශාල ප්‍රමාණයේ ඡන්ද පෙට්ටි, භාවිතයට ගනු ලැබේ. මේ වනවිට ලියාපදිංචි දේශපාලන පක්ෂ සංඛ්‍යාව ඉහළ යාම, ඡන්ද විමසීම් සඳහා එම පක්ෂ යටතේ තරග කරන අපේක්ෂකයින් සංඛ්‍යාව වැඩිවීම හා ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වීම නිසා ඡන්ද පත්‍රිකාව අසාමාන්‍ය පරිදි දිගුවීම හේතුවෙන් එක් ඡන්ද පෙට්ටියකට බහාලිය හැකි ඡන්ද පත්‍රිකා ප්‍රමාණය අඩුවීම හේතුකොට ගෙන එක් ඡන්ද මධ්‍යස්ථානයකට ඡන්ද පෙට්ටි එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ලබාදීමට සිදුව තිබිණ. එමගින් ඡන්ද මධ්‍යස්ථාන කටයුතු කළමනාකරණයේ දී මහත් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවූ බව සඳහන් කළ යුතුව ඇත.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අපේක්ෂයින් 35 දෙනෙකු නාමයෝජනා භාරදීම හේතුවෙන් සහ එම සියලුම නාමයෝජනා පත්‍ර පිළිගන්නා ලද හෙයින් ඡන්ද විමසීමේදී නිකුත් කරන ඡන්ද පත්‍රිකාවක දිග උප පත්‍රිකාව හැර අඟල් 24 ක් පමණ විය. ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය මත එක් ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්දය ප්‍රකාශ කරන ලද ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා අවශ්‍ය ඡන්ද පෙට්ටි සංඛ්‍යාව සැපයීම අභියෝගාත්මක කරුණක් විය. මැතිවරණ කොමිෂන් සභාව සතුව තිබූ මෙතෙක් පැවති ඡන්ද විමසීම්වල දී භාවිත කරන ලද දැවමය ඡන්ද පෙට්ටියක විශාලත්වය අනුව ඇතුළත් කළ හැකි වනුයේ මෙම ඡන්ද විමසීමේ දී භාවිත කරන ප්‍රමාණයේ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව 350 - 400 අතර ප්‍රමාණයක් බව කරන ලද අධ්‍යයනයේ දී නිරීක්ෂණය විය. එබැවින් එක් ඡන්ද මධ්‍යස්ථානයන් සඳහා ඡන්ද පෙට්ටි කිහිපයක් භාවිත කිරීමට සිදුවන බව අදාළ නිලධාරීන් විසින් මැතිවරණ කොමිෂන් සභාවට දන්වා සිටින ලදී. එම දැවමය ඡන්ද පෙට්ටි බරින් අධික හා හැසිරවීම අපහසු බැවින් එක් ඡන්ද මධ්‍යස්ථානයක් සඳහා ඡන්ද පෙට්ටි කිහිපයක් නිකුත් කළ හොත් විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට හා කාර්ය මණ්ඩලයට ඒවා හැසිරවීම ඉතා දුෂ්කර විය හැකි බව ප්‍රත්‍යක්ෂ විය. එමෙන්ම කඩිනමින් අමතර දැවමය ඡන්ද පෙට්ටි සපයා ගැනීම ද අපහසු කාර්යයක් වූ බැවින් විකල්ප වැඩපිළිවෙලක අවශ්‍යතාව මතු වූ අතර, එය කඩිනමින් ඉටු කරවාගත හැකි එකක් විය යුතුව තිබිණ.

මෙරට ප්‍රධාන පෙළේ ප්ලාස්ටික් නිෂ්පාදකයින් සමග ප්ලාස්ටික් ඡන්ද පෙට්ටි නිෂ්පාදනය පිළිබඳව සාකච්ඡා කරන ලද නමුත් කොමිෂන් සභාවේ අවශ්‍යතාව වහාම ඉටුකර ගැනීමට සුදුසු පසුබිමක් සකස් නොවිණි. විදේශීය සැපයුම්කරුවන්ගෙන් ප්ලාස්ටික් ඡන්ද පෙට්ටි ලබාගත නොහැකි වූයේ ඒ සඳහා වන අධික වියදම හේතුවෙනි. මෙවැනි පරිසරයක් තුළ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි නිෂ්පාදනය කරවාගෙන භාවිතයට ගැනීම වඩා ලාභදායී හා සුදුසු විසඳුමක් බවට තහවුරු වුයෙන් ඒ සඳහා අවධානය යොමු කරවන ලදී.

මේ පිළිබඳව කරන ලද සාකච්ඡාවල දී ඉදිරිපත් වූ යෝජනා අනුව ප්‍රමාණ තුනකින් යුත් විශේෂිත සන කාඩ්බෝඩ්වලින් සාදන ලද ඡන්ද පෙට්ටි යොදා ගැනීම සුදුසු බව තීරණය කරන ලදී. තවද විදේශ රටවල නිෂ්පාදිත ඡන්ද පෙට්ටි යොදා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් වුව ද ජාතික මැතිවරණ අංශය හාර අතිරේක මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රමුඛ සෙසු කාර්ය මණ්ඩලය විසින් දේශීය සැපයුම්කරුවන් වෙත ආදර්ශ ඉදිරිපත් කර අවශ්‍ය නිසි උපදෙස් ලබා දී ඔවුන් දිරිමත් කරමින් කාඩ්බෝඩ්වලින් නිෂ්පාදිත ඡන්ද පෙට්ටි දේශීයව සකස් කරවා ගැනීමට පියවර ගන්නා ලදී. මෙම ක්‍රියාමාර්ගය නිසා බරින් අඩු, හැසිරවීමට පහසු වූ ඡන්ද පෙට්ටි අවශ්‍යතාව, අඩු පිරිවැයකින් සපයා ගැනීමට හැකි විය.

ඒ අනුව දේශීය සැපයුම්කරුවන් මගින් නියමිත පිරිවිතරවලට අනුකූල වන අයුරින් සහ ගුණාත්මකභාවයෙන් යුතුව ඡන්ද පෙට්ටි කුඩා (14"x14"x24"), මධ්‍යම (18"x15.5"x25") හා විශාල (21"x18.5"x27") යන ප්‍රමාණයන්ගෙන් කුඩා පෙට්ටියක බර 1.55kg ලෙස ද, මධ්‍යම ප්‍රමාණයේ පෙට්ටියක බර 2.05kg ලෙස ද විශාල ප්‍රමාණයේ පෙට්ටියක බර 2.65kg ලෙස ද අඩු බරකින් යුතුව ඡන්ද විමසීම සඳහා අවශ්‍ය වූ ඡන්ද පෙට්ටි සංඛ්‍යාව ඉතා කෙටි කාලයක් තුළ නිෂ්පාදනය කරවා ගත හැකි විය.

රජයේ කර්මාන්ත ශාලාවේ දී ලී ඡන්ද පෙට්ටියක් නිෂ්පාදනය කිරීම සඳහා වියදම රු.15,000.00කට අධිකවේ. 2014 වර්ෂයේ ආනයනය කරන ලද ප්ලාස්ටික් ඡන්ද පෙට්ටියක එවකට මිල රු.10,450.00 පමණ විය. එසේ වුව ද කුඩා කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටියක් රු.800.00 බැගින් ද, මධ්‍යම ප්‍රමාණයේ පෙට්ටියක් රු.950.00කට ද, විශාල ප්‍රමාණයේ ඡන්ද පෙට්ටියක් රු.1050.00කට ද වැට බදු රහිත මිලකට නිෂ්පාදනය කර ගැනීමට හැකි විය. කාඩ්බෝඩ්වලින් නිර්මිත මෙම ඡන්ද පෙට්ටි ලාභදායී මෙන්ම සැහැල්ලු බව, ප්‍රවාහනයට පහසුව හා හැසිරවීමේ පහසුව හේතුවෙන් මෙම ඡන්ද පෙට්ටි පරිහරණය කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ ද ඇගයීමට ලක් විය. කෙසේ වුවද සන කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටිවලට අමතරව මෙතෙක් භාවිත කරන ලද ෆයිබර් හා දැවමය ඡන්ද

පෙට්ටි ද මෙම ඡන්ද විමසීමේදී භාවිතයට ගන්නා ලදී.

3.8 ආරක්ෂක කටයුතු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ ව්‍යවස්ථාවට අනුව ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ සිට, ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කොට සතියක කාලයක් ගතවන තෙක්ම, මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධරයන් සංඛ්‍යාවක් මැතිවරණ කොමිෂන් සභාවේ දැනුම් දීම පරිදි අනුයුක්ත කිරීම පොලිස්පතිවරයා වෙත පැවරේ. එමෙන්ම 104 ඈ ව්‍යවස්ථාව යටතේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අහිතකර විය හැකි යම් ක්‍රියා හෝ සිද්ධි වැළැක්වීම හා පාලනය කිරීම සඳහා රජයේ සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට ද කොමිෂන් සභාව වෙත ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී ආරක්ෂාව සැලසීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා හා මැතිවරණ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග සාකච්ඡා කිහිපයක්ම මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. මෙම සාකච්ඡාවල දී එළැඹී තීරණවලට අනුව තේරීම්භාර නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ද දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් සමඟ සාකච්ඡා පවත්වා ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ අයුරින් පැවැත්වීමට අවශ්‍ය ආරක්ෂක වැඩපිළිවෙල සංවිධානය කරන ලදී. දිස්ත්‍රික්කවල පැවැති තත්ත්වය, ආරක්ෂක කටයුතු හා මැතිවරණ නීති බලාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ නීති විමර්ශන හා මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකයේ නිලධාරීන් ද සහභාගී විය. එසේම ඡන්ද විමසීමට අවශ්‍ය ආරක්ෂක වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ සහාය ද අවශ්‍ය අවස්ථාවලදී ලබාගන්නා ලදී.

ඡන්ද විමසීම් දැන්වීම ප්‍රකාශයට පත් කළ දින සිට මැතිවරණ මහල්කම් කාර්යාලයට මෙන්ම සියලුම තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාල හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ප්‍රමාණවත් පොලිස් ආරක්ෂාවක් ලබාදීමට පොලිස්පතිවරයා ක්‍රියා කර තිබුණි. මෙම ආරක්ෂක වැඩපිළිවෙල හා ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ කටයුතු සාක්ෂාත් කර ගනු පිණිස ශ්‍රී ලංකා පොලීසිය දිවයිනේ සෑම පොලිස් ස්ථානයකම පොලිස් මැතිවරණ ඒකකයක් ස්ථාපිත කොට මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සමඟ සෘජු සම්බන්ධතා ඇති කර ගන්නා ලදී. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ගැනීම මැතිවරණ කොමිෂන් සභාවේ මෙන්ම දේශපාලන පක්ෂ, අපේක්ෂකයින්, නිරීක්ෂණ සංවිධාන හා සිවිල් සංවිධානවල ද අපේක්ෂක්ෂාව වන හෙයින් දේශපාලන පක්ෂ ලේකම්වරු, ස්වාධීන කණ්ඩායම් නායකයන් සමඟ මැතිවරණ කොමිෂන් සභාවේ පැවැති සාකච්ඡා සඳහා පොලිස්පතිවරයා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගි කරගන්නා ලදී.

තවද ඡන්ද විමසීම් නීතිය බලාත්මක කිරීම, තහවුරු කිරීම සහ ඡන්ද විමසීම් කාල සීමාව තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා පොලීසිය, ඡන්ද විමසීම් කාල සීමාව තුළ විශාල මෙහෙයක් ඉටු කරන ලදී. ඒ අනුව පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ) ගේ මෙහෙයවීම යටතේ පොලිස් මූලස්ථානයේ මැතිවරණ ඒකකයට අනුයුක්තව නිලධාරීන් 30 දෙනෙකු යොදවා තිබුණි. ඔවුන්ගේ සෘජු සම්බන්ධීකරණය යටතේ රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථාපිත කරනු ලැබූ මැතිවරණ මෙහෙයුම් හා ආරක්ෂක සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙහි පොලිස් නිලධාරීන් 15ක්, පොලිස් කොට්ඨාස මැතිවරණ මෙහෙයුම් මැදිරි නිලධාරීන් 238 ක් හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි

කළමනාකරණ ඒකක 25ක් සඳහා පොලිස් නිලධාරීන් 281 ක් මගින් ඡන්ද විමසීම ප්‍රකාශිත දිනයේ සිට ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනය දක්වා වන කාල සීමාව තුළ ඡන්ද විමසීම ආශ්‍රිත ආරක්ෂක කටයුතු මෙහෙයවීම හා නීතිය බලාත්මක කිරීම සම්බන්ධීකරණය හා මෙහෙයවීම සිදු කරන ලදී. මීට අමතරව නාමයෝජනා දිනයේ දී රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාල පරිශ්‍රය හා ඒ අවට ප්‍රදේශය ආශ්‍රිතව විශේෂිත ආරක්ෂක සැලැස්මක් ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා පොලිසියේ හා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 350 කට ආසන්න ප්‍රමාණයක් රාජකාරී සඳහා යොදවන ලදී. ප්‍රචාරක කටයුතු අවසන් වූ නිහඬ කාලසීමාව තුළ, ඡන්ද විමසීම් දිනයේ දී හා ප්‍රතිඵල ප්‍රකාශ කරන දිනය අතර කාල සීමාව තුළ ආරක්ෂක කටයුතු ආවරණය වන පරිදි පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 72,808 දෙනෙකු යෙදවීමට ශ්‍රී ලංකා පොලීසිය විසින් කටයුතු කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත සටහනෙහි දැක්වේ.

පූර්වයෙන් හඳුනාගත් විශේෂ ස්ථානවල ස්ථානගත කිරීම් හා පොලිස් ජංගම මුර සංචාරක සේවා සඳහා ද මෙම නිලධාරීන් යොදවන ලදී. ඡන්ද මධ්‍යස්ථානයන්හි, ව්‍යවස්ථාපිත ලිපි ලේඛනවල හා ඡන්ද පත්‍රිකා ඇතුළු ආරක්ෂිත ද්‍රව්‍යවල මෙන්ම කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල සියලුම ආරක්ෂක කටයුතු ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරන ලද අතර එහිදී ඔවුන් තම කාර්යය ලබා දී ඇති උපදෙස් පරිදි ඉටු කරන ලදී. ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වාර්තා වූ වහාම ඒ පිළිබඳව කටයුතු කිරීම ශ්‍රී ලංකා පොලිසිය වෙත පැවැරුණු ප්‍රධාන කාර්යයක් වූ අතර දිස්ත්‍රික් පැමිණිලි විමර්ශන අංශ මගින් මෙහෙයවන ලද අවදානම් සහිත බවට සලකන ලද ස්ථානීය පරීක්ෂණවල දී ආරක්ෂාව සැපයීමේ කටයුතුවල දී ශ්‍රී ලංකා පොලීසිය ඉමහත් සේවාවක් සිදු කරන ලදී.

ආරක්ෂක කටයුතු සඳහා යොදවන ලද පොලිස් නිලධාරීන්

පළාත/ විශේෂයෙන් හඳුනාගත් ස්ථාන	ආරක්ෂක රාජකාරී සඳහා යොදවන ලද නිලධාරීන් සංඛ්‍යාව
බස්නාහිර පළාත	15,902
දකුණු පළාත	7,176
උතුරු මැද පළාත	5,243
ඌව පළාත	4,541
වයඹ පළාත	7,375
මධ්‍යම පළාත	8,560
සබරගමුව පළාත	5,708
උතුරු පළාත	7,134
නැගෙනහිර පළාත	6,840
රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලය	50
රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලය සඳහා විශේෂ කාර්ය බලකාය	150
ඡන්ද විමසීම් ආරක්ෂක කටයුතු සඳහා යෙදවූ විශේෂ කාර්ය බලකාය	4,129
එකතුව	**72,808**

හතරවන පරිච්ඡේදය

කාර්ය මණ්ඩල අවශ්‍යතා

4. කාර්ය මණ්ඩල අවශ්‍යතා

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සාර්ථක අයුරින් කළමනාකරණය කිරීම පිණිස මූලික සංවිධාන කටයුතු හා නාමයෝජනා, තැපැල් ඡන්ද, ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම, සම්බන්ධීකරණ කටයුතු, ඡන්ද විමසීමට අදාළව පත්කරනු ලබන කමිටු රාජකාරී හා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම ආදී කාර්යයන් පිළිබඳව සියලුම තේරීම්භාර නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු ප්‍රධාන කාර්යාලයට කැඳවා උපදෙස් ලබාදෙන ලදී. මෙහිදී දිස්ත්‍රික් මට්ටමේ මූලික සංවිධාන වැඩපිළිවෙල පිළිබඳව වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කොට අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබාදීමට ක්‍රියා කරන ලදී.

4.1 ඡන්ද විමසීම් කාර්ය මණ්ඩල පත් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම ජාතික මට්ටමින් පවත්වනු ලබන ඡන්ද විමසීමක් බැවින් ඒ සඳහා විශාල කාර්ය මණ්ඩලයක් යොදා ගැනීමට සිදුවේ. එබැවින් මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ජනාධිපති ලේකම්වරයා විසින් 2019.10.09 දිනැති චක්‍රලේඛයක් මගින් සියලුම ආණ්ඩුකාරවරු, සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, ප්‍රධාන ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත ඡන්ද විමසීම කාර්යක්ෂමවත් ඵලදායීවත් සංවිධානය කරගැනීම පිණිස නිලධාරීන් නිදහස් කිරීමට, වාහන හා වෙනත් අවශ්‍යතා ද සපුරාලීමට ක්‍රියා කරන ලෙස දන්වා යවා තිබුණි. මැතිවරණ කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඊ(1), (2), 104උ සහ 104ඌ ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවල ලේකම්වරුන්, සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්, පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්, සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්, සාමාන්‍යාධිකාරීවරුන් වෙත අංක EC/ADM/EL/1/ ST හා 2019.08.05 දිනැති "මැතිවරණ කාර්යයන් සඳහා රාජ්‍ය අංශයේ නිලධරයන්ගේ තොරතුරු රැස් කිරීම" මැයත් වූ චක්‍රලේඛය නිකුත් කර, නිලධාරීන්ගේ තොරතුරු දන්වා එවන මෙන් ඉල්ලා සිටින ලදී. එසේම එම චක්‍රලේඛයේ පිටපත් ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්, මහබැංකු අධිපතිවරයා හා විගණකාධිපතිවරයා වෙත ද යවා තිබුණි.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය කාර්ය මණ්ඩල හැකිතාක් දුරට දිස්ත්‍රික්කය තුළින්ම ලබා ගැනීමට හැකිවන පරිදි, ඒ ඒ දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා සෙසු ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරී දත්ත පත්‍ර ඒ ඒ දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ පාසල් හැර, කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ හා බත්තරමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති සෙත්සිරිපාය I හා II අදියර, සුභූරුපාය, සම්පත්පාය, ගොවිජන මන්දිරය, ඉසුරුපාය, රන්මගපාය හා පළාත් සභා සංකීර්ණය ඇතුළු සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සහකාර තේරීම්භාර නිලධාරී හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති තනතුර සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගේ දත්ත පත්‍ර මැතිවරණ මහලේකම් කාර්යාලයට ද, එම සියලුම ආයතනවල සෙසු නිලධරයන් හා සේවකයන්ගේ දත්ත පත්‍ර කොළඹ නාගරික මැතිවරණ කාර්යාලයට ද යැවිය යුතු බවට ආයතන ප්‍රධානීන්ට උපදෙස් දී තිබිණ.

ඡන්ද සංඛ්‍යාව, ජන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව, නිකුත් කිරීමේ හා භාරගැනීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව,

ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව ආදිය පිළිබඳව අවධානය හා සැලකිල්ල යොමු කොට එක් එක් දිස්ත්‍රික්කයේ නිලධාරී අවශ්‍යතාව, ඒ ඒ දිස්ත්‍රික්කයෙන් හෝ යාබද දිස්ත්‍රික්ක වෙතින් හා කොළඹ සංචිතයන් සපුරා ගැනීමට අපේක්ෂිත තොරතුරු, මැතිවරණ මහලේකම් කාර්යාලයට ගෙන්වා ගන්නා ලදී. මෙම තොරතුරු අනුව දිස්ත්‍රික්කයේ නිලධාරී අවශ්‍යතාව අදාළ දිස්ත්‍රික්කයෙන් සම්පූර්ණ කරගත නොහැකි වන්නේ නම් යාබද දිස්ත්‍රික්ක වෙතින් හෝ කොළඹ සංචිතයෙන් සම්පාදනය කිරීමේ වැඩපිළිවෙලක් ද මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය පරිදි ක්‍රියාත්මක කරන ලෙසට උපදෙස් දී සංවිධානය කොට තිබුණි. එක් එක් දිස්ත්‍රික්කයේ නිලධාරී අවශ්‍යතා පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන් අංක 01 හි දක්වා ඇත.

තවද ඡන්ද පත්‍රිකා පරීක්ෂා කිරීම, ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි ඇතුළු ව්‍යවස්ථාපිත ලිපි ලේඛන නිකුත් කිරීම හා භාරගැනීම, ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම, සම්බන්ධීකරණ කාර්යාල, ප්‍රතිඵල වගුගත කිරීම. සුභසාධන, ප්‍රවාහන, පොදු පහසුකම්, මෙහෙයුම් මැදිරි රාජකාරි සඳහා අනියම් සේවකයාගේ සිට රජයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් දක්වා වූ විවිධ කණ්ඩායම්වල සහාය ලබාගැනීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවිය. මූලික සංවිධාන කටයුතු සඳහා පිහිටුවිය යුතු කමිටු, ඒවායේ ක්‍රියාකාරීත්වය හා රාජකාරී කාල වකවානු, ඒවාට අනුයුක්ත කළ හැකි නිලධාරී සංඛ්‍යාව හා ඒවායේ පරිපාලන කටයුතු පිළිබඳව සියලුම තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත උපදෙස් දෙන ලදී. මෙම ඡන්ද විමසීම සඳහා දළ වශයෙන් ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩල සේවකයන් 223,983 ක් පමණ යොදා ගෙන ඇත. ඉන් නිලධාරීන් 218,623ක් පමණ අදාළ දිස්ත්‍රික්කවල පාසල් හා රාජ්‍ය ආයතන වෙතින්ම සපයා ගන්නා ලදී. මෙහිදී එක් එක් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව අනුව මැතිවරණ මහලේකම් කාර්යාලයේ සංචිතයෙන් නිලධාරීන් 5,360ක් පමණ ලබාදීමට ක්‍රියා කරන ලදී. විශේෂයෙන් සහකාර තේරීම්භාර නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් මේ යටතේ ලබාදී ඇති අතර එම විස්තර ඇතුළත් සංඛ්‍යා සටහන අංක 02 වශයෙන් වාර්තාවට ඇතුළත් කර ඇත. මෙම නිලධාරීන් තෝරා ගැනීමේ සංගණන කටයුතු හා නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු කොළඹ මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී මෙන්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මට්ටමින් ද සිදු කරන ලදී.

4.2 කාර්ය මණ්ඩල සංචිත පවත්වා ගැනීම

ඡන්ද විමසීමේ රාජකාරී කටයුතුවලදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට ඡන්ද විමසීමට පෙර දින පෙරවරුවේ තමා පත්කර ඇති ඡන්ද මධ්‍යස්ථානයට අදාළ බඩුබාහිරාදිය භාරගැනීම සඳහා වාර්තා කිරීමට දන්වනු ලැබේ. එහෙත් අසනීප තත්ත්වයන් හා වෙනත් අත්‍යවශ්‍ය කාරණා හේතුවෙන් වාර්තා නොකරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙනුවට පත්කිරීම සඳහා තේරීම්භාර නිලධාරීන් විසින් අවශ්‍ය බවට තීරණය කරනු ලබන නිලධාරී සංචිතයක් සෑම බඩුබාහිරාදිය නිකුත් කරන ශාලා පිහිටි පරිශ්‍රයකම පිහිටුවන ලදී. එසේම ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් හදිසි හා නොවැළැක්විය හැකි හේතු මත සේවය සඳහා වාර්තා නොකරනු ලබන අවස්ථා වලදී එම නොපැමිණි නිලධාරීන් වෙනුවට වහාම පත් කර යැවීමට හැකිවන අන්දමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිලධාරී සංචිත පවත්වා ගෙන යාමට පියවර ගන්නා ලදී. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු මෙම සංචිතය භාරව කටයුතු කළ අතර, කලාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන් විසින් කාර්ය මණ්ඩල අඩුපාඩු පිළිබඳව දැන්වූ පසු ඒවා පරීක්ෂා කර සංචිතයේ රැඳී සිටින නිලධාරීන් පත්කර යැවීමට සුදුසු වැඩ පිළිවෙලක් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකදී ම ක්‍රියාත්මක විය. ඒ සඳහා පත්කරනු ලබන නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන කරා ප්‍රවාහනයට අවශ්‍ය පහසුකම් ද සපයන ලදී. මෙම වැඩපිළිවෙල දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව සහ පවතින සම්පත් අනුව සකස් කර ගැනීම සුදුසු බවට ද සියලුම තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයේ ද, නොපැමිණෙන නිලධාරීන් වෙනුවෙන් අනුයුක්ත කිරීමට හැකිවන පරිදි සංචිත නිලධාරීන් සෑම ගණන් කිරීමේ පරිශ්‍රයකටම පත් කිරීමට කටයුතු කරන ලදී.

4.3 ප්‍රවාහන පහසුකම්

ඡන්ද විමසීමක දී ප්‍රවාහන වැඩපිළිවෙල මනාව සංවිධානය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. එහෙයින් ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සංවිධානය කරනු ලබන ආරම්භක අවස්ථාවේදීම සෑම දිස්ත්‍රික්කයකම සහකාර තේරීම්භාර නිලධාරියකුගේ ප්‍රධානත්වයෙන් ප්‍රවාහන කමිටුවක් ස්ථාපිත කර ඊට අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් තේරීම්භාර නිලධාරීන් වෙත දැන්වීමට කටයුතු කරන ලදී. ඡන්ද විමසීම් දිනට පෙර දින සියලුම ඡන්ද පොළවල් වෙත නිලධාරීන් හා ඡන්ද මධ්‍යස්ථානයේ බඩු බාහිරාදිය යවා තිබීමත්, ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පෙට්ටි සහ අනෙකුත් ආරක්ෂිත දෑ සමග නිලධාරීන් ගෙන්වා ගැනීමේ මධ්‍යස්ථාන වෙත හැකි ඉක්මනින් ආරක්ෂිතව ආපසු ප්‍රවාහනය කිරීමත් ඡන්ද විමසීම් කටයුතු සංවිධානයේ දී ඉතා වැදගත් වේ. මීට අමතරව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට ඡන්ද විමසීමේ කටයුතු අධීක්ෂණයට මෙන්ම අනෙකුත් සම්බන්ධීකරණ කාර්යයන් සඳහා ශක්තිමත් ප්‍රවාහන වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. ඡන්ද විමසීමේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය ආරක්ෂාව ලබාදීම වෙනුවෙන් ජංගම මුර සංචාර පැවැත්වීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ද සළසා දීමට කටයුතු කරන ලදී. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම දිවයින පුරා එක් දිනක දී පැවැත්වෙන බැවින් ඉහත සඳහන් කළ අවශ්‍යතා වෙනුවෙන් විශාල වාහන සංඛ්‍යාවක් යෙදවීමට සිදුවිය.

මෙම ප්‍රවාහන අවශ්‍යතා සැලකිල්ලට ගෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සංස්ථා මණ්ඩල ප්‍රධානීන් වෙත 2019.08.05 දිනෙන් යුතුව ලිපියක් යවමින්, තම ආයතන සතුව ඇති සියලුම වාහන සම්බන්ධ විස්තර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ලබා දිය යුතු බව දන්වන ලදී. ඒ අනුව කොළඹ නාගරික සීමාව තුළ පිහිටි රජයේ කාර්යාලවල වාහන සම්බන්ධ විස්තර මැතිවරණ මහලේකම් කාර්යාලයට ද, ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටි ආයතනවල ඇති වාහන පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ද සැපයිය යුතු විය. ඡන්ද විමසීම් රාජකාරී සඳහා පත්කොට ඇති අතිරේක ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හා වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ස්වකීය ප්‍රවාහන කටයුතු සඳහා සිය නිල මෝටර් රථ වෙන්කර තබා ගැනීමේ අවස්ථාව ලබාදෙන ලදී. ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එම දිස්ත්‍රික්ක තුළින් ලබාගත් වාහනවලට අමතර වශයෙන් මැතිවරණ මහලේකම් කාර්යාල සංචිතයෙන් විවිධ වර්ගයේ වාහන 1933 ක් ඒ ඒ දිස්ත්‍රික්කවල අවශ්‍යතා අනුව ලබා දීමටත් ක්‍රියා කරන ලදී. ඒ පිළිබඳ විස්තර ඇතුළත් **සංඛ්‍යා සටහන 03** යටතේ දක්වා ඇත.

තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් කටයුතු සඳහා වාහන අවශ්‍යතාව ගණන් බැලීමෙන් පසුව, රජයේ වාහන ප්‍රමාණවත් නොවීම නිසා ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ, පෞද්ගලික මගී ප්‍රවාහන බස්රථ හා වෙනත් රථ වාහන කුලී පදනමින් ද ලබා ගැනීමට කටයුතු කරන ලදී. මීට පෙර පැවති ඡන්ද විමසීම්වල දී මෙන්ම ජනාධිපතිවරණයේ දී ද කුලී වාහන සඳහා ගාස්තු ක්‍රමයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. රජයේ වාහන ලබා ගැනීමට නොහැකි අවස්ථාවල දී එම ගාස්තු ගෙවා කුලී පදනමින් වාහන ලබා ගැනීමට තේරීම්භාර නිලධාරීන්ට හා ශ්‍රී ලංකා පොලිසියට මෙන්ම තැපැල් දෙපාර්තමේන්තුවට අවසර ලබා දුනි.

පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවට හා තැපැල් දෙපාර්තමේන්තුවට රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් රජයේ වාහන නොමැතිවීම හේතුවෙන් අනුමත කුලී පදනම මත වාහන ලබාගැනීමට මෙම ඡන්ද විමසීම් අවස්ථාවේ දී ද අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

ඡන්ද පොළවල් භාරව ක්‍රියා කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින්ට හා ඡන්ද පොළවල් කීපයක අධීක්ෂණ කටයුතු භාරව ක්‍රියා කරන කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ඡන්ද විමසීම් රාජකාරී සඳහා තම පෞද්ගලික මෝටර් රථ යොදා ගැනීම සඳහා ද අවසර දෙන ලදී. එසේ වුවද ඡන්ද පොළ රාජකාරී සඳහා අනුයුක්ත ජ්‍යෙෂ්ඨ ඡන්ද

ස්ථානාධිපතිවරයාට ඡන්ද පෙට්ටි සහ ආරක්ෂිත ද්‍රව්‍ය ද, පොලිස් නිලධාරීන් සහ තම සහායකයා ද කැටුව ගමන් කිරීමට සිදුවන නිසා ඒ සඳහා සුදුසු ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති කාර් රථ, වෑන් රථ හා ජීප් රථ වැනි වාහන ඇත්නම් ඒවා පමණක් යොදා ගැනීමට අනුමැතිය ලබාදිය යුතු බවට තේරීම්භාර නිලධාරීන් දැනුම්වත් කරන ලදී.

ඡන්ද විමසීමට අදාළ ප්‍රවාහන පහසුකම් අඩාල නොවන පරිදි සපුරාලීමට අවශ්‍ය වන ඉන්ධන තොග රැස්කර තබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මැතිවරණ කොමිෂන් සභාව විසින් උපදෙස් නිකුත් කරන ලදී. ඒ සම්බන්ධයෙන් තවදුරටත් තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරමින්, ඒ ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් කාර්යයට යොදා ගනු ලබන වාහන සඳහා වූ ඉන්ධන අවශ්‍යතාව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත දැන්වීමට හා අවශ්‍ය තොග ගබඩාකර තබා ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ඔවුන් සමග සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා මෙන් ද උපදෙස් දෙන ලදී. තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීමට අදාළ කාර්යයන් සඳහා ඉන්ධන ලබා ගැනීමට නියමිත පිරවුම්හල් කළමණාකරුවන් ද දැනුවත් කරමින් තොග වෙන්කර තබා ගැනීමට කටයුතු කරන ලදී.

4.4 පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම

ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම ද පොලිස් ආරක්ෂාව යටතේ සිදු කිරීමට තේරීම්භාර නිලධාරීන් විසින් කටයුතු යොදන ලදී. ඡන්ද පොළ සෙසු කාර්ය මණ්ඩලය පොදු ප්‍රවාහන පහසුකම් හෝ තමා විසින් යොදාගත් ප්‍රවාහන පහසුකම් උපයෝගි කරගනිමින් ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරු 2.00ට පෙර අදාළ ඡන්ද පොළවල් වෙත වාර්තා කළ යුතු විය. එහිදි දුම්රියෙන් ගමන් කරන නිලධාරීන්ට තම සේවා ස්ථානයෙන් ඒ සඳහා රාජකාරි දුම්රිය බලපත් ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී. මහනුවර, නුවරඑළිය, මඩකලපුව සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල මාර්ග දුෂ්කරතා හේතුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් ක්‍රියාත්මක නොවන ප්‍රදේශවල පිහිටුවා තිබූ ඡන්ද මධ්‍යස්ථානවල සෙසු කාර්ය මණ්ඩලයට ද තේරීම්භාර නිලධාරී විසින් ප්‍රවාහන පහසුකම් සලසන ලදී. එමෙන්ම දූපත් ආශ්‍රිතව පිහිටුවා තිබූ ඡන්ද මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ලබා ගන්නා ලදී.

ප්‍රවාහන පහසුකම් සැලසීමේ දී අනෙකුත් වැදගත් අංශය වූයේ ඡන්ද දායකයන් සඳහා පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම ය. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 82 වගන්තියේ සඳහන් කරුණු අනුව ඡන්ද දායකයාට තම පෞද්ගලික වාහනයෙන් ඡන්ද පොළ වෙත යාමේ නීතිමය බාධා පවතින බැවින් පොදු ප්‍රවාහන පහසුකම් ශක්තිමත් කළයුතු විය. ඒ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවා, ඡන්ද විමසීම් රාජකාරි සඳහා යෙදවීමට අවශ්‍ය වාහන ලබාදීම මෙන්ම, ඡන්ද විමසීම් දින ඡන්ද දායකයාට අපහසුවකින් තොරව ඡන්ද පොළවෙත යාමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමේ ඇති වැදගත්කම පිළිබඳව ඔවුන් දැනුම්වත් කරන ලදී. දිස්ත්‍රික් මට්ටමේ දී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මගින් ද අදාළ ආයතනවල ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කොට අවශ්‍ය පහසුකම් සලසා තිබිණ.

පස්වන පරිච්ඡේදය

තැපැල් ඡන්ද පහසුකම් සැලසීම

5. තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම

ඡන්ද විමසීම් රාජකාරීවල නිරත වන රජයේ සේවකයන්ට හා ඡන්ද විමසීම් රාජකාරී කටයුතු හා සම්බන්ධිත වෙනත් අත්‍යවශ්‍ය සේවාවල නිරත වන සේවකයන්ට ද 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 23(1) වගන්තියේ විධිවිධාන අනුව තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇත. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 23(3) අනුව තැපැල් ඡන්ද දායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක්, ඡන්ද විමසීමක් පවත්වන ලෙස නියම කෙරෙන ප්‍රකාශනය පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය හා ඊට අදාළ පහසුකම් ජාතික මට්ටමින් මෙන් ම දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කරනු ලබන අතර පුවත්පත් දැන්වීම්, චක්‍රලේඛ මගින් හා මාධ්‍ය නිවේදන මගින් ඒ පිළිබඳව ඡන්ද හිමියන් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

5.1 තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්

තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන පිරිස කවුරුන්දැයි යන්න, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 23(2) වගන්තියේ සඳහන් වේ. තරග කරන අපේක්ෂකයින්, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්, පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, දුම්රිය, තැපැල් හා විදුලි සංදේශ යන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලවල හා ලංකා ගමනා ගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය, මැතිවරණ රාජකාරී පැවරෙන රජයේ හෝ පළාත් සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් මෙම පහසුකම ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇති තැනැත්තෝ වෙති. තේරීම්භාර නිලධාරියා වෙත එවිය යුතු තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අයදුම්කරුවන්ට තම ලියාපදිංචි විස්තර, ඡන්දහිමි නාමලේඛනවලින් පරීක්ෂාකර ලබා ගැනීම අවශ්‍ය වේ. එම කාර්යය පහසුකරවීම් වස් ඡන්ද විමසීමට වලංගු ඡන්දහිමි නාමලේඛන, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද, ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අදාළ වන ඡන්දහිමි නාමලේඛන එකී ග්‍රාම නිලධාරී කාර්යාලවල ද වශයෙන් ප්‍රදර්ශනය කරන ලදී. එයට අමතරව රජයේ නිලධාරීන් බහුතරයක් ස්ථානගත වී සිටින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, කම්කරු මහ ලේකම් කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, තැපැල් මූලස්ථානය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිහිටි පරිශ්‍රවල ද සෙත්සිරිපාය කාර්යාල සංකීර්ණයේ ද ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනයට අවශ්‍ය පියවර ගන්නා ලදී. ආරක්ෂක අංශවල සාමාජිකයින් හා පොලිස් නිලධාරීන් දිවයින පුරා පිහිටා ඇති සේවා ස්ථානවල සේවය කරනු ලබන බැවින්, ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට අදාළ සේවා ස්ථානවල, තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන්නන්ගේ ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කර බැලීමට, සංයුක්ත තැටි වශයෙන් සකසන ලද ඡන්දහිමි නාමලේඛන පිටපත්, මැතිවරණ මහ ලේකම් කාර්යාලයෙන් අදාළ සහනික කිරීමේ නිලධාරීන් වෙත ලබාදෙන ලදී. ඊට අමතරව මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙම තොරතුරු ලබා දීම සඳහාම ස්ථාපිත කර තිබූ විශේෂ දුරකථන මාර්ගවලින් ද, 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය මගින් ද අදාළ අයට ඡන්දහිමි නාමලේඛනයේ තම ලියාපදිංචි විස්තර ලබා ගැනීමට පහසුකම් සලසා තිබිණි.

5.2 තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීම 2019 සැප්තැම්බර් 18 දින ආරම්භ කොට 2019 සැප්තැම්බර් 27 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු ලබාගැනීමේ දී පැවැති ගැටලු, සහතික කිරීමේ දී සිදුවන ප්‍රමාදවීම් හා තැපැල් ප්‍රමාදය සලකා බලා තැපෑලෙන් ඡන්දයදීම සඳහා ලැබෙන ඉල්ලුම්පත් 2019 සැප්තැම්බර් 30 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා භාරගැනීමට තීරණය කරන ලද බව තේරීම්භාර නිලධාරීන් වෙත දන්වන ලදී. එසේ වුවද ඒ වන විට රට තුළ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හා ඒ පිළිබඳව වූ තේරීම්භාර නිලධාරීන්ගේ වාර්තා හා ඉල්ලීම් අනුව සහතික කිරීමේ නිලධාරීන් වෙත 2019.10.04 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ලැබී තිබූ සියලුම අයදුම්පත් භාර ගැනීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ද ලබා දීමට ක්‍රියා කරන ලදී. ඡන්ද විමසීම් රාජකාරී සඳහා යෙදවීමට අපේක්ෂිත සියලුම නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් හා අවස්ථාවක් ලබාදීමේ අරමුණෙන් තැපැල් ඡන්ද අයදුම් කිරීමේ දින වකවානු මෙලෙස සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව පැවතිණ.

තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීමේ දින දීර්ඝ කිරීම හේතුකොට ගෙන තැපැල් ඡන්ද ක්‍රියාවලියේ කාර්යයන් හා කර්තව්‍යයන් වඩාත් කාර්යක්ෂම කරනු පිණිස 2019.10.04 දින එක් එක් දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබෙන වෙනත් දිස්ත්‍රික්ක වෙත යැවිය යුතු අයදුම්පත්‍ර ද භාරගැනීමට ක්‍රියා කරන ලෙස හා එම ඉල්ලුම්පත්වලින් ආසන්නතම දිස්ත්‍රික්ක වෙත යැවිය යුතු ඒවා පසුදිනම පණිවුඩකරුවන් මගින් හුවමාරු කර ගැනීමට හා දුරබැහැර දිස්ත්‍රික්කවලට අදාළ අයදුම්පත්‍ර වෙන් වෙන්ව තෝරා ආවරණ ලිපියක් සහිතව 2019.10.05 දින නිලධරයකු භාරයේ මැතිවරණ මහලේකම් කාර්යාලයට ගෙන්වා ගෙන ඒවා එහිදී අදාළ දිස්ත්‍රික්ක අතර හුවමාරු කර ගැනීමේ වැඩපිළිවෙලක් ද සංවිධානය කරන ලදි.

5.3 තැපැල් ඡන්ද අයදුම්පත් පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීම

ලැබී ඇති සියලුම තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ තීරණය, ඉල්ලුම්කරුවන්ට පිටපතක් ද සහිතව ඔවුන්ගේ සහතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට විවිධ කරුණු හේතු විය හැකිය. තේරීම්භාර නිලධාරියා වෙත අයදුම්පත් නියමිත කාලය තුළ දී නොලැබීම, අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරුගේ විස්තර නිවැරදි ලෙස සඳහන් නොකිරීම හෝ අඩුපාඩු සහිතව සඳහන් කිරීම, සහතික කිරීමේ නිලධාරියා විසින් හෝ අයදුම්කරු විසින් හෝ අයදුම්පත අත්සන් නොකිරීම, ප්‍රමාද වී ලැබීම ආදී කරුණු තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට බලපාන ප්‍රධාන හේතු වේ. මෙම ඡන්ද විමසීමට අදාළව සියලු තේරීම්භාර නිලධාරීන් වෙත ලැබුණු අයදුම්පත් පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන 04 යටතේ දක්වා ඇත.

මේ අනුව තැපැල් ඡන්ද අයදුම්පත් 720,135 ප්‍රමාණයක් ලැබුණු අතර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 61,106 කි. ඒ අනුව පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව 659,029කි.

5.4 තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්

එක් එක් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර සහතික කිරීම සඳහා ඒ ඒ ආයතනවලින් සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීමට හා එලෙස පත්කරන ලද

නිලධාරීන් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය උපදෙස් මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබාදෙන ලදී. මේ අනුව එක් එක් ආයතනය වෙනුවෙන් පත්කරන ලද සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපැල් ඡන්ද අයදුම්පත් සහතික කිරීමට ක්‍රියා කරනු ලැබේ. පිළිගත් තැපැල් ඡන්ද හිමියන් සඳහා ඡන්ද පත්‍රිකාව ද ඇතුළත් සියලුම ලියකියවිලි යොමු කරනු ලබන්නේ ද එම සහතික කිරීමේ නිලධාරීන් වෙතය. සහතික කිරීමේ නිලධාරීන් ක්‍රියා කළ යුතු ආකාරය, ඔවුන්ගේ වගකීම හා අදාළ වෙනත් කරුණු පිළිබඳ උපදෙස් මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත හා ආයතන ප්‍රධානීන් මගින් සියලුම සහතික කිරීමේ නිලධාරීන්ට ලබාදීමට ක්‍රියා කරන ලදී. සහතික කිරීමේ නිලධාරීන්ගේ රාජකාරී පිළිබඳව ඔවුන් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ලිඛිත උපදෙස් එම නිලධාරීන් වෙත යැවීමටත්, ඊට අමතරව ඔවුන් කැඳවා උපදෙස් ලබාදීමේ පුහුණු සැසි පැවැත්වීමටත්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් කටයුතු කරන ලදී. මෙම දැනුම්වත් කිරීමේ උපදෙස් පන්ති අදාළ වන පරිදි සිංහල හා දෙමළ භාෂාවෙන් පැවැත්වීමට කටයුතු සලසන ලදී.

තැපැල් ඡන්ද දායකයින් විසින් ඡන්දය ප්‍රකාශ කිරීම නියමිත දිනයේ දී සිදු කරනු ලබන්නේ අදාළ සහතික කිරීමේ නිලධාරියා ඉදිරිපිට දී, එහෙත් රහස්‍යභාවය ආරක්ෂා වන පරිදිය. ඡන්ද දායකයා විසින් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසු ඡන්ද පත්‍රිකාව අඩංගු කවරය හා අදාළ ලියකියවිලි ඇතුළත් රක්ෂණ කවර තැපැල් කාර්යාලය වෙත භාරදීම හෝ අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත අතින් ගෙනගොස් භාරදීම සහතික කිරීමේ නිලධාරීන්ගේ වගකීමකි. ඡන්දය ප්‍රකාශ නොකරන ලද තැපැල් ඡන්ද දායකයින්ගේ තැපැල් ඡන්ද පත්‍රිකාව ද අඩංගු පැකැට්ටු ලබාදී ඇති උපදෙස් පරිදි අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ආරක්ෂිතව ආපසු යැවීම සහතික කිරීමේ නිලධාරීන් වෙත පැවරෙන තවත් විශේෂ රාජකාරියක් මෙන්ම වගකීමකි.

5.5 තැපැල් ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන 1981 තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ (ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම) නියෝග මාලාවේ 4 (1) නියෝගය අනුව තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව සකස් කිරීම සඳහා එක් එක් තැපැල් ඡන්ද හිමියන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු සහ එම අයගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, තනතුර හා රාජකාරී ලිපින අවශ්‍ය වේ. තැපැල් ඡන්ද අයදුම්පත්වල සඳහන් එම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර වලංගු ඡන්දහිමි නාමලේඛනය අනුසාරයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක අංශයේ මෘදුකාංගය භාවිත කර තැපැල් ඡන්ද හිමියන්ගේ නාමලේඛනය සකස් කරන ලදී. එම තැපැල් ඡන්ද නාමලේඛනය දෘඪ පිටපත් හා සංයුක්ත තැටි (CD) වශයෙන් සකස් කරන ලදී. තරග කරනු ලැබූ අපේක්ෂකයින් වෙත නිකුත් කරනු ලැබුවේ මෘදු පිටපත් (සංයුක්ත තැටි) පමණි.

5.6 තැපැල් ඡන්ද නිකුත් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ නියෝග මාලාවේ 10(1) නියෝගය අනුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල හා වෙනත් විශේෂයෙන් තෝරා ගන්නා ලද රාජ්‍ය ආයතන හා රජයේ පාසල්වල දී තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම කළ යුතුව තිබුණි. 2019.10.10 දින තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දැන්වීම නිකුත් කරන ලදී. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා තැපෑලට භාරදීම

2019.10.18 දින මධ්‍යස්ථාන 987කදී සිදු කරන ලදී. එලෙස තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සිදු කරන බව හා එක් එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථාන සඳහා පත් කළ හැකි නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳව තරග කරනු ලබන අපේක්ෂකයින් හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙත තේරීම්භාර නිලධාරීන් විසින් දැනුම් දී තිබිණි. තැපැල් ඡන්ද හිමියන් වෙත නිකුත් කිරීමට අවශ්‍ය වන ඡන්ද පත්‍රිකා ප්‍රමාණය කල්වේලා ඇතිව රජයේ මුද්‍රණාලයෙන් ලබාගෙන ආරක්ෂිත සේප්පුවක බහා පොලිස් ආරක්ෂාව යොදවනු ලැබේ. එලෙස ආරක්ෂිතව ගබඩා කර ඇති ඡන්ද පත්‍රිකා 2019.10.18 වන දින නිකුත් කිරීමට පෙර පරීක්ෂා කර බලා නිකුත් කිරීමේ ශාලාවලට අවශ්‍ය ප්‍රමාණය වෙන් කිරීමේ දී හා තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරන අවස්ථාවේ දී එම කටයුතු සිදු කරන පරිශ්‍ර වෙත ප්‍රමාණවත් පොලිස් ආරක්ෂාවක් ලබාගැනීමට තේරීම්භාර නිලධාරීන් විසින් කටයුතු කරන ලදී. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කර අදාළ පැකට්ටු තැපැල් දෙපාර්තමේන්තුවට භාරදීම දක්වා සියලු කටයුතු පොලිස් ආරක්ෂාව යටතේ සිදුවිය යුතු බවට මැතිවරණ කොමිෂන් සභාව විසින් තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් ලබාදී තිබුණි.

5.7 තැපැල් ඡන්ද සලකුණු කිරීම

මෑත කාලීනව පැවැත් වූ ඡන්ද විමසීම්වල දී මෙන්ම මෙම ඡන්ද විමසීමේ දී ද තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා වෙන් කරන ලද්දේ සීමිත දින ගණනක් පමණි. ඒ අනුව මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට ඒ ඒ ආයතන සඳහා වෙන් කරන ලද දිනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

ආයතන	තැපැල් ඡන්ද සලකුණු කිරීමට දෙන ලද දින
සියලුම රජයේ කාර්යාල, ත්‍රිවිධ හමුදා කඳවුරු, පාසල්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල	2019.10.31 හා 2019.11.01
දිස්ත්‍රික් ලේකම් කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ශ්‍රී ලංකා පොලිසිය හා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය	2019.11.04 හා 2019.11.05
ප්‍රභූ ආරක්ෂක කොට්ඨාසය	2019.11.04 හා 2019.11.05

ඉහත සඳහන් පරිදි නියමිතව තිබූ දිනවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ තැපැල් ඡන්ද හිමියන්ගේ රක්ෂණ කවර සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලයන්හි දී තැපැල් ඡන්ද සලකුණු කිරීම නිරීක්ෂණය සඳහා යොදවන ලද සහකාර තේරීම්භාර නිලධාරීන් මගින් හෝ එසේ නොවන අවස්ථාවන්හි දී සහතික කිරීමේ නිලධාරී විසින් අප්‍රමාදව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ගෙනවිත් භාරදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය. නියම කර තිබූ දිනයේ දී ස්වකීය තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ තැපැල් ඡන්ද හිමියන්ට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා 2019.11.07 දින දී ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී පහසුකම් සලසන ලදී. මෙම කාර්යය නිරීක්ෂණය කිරීම සඳහා ද නියෝජිතයින් නම් කරන ලෙස අපේක්ෂකයින් හා ඔවුන්ගේ නියෝජිතයින් වෙත දන්වා යවන ලදී. විශේෂ මාධ්‍ය නිවේදනයක් හා දැන්වීම් මගින් මේ පිළිබඳව අදාළ තැපැල් ඡන්ද හිමියන් දැනුම්වත් කිරීම සිදු කරන ලදී. එමෙන්ම තැපැල් ඡන්ද සලකුණු කරන දිනවල ඒ ඒ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාල වෙත ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දෙන ලෙස හා ඡන්ද විමසීම් නීති රීති නිසිපරිදි බලාත්මක කිරීම සිදු කරන ලෙස පොලිස්පතිවරයාට දැනුම්දෙන ලදී.

5.8 තැපැල් ඡන්ද නිරීක්ෂණ කටයුතු

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට

නියමිත දිනවල දී එම කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් තේරීම්භාර නිලධාරීන් මගින් පූර්වයෙන් ලබාදී ඇති උපදෙස් පරිදි සිදුවන බවට නිසැක වීම සඳහා සෑම සහතික කිරීමේ නිලධාරියකුගේ කාර්යාලයකටම සහකාර තේරීම්භාර නිලධාරීවරයකු හෝ පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරියකු යොදවන ලදී. තැපැල් ඡන්ද 30 කට අඩුවෙන් සලකුණු කිරීමට නියමිත කාර්යාල සඳහා ජංගම නිරීක්ෂකවරයකු ද ඊට වැඩි තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන කාර්යාල සඳහා ස්ථානගත නිරීක්ෂකයකු ද යෙදවීමට පියවර ගෙන තිබුණි. තැපැල් ඡන්ද 30 ට අඩු වුව ද හඳුනාගත් විශේෂ ස්ථානවල එනම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ/ ඩිපෝ, සිවිල් ආරක්ෂක කඳවුරු, අධිවේගී මාර්ග කාර්යාල, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන, පොලිස් ස්ථාන සඳහා ස්ථානගත නිරීක්ෂකයකු යොදවන ලදී. මෙම නිරීක්ෂණ කටයුතු සිදු කරන නිලධාරීන් විසින් තමාගේ නිරීක්ෂණයට ලක්වන එක් එක් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ මධ්‍යස්ථාන සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් ලබාදෙනු ලබන ජර්නලයේ අදාළ තොරතුරු සටහන් කළයුතු අතර නිරීක්ෂණ රාජකාරි අවසානයේ දී එය දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත භාර දෙන ලෙස ද උපදෙස් ලබා දුනි.

පූර්ව ඡන්ද විමසීම්වලදී මෙන් මෙවර ද තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ හා සලකුණු කිරීමේ ස්ථානවල දී එම කාර්යයන් නිරීක්ෂණය කිරීම සඳහා දේශීය නිරීක්ෂණ සංවිධාන වූ, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වන ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධස්ථානය (CMEV) යන නිරීක්ෂණ සංවිධානවලට එක් මධ්‍යස්ථානයකට එක් නිරීක්ෂණ සංවිධානයකින් එක් නිරීක්ෂකයකු පමණක් යෙදවීමට අවසර ලබාදෙන ලදී.

5.9 සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද හිමියන් 659,029ක් වෙනුවෙන් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරන ලදී. ඒවා සලකුණු කිරීම සඳහා අවස්ථා කිහිපයක් ලබාදී තිබුන ද යම් යම් හේතු මත ඉන් තැපැල් ඡන්ද හිමියන් 5,669 දෙනෙකු ස්වකීය තැපැල් ඡන්ද සලකුණු කිරීමට පැමිණ නොමැති බව අනාවරණය විය. එක් තැපැල් ඡන්දයක් සඳහා වැයවන කාලය, ශ්‍රමය හා වියදම සලකා බැලූ විට එකී ඉල්ලුම්කරුවන් තැපැල් ඡන්ද ප්‍රකාශ නොකිරීම මහජන මුදල් අපතේ යැවීමක් ලෙස සැලකිය හැකිය. එබැවින් මෙවැනි තත්ත්වයක් ඉදිරි ඡන්ද විමසීම්වල දී ඇතිවීම අවම කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුව ඇත. සලකුණු නොකරණ ලද තැපැල් ඡන්ද පිලිබඳ විස්තර සංඛ්‍යා සටහන් අංක 5 යටතේ දක්වා ඇත.

හයවන පරිච්ඡේදය

ප්‍රචාරණ කටයුතු හා මාධ්‍ය

6. ප්‍රචාරණ කටයුතු

ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 68 සිට 74 දක්වා වගන්ති වලින් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, පෙරහැරවල් පැවැත්වීම, ඡන්ද විමසීමට අදාළ ප්‍රචාරක පත්‍රිකා මුද්‍රණය හා බෙදා හැරීම, දැන්වීම් ප්‍රදර්ශනය හා ඡන්ද කාර්යාල පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ඡන්ද විමසීම් කාලය තුළ යම් යම් සීමා යටතේ කටයුතු කළ යුතු ආකාරය සහ ඡන්ද විමසීම් දින කටයුතු කළ යුතු ආකාරය ද දක්වා ඇත. ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ පසුව මැතිවරණ කොමිෂන් සභාව සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමග සාකච්ඡාවක් පවත්වා අදාළ අණපනත් ඇතුළු ඡන්ද විමසීම හා සම්බන්ධ අනෙකුත් ලිපි ලේඛන ඔවුන් වෙත ලබාදීම සිදු කෙරේ. තවද නාමයෝජනා භාර ගැනීමෙන් පසුව අපේක්ෂකයින්, පක්ෂ ලේකම්වරුන්, ඡන්ද නියෝජිතයින් මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවා සාකච්ඡාවක් කරනු ලැබීය. එහිදී අපේක්ෂකයින්ගේ බලයලත් නියෝජිතයින් හා ප්‍රාදේශිය නියෝජිතයින් අදාළ අණපනත් පිළිබඳව දැනුම්වත් වී සිටීම හා ඒ අනුව ක්‍රියා කළ යුතු බවට පැහැදිලිකර දීමට කටයුතු කරන ලදී.

6.1 නීති විරෝධී ප්‍රචාරණ කටයුතු පිළිබඳව ක්‍රියා කිරීම

කිසියම් පාර්ශවයක් විසින් නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සම්බන්ධ පැමිණිල්ලක් පොලිසිය වෙත යොමු කළහොත්, හෝ වෙනත් ආකාරයකින් වාර්තා වුවහොත් ඒ සම්බන්ධයෙන් සොයා බලා අප්‍රමාදව නිසි පියවර ගැනීම පොලිස් දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂා කෙරේ. දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා අපේක්ෂකයින් මෙන්ම නීතිය බලාත්මක කිරීමේ කාර්යයන්හි නිරත නිලධාරීන් ද ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් පනවා ඇති නීති හා කොන්දේසි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ගැටලු පැනනගින බව මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා ඇත. ප්‍රයෝගිකව පැනනගින එම ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ප්‍රචාරණ කටයුතු සඳහා විකල්ප ක්‍රමවේද භාවිත කිරීමට යොමුවීම සාමාන්‍ය තත්වයක් බවට පත්ව ඇත. නීතියෙන් ප්‍රතිපාදන සලසා නොමැති විකල්ප ප්‍රචාරණ කටයුතු හේතුවෙන් ඡන්ද විමසීම් කාලය තුළ නීති උල්ලංඝනය පිළිබඳව වැඩි වශයෙන් වාර්තා විය. පොදු මහජනතාව ගැවසෙන ස්ථානවල කටවුට් බැනර් ප්‍රදර්ශනය තහනම් වුවද, එම නීති රීති නොසලකා හැර කටයුතු කළ අවස්ථා මෙම ඡන්ද විමසීමේ දී ද වාර්තා විය. එනමුත් පෙර ඡන්ද විමසීම් සමග සසඳා බැලීමේ දී නීතිවිරෝධී ප්‍රචාරණ කටයුතුවල සැලකිය යුතු අඩුවක් දක්නට ලැබීම සතුටුදායක තත්ත්වයකි.

ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ කාර්යය භාරව කටයුතු කරන පොලිසියට එදිනෙදා සාමාන්‍ය රාජකාරිවලට අමතරව මාස දෙකක් පමණ වන ඡන්ද විමසීම් කාල පරිච්ඡේදය තුළ මහජන නියෝජිතයින්ට සහ අපේක්ෂකයින්ට ආරක්ෂාව සැලසීම, රැස්වීම් පැවැත්වෙන ස්ථානවල ආරක්ෂාව සැලසීම වැනි රාජකාරි ද ආරක්ෂක කටයුතු හා බැඳි රාජකාරි ද ඉටු කළයුතු බැවින්, ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කරමින් ප්‍රචාරණ කටයුතු කරන අවස්ථාවල ඒ සඳහා ප්‍රමුඛත්වයක් දී කටයුතු කිරීමේ දී යම් යම් අපහසුතා ඇති වන බව ද මෙහිදී නිරීක්ෂණය විය.

මැතිවරණ කොමිෂන් සභාව විසින් පක්ෂ ලේකම්වරුන් හා පක්ෂ නියෝජිතයින් සමග

පවත්වන සාකච්ඡාවල දී පොදු එකඟතාවට පැමිණ, මැතිවරණ ප්‍රචාරක කටයුතු හා සම්බන්ධ සමඟර සීමා ලිඛිල් කර ප්‍රචාරණ කටයුතු සඳහා අවස්ථාව සලසා දී තිබුණ ද ඒ පිළිබඳව තැකීමක් නොකර සුපුරුදු පරිදිම නීතියට පටහැනිව කටයුතු කිරීමට සමඟර පක්ෂවල අනුගාමිකයන් පෙළඹී සිටීම ගැටලු සහගතය. නීති විරෝධී ප්‍රචාරණ ක්‍රියාකාරකම් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි. තමන්ගේ හෝ අන් අයගේ සහයෝගයෙන් අධික ලෙස මුදල් වැයකළ හැකි අපේක්ෂකයින් තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා විශාල ලෙස වියදම් දරමින් මහා පරිමාණයෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම නිසා සෙසු අපේක්ෂකයින්ට අසාධාරණයක් ද සිදුවන බව නිරීක්ෂණ සංවිධාන ඇතුළු පොදු මහජනතාව විසින් පෙන්වා දී ඇත. ඊට අමතරව ප්‍රචාරණ කටයුතු සඳහා පොලිතින් හා ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය වැඩි වශයෙන් යොදාගෙන කරනු ලබන ප්‍රචාරණ කටයුතු හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑමද සුළුපටු නොවේ. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන එවැනි කටයුතු පාලනය සඳහා යම් පියවර ගැනීම කඩිනමින් කළ යුතුව ඇත.

6.2 ප්‍රචාරක රැලි සඳහා ස්ථාන වෙන්කර දීම

ප්‍රචාරක රැස්වීම් පැවැත්වීමට ස්ථාන වෙන්කර ගැනීමේ දී ද අපේක්ෂකයින් හා දේශපාලන පක්ෂවල සංවිධායකයින් ද තමන්ට අසාධාරණකම්වලට මුහුණදීමට සිදුවන බවට පැමිණිලි කරන ලද අවස්ථා විශාල වශයෙන් වාර්තා විය. මෙම තත්ත්වය නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා යහපත් ප්‍රවණතාවයක් නොවේ. පාලන බලය සහිත දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් අනෙකුත් අපේක්ෂකයින්ගේ ප්‍රචාරක කටයුතුවලට අගතිගාමී ලෙස බලපෑම් කරමින්, රැස්වීම් පවත්වන සියලු පොදු ස්ථාන තමන් වෙනුවෙන් වෙන්කර තැබීම පුරුද්දක් ලෙස කරනු ලබයි. මේ නිසා සියලුම අපේක්ෂකයින්ට සමාන ප්‍රචාරණ අවස්ථා අහිමිවීමක් සිදු වේ. එහෙයින් ඡන්ද විමසීම් ප්‍රචාරක රැළි පැවැත්වීම සඳහා ස්ථාන වෙන් කිරීමේ දී සියලුම අපේක්ෂකයින්ට සමාන අවස්ථා ලබා දිය යුතු බවට අදාළ ස්ථාන පාලනාධිකාරීන් වෙත තරයේ දැනුම්දීමට කටයුතු කරන ලදි.

අපේක්ෂකයින්ට ප්‍රචාරක රැළි පැවැත්වීම සඳහා ශාලා පහසුකම් හා ක්‍රීඩා භූමි වෙන්කර දීම් වලදී ඒ සඳහා පළාත් පාලන ආයතන, අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ප්‍රධානීන් හා අනෙකුත් නිලධාරීන් සියලුම අපේක්ෂකයින්ට සාධාරණව එම ස්ථාන වෙන් කිරීම සිදු කරන්නේ දැයි සොයා බලා කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදු විය. ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් මතු වූ ගැටලු විසඳීමේදී දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ගෙන්, අපේක්ෂකයින්ගෙන්, ඡන්ද නියෝජිතයින්ගෙන් හා නිත්‍ය නියෝජිතයින්ගෙන් සහ ඊට සම්බන්ධ වූ නිලධාරීන්ගෙන් ලද සහාය එම ගැටලු විසඳා ගැනීමට බෙහෙවින් උපකාරී විය.

6.3 විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා මාධ්‍ය උපමාන

ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක දී ඡන්ද විමසීමට අදාළ තොරතුරු මහජනතාව වෙත සංනිවේදනය කිරීම බොහෝ විට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදුවේ. තරග කරනු ලබන දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් හා ස්වාධීන අපේක්ෂකයින් විසින් ස්වකීය ජයග්‍රහණයෙන් පසුව රටේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් හා ව්‍යාපෘති පිළිබඳව වන තම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම ද මාධ්‍ය ඔස්සේ සිදු වේ. එම තොරතුරු වාර්තාකරණය මෙන්ම අපෙක්ෂකයින්ගේ ප්‍රචාරක කටයුතුවලදී ද සමබරව සහ මධ්‍යස්ථව කටයුතු කිරීම ජනමාධ්‍ය තුළින් අපේක්ෂා කෙරේ. පක්ෂග්‍රාහීව හෝ පුද්ගලබද්ධව ක්‍රියා කිරීම මගින් අනෙකුත් පාර්ශ්වයන්ට බලවත් අසාධාරණයක් සිදුවේ. රාජ්‍ය මාධ්‍ය මෙන්ම පෞද්ගලික මාධ්‍ය ද ඡන්ද විමසීමට අදාළ පුවත් වාර්තාකරණයේ දී මධ්‍යස්ථව ක්‍රියා කිරීම නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. ඡන්ද විමසීමේ දී කිසිදු අපේක්ෂකයෙකු

ප්‍රවර්ධනයට හේතු වන පරිදි හෝ අගතියට පත්වන පරිදි හෝ අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් හෙවත් සනාථ කළ නොහැකි ප්‍රවෘත්ති පළ කිරීමෙන් වැළකී සිටීමට මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් බැඳී සිටි. සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් භාවිත කරනු ලබන සංඛ්‍යාත මහ ජනතාව සතු දේපළකි. එම සංඛ්‍යාත නැතහොත් තරංගමලා මහජනතාව සතු දේපළකි. එනම් එම සංඛ්‍යාත භාවිත කරනු ලබන ආයතන විසින් ඒවායේ තාවකාලික හිමිකාරිත්වයක් පමණක් දරනු ලැබේ. මෙලෙස තාවකාලිකව පවරනු ලබන මහජන දේපළ අවභාවිත වීම වැලැක්වීමට සුදුසු නියාමන ක්‍රමවේද හඳුන්වාදීමේ කටයුතු කරන ලෙස එම සංඛ්‍යාත පිළිබඳව වගකීම දරන ආයතන ප්‍රධානීන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(5)(අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන් සාකච්ඡාවකට කැඳවා ඔවුන්ගේ ද එකඟතාවෙන් සහ මානව හිමිකම් කොමිෂන් සභාව සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව ඡන්ද විමසීම් කාලසීමාවක දී අදාළ ආයතන විසින් පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන සකස් කොට අංක 2141/87 හා 2019.09.21 දින අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එය **ඇමුණුම 11** වශයෙන් දක්වා ඇත. මෙම උපමාන පෞද්ගලික හිමිකාරිත්වය දරන විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යවලට ද අදාළ වේ. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 83 වන වගන්තිය අනුව අසත්‍ය නැතහොත් සනාථ කළ නොහැකි ප්‍රවෘත්ති හෝ තොරතුරු පළ කිරීමෙන් වැළකී සිටීමට පුවත්පත් කතෘවරු බැඳී සිටී. එම වරද කළහොත් වන දණ්ඩනය ද පනතේම නියම කර තිබේ. එබැවින් මෙම පනතේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කොට ක්‍රියා කරන ලෙස සියලුම මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන් ද දැනුම්වත් කරන ලදී. ඉන් පසුව ද වරින් වර මතු වූ ගැටලු සඳහා ද විසඳුම් ලබා දීමේ අරමුණින් යුතුව උක්ත ගැසට් පත්‍රයට කරනු ලැබූ සංශෝධන ඇතුළත් කොට නැවත අංක 2146/39 හා 2019.10.27 දින හා අංක 2148/21 හා 2019.11.05 දිනැති සංශෝධිත අති විශේෂ ගැසට් පත්‍ර ද නිකුත් කරන ලදී. එම ගැසට් පත්‍ර **ඇමුණුම 12 හා 13** වශයෙන් දක්වා ඇත.

ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ඉහතින් දක්වන ලද මාධ්‍ය උපමාන නිකුත් කිරීමට අමතරව රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා අවස්ථාවෝචිතව ප්‍රවෘත්ති කර්තෘ සහ සංස්කාරකවරුන් ද අවස්ථා 9 ක දී මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවා සාකච්ඡා කර නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පවත්වා ගැනීම සඳහා මාධ්‍ය වගකීම හා භාවිතය පිළිබඳව උපදෙස් ලබා දෙන ලදී. එසේම විද්‍යුත් මාධ්‍ය මගින් ඡන්ද විමසීම් නීති හා මාධ්‍ය උපමාන උල්ලංඝනය කිරීම පිළිබඳව නිරන්තරයෙන් ලැබුණු පැමිණිලිවල අන්තර්ගත කරුණු විමර්ශනය කොට සියලුම මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට කැඳවා එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වාර දෙකක් පවත්වා මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් පැවති එම අයහපත් තත්ත්වය අවම කර ගැනීම සඳහා පූර්වෝපායන් යොදවන ලදී. මේ සාකච්ඡා තුළින් මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලැබුයේ ඒ වන විට ගැසට් පත්‍ර මගින් නිවේදනය කර ඇති මාධ්‍ය උපමාන උල්ලංඝණය නොවන ආකාරයේ ස්වයංවාරණයක් මාධ්‍ය ආයතන විසින්ම ඇති කර ගැනීම සඳහා යොමු කිරීමේ වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීමට සුදුසු පසුබිමක් නිර්මාණය කර ගැනීමය. එයට අමතරව මාධ්‍ය උපමාන උල්ලංඝණය වීම පිළිබඳව ලැබී තිබූ පැමිණිලි පිළිබඳව ද ඔවුන් සමග සාකච්ඡා කොට

තත්ත්වය යහපත් ආකාරයකින් පවත්වා ගැනීමට අවශ්‍ය පරිසරය සකස් කරන ලදී.

6.4 මාධ්‍ය වගකීම හා මාධ්‍ය නියාමනය

ජන්ද විමසීමක දී මාධ්‍ය මගින් කරන බලපෑම සුළු පටු නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මාධ්‍ය උපමාන උල්ලංඝනය කළහොත් මැතිවරණ කොමිෂන් සභාවට ක්‍රියාත්මකවී දඬුවම් පැනවිය හැකි වනුයේ රාජ්‍ය මාධ්‍ය ආයතන වෙත පමණකි. විද්‍යුත් මාධ්‍ය මගින් මාධ්‍ය උපමාන උල්ලංඝනය කිරීමේ දී රාජ්‍ය මාධ්‍ය ද පෞද්ගලික මාධ්‍ය ද යන්න වැදගත් නොවන්නේ ගුවන් විදුලි හා විද්‍යුත් තරංග ජනතාව සතු දේපළක් වන බැවිනි. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පනවා ඇති එම නීතිය සියලුම මාධ්‍ය සඳහා ද අදාළ විය යුතු බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වේ. මාධ්‍ය උපමාන උල්ලංඝනයවීමක් සිදුවන බවට නිරීක්ෂණය වන පළමු අවස්ථාවේදීම මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ මාධ්‍ය වෙත එසේ කිරීමෙන් වළකින ලෙස හා මාධ්‍ය උපමානවලට අනුගතව ක්‍රියා කරන ලෙස දැනුම් දීම් සිදු කෙරේ. මැතිවරණ කොමිෂන් සභාව අදහස් කරන පරිදි මාධ්‍ය උපමානවලට අනුගතව කටයුතු නොකරන අවස්ථාවල දී එය රාජ්‍ය මාධ්‍ය හෝ පෞද්ගලික මාධ්‍ය වුව ද ජන්ද විමසීම අවසන්වන තෙක් ජන්ද විමසීමට අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණය, දේශපාලනික ස්වරූපයේ ප්‍රවෘත්ති, වැඩසටහන් හා සංවාද පැවැත්වීම අත්හිටුවීමට කටයුතු කරන බවට දැනුම් දීම සිදු කිරීම ද ඒ සඳහා ද යහපත් ප්‍රතිචාර නොදක්වා තවදුරටත් මාධ්‍ය උපමාන උල්ලංඝනය වන අයුරින් කටයුතු කරන්නේ නම්, ජන්ද විමසීම අවසන් වන තෙක් පෙර සඳහන් මාධ්‍ය කටයුතු අත්හිටුවීමට අවශ්‍ය බලතල සහිතව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිසි බලධරයෙක් පත් කිරීමට හැකිවන ලෙස හෝ නීති සම්පාදනය කිරීම කළ යුතුව ඇත. එසේ නොවන්නේ නම් මාධ්‍ය භාවිතය මගින් අගතියට පත්වන අපේක්ෂකයින් වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට කළ හැකි මැදිහත් වීම ඉතා අවම මට්ටමක පවතින අතර එය නිදහස් හා සාධාරණ ජන්ද විමසීම් ක්‍රියාවලියට බාධාවක් වේ.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයින්, මැතිවරණ කොමසාරිස් ජනරාල් හා සෙසු නිලධාරීන් විසින් මාධ්‍ය ආයතන වෙතින් ලද ඇරයුම් මත සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වී ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ජන්ද විමසීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය උපමාන හා ඒ අනුව ජනමාධ්‍ය ආයතන ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳවත්, මාධ්‍ය උපමාන නිකුත් කිරීමෙන් අපේක්ෂා කරනු ලබන නිදහස් හා සාධාරණ ජන්ද විමසීමක් පවත්වාගෙන යෑම සඳහා මාධ්‍ය භාවිතය කෙසේ විය යුතු ද යන්න පිළිබඳවත්, සහ ජන්ද විමසීම් හා සබැඳි ව්‍යවස්ථාපිත කරුණු හා නීති රීති පිළිබඳවත් ද මහජනතාව දැනුම්වත් කරන ලදී. එසේම මැතිවරණ ප්‍රචාරක කටයුතු තහනම් වූ නිහඬ කාල සීමාවේ දී බොහෝ මාධ්‍ය වෙතින් ලද ඇරයුම් මත දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක්ම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් හා නිලධාරීන් සහභාගී වූහ. තවද සමාජ මාධ්‍ය ජාල මගින් ද පවත්වන ලද සම්මුඛ සාකච්ඡා රාශියකට ද සභාපතිවරයා සහභාගී වී ජන්ද විමසීම හා සබැඳි කරුණු ඉදිරිපත් කරන ලද අතර එම සියලුම වැඩසටහන් මැතිවරණ කොමිෂන් සභාවේ නිල මුහුණු පොතේ පළ කරන ලදී.

6.5 මාධ්‍ය දැන්වීම් හා නිවේදන

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ජන්ද විමසීමට අදාළ ව්‍යවස්ථාපිත හා අත්‍යවශ්‍යයෙන්ම දැනුම්වත් කළ යුතු කරුණු පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම පිණිස භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ දැන්වීම් 15 ක් ලංකාදීප, දිනමිණ, තිනකරන්, ඩේලි

නිවුස්, දිවයින, ද අයිලන්ඩ්, වීරකේසරී, ඩේලි මිරර් හා උදයන් පුවත්පත්වල පළ කරන ලදී. එම දැන්වීම් පළ කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් රු.3,642,083.25 ක වියදමක් දරා ඇත.

තවද ඉහතින් දක්වා ඇති පුවත්පත් දැන්වීම්වලට අමතරව ඡන්ද විමසීමට අදාළ තොරතුරු අළලා මාධ්‍ය නිවේදන 90 ක් ද නිකුත් කර ඇත. මෙම මාධ්‍ය නිවේදන ද භාෂාත්‍රයෙන්ම නිකුත් කරනු ලැබූ අතර සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත යොමු කරන ලදී. එම අයාතනවලට අයත් මාධ්‍ය මගින් නිවේදනයේ සඳහන් කරුණු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමට කටයුතු සම්පාදනය කර තිබුණි. එසේම ඉහත සඳහන් පරිදි පුවත්පත්වල පළ කරන ලද දැන්වීම් සහ මාධ්‍ය නිවේදන මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.elections.gov.lk) ද පළ කරන ලදී.

6.6 අපේක්ෂක ප්‍රචාරණය සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි පහසුකම් ලබාදීම

1988 අංක 16 දරණ (සංශෝධිත) පනතින් සංශෝධිත 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 117 වැනි වගන්තිය අනුව තරග කරනු ලබන අපේක්ෂකයින්ට කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව ගුවන් ප්‍රචාර පහසුකම් සලසා දිය යුතුය. එම පහසුකම් ලබා ගැනීම සඳහා නාමයෝජනා කිරීමේ දිනයේ සිට සතියක් ඇතුළත ඒ සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුව ඇත. සෑම අපේක්ෂකයෙකුටම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව එම ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා නියමිත අවසන් දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයේ සිට ඡන්ද විමසීම ආරම්භ කිරීමට පැය හැත්තෑ දෙකකට කලින් අවසන් වන කාලය ඇතුළත ගුවන් විකාශන පහසුකම් ප්‍රයෝජනයට ගැනීමට නියමිත පරිදි ඉල්ලීම් කරන ලද අපේක්ෂකයින්ට හිමිකම් ලබා දී ඇත.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 117 වැනි වගන්තිය යටතේ, මෙම ජනාධිපතිවරණය සඳහා තරග කිරීමට ඉදිරිපත් වූ පිළිගත් දේශපාලන පක්ෂ අපේක්ෂකයින් දහඅට (18)ක් වෙනත් දේශපාලන පක්ෂ අපේක්ෂකයින් දෙක(2)ක් හා අනෙකුත් අපේක්ෂකයින් පහළොව (15) කට, දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා ගුවන් විදුලි විකාශන පහසුකම්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් විකාශන අවස්ථා ලබා ගැනීමට අවකාශ සලසන ලදී. මෙම එක් විකාශන අවස්ථාවක කාලය විනාඩි 15 කට නොඅඩු සහ උපරිම විනාඩි 30 කට නොවැඩි එමෙන්ම අවස්ථා 3 කට නොවැඩි හෝ එය උපරිම විනාඩි 90 කට නොවැඩි කාලයකට සීමා වේ.

මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා තරග කරනු ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පෙර පවතී ඡන්ද විමසීම්වලට වඩා අධික වීම හේතුකොට ගෙන පනතේ අදාළ වගන්තිවල දැක්වෙන විධිවිධාන අනුව මෙම ගුවන් කාල වෙන් කිරීම සඳහා කුසපත් ඇදීම සිදු විය. ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සම්පාදනය කර දෙන ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රධානීන් කරන ලද ඉල්ලීම අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019.10.10 දින ප.ව 2.30 ට මැතිවරණ මහලේකම් කාර්යාලයට අපේක්ෂකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ද කැඳවා කුසපත් ඇදීමෙන් විකාශන කාල වෙන් කර දීමට කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට කොමිෂන් සභාවේ නිලධාරීන්ට අමතරව ශ්‍රී ලංකා

රූපවාහිනී සංස්ථාවේ හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිලධාරීන් ද සහභාගී විය.

ඒ අනුව අපේක්ෂකයින් 35දෙනා සඳහා වෙන් කරන ලද සම්පූර්ණ ගුවන් විකාශන කාලය විනාඩි 3,150කි. එම කාලය තුළ සියලුම අපේක්ෂකයින් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 210කි. මෙම විකාශන වැඩසටහන් පටිගත කිරීම් සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මැදිරි භාවිත කිරීමට අවස්ථාව ලබාදුන් අතර සමහර අපේක්ෂකයින් විවිධ හේතු සාධක ඉදිරිපත් කරමින් ස්වකීය දේශපාලන කතා ඇතුළත් වැඩ සටහන් බාහිර ආයතනවලින් පටිගත කර විකාශය කිරීම සඳහා රූපවාහිනී සංස්ථාවට හා ගුවන් විදුලි සංස්ථාවට භාරදෙන ලද අවස්ථා නිරීක්ෂණය විය. එලෙස බාහිරව පටිගත කරන ලද වැඩසටහන් රූපවාහිනියේ විකාශය කිරීමේදී යම් යම් තාක්ෂණික දුර්වලතාවලට මුහුණපෑමට සිදුවන බවට රූපවාහිනී සංස්ථාව කරන ලබන දැනුම්දීම අනුව වැඩසටහන්වල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමේ විශේෂිත අවශ්‍යතාව අනුව බාහිර පටිගත කිරීම් සඳහා Beta Cam Casstees හෝ XD Cam Disk ආකෘතිය භාවිත කළයුතු බවට සියලුම අපේක්ෂකයින් වෙත ලිඛිතව මෙන්ම වාචිකව ද උපදෙස් දෙන ලදී.

අපේක්ෂකයින් සඳහා ලබා දෙන ලද මෙම ගුවන් විකාශන කාල පහසුකම් යටතේ කථා පැවැත්වීමේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතියක් දේශපාලන පක්ෂවල නායකයන් හා අපේක්ෂක නියෝජිතයින් සමග ද සාකච්ඡා කොට මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත ද තරග කරනු ලබන සියලුම අපේක්ෂකයින් වෙත ද ලිඛිතව දැනුම් දෙන ලදී. මෙම ආචාර ධර්ම පද්ධතියට කිසිදු අපේක්ෂකයකුට වෙනත් අපේක්ෂකයකු වෙනුවෙන් කථා කිරීම, අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්තිවලට අදාළ කරුණු හැර ප්‍රකෝපකාරී, ද්වේශ සහගත, වෛරී ප්‍රකාශ හෝ වෙනත් යම් පාර්ශවයක් ප්‍රවර්ධනයට හෝ අගතියට හෝ පත්වන ආකාරයට ද කථා පැවැත්වීම නොකළ යුතු බවට වූ කොන්දේසි ඇතුළත් කරන ලදී. මෙම උපදෙස් හා කොන්දේසි 2019.10.10 දින පැවති ගුවන් විකාශන කාල වෙන් කිරීමේ අවස්ථාවේදී ද පැමිණ සිටි නියෝජිතයින් ඉදිරියේ දී පැහැදිලිව කියවා තේරුම්කර දීමට ද කටයුතු කරන ලදී. එහිදී එක් එක් අපේක්ෂකයා වෙත ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් ලබාදෙන ලද ගුවන් කාල වෙන් කිරීම පිළිබඳව තොරතුරු **ඇමුණුම 15** හි දැක්වේ. තවද එකී අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් වෙන් කර දෙන ලද ගුවන් කාල වෙන් කිරීම පිළිබඳ තොරතුරු **ඇමුණුම 16** වශයෙන් යා කොට ඇත.

6.7 ඡන්ද භිමියන් වෙත ගාස්තුවකින් තොරව තැපෑලෙන් සංදේශයක් යැවීමට අපේක්ෂකයින්ට ලබාදෙන පහසුකම

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 114 වන වගන්තියට අනුව නාමයෝජනා භාරගැනීමේ දින සිට ඡන්ද විමසීම් දිනට දින 10කට පෙර දක්වා වූ කාලය තුළ, ඡන්ද විමසීමට අදාළ වූ සංදේශයක් තැපැල් ගාස්තුවකින් තොරව ඡන්දදායකයා වෙත යැවීමට අපේක්ෂකයින්ට හිමිකම ඇත.

මේ අනුව අදාළ සංදේශය යැවීමේදි තැපෑලට භාරදීම කෙසේ විය යුතු ද යන්න හා සංදේශයේ ස්වරූපයට අදාළ කොන්දේසි තීරණය කිරීම තැපැල්පතිවරයා විසින් කළයුතු වේ. මේ සම්බන්ධයෙන් අපේක්ෂකයින් දැනුවත් කරමින් තැපැල්පතිවරයා විසින් 2019.10.02 වන දින අපේක්ෂකයින් වෙත යවන ලද ලිපියට අනුව සංදේශය බර ග්‍රෑම් 30 හෝ ඊට අඩුවිය යුතු බවත්,

මිලි මීටර 300 X 100 දිග, පළලින් යුක්ත විය යුතු බවටත් දන්වා ඇත. තවද අදාළ සංදේශ ඒ ඒ දිස්ත්‍රික්කවලදී භාරදිය යුතු තැපැල් කාර්යාල පිළිබඳව තොරතුරු ද එම ලිපියේ සඳහන් කර තිබිණි. ඡන්ද විමසීම් දිනට, දින දහයකට පෙර මෙම සංදේශ තැපැල් කාර්යාල වෙත ලබාදිය යුතු අතර, ඉන් පසුව භාර දෙනු ලබන එවැනි සංදේශ පිළිනොගත යුතුය. ඡන්ද විමසීම් දිනට දින පහකට පෙරාතුව වූ කාලය තුළ මෙම සංදේශ ඡන්ද හිමියන් වෙත ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලෙන් සංදේශ යැවීමට ලබාදී තිබූ පහසුකම් අවභාවිත කිරීමට උත්සාහ දරන ලද අවස්ථා වාර්තා වූ අතර මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ක්‍රියා කර එම කටයුතු වැළැක්වීම සඳහා තැපැල්පතිවරයා විසින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලදී.

6.8 නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73 වන වගන්තිය යටතේ අපේක්ෂකයින්ගේ ප්‍රවර්ධන කටයුතු සඳහා නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා විධිවිධාන සලසා ඇත. මේ යටතේ මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග 4ක් හඳුන්වා දී ඇති අතර එවැනි කාර්යාල පිහිටුවීමට බලය ඇති අය, කාර්යාල පවත්වා ගෙන යා හැකි කාලය, කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය, පිහිටුවිය හැකි කාර්යාල සංඛ්‍යාව ආදී නිර්ණායක නියම කර ඇත. එක් එක් අපේක්ෂකයකු වෙනුවෙන් මෙම ඡන්ද විමසීමේ කාලය තුළ පවත්වා ගෙන යා හැකි නිවේදිත කාර්යාල පිළිබඳ විස්තරය පහත සටහනෙහි දක්වා ඇත.

නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීමට අදාළ උපදෙස් හා ඉල්ලුම්පත්‍ර සියලුම ජනාධිපතිධුර අපේක්ෂකයින්ගේ ඡන්ද නියෝජිතයින් හා බලයලත් නියෝජිතයින් වෙත ලබා දී කාර්යාල පිහිටුවීමට අදාළ උපදෙස් හා කොන්දේසි දැක්වෙන අංක PRE/2019/12 හා 2019.09.29 දිනැති ලිපිය මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී.

නිවේදිත කාර්යාල පිහිටුවීම පිළිබඳව නිකුත් කරන ලද එම ලිපියේ කරුණු පැහැදිලි කිරීම යටතේ මැතිවරණ කොට්ඨාස, ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස යන බලප්‍රදේශ ද ඡන්ද නියෝජිත, බලයලත් නියෝජිත හා ප්‍රාදේශීය නියෝජිත යන යෙදුම් පිළිබඳ පැහැදිලි විස්තර කිරීමක් ද සිදු කරන ලදී. එමගින් නිවේදිත කාර්යාල පිහිටුවීම පිළිබඳව ඉල්ලුම් කිරීමේදී සිදුවන දෝෂ සහ අනවබෝධයෙන් කටයුතු කිරීමෙන් සිදුවන ගැටලු අවම කර ගැනීමට හැකිවිය.

පිහිටුවිය හැකි කාර්යාල වර්ගය	කාර්යාල පිහිටුවීමට බලය ඇති අය	කාර්යාල පවත්වාගෙන යාහැකි කාලය	කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය	පිහිටුවිය හැකි කාර්යාල ගණන
නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාල	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත	2019.10.07 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය	එක් කාර්යාලයක් පමණි
නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (i)	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත	2019.10.07 දින සිට 2019.11.14 දින මධ්‍යම රාත්‍රිය දක්වා	එක් එක් ඡන්ද කොට්ඨාසය	ඡන්ද කොට්ඨාසයට එකක් බැගින්
නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (ii)	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත	2019.11.15 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	එක් එක් ඡන්ද ප්‍රදේශය	ඡන්ද ප්‍රදේශයකට එකක් බැගින්
සාමාන්‍ය පදිංචි නිවස කාර්යාලය ලෙස	අපේක්ෂක/ බලයලත් නියෝජිත	2019.10.07 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය	එක් කාර්යාලයක් පමණි

තවද මෙම උපදෙස් ලිපිය මගින් නිවේදිත කාර්යාලවල ප්‍රචාරක පුවරු, ධජ, අපේක්ෂකයාගේ ඡායාරූපය වැනි දෑ ප්‍රදර්ශනය කිරීමේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැනුම් දෙනු ලැබිණි. මෙමඟින් ඡන්ද විමසීම් කාලය තුළ සිදුවන නීති විරෝධී ප්‍රචාරක කටයුතු පිළිබඳ පැමිණිලි අවම කර ගැනීමට බලාපොරොත්තු විය. රජයට අයත් භූමි, රාජ්‍ය ආයතන පිහිටි පරිශ්‍ර හා වෙනත් පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට අයුතු ලෙස යොදා ගැනීම වැළැක්වීම සඳහා රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පෙර කී කිසිදු කාර්යාලයක් ස්ථාපිත කළ නොහැකි බවට කොන්දේසි පනවන ලදී. රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට එම නිවස ප්‍රචාරක කාර්යාලයක් ලෙස භාවිත කිරීමේ හැකියාව පිළිබඳව ද, නිවේදිත කාර්යාලයකට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදිය ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීමෙන් වැළකිය යුතු බවට ද කොන්දේසි ඇතුළත්ව ඇත. යම්කිසි අපේක්ෂකයකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියට පත්වන අයුරින් ප්‍රචාරක කටයුතු කිරීම නීති විරෝධී ක්‍රියාවක් වන බව ද එමෙන්ම නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට ද අදාළ පාර්ශව වෙත ඉහත ලිපියෙන් දැනුම් දෙන ලදී.

සේවා ලබාගැනීම සඳහා නිරන්තරයෙන් මහජනතාව පැමිණෙන ඍජුවම ඡන්ද විමසීම් කටයුතු හා සම්බන්ධ රාජ්‍ය ආයතනයන් වන පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, තැපැල් කාර්යාල සහ අධිකරණ සංකීර්ණ ආසන්නයේ මෙන්ම දරුවන් අධ්‍යාපනය ලබන රජයේ පාසැල් ආසන්නයේ නිවේදිත කාර්යාල පිහිටුවීමෙන් මහජනතාවට සහ දරුවන්ට සිදුවිය හැකි දුෂ්කරතා අවම කිරීම පිණිස එවැනි ස්ථානවල කාර්යාල පිහිටුවීමෙන් වළකින ලෙස තම ප්‍රාදේශීය ක්‍රියාකාරීන් දැනුම්වත් කරන ලෙස අපේක්ෂකයින්, ඔවුන්ගේ ඡන්ද නියෝජිතයින් හා බලයලත් නියෝජිතයින් වෙත උපදෙස් දෙන ලදී.

ඍජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනයක් ආසන්නයේ නිවේදිත ඡන්ද කාර්යාලයක් පිහිටුවීමේ දී ඡන්ද කාර්යාලය හා අදාළ ආයතනය අතර තිබිය යුතු දුර ප්‍රමාණයන් නියම කිරීම මගින් මහජනතාවට සිදුවන හිරිහැර අවම කිරීමට හැකිවිය. නිවේදිත කාර්යාල පිහිටුවීමේදී මෙම නීති හා කොන්දේසි අනුව කටයුතු කිරීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඉමහත් පිටිවහලක් ලැබිණි.

හත්වන පරිච්ඡේදය

ඡන්ද විමසීම් පනතේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම

7. ඡන්ද විමසීම් පනතේ දැක්වෙන විධිවිධාන

ඡන්ද විමසීමක දී අදාළ කරගත යුතු නීතිමය විධිවිධාන රාශියකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කර ඇති නීතිමය විධිවිධාන හා ඒ ඒ ඡන්ද විමසීමට අදාළ පනත්වල ඇතුළත් විධිවිධාන මේ අතර වැදගත් වේ. ඒ අනුව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ මෙම ඡන්ද විමසීමට අදාළව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු පෙර දක්වන ලද නෛතික ප්‍රතිපාදන මෙන්ම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ දැක්වෙන විධිවිධාන සියල්ල අදාළ කරගත යුතු වේ. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ දැක්වෙන ප්‍රධාන විධාන මෙන්ම ඡන්ද විමසීම් ක්‍රියාවලියට ඇතුළත් සාමාන්‍ය කරුණු කෙරෙහි ද මේ අනුව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එසේ කිරීමේදී වැදගත්වන කරුණු කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදයෙහි විස්තර දක්වා ඇත. එමෙන්ම මෙම පනතට පරිබාහිර වූ වෙනත් පනත් මගින් ද ඡන්ද විමසීමකට අදාළ කරගත යුතු නීති ඇතුළත් කර ඇති බැවින් ඒ සියල්ල කෙරෙහි ද අවධානය යොමු කිරීම කළ යුතු වේ.

7.1 නිල ඡන්ද දැන්වීම්පත්

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 24 වන වගන්තිය අනුව ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම්ලත් සියලුම ඡන්ද හිමියන් වෙත මැතිවරණ කොට්ඨාසයේ නම හා අංකය, ඡන්දහිමි නාමලේඛනයේ දැක්වෙන පරිදි ඡන්ද හිමියාගේ නම, ලිපිනය හා අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය හා ඡන්ද කොට්ඨාසය, ඡන්ද හිමියාට වෙන්කරන ලද ඡන්ද පොළ සහ ඡන්ද විමසීම පවත්වන දිනය හා වේලාවන් පිළිබඳ විස්තර ඇතුළත් නිල ඡන්ද දැන්වීම්පතක් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති ගෘහයේ ලිපිනයට තැපෑලෙන් යවනු ලැබේ. තවද තැපෑලෙන් ඡන්දය දීමට හෝ වෙනත් ඡන්ද පොළක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාගෙන ඇති ඡන්ද හිමියන්ට යවනු ලබන නිල ඡන්ද දැන්වීම් පතෙහි ඒ බව සඳහන් කර යැවීමට තේරීම්භාර නිලධාරීන් විසින් කටයුතු කරන ලදී. මෙම නිල ඡන්ද දැන්වීම්පත් යටත් පිරිසෙයින් ඡන්ද විමසීම් දිනයට දින හතකටවත් පෙර ඡන්ද හිමියන් වෙත ලැබෙන පරිදි තැපෑලෙන් යවන ලදී. තැපැල් මඟින් යවනු ලබන මෙම නිල ඡන්ද දැන්වීම් පත් නියමිත කාලය තුළ නොලැබුණ හොත් ලියාපදිංචි ස්ථානයට සේවා සපයන තැපැල් කාර්යාලය වෙත ගොස් අනන්‍යතාව තහවුරු කිරීමෙන් පසුව ඡන්ද හිමියාට තම නිල ඡන්ද දැන්වීම් පත ලබා ගත හැකි බව නිවේදනය කරන ලදී. 2019 ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් ඡන්ද හිමියන් වෙත බෙදා හැරීම සඳහා 2019.10.23 වන දින දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් අදාළ තැපැල් කාර්යාල වෙත භාරදෙන ලදී.

මුල් අවධියේ දී නිල ඡන්ද දැන්වීම් පත් රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරවා ගෙන අදාළ විස්තර ලියා නිල ඡන්ද දැන්වීම්පත් සකස් කරන ලදී. එහෙත් මේ වනවිට ඡන්දහිමි නාමලේඛනයේ සියලු දත්ත පරිගණක ගතකර ඇති බැවින්, එම දත්ත මුද්‍රණය (Data Printing) කිරීම මගින් නිල ඡන්ද දන්වීම්පත් පහසුවෙන් හා කඩිනමින් මුද්‍රණය කරවා ගැනීමට හැකියාව ඇති විය. එහෙත් පරිගණක දත්ත මුද්‍රණය කිරීමේ පහසුකම් රජයේ මුද්‍රණාලයට නොතිබූ බැවින් එකී පහසුකම් තිබූ හා මෙයට පෙර මෙම කාර්ය සිදුකළ පළපුරුදු පෞද්ගලික ආයතන මගින් මුද්‍රණය කරවන ලදී. මෙම නිල ඡන්ද දැන්වීම් පත් අදාළවන

පරිදි සිංහල හෝ දෙමළ භාෂාවෙන් සකස් කොට ඡන්ද හිමියන් වෙත යවනු ලැබේ. මුද්‍රණය කරවන ලද නිල ඡන්ද දැන්වීම්පත් තේරීම්භාර නිලධාරීන් වෙත ලබා දී ඡන්ද හිමියන් වෙත තැපෑලෙන් බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. නියමිත කාලය තුළ බෙදාදීමට නොහැකි වූ නිල ඡන්ද දැන්වීම් පත් තැපැල් කාර්යාලයට පැමිණ භාරගැනීමට හෝ විශේෂ බෙදාහැරීම් දිනයක දී බෙදාහැරීමට අවශ්‍ය පහසුකම් තේරීම්භාර නිලධාරීන් විසින් සංවිධානය කරන ලදී.

7.2 ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම

ඡන්ද විමසීමක දී කිසියම් ඡන්ද දායකයකු හට ඡන්ද පත්‍රිකාවක් ලබා දීමට පෙර ඔහුගේ අනන්‍යතාව ඡායාරූපයක් සහිත හැඳුනුම්පතක් මඟින් තහවුරු කර ගත යුතු වේ. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව ජාතික හැඳුනුම්පත මේ සඳහා උපයෝගී කර ගත යුතු ප්‍රධානතම හඳුනා ගැනීමේ පත්‍රය වේ. එහෙත් කිසිදු බාධාවකින් තොරව ජාතික හැඳුනුම්පත මහජනතාවට ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසන තෙක් හා සියලුම ඡන්ද හිමියන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කර අවසන් වන තෙක් වෙනත් පිළිගත හැකි අනන්‍යතා ලේඛන ද ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ඡන්ද දායකයන්ගේ අනන්‍යතාව සහතික කර ගැනීම සඳහා පිළිගැනීමට පූර්වගාමී මැතිවරණ කොමසාරිස්වරු විසින් ගන්නා ලද තීරණ මැතිවරණ කොමිෂන් සභාව ද අනුගමනය කරන ලදී. ඒ අනුව ඡන්ද දායකයින් විසින් සිය ඡන්ද ප්‍රකාශ කිරීමේ දී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතට අතිරේක වශයෙන් පහත සඳහන් හැඳුනුම්පත් වලංගු ඒවා බවට පිළිගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට විශේෂයෙන් උපදෙස් දෙන ලදී.

- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය
- රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
- වැඩිහිටි හැඳුනුම්පත
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පූජ්‍ය/ පූජක හැඳුනුම්පත
- හැඳුනුම්පත් ලබා ගැනීමට අයදුම්කර ඇති තැනැත්තන් වෙනුවෙන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "ජාතික හැඳුනුම්පතේ තොරතුරු තහවුරු කිරීමේ ලිපිය".

ඉහත සඳහන් කවර හෝ වලංගු හැඳුනුම්පතක් හෝ ලේඛනයක් නොමැති ඡන්ද හිමියන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පතක් ලබා ගත හැකි බවත් ඒවා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වලංගු වන බවත් 2019.10.14 වන දින අංක 34 දරන මාධ්‍ය නිවේදනය මඟින් දැනුම් දෙන ලදී. ඒ අනුව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම වෙනුවෙන් තාවකාලික හැඳුනුම්පත් 196,698ක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. මෙම තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් සිදු කරන ලදී. ඒ පිළිබඳ විස්තර ඇමුණුම අංක 17හි දක්වා ඇත.

7.3 මැකිය නොහැකි තීන්ත මඟින් ඡන්ද දායකයා සලකුණු කිරීම නැතහොත් උචිත ලකුණින් සලකුණු කිරීම

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 36 (3) වන වගන්තියට අනුව ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින හෝ එම අරමුණ ඇතිව පැමිණ සිටින කිසියම් ඡන්ද දායකයකු වේ නම් ඔහු උචිත ලකුණින් සලකුණු කිරීම කළ යුතු බව සඳහන් වේ. එක් ඡන්ද දායකයකු එක් වරකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය ප්‍රකාශ කිරීම වැළැක්වීම පිණිස ගනු ලබන

පියවරක් සේ මෙම සලකුණු කිරීම සැලකේ. 1965 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ දී උචිත ලකුණින් සලකුණු කිරීම සඳහා මැකිය නොහැකි තීන්තෙන් ඡන්ද දායකයා සලකුණු කිරීම ආරම්භ කරන ලදී. මෙහිදී ඡන්ද දායකයාගේ වම් සුළඟිල්ලේ ඉහළ කොටස නොමැකෙන තීන්ත ආලේප කිරීම මගින් සළකුණු කිරීම සිදු කරන ලදී.

මෙම සලකුණු කිරීම හඳුන්වා දෙන ලද අවස්ථාව වන විට ඡන්ද දායකයාට ඡන්දය ප්‍රකාශ කිරීමේ දී තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ඡායාරූපයක් සහිත හඳුනා ගැනීමේ පත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්යය අවශ්‍යතාවක් නොවිය. වර්තමානයේ දී යම් ඡන්ද දායකයෙකුට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ජාතික හැඳුනුම්පත මගින් හෝ මැතිවරණ කොමිෂන් සභාව පිළිගන්නා වෙනත් අනන්‍යතා ලේඛනයක් මගින් තම අනන්‍යතාව සහතික කිරීම අනිවාර්ය කරුණක් වන බැවින් තවදුරටත් විශාල මුදලක් වියදම් කරමින් හා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යොදවා නොමැකෙන තීන්ත මඟින් ඡන්ද දායකයා සළකුණු කිරීමේ අවශ්‍යතාව නැවත සමාලෝචනයට ලක්කළ යුතු බවට විවිධ පාර්ශ්ව විසින් අදහස් පළ වී ඇත. ඡන්ද දායකයා සලකුණු කිරීම සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය අඩංගු තීන්ත තම සිරුරේ අලේප කිරීම පිළිබඳව ඡන්ද දායකයන් විසින් විරුද්ධත්වයක් ප්‍රකාශ කරන අවස්ථා මෑත කාලීනව වාර්තා වේ. එම තීන්ත නිසි පරිදි ක්‍රියානොකරන අවස්ථාවල දී ඡන්ද දායකයන් මෙන්ම දේශපාලන ක්‍රියාකාරීන් විසින් ද ප්‍රශ්න කරන ලද අවස්ථා ද තිබේ. ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හැඳුනුම්පතක් මගින් අනන්‍යතාව සහතික කිරීම අනිවාර්ය කිරීම මගින් නියමිත පුද්ගලයා හැර වෙනත් අයෙකු විසින් වංචනිකව ඡන්ද ප්‍රකාශ කිරීමට ඇති අවස්ථා වැළැක්වීමට හැකි වී තිබේ. එනම් හොර ඡන්ද ප්‍රකාශ කිරීම අවම කිරීමට හැඳුනුම්පත ඉදිරිපත් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව බෙහෙවින් ඉවහල් වී ඇත.

ඉහතින් දක්වන ලද කරුණු පනතේ 36 වන වගන්තිය ප්‍රකාරව උචිත ලකුණින් ඡන්ද දායකයා සලකුණු කිරීම සමාලෝචනය කිරීම පිණිස නීති සංශෝධන ගෙන ඒමට හෝ සලකුණු කිරීම සඳහා නොමැකෙන තීන්ත ආලේප කිරීම වෙනුවට විකල්ප ක්‍රියා මාර්ගවලට යොමුවීම සඳහා කාලය එළඹ තිබේ.

7.4 මියගිය හෝ විදේශ ගත ඡන්ද හිමියන් පිළිබඳව ක්‍රියා කිරීම

මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වල දී සිදු කරන ලද ආකාරයෙන්ම මෙම ඡන්ද විමසීමේ දී ද ඡන්ද පොළ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත සපයන නාමලේඛන පිටපත්වල මියගිය බවට වාර්තා වූ ඡන්ද හිමියන්ගේ නම් “D” අක්ෂරයෙන් සහ විදේශ ගතව සිටින ඡන්ද හිමියන්ගේ නම් “A” අක්ෂරයෙන් සලකුණු කරන ලදී. 2018 ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචි එහෙත් 2019.10.15 දින දක්වා වන කාලය තුළ මියගොස් ඇති බවට වාර්තා වූ ඡන්ද හිමියන් ගේ විස්තර හා 2019.10.15 දින වන විට විදේශ ගතව සිටින බවට වාර්තා වූ ඡන්ද හිමියන්ගේ විස්තර ද ග්‍රාම නිලධාරීන් මඟින් ලබාගෙන ඡන්ද හිමියා වෙත යවනු ලබන නිල ඡන්ද දැන්වීම් පතෙහි ඒ බව සටහන් කර යැවීමට කටයුතු කරන ලදී. මියගිය හෝ විදේශ ගතව සිටින තැනැත්තකුගේ ඡන්දය ව්‍යාජ ලෙස වෙනත් තැනැත්තෙකු විසින් ප්‍රකාශ කිරීමට ඇති අවස්ථාව වැළැක්වීම සඳහා මෙලෙස ක්‍රියා කරන ලදී. ඡන්ද පොළේ භාවිත කිරීමට ලබා දී ඇති ඡන්ද හිමි නාමලේඛනයේ නමට ඉදිරියෙන් මෙවැනි යම් සටහනක් යොදා ඇති තැනැත්තෙකු යම් හෙයකින් ඡන්ද පොළ වෙත පැමිණිය හොත් එබඳු අය ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකාවක් ලබා දීමට ක්‍රියා කරන්නේ නම් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම සඳහා වූ පනතේ 41 සහ 43 වගන්තිවල ඇතුළත් ප්‍රකාශ සුදුසු පරිදි අත්සන් කර ගැනීමෙන් පසුව පමණක් එබඳු අයට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ යුතු බවට

ඡන්ද පොළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ග්‍රාම නිලධාරීන් විසින් සපයන ලද තොරතුරු අනුව මියගිය බවට සහ විදේශගත සිටින බවට වාර්තා වූ ඡන්ද හිමියන් පිළිබඳ විස්තර **ඇමුණුම 17** හි දක්වා ඇත.

7.5 නිල සලකුණ - 35 වන වගන්තිය

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 35 වන වගන්තිය මඟින් ඡන්ද දායකයින් වෙත ඡන්ද පත්‍රිකා නිකුත් කළ යුතු ආකාරය දක්වා ඇත. එම වගන්තියේ 35 (ඇ) උපවගන්තිය අනුව ඡන්ද දායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර එය නිල ලකුණෙන් සලකුණු කළ යුතුය. නිල සලකුණින් මුද්‍රා තැබීමෙන්, නිල සලකුණ ඡන්ද පත්‍රිකාවෙහි තෙරපීම මගින් එබ්බවීම (Embossed) හෝ සිදුරු කිරීම මගින් වුව ද සලකුණු කිරීම කළ හැකිය. සාමාන්‍යයෙන් ඡන්ද විමසීමක දී ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා භාවිත කරන මෙම නිල සලකුණු ඡන්ද විමසීමේ දිනට ආසන්න දිනක දී මැතිවරණ කොමිෂන් සභාව විසින් තේරීම්භාර නිලධාරීන් වෙත ආරක්ෂිතව යැවීමට කටයුතු කරන ලදී. ඒ ඒ ඡන්ද පොළේ භාවිත කිරීමට නියමිත නිල සලකුණු පිළිබඳ තොරතුරු ඡන්ද පොළ කාර්ය මණ්ඩලයට පවා ඡන්ද විමසීම ආරම්භ කරන තෙක් දැන ගැනීමට නොහැකි වන සේ ඒවායේ රහස්‍යභාවය රැකෙන පරිදි කවරයක බහා මුද්‍රා තබා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාරදෙනු ලැබේ. ඡන්ද විමසීම් දින ඡන්ද විමසීම ආරම්භ කිරීමට ස්වල්ප වෙලාවකට පෙර ඡන්ද පොළ නියෝජිතයින්, නිරීක්ෂකයින් හා කාර්ය මණ්ඩලය ඉදිරියේ ඒ වනවිට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා භාරයේ තිබෙන මුද්‍රා තබන ලද නිල සලකුණු අඩංගු කවරයෙන් එක් එක් පෝලිම සඳහා අහඹු ලෙස තෝරාගනු ලබන නිල සලකුණ බැගින් ලබා දෙනු ඇත. නිල සලකුණු ඡන්ද මධ්‍යස්ථානයේ දී ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමට යොදා ගත් ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසුව සුරක්ෂිතව ආපසු භාරදිය යුතු අනෙකුත් බඩු බාහිරාදිය සමඟ භාර ගැනීමේ මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතුය. එමන්ම ඡන්ද මධ්‍යස්ථානයේ භාවිත කරන ලද නිල සලකුණුවල ආදර්ශයන් ඒ සඳහා සපයා ඇති කවරයේ බහා ඡන්ද මධ්‍යස්ථානයට අදාළ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියා වෙත භාර ගැනීමේ මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරී මගින් ලබාදිය යුතුය. ඡන්ද විමසීම අවසන් වූ පසු මෙම නිල සලකුණු වහාම ආපසු මැතිවරණ කොමිෂන් සභාවට භාරදීමට තේරීම්භාර නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතුය. පනතේ සඳහන් මෙම ක්‍රියාමාර්ගවල අභිප්‍රාය වනුයේ ඡන්ද විමසීමේ දී එහි විශ්වාසනීයත්වය හා රහස්‍යභාවය ආරක්ෂා කර තහවුරු කිරීමයි.

7.6 ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන ඡන්ද හිමියන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සැලසීම

සාමාන්‍ය තත්ත්වය යටතේ ඡන්ද මධ්‍යස්ථානයකට ඡන්ද දායකයා පැමිණිය යුත්තේ පා ගමනින් වේ. එසේ වුවද ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන ඡන්ද දායකයන්ට ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 82(4) (ඇ) වගන්තියට අනුව නියමිත ඡන්ද පොළ වෙත වාහනයකින් යාම සඳහා විධිවිධාන සලසා ඇත. මෙම පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු ආකාරය පුවත්පත් දැන්වීම් හා මාධ්‍ය නිවේදන මඟින් ජනතාව දැනුම්වත් කිරීමට කොමිෂන් සභාව මඟින් පියවර ගන්නා ලදී. පනතේ විධිවිධාන අනුව ඡන්ද විමසීමේ දිනට, දින 7කට පෙර වෛද්‍ය නිර්දේශයක් සහිතව තේරීම්භාර නිලධාරී වෙත ලැබෙන සේ වාහන පහසුකම් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. තේරීම්භාර නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගන්නා ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන තැනැත්තන්ට වාහනයෙන් ඡන්ද මධ්‍යස්ථාන වෙත යාමට අවසර ලැබේ. මෙම පහසුකම ලබාදීමේ ක්‍රමවේදය වඩා පුළුල් හා සරල විය යුතු බව ද නිරීක්ෂණය වී ඇත.

7.7 සේවා නියුක්තිකයින්ට ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබාදීම - 110 වන වගන්තිය

ඡන්ද විමසීම් අවස්ථාවක දී තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හිමිකම් ඇති පිරිස සීමිතය. ආරක්ෂාව හා සම්බන්ධ කටයුතුවල යෙදී සිටින ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළුව ඡන්ද විමසීම් කාර්යය හා සබැඳි අත්‍යාවශ්‍ය සේවා සපයන තැපැල්, විදුලි, ජල පහසුකම් සැපයීමේ ආයතනවල සේවයේ නියුතු අයට එම සේවාවන් අඩාල නොවී පවත්වාගෙන යාම සඳහා යොදවා ගැනීමේ අවශ්‍යතාව මත තැපැල් ඡන්ද පහසුකම් සලසනු ලැබේ. රටේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු කෙරෙන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් පවත්වාගෙන යනු ලබන විවිධ ව්‍යාපාරික ආයතනවල සේවයේ නියුක්ත කර ඇති ශ්‍රමිකයන්ගේ සේවාව අඛණ්ඩව ලබාගැනීමේ අවශ්‍යතාව හේතු කොට ගෙන එම ආයතන හිමිකරුවන් හා සේවයේ නියුක්තිකයන් විසින් එකී ශ්‍රමිකයන්ට ඡන්ද විමසීම් දිනට පෙර තම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලසාදීම හෝ තැපැල් ඡන්ද පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතී. මේ පිළිබඳව කරුණු සලකා බැලීමේ දී එවැනි සේවා නියුක්තිකයන් සැලකිය යුතු පිරිසක් සිටින නමුත් එම ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීමට ක්‍රමවේදයක් මෙතෙක් සකස් වී නොමැත. ඡන්ද විමසීම් නීතිරීතිවල අවශ්‍ය සංශෝධන, තැපැල් ඡන්ද සඳහා දැරිය යුතු වියදම හා එම කටයුතු සංවිධානය කිරීමේ දී උද්ගතවිය හැකි බවට සැලකෙන ගැටලු එවැනි ක්‍රමවේදයක් සැකසීම ප්‍රමාදවීමට බොහෝ සේ බලපා ඇත. මැතිවරණ කොමිෂන් සභාව අවශ්‍ය නීති සංශෝධනය පිණිස යෝජනා ඉදිරිපත් කර ඇතත්, එහි ඉදිරි කටයුතු නොවැළැක්විය හැකි හේතු මත ප්‍රමාද වෙමින් පවතී. තවද, තැපැල් ඡන්ද පහසුකම ලබාදීම වෙනුවට ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේ ම විකල්ප ඡන්ද මධ්‍යස්ථානවල දී හෝ පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් යටතේ අත්‍යාවශ්‍ය සේවා නියුක්තිකයන් පිරිසකට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීමට අවධානය යොමු වුවත් එයද මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 110 වගන්තිය අනුව සේවා නියුක්තිකයන්ට පෞද්ගලිකව තමාට වෙන්කර ඇති ඡන්ද මධ්‍යස්ථානයේ දී සිය ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවනු පිණිස ඒ තැනැත්තාට ප්‍රමාණවත් නිවාඩු කාලයක් වැටුප් අහිමි වීමකින් තොරව සේවායෝජකයා විසින් ලබාදිය යුතුය. මේ සඳහා වන අවම කාලය පැය 4කි. එසේම මැතිවරණ කොමිෂන් සභාව, කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව සහ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සේවායෝජකයින් සමඟ සාකච්ඡා කර ඡන්දය ප්‍රකාශ කිරීමට යායුතු දුර ප්‍රමාණය අනුව නිවාඩු ලබා දීම සඳහා ක්‍රියා කර ඇත. මෙම විධිවිධාන කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින තැනැත්තෙකුට නඩු පැවරීමකින් පසුව වරදකරුවකු වුවහොත් අදාළ නීති අනුව දඩුවම් කිරීමට යටත් වේ. මේ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් පළ කරන ලද සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම පිළිබඳ දැන්වීම (මාධ්‍ය නිවේදන අංක 51) **ඇමුණුම 18** වශයෙන් අමුනුම්ගතව ඇත.

අටවන පරිච්ඡේදය

ඡන්ද විමසීම පැවැත්වීම

8. ඡන්ද විමසීමේ දිනට පෙර දින ඉටු කළයුතු කටයුතු

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවන (2) වගන්තිය යටතේ ඡන්ද විමසීම් ප්‍රකාශය නිකුත් කළ පසුව එළඹෙන ඡන්ද විමසීම් දිනය හා ඡන්ද ගණන් කොට ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය ඡන්ද විමසීමක උච්චතම අවස්ථාව ලෙස සැලකේ. ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් අත්‍යවශ්‍යයෙන්ම ඉටු කළ යුතුව තිබූ සියලුම සංවිධාන කටයුතු 2019.11.15 වන දින උදෑසන වන විට නිසි පරිදි අවසන් කර තිබුණි. ඡන්ද විමසීමට පෙර දිනයේ දී ඡන්ද මධ්‍යස්ථාන වෙත නිලධාරීන් හා ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි ඇතුළු ව්‍යවස්ථාපිත ලේඛන හා බඩුබාහිරාදිය යැවීම සඳහා කටයුතු සම්පාදනය කර තිබීම ඒ ඒ තේරීම්භාර නිලධාරීන්ගේ මුලික වගකීමක් වේ. ඒ අනුව ඡන්ද විමසීමට සතියකට පමණ පෙර එක් එක් ඡන්ද පොළ සඳහා අනුයුක්ත කිරීමට තෝරා ගත්තා ලද කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු, ඡන්ද පොළ ලිපිකරුවන් වෙත ඡන්ද පොළ කාර්යභාරය පිළිබඳව ලිඛිත උපදෙස් හා ඡන්ද මධ්‍යස්ථානයට ගමන් කිරීමේ ගමන් මාර්ග විස්තරය ද සමග පත්වීම් ලිපි යවා තිබූ අතර, ඡන්ද විමසීමට පෙර දින පස්වරු 2.00 ට නියමිත ඡන්ද පොළ වෙත වාර්තා කොට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පවත්වනු ලබන පෙරහුරුව සඳහා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බවත්, පසුදින රාජකාරී සඳහා වාර්තා කිරීමට සූදානම් විය යුතු බවත් එමගින් දන්වා තිබුණි. මෙම නිලධාරීන් ඡන්ද පොළ වෙත රාජකාරී සඳහා වාර්තා කිරීමට පොද්ගලික හෝ පොදු ප්‍රවාහන සේවා භාවිත කළ යුතුව තිබුණි. විශේෂයෙන් යාපනය අර්ධද්වීපයේ දූපත්වල පිහිටි ඡන්ද මධ්‍යස්ථාන සඳහා යාමට ඒමට නාවික හමුදාවේ සහාය ලබාදීමට පියවර ගන්නා ලදී. කාන්තා නිලධාරිනියන් හැකි සෑම විටම පදිංචි ප්‍රදේශයේ තමා ඡන්ද භිමියකු ලෙස ලියාපදිංචි ඡන්ද මධ්‍යස්ථානය හැර වෙනත් ආසන්න ඡන්ද මධ්‍යස්ථානයකට රාජකාරි සඳහා පත්කර තිබූ අතර, පිරිමි නිලධාරීන් අවශ්‍යතාව අනුව දිස්ත්‍රික්කය ඇතුළත හෝ රාජකාරී කරන දිස්ත්‍රික්කයෙන් පිටත වෙනත් දිස්ත්‍රික්කවල රාජකාරී සඳහා ද අනුයුක්ත කොට තිබුණි.

එක් එක් මැතිවරණ කොට්ඨාසවල ඡන්ද මධ්‍යස්ථානය සඳහා ඡන්ද පෙට්ටි ඇතුළු බඩුබාහිරාදිය නිකුත් කිරීමේ හා භාර ගැනීමේ මධ්‍යස්ථාන එක් පරිශ්‍රයක හෝ අවශ්‍යතාව අනුව පරිශ්‍ර කිහිපයක පිහිටුවා තිබුණි. මෙම නිකුත් කිරීමේ හා භාර ගැනීමේ මධ්‍යස්ථානයක් සඳහා කාර්යභාර සහකාර තේරීම්භාර නිලධාරියකු ඇතුළු අවම වශයෙන් සහකාර තේරීම්භාර නිලධාරීවරුන් දෙදෙනෙකු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් දෙදෙනකු කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ලිපිකරුවන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයන් දෙදෙනෙකු අනුයුක්ත කරන ලදී. නිකුත් කිරීම් හා භාර ගැනීම් මධ්‍යස්ථාන සඳහා පත්කිරීමට නියමිත සහකාර තේරීම්භාර නිලධාරීවරුන්ට ද නියමිත රාජකාරී සහ දිස්ත්‍රික්කයේ සංවිධාන වැඩපිළිවෙල පිළිබඳව දැනුවත් කිරීමේ උපදෙස් පත්ති පවත්වා තිබුණි. ඡන්ද මධ්‍යස්ථාන භාරව කටයුතු කරන සියලුම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු ද ඡන්ද පොළ කිහිපයක් එනම් කලාපයක් අධීක්ෂණය කිරීම සඳහා පත් කිරීමට නියමිත කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් ද ඡන්ද විමසීමට පෙර දින සේවයට වාර්තා කළ යුතු ස්ථාන කවරේ ද යන්න පූර්වයෙන් දැනුම් දී තිබුණි. මෙම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු හා කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ඡන්ද විමසීම් කාර්ය

පටිපාටිය, මැතිවරණ නීති, ඡන්ද පොළ පරිපාලනය, මැතිවරණ නීති බලාත්මක කිරීම මෙන්ම දිස්ත්‍රික්කයේ මැතිවරණ සංවිධාන වැඩපිළිවෙල පිළිබඳව ද උපදෙස් සැපි පවත්වා විධිමත් පරිදි දැනුම්වත් කර තිබුණි. එසේම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු හා කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීවරු බහුතරයක් ඔවුන් පදිංචි හෝ රාජකාරී කරනු ලබන දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කිරීමට පියවර ගෙන තිබුණු අතර, සෙසු පිරිස රාජකාරි කරන කාර්යාලය පිහිටි ප්‍රදේශයන් හි පදිංචි ප්‍රදේශයෙන් පිටත ඡන්ද බල ප්‍රදේශ වෙත අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබුණි.

8.1 ඡන්ද මධ්‍යස්ථාන වෙත රැගෙන යායුතු ද්‍රව්‍ය නිකුත් කිරීම

මෙම කාර්‍යය පිළිබඳ සංවිධාන වැඩපිළිවෙල අනුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු හා කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරිවරුන්ට තමන් අනුයුක්ත ඡන්ද මධ්‍යස්ථානය හෝ කලාපය සඳහන් විධිමත් පත්වීම් ලිපිය භාර දෙනු ලැබුයේ ඡන්ද විමසීම් දිනට පෙර දිනයේ දී ය. අපේක්ෂකයින් හෝ ප්‍රදේශයේ දේශපාලනඥයන් විසින් මැතිවරණ රාජකාරීවල නිරත කරවනු ලබන නිලධාරීන්ට බලපෑම් කර ඔවුන්ට වාසි සහගත අයුරින් කටයුතු කිරීමට පොළඹවා ගනු ලබන බවට වූ දුර්මතය හේතුවෙන් සාමාන්‍යයෙන් සෑම ඡන්ද විමසීමකදීම මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව නිලධාරීන් හෝ වෙනත් පාර්ශ්ව මැතිවරණ නිලධාරීන්ගේ රාජකාරී ස්ථාන පිළිබඳව පූර්වයෙන් දැනුවත්වීමක් සිදු නොවන බැවින් බලපෑම් සිදුවන බවට වන දුර්මතය බොහෝ දුරට වෙනස් වී ඇත. පූර්වයෙන් දන්වා යවා තිබූ පරිදි ඡන්ද විමසීමට පෙර දිනයේ දී තේරීම්භාර නිලධාරී කාර්යාල හෝ වෙනත් පරිශ්‍රයක් වෙත ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු වාර්තා කළ පසුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු විසින් ද විශේෂ සාකච්ඡා සැසියක් පවත්වන ලදී. පූර්ව උපදෙස් සැසිවල දී පැහැදිලි කළ කරුණු නැවත සිහිපත් කිරීමත් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ අවශ්‍යතාවත්, එහි දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පවරන රාජකාරිමය වගකීමත් පිළිබඳව නැවත නැවතත් අවධාරණය කෙරිණි. එසේම මැතිවරණ කොමිෂන් සභාවෙන් ලද විශේෂ උපදෙස් ද ඔවුන් වෙත පැහැදිලි කරදෙන ලදී. අනතුරුව ඔවුන්ගේ අනන්‍යතාව හා සේවය කරන ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හැඳින්වීමේ පත්‍රය ද පරීක්ෂා කර බලා නිලධාරියා නිවැරදිව හඳුනාගෙන විධිමත් පත්වීම් ලිපිය නිකුත් කරන ලදී. එම පත්වීම ලබාගැනීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තමාට නියමිත ඡන්ද පොළට අදාළ ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි ඇතුළු බඩුබාහිරාදිය නිකුත් කරනු ලබන ස්ථානයට වාර්තා කළ පසු එම නිකුත් කිරීමේ මධ්‍යස්ථානය භාරව සිටින සහකාර තේරීම්භාර නිලධාරිවරයා ද නැවත පත්වීම් ලිපිය හා අනන්‍යතාව පරීක්ෂා කොට බලා තොරතුරු තහවුරු කොට ගෙන ඡන්ද පොළට අදාළ ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි හා ව්‍යවස්ථාපිත ලේඛන ඇතුළු අනෙකුත් බඩුබාහිරාදිය ද නිකුත් කරනු ලැබේ.

සමහර දිස්ත්‍රික්කවල ඡන්ද පොළට අනුයුක්ත කිරීමට නියමිත එක් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකුට ද නිකුත් කිරීම් මධ්‍යස්ථානයට පැමිණෙන ලෙස දන්වා යවා තිබූ අතර, ඡන්ද පොළට අදාළ බඩුබාහිරාදිය භාරගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට සහාය වී ජ්‍යෙෂ්ඨ ඡන්ද, ස්ථානාධිපතිවරයා සමඟම ඡන්ද මධ්‍යස්ථානය වෙත යාමටත් උපදෙස් දී තිබිණි.

ඡන්ද පොළ වෙත යාමට අවශ්‍ය ප්‍රවාහන වැඩපිළිවෙල යටතේ තමාගේ පෞද්ගලික රථය හෝ ඉල්ලාගත් රථයක් භාවිත කරන්නේ නම් හා ඒ සඳහා පූර්වයෙන් අවසර ලබාගෙන තිබිණි නම්, එම රථයේ තොරතුරු ප්‍රවාහන ඒකකයේ ලියාපදිංචි

කොට අදාළ මාර්ග විස්තරයට අනුව කෙළින්ම ඡන්ද පොළ කරා යාමට හැකියාව තිබුණු අතර, එවැනි ප්‍රවාහන පහසුකමක් නොමැති ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට තේරීම්භාර නිලධාරීන්ගේ ප්‍රවාහන වැඩපිළිවෙල අනුව ඡන්ද පොළ දක්වා ප්‍රවාහන පහසුකම් ලබාදෙන ලදී.

8.2 ඡන්ද පොළ සහායකයින් හා ආරක්ෂක නිලධාරීන් යෙදවීම

ඡන්ද පොළ රාජකාරී සඳහා තමා කැටුව යාම පිණිස සහායකයකු රැගෙන එන ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු වෙත දන්වා යවා තිබූ අතර, එසේ රැගෙන ආ සහායකයාට ද නිකුත් කිරීම් භාර ගැනීම් මධ්‍යස්ථානයේ දී පත්වීම් ලිපියක් නිකුත් කරන ලදී. සහායකයකු රැගෙන ඒමට නොහැකි වූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට කාර්යාල කාර්ය සහායක නිලධාරීන්ගේ සංචිතයෙන් සහායකයකු අනුයුක්ත කරන ලදී. එසේම ඡන්ද මධ්‍යස්ථානයේ ආරක්ෂාවට පත්කරනු ලබන අවි සහිත පොලිස් නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයකු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සමග ඡන්ද මධ්‍යස්ථානයට අදාළ බඩුබාහිරාදිය නිකුත් කිරීම් මධ්‍යස්ථානයේ සිට ආරක්ෂාව සලසමින් ගමන් කළ යුතු බව නියම කොට තිබුණි. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා අදාළ නිකුත් කිරීමේ මධ්‍යස්ථානයෙන් බඩුබාහිරාදිය ලබාගත් අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන් කර ඒවා නැවත භාරදීම දක්වා වූ කාලය තුළ මම පොලිස් නිලධරයා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සමගම රැඳී සිටිය යුතු වේ. ඡන්ද පොළ ආරක්ෂාවට පත් කරනු ලබන අනෙක් පොලිස් නිලධරයා ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් කෙළින්ම ඡන්ද පොළ වෙත අනුයුක්ත කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල සකස් කිරීම පොලිස්පතිවරයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව සංවිධානය කර තිබුණි.

8.3 ඡන්ද මධ්‍යස්ථානයේ පහසුකම් සැලසීම

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඡන්ද පත්‍රිකා ඇතුළු බඩුබාහිරාදිය රැගෙන නියමිත ඡන්ද මධ්‍යස්ථානය වෙත ළඟා වනවිට, එය පිහිටි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ඡන්ද පොළට අවශ්‍ය පහසුකම් සපයා සුදුසු පරිදි සූදානම් කොට තැබීම කරනු ලැබේ. සමහර ග්‍රාම නිලධාරීන්ට, විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ තම වසම තුළ ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක්ම සූදානම් කිරීමේ වගකීම පැවරී තිබුණි. එලෙස සූදානම් කළ යුතු මධ්‍යස්ථාන ගණන 3 කට වැඩි වූ අවස්ථාවල දී ඡන්ද පොළ සකස් කිරීම සඳහා ඔහුගේ නියෝජිතයකු පත් කර ගැනීමට හා එම සහායකයා මගින් ඡන්ද පොළ කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීමට මැතිවරණ කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා දී තිබුණි. එසේ වූව ද හැකි සෑම විටම ඡන්ද මධ්‍යස්ථානයේ පූර්ව සූදානම හා සුභ සාධන පහසුකම් සලසා දීම කෙරෙහි අවධානයන් පසුවන ලෙස අදාළ ග්‍රාම නිලධාරීවරුන්ට උපදෙස් ලබා දී තිබුණි. මෙවැනි ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳව දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සමීප අධීක්ෂණයෙන් කටයුතු කළ යුතු බවට ද උපදෙස් දී තිබිණි. එසේම නියමිත ගාස්තුවක් යටතේ ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාව පරිදි කෑම බීම ලබාදීමටත් ග්‍රාම නිලධාරීවරුනට පවරා තිබුණි. ඡන්ද පොළ රාජකාරී සඳහා පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සහ සහායකයා, පොලිස් නිලධාරීන් ඇතුළු ඡන්ද පොළවල රාත්‍රී නවාතැන් ගැනීමට නියම කොට තිබූ නිලධාරීන්ගේ නවාතැන් සඳහා ද අවශ්‍ය පහසුකම් සැපයීම ග්‍රාම නිලධාරීන්ගේ වගකීමක් වේ. ස්ථිර ගොඩනැගිලි නොමැති බැවින් තාවකාලික මඩුවල පවත්වාගන යන ඡන්ද පොළවලට අනුයුක්ත නිලධාරීන්ට සුදුසු යැයි හඳුනාගත් වෙනත් ආසන්න සුදුසු ස්ථානවල ආරක්ෂා සහිතව ඡන්ද මධ්‍යස්ථානයට අදාළ ඡන්ද පත්‍රිකා ඇතුළු බඩුබාහිරාදිය සහ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික බඩුබාහිරාදිය ආරක්ෂිතව තබා ගැනීමට හැකිවන පරිදි නවාතැන් පහසුකම් සපයන ලෙස ද

වැඩිදුරටත් උපදෙස් දී තිබුණි. ග්‍රාම නිලධාරීවරයා සම්පාදනය කරනු ලබන මෙම පහසුකම් පිළිබඳව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ඔහුගේ නිරීක්ෂණ ඇතුළත් පිටපත් දෙකකින් යුත් වාර්තාවෙන් එක් පිටපතක් ග්‍රාම නිලධාරීවරයාට ලබා දිය යුතු යයි නියම කරන ලද්දේ පූර්වයෙන් ලත් අත්දැකීම් අනුව වඩාත් ඵලදායී සේවාවක් ලබාගැනීමේ අරමුණින් යුතුවය. ඡන්ද පොළ නිලධාරීන් අපේක්ෂා කරන ආකාරයෙන්ම පහසුකම් හා වෙනත් සුබසාධන සේවා ලබාදීම ඒ ඒ ප්‍රදේශවල පවත්නා ප්‍රායෝගික තත්ත්වය අනුව තරමක් අසීරු කාර්යයක් වුව ද රජයේ සේවකයන් විසින් ප්‍රජාතන්ත්‍රවාදය අගයනු වස් රටේ අභිවෘද්ධිය වෙනුවෙන් සේවය කිරීමේ හුදු චේතනාවෙන් එකී අඩුපාඩු පිළිබඳව අනවශ්‍ය ප්‍රශ්න කිරීමකින් හෝ ගැටුම් ඇතිකර ගැනීමකින් තොරව ඒවා ඉවසා දරා සිටීම ද ප්‍රශංසාවට ලක්විය යුතුය.

8.4 ඡන්ද විමසීම් කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය

ඡන්ද පටිටි, ඡන්ද පත්‍රිකා ඇතුළු ව්‍යවස්ථාපිත ද්‍රව්‍ය ඡන්ද මධ්‍යස්ථාන කරා රැගෙන යාමේ සිට ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කොට කාර්යයන් අවසන් කිරීම දක්වා වූ කාලය තුළ එකී ක්‍රියාදාමය මෙහෙයවීම සඳහා සන්නිවේදන ක්‍රමවේදයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් යොදාගෙන තිබුණි. මේ දක්වාම ඒ සඳහා භාවිත කරන ලද්දේ දුරකථන හා ෆැක්ස් පණිවිඩයි. එසේ වුව ද 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් මෙම මූලික කාර්යයන් මෙහෙයවීම හා පසුවිපරම් කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයක් වූ කෙටි පණිවුඩ සේවාවක් (SMS) හඳුන්වා දෙන ලදී. විශේෂයන්ම ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරි මගින් තේරීම්භාර නිලධාරි වෙත ලබාදිය යුතු පණිවිඩයම පෙර සැකසුම් කළ කෙටි පණිවුඩ සේවාවන් මගින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ කෙටි පණිවුඩ ද්වාරය හරහා මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක පද්ධතිය වෙත එවනු ලබන අතර මැතිවරණ කොමිෂන් සභාවේ තාරතුරු තාක්ෂණ අංශය විසින් එම පණිවිඩවල තොරතුරු ආශ්‍රයන් ඡන්ද මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට එම නිරීක්ෂණ වාර්තාව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි. දුරකථන හා ෆැක්ස් මගින් යොමු කරනු ලැබූ මෙහෙයුම් ක්‍රියාවලියට අමතරව මෙ මගින් වඩාත් පහසු හා සංවිධිත ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණ ද ලංකාවේ සමහර ප්‍රදේශවල ජංගම දුරකථන සංඥා නොතිබීම හෝ දුර්වල වීම, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පැවරී තිබූ රාජකාරී අධික වීම, තොරතුරු තාක්ෂණ ක්‍රම ද භාවිතයට තිබූ යම් යම් අපහසුතා මත මෙම ව්‍යාපෘතිය මගින් සමස්ත ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාවම ආවරණය කර ගත නොහැකි විය. එසේ වුව ද හඳුන්වා දී තිබූ එම ක්‍රමවේදය ඉදිරි ඡන්ද විමසීම්වල දී භාවිතයට ගැනීමෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සන්නිවේදනයක් තුළින් ඡන්ද මධ්‍යස්ථානවල කටයුතු අධීක්ෂණය, මෙහෙයවීම හා සම්බන්ධීකරණයට පහසුවක් වනු ඇත.

කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීවරුන් සමග ද රාජකාරී සඳහා වාර්තා කරන ලද මධ්‍යස්ථානයේ දී කෙටි සාකච්ඡාවක් පැවැත්වීමට තේරීම්භාර නිලධාරීන් විසින් සංවිධානය කොට තිබුණි. එහි අරමුණ වූයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අදාළ රාජකාරී කටයුතු පූර්වයෙන් ලබා දී ඇති උපදෙස් හා පනතේ විධිවිධාන අනුව නිසි පරිදි ඉටු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව හා මැතිවරණ කොමිෂන් සභාවෙන් නිකුත්කරන ලද විශේෂ උපදෙස් පිළිබඳව ද

තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත දන්වා තිබූ කරුණු අදාළ නිලධාරීන්ට පැහැදිලි කරදීමය. ඉන් අනතුරුව කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් විධිමත් පත්වීම් ලිපි ලබා දී ඇති අතර, පත්වීම් ලිපි ලබාගන්නා අවස්ථාව දක්වාම තමන් අනුයුක්ත කලාපය කුමක් ද යන්න ඔවුන් වෙත දන්වා නොතිබුණි. විධිමත් පත්වීම් ලිපිය ලබාගත් පසුව තමන් අනුයුක්ත කලාපයට අදාළ නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත ගොස් අධීක්ෂණයට නියමිත ඡන්ද පොළවලට පත්වීම් ලද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් බඩුබාහිරාදිය රැගෙන පිටත්ව ගොස් ඇති බවට නිසැක වී, පත්වීමට අදාළ කලාපයේ අධීක්ෂණ කටයුතු සඳහා පිටත්වන ලෙස උපදෙස් දී තිබුණි. ඔවුන්ගේ රාජකාරි සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට අනුරූප වන සංවිධානය කොට තිබුණි. අධීක්ෂණය කරන කලාපයේ ඡන්ද මධ්‍යස්ථාන පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගොස් එහි සිටින සම්බන්ධීකරණ සහකාර භාර නිලධාරීන්ට ද වාර්තා කොට ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය සඳහා යා යුතු බවට එම නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබීමේ අපේක්ෂාව වුයේ කිසිදු කාර්යයක් අතපසුවීමකින් තොරව පවත්වා ගැනීමයි.

8.5 ඡන්ද විමසීම් දිනට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ක්‍රියා කළ යුතු ආකාරය

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් නියමිත මධ්‍යස්ථානයට වාර්තා කළ පසු එහි පහසුකම් පරීක්ෂා කොට බලා තේරීම්භාර නිලධාරී විසින් ලබා දී ඇති උපදෙස් පරිදි නිදහස් හා සාධාරණ අයුරින් රහස්‍යභාවය රැකෙන පරිදි ඡන්ද විමසීම පැවැත්වීමට හැකියාවක් පවතී ද යන්නත් ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ඇතුළු බඩුබාහිරාදිය වඩාත් සුරක්ෂිතව තබා ගැනීමට පහසුකම් පවතී ද යන්න විමසා බලා ඒ පිළිබඳව නිසැක විය යුතු අතර අදාළ පහසුකම් සපයා නොමැති නම් හා වෙනත් යම් බාධාවක් ඇත්නම් වහාම කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙත දන්වා ඔහු මගින් තේරීම්භාර නිලධාරී වෙත ද වාර්තා කරන ලෙස උපදෙස් දී තිබුණි.

පස්වරු 2.00ට පමණ සෙසු කාර්ය මණ්ඩලයට ද අදාළ ඡන්ද පොළ වෙත වාර්තා කරන ලෙසට උපදෙස් දී තිබිණි. ඔවුන් වාර්තා කළ පසු එම නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත හා පත්වීම් ලිපි සමග අනන්‍යතාව පරීක්ෂා කොට බලා පැමිණීමේ ලේඛනය අත්සන් කරගැනීම සිදුකරන ලදී. ඉන් අනතුරුව සියලුම නිලධාරීන් එක්ව ඔවුනොවුන් හඳුනාගැනීම හා ඡන්ද පොළ පෙරහුරුව පැවැත්වීම සිදුකළ යුතු අතර, මෙම පෙරහුරුව සඳහා මොන යම් හෝ හේතුවක් නිසාවත් ඡන්ද පත්‍රිකා, නිල සලකුණු, නොමැකිය හැකි තීන්ත ආලේපන ආදිය විවෘත නොකරන ලෙස උපදෙස් සැසිවල දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත අවධාරණය කර තිබුණි. පෙරහුරුවේ දී එක් එක් නිලධාරියාගේ හැකියාවන් හඳුනාගෙන රාජකාරි පැවරීමත් ඒ සඳහා ලබා දී ඇති උපදෙස් අධ්‍යයනය කොට නියමිත කාර්යයන් පහසු කරගැනීමට අවශ්‍ය මග පෙන්වීම ලබාදීමත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ වගකීමක් වේ. තවද මෙම පෙරහුරුව පැවැත්වීම තුළින් ඡන්ද මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරීන්ගේ පැමිණීම සනාථ කරගැනීම හා පසුදින කිසිදු බාධාවකින් තොරව ඡන්ද විමසීම ආරම්භ කිරීමට හැකි බවට සනාථ කරගැනීමට ඉවහල් වේ. ඡන්ද මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් නිලධාරීන් අනුයුක්ත කර තිබුණ ද යම් හෙයකින් පසුදින ඡන්ද විමසීම පවත්වාගෙන යාමට අවශ්‍ය අවම හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පෙර දින පෙරහුරුවට වාර්තා නොකළේ නම් වහාම කලාප අධීක්ෂණය සඳහා පැමිණන සහකාර භාර නිලධාරීවරයාට ඒ පිළිබඳව වාර්තා කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ස්ථාපිත කොට තිබෙන නිලධාරි සංචිතයෙන් අඩුපාඩු නිලධාරීන් වෙනුවට වෙනත් නිලධාරීන් අනුයුක්ත කරගැනීමට ද අවශ්‍ය

පහසුකම් සලසා දී තිබුණි. පෙරහුරුවෙන් පසුව කාන්තා නිලධාරිනියන්ට පසුදින රාජකාරි සඳහා සූදානම්වීමට කල් වේලා ඇතිව එනම් පෙරවරු 6.00 ට පෙර පැමිණෙන ලෙස දන්වා ඔවුන්ව නිදහස් කිරීමට ක්‍රියා කර තිබුණි. පිරිමි නිලධාරීන් ඡන්ද පොළ තුළම රාත්‍රිය ගත කළ යුතු විය. මේ වනවිට කලාප භාර සහකාර තේරීම්භාර නිලධරයා ද ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණයට පැමිණ, භාර ගන්නා ලද හා ලැබී තිබූ බඩුබාහිරාදිය නිවැරදිව හා ප්‍රමාණවත්ව තිබේ ද යන්නත් විශේෂයෙන්ම ඡන්ද පත්‍රිකා, නිල සලකුණ, නොමැකෙන තීන්ත ආදිය විවෘත කිරීමකින් තොරව පෞද්ගලිකවම පිටතින් පරීක්ෂා කොට බලා සත්‍යාපනය කිරීමෙන් අනතුරුව නිසැක වීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු යැයි උපදෙස් ලබා දී තිබුණි. එම ඡන්ද පොළ තුළ තිබිය යුතු පහසුකම් පිළිබඳවත් සොයා බලා පෙරහුරුව පැවැත්වීම ද නිරීක්ෂණය කිරීම හෝ එම අවස්ථාව වන විට පෙරහුරුව පවත්වා නොමැති නම් එම අවස්ථාවේ ම පෙරහුරුව පවත්වන ලෙස දන්වා එකී කාර්යයන් අධීක්ෂණය කළ යුතු අතර, අවශ්‍ය උපදෙස් හා නියෝග ලබාදීම සිදු කළ යුතු ය. අධීක්ෂණ කටයුතුවලින් පසුව පසුදින නියමිත ඡන්ද විමසීම පරිදි පෙරවරු 7.00 ට ආරම්භ කිරීමට හැකිවන අයුරින් කාර්යයන් සංවිධානය කර ඇති බවට කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරියා සිය පළමු පණිවුඩය තේරීම්භාර නිලධාරී හෝ මෙහෙයුම් කාර්යාල වෙත දුරකථන හා ෆැක්ස් මගින් ලබාදිය යුතු වේ.

8.6 ඡන්ද විමසීම් දින රාජකාරී කටයුතු

ඡන්ද විමසීම් දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සිය රාජකාරී ඉටු කිරීමේ දී පවත්වාගෙන යා යුතු වැදගත්ම ලේඛනය වන්නේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්ය පටිපාටි සංග්‍රහය හෙවත් ජර්නලයයි. ඡන්ද විමසීම ආරම්භක අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන් කරන තෙක් කාලය තුළ සිදු කරනු ලබන සියලුම කටයුතු හා සිදුවන සිද්ධි සම්බන්ධයෙන් මෙහි සටහන් තැබිය යුතුය. එමෙන්ම තම කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු, පැමිණ සිටින ඡන්ද නියෝජිතයින් හා වරින් වර ඡන්ද මධ්‍යස්ථානයට පැමිණෙන අපේක්ෂකයින් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් සහ අනෙකුත් නිලධාරීන් ඇතුළු ඡන්ද පොළට ඇතුළුවීමට අවසර ඇති තැනැත්තන් පිළිබඳව මෙහි සටහන් තැබිය යුතුය. තවද ඡන්ද මධ්‍යස්ථානයේ කටයුතුවලට සිදුවන බාධා හෝ වෙනත් සිද්ධි ඇත්නම් ඒවා පිළිබඳ සටහන් ද මෙම ජර්නලයට ඇතුළත් කළයුතු වේ. ඡන්ද විමසීම අවසන්වීමෙන් අනතුරුව එම ජර්නලය ඡන්ද පෙට්ටි ආපසු භාරදෙන අවස්ථාවේ දී ඔහු වෙත ලබාදී ඇති උපදෙස් අනුව භාරදීමට ක්‍රියා කළ යුතුය.

ඡන්ද විමසීම් දින පෙරවරු 6.00 වනවිට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා සෙසු කාර්ය මණ්ඩලය ඡන්ද පොළ රාජකාරී කටයුතු සඳහා සූදානම්ව සිටිය යුතු බවටත්, ඡන්ද දායකයන් දැනුවත් කිරීම පිණිස සපයා ඇති උපදෙස් සහිත දැන්වීම් හා පුවරු ප්‍රදර්ශනය කිරීම හා ඡන්ද කුටි ස්ථානගත කිරීම ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමට සූදානම් කර තබාගැනීම ආදී කාර්යයන් ඉටු කළ යුතු බවටත් මැතිවරණ කොමිෂන් සභාව විසින් විසින් උපදෙස් ලබා දී තිබුණි. එක් ඡන්ද පොළක් සඳහා නියෝජිතයින් දෙදෙනෙකු යෙදවීමට පනත ප්‍රකාරව බලය ලැබී තිබුණ ද මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයින් 35 දෙනෙකු තරග කළ බැවින් එක් ඡන්ද මධ්‍යස්ථානයක නියෝජිතයින් දෙදෙනෙකු යෙදවීම ගැටලුවක් විය. මේ අනුව ඡන්ද මධ්‍යස්ථානයේ ඉඩපහසුකම් අනුව එක් නියෝජිතයෙකු පමණක් නිරීක්ෂණ කටයුතු සඳහා යෙදවීමට අවසර ලබාදී තිබුණි.

නියෝජිතයින්ගේ පත්වීම් ලිපිය සමග අනන්‍යතාව පරීක්ෂා කර බැලීම සිදුකිරීම කළ යුතු වීම හා ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමේ දී ඔවුන්ගේ සහභාගීත්වය අවශ්‍යව තිබූ හෙයින් ඡන්ද පොළ

සඳහා පත්කර තිබූ නියෝජිතයට එදින පෙරවරු 6.30 පමණ වනවිට පැමිණ සිටින ලෙසට තේරීම්භාර නිලධාරීන් විසින් දන්වා තිබුණි. එම ඡන්ද විමසීම සඳහා භාවිත කරනු ලබන ඡන්ද හිමි නාමලේඛන, ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා, නිල සලකුණු ආදිය පරීක්ෂක්ෂා කර බැලීම හා විශේෂයෙන් ඡන්ද පත්‍රිකාව පිටුපස තබනු ලබන නිල සලකුණ අහඹු ලෙස තෝරා ගැනීමේ දී ඔවුන්ගේ නිරීක්ෂණය අපේක්ෂක්ෂා කරන බැවින් මෙන්ම, ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ අයුරින් පැවැත්වීම පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමට, නියෝජිතයින් වෙත මෙම අවස්ථාව සලසා දී ඇත. ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමට පෙර ඒවා පැහැදිලිව පිටතට පෙනෙන සේ විවෘත කොට ඡන්ද පෙට්ටිය තුළ කිසිවක් නොමැති බවට නිසැක වීම හා ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීමට පෙර නියෝජිතයින් ඉල්ලා සිටිනම් දේශපාලන පක්ෂ සලකුණක් හෝ ඡන්ද පත්‍රිකාවේ ඇතුළත් සලකුණක් නොවන යම් මුද්‍රාවක් හෝ හඳුනාගැනීමේ සලකුණක් හෝ ස්ටිකරයක් ඇලවීමටත් අවසර ලබාදෙන ලදී. එලෙස මුද්‍රා තබන්නේ නම් ඒවායේ ආදර්ශ ඡන්ද පෙට්ටියේ ඇලවීමට පෙර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලබාදිය යුතු තිබුණි.

ඡන්ද විමසීමක දී අත්‍යවශ්‍ය ව්‍යවස්ථාපිත ආකෘති පත්‍ර අඩුපාඩුවකින් තොරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ ගොනුවට ඇතුළත් කිරීම වඩාත් නිවැරදිව සිදු කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. එහෙයින් මේ පිළිබඳව ගබඩා භාර නිලධාරීන් මෙන්ම ඊට අදාළ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම හා ආකෘති පත්‍ර බහාලන අදාළ කවර සම්පූර්ණ කිරීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ යටතේ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලවා සිදු කරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී තිබුණි.

8.7 ඡන්ද විමසීම පැවැත්වීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම නියමිත පරිදි 2019.11.16 වන දින පෙරවරු 7.00 ට ආරම්භ කරන ලදී. මෙම ඡන්ද විමසීම නීතිමය විධිවිධාන අනුව පස්වරු 4.00ට අවසන් කළ යුතු වුවද ඡන්ද පත්‍රිකාව විශාලවීම හේතුකොට ගෙන ඡන්ද දායකයාට ඡන්දය සලකුණු කිරීමට වැඩි වෙලාවක් ගතවේ යැයි යන උපකල්පනය මත දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කිරීමෙන් පසු ඡන්දය අවසන් කිරීම පස්වරු 5.00 දක්වා දීර්ඝ කරන ලදී. එය අංක 2147/46 හා 2019.10.29 දිනැති ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද අතර ඇමුණුම 19 වශයෙන් වාර්තාවට ඇතුළත් කර ඇත. ඒ අනුව නියමිත කාලය තුළ දිවයිනෙහි ඡන්ද මධ්‍යස්ථාන 12,845 ක දී ඡන්ද විමසීම පවත්වන ලදී. මේ සඳහා විවිධ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් ආසන්න වශයෙන් 224,000 ක ගේ සහාය ලබා ගන්නා ලදී. මෙහිදී සෘජුව මැතිවරණ ක්‍රියාවලිය හා සම්බන්ධ වූ නිලධාරීන් මෙන් ම සහායක සේවා වශයෙන් ඡන්ද විමසීම් කටයුතු සඳහා වක්‍රව දායක වූ නිලධාරීන් ද උපකාරක සේවා සපයන ලද සේවා සැපයුම්කරුවන් ද විය. ආරක්ෂක අංශ විසින් ආරක්ෂාව සැපයීම හා නීති බලාත්මක කිරීම පිණිස දක්වන ලද සහාය ඡන්ද විමසීම් කටයුතු සාමකාමීව පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් වැදගත් විය. සමස්ත ඡන්ද විමසීම් ක්‍රියාවලිය නියමිත පරිදි නිදහස් හා සාධාරණ අන්දමින් පැවැත්වීමට ද බහුතර ජනතාවගේ කැමැත්ත පරිදි ප්‍රජාතන්ත්‍රවාදීව සිය රටේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමට මෙම ඡන්ද විමසීම ඉවහල්වීම සතුටට කරුණකි.

8.8 ඡන්ද විමසීම අවසන් කිරීම, ඡන්ද පෙට්ටි හා සෙසු ව්‍යවස්ථාපිත ලේඛන භාරදීම

ඡන්ද විමසීම ආරම්භ වූ පසුව කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්, තේරීම්භාර

නිලධාරීන් හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ සහායට පත්කරනු ලබන, විශේෂ නැතහොත් මහ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් (Mega Zone) විසින් වරින්වර ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය සඳහා පැමිණ තිබුණි. මෙම නිලධාරීන්ට ඡන්ද පොළ තුළ රාජකාරි අධීක්ෂණය පමණක් නොව ඉන් පරිබාහිර ප්‍රදේශවල ද මැතිවරණ නීති රිති බලාත්මක කිරීමට අවශ්‍ය අධීක්ෂණ කටයුතු ද පැවරී තිබුණි. එසේම යම් නීති විරෝධී කටයුත්තක් හෝ ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වන බවට නිරීක්ෂණය වූ වහාම පොලිසියේ සහාය ඇතිව ඒවා මැඩ පැවැත්වීමට කටයුතු සැලැස්වීම ඔවුන්ගේ මූලික රාජකාරියක් වේ. කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීවරුන් අනිවාර්යයන් හා අවම වශයෙන් තෙවරක් ස්වකීය කලාපයට අයත් මධ්‍යස්ථාන අධීක්ෂණය කළ යුතුව තිබූ අතර එසේ කිරීමට හැකිවන පරිදි ඔවුන් වෙත ඡන්ද මධ්‍යස්ථාන අනුයුක්ත කොට තිබුණි.

එමෙන්ම මෙම නිලධාරීන් ඡන්ද විමසීම ආරම්භයේදී එක් මධ්‍යස්ථානයක රැඳී සිටීමත් හා ඡන්ද විමසීම අවසන් වන අවස්ථාවේ දී තවත් ඡන්ද මධ්‍යස්ථානයක රැඳී සිටීමත් අනිවාර්ය බවට ද තේරීම්භාර නිලධාරීන් විසින් උපදෙස් ලබා දී තිබුණි. ඡන්ද විමසීම පස්වරු 5.00 ට අවසන් වීමෙන් පසු ලබා දී තිබූ උපදෙස් පරිදි ඡන්ද පෙට්ටි හා සෙසු ව්‍යවස්ථාපිත කවර මුද්‍රා තැබීම සිදුකරන ලදී. ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමත් අනතුරුව නියෝජිතවරුන්ට ද ඉල්ලා සිටින්නේ නම් මුද්‍රා හෝ ස්ටිකර් ඇලවීමට අවසර ලබා දී තිබූ අතර, ඒවායේ ආදර්ශ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලබාදිය යුතු බව ද නියෝජිතයින්ට දැනුම් දී තිබුණි.

ඉන් අනතුරුව ඡන්ද මධ්‍යස්ථානයට අදාළ බඩුබාහිරාදිය ආපසු භාරදීමේ මධ්‍යස්ථානය දක්වා පෙර දින යොදාගත් ප්‍රවාහන වැඩ පිළිවෙල අනුව එම මාර්ගයේම ඒවා රැගෙන යාමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ක්‍රියාකර තිබුණි. ඡන්ද පත්‍රිකා අඩංගු පෙට්ටි ආපසු භාර දීම සඳහා රැගෙන යාමේ දී අක්‍රමිකතා සිදුවන බවට අපේක්ෂකයින් හා ආධාරකරුවන් විසින් දුර්මත සමාජගත කර ඇති බැවින් ඡන්ද විමසීමෙන් පසු ඡන්ද මධ්‍යස්ථානයේ බඩුබාහිරාදිය ආපසු ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත රැගෙන යාම නිරීක්ෂණය සඳහා එක් අපේක්ෂකයකු වෙනුවෙන් එක් ඡන්ද පොළ නියෝජිතයකු සඳහා අවසර ලබාදෙන ලෙස උපදෙස් දී තිබිණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ඉල්ලීමක් කර ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පරිශ්‍ර පිවිසුම දක්වා තම වාහනයකින් ගමන් කරමින් නිරීක්ෂණය සඳහා එම ඡන්ද පොළ නියෝජිතයාට අවශ්‍ය අවසර පත්‍ර ලබාගත හැකි බව දන්වා තිබුණි.

කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් ද තමන් අධීක්ෂණය කළ ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීමට අදාළ අවසාන නිවේදනය ද ෆැක්ස් මගින් තේරීම්භාර නිලධාරීන් වෙත යවා, දුරකථනයෙන් ද ඒ බව දන්වා ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත ද වාර්තා කිරීමෙන් පසුව, තේරීම්භාර නිලධාරී වෙත පැමිණ ඡන්ද විමසීමේ කලාප අධීක්ෂණ රාජකාරීවලට අදාළ ජර්නලය භාර දිය යුතු වේ. තේරීම්භාර නිලධාරීන් වෙත ලැබී තිබූ එම වාර්තා අනුව දිවයින පුරා ඡන්ද විමසීම ඉතා සාමකාමී අයුරින් පවත්වා අවසන් කළ බව වාර්තා කර තිබිණි. ඡන්ද විමසීම අඩාල කිරීමට හෝ අත්හිටුවීමට තරම් වූ කිසිදු බරපතල සිදුවීමක් වර්තා නොවීම පැසසුම් කටයුතු වේ. ඡන්ද විමසීම් දින දිවයිනේ සියලුම ඡන්ද පොළවල ඡන්ද විමසීම සාමකාමීව පවත්වා කිසිදු බාධාවකින් හෝ අවහිරතාවකින් තොරව ඡන්ද පත්‍රිකා අඩංගු ඡන්ද පෙට්ටි සියල්ලම එදින රාත්‍රී 8.00 පමණ වන විට ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ලැබී තිබූ බව තේරීම්භාර නිලධාරීන්වරුන් විසින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත වාර්තා කොට තිබුණි.

8.9 මැතිවරණ ආරවුල් කළමනාකරණය

මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ දැන්වීම පළකිරීමෙන් පසුව

නිදහස් හා සාධාරණ ද විමසීමක් පැවැත්වීම පිණිස සමබිමක් නිර්මාණය කිරීමේ වගකීම මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් අභිනවයෙන් ස්ථාපිත කරන ලද "මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය" වෙත පැවරිණි. දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්, පොදු මහජනතාව, සිවිල් සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ඡන්ද විමසීම් කාලය තුළ සිදුකරන නීති රීති උල්ලංඝනය කිරීම් සම්බන්ධව යොමු කරන පැමිණිලි පිළිබඳව, ක්ෂණිකව ක්‍රියාත්මක වී නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් මෙතෙක් පැවැති ක්‍රමවේදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් මෙන්ම ඡන්ද විමසීම නිදහස් හා සාධාරණව පැවැත්වීම පිළිබඳව විශ්වසනීයත්වය වඩාත් තහවුරු කිරීමේ අරමුණින් මෙම පියවර ගන්නා ලදී. මැතිවරණ ආරවුල් කළමනාකරණය සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය මගින් ජාතික ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකක නාමයෝජනා භාරගැනීමත් සමගම ආරම්භ කරන ලදී. මේ අනුව එම ජාතික හා දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකක 2019.11.18 දින දක්වා කාලය තුළ ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ලදී. මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමේ දී මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය සිදු කරනු ලැබූ කාර්යයන් පහත සඳහන් පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

- ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 66 වන වගන්තියේ සිට 75 වන වගන්තිය දක්වා වූ "වැරදි", 76 වන වගන්තියේ සිට 81 වන වගන්තිය දක්වා වූ "දූෂණ ක්‍රියා" හා 82 වන වගන්තියේ සිට 87 වන වගන්තිය දක්වා වූ "නීති විරෝධී ක්‍රියා" සම්බන්ධව නීති බලාත්මක කිරීම පිණිස චක්‍රලේඛ හා උපදෙස් නිකුත් කිරීම.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උ ව්‍යවස්ථාවෙහි දැක්වෙන පරිදි විධාන, උපමාන හා ආචාරධර්ම සකස් කිරීම හා අති විශේෂ ගැසට් නිවේදන මගින් ඒවා ප්‍රසිද්ධ කිරීම.

- ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකක ස්ථාපිත කිරීම් කටයුතු හා ඒවාට අනුයුක්ත කෙරෙන නිලධාරීන් පුහුණු කිරීම, පැමිණිලි ඒකකයේ කාර්යයන් අධීක්ෂණය කිරීම, පැමිණිලි වාර්තා තබාගැනීම හා ඒ සම්බන්ධ දෙනික වාර්තා සකස් කිරීම හා එහි සමාලෝචන වාර්තා සුදුසු උපදෙස් හා නියෝග සඳහා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.

- රාජ්‍ය දේපළ, නිලධාරීන් ඇතුළු අනෙකුත් රජයේ සම්පත් දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රචර්ධනය පිණිස අවභාවිත කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන නිර්ණායක හඳුනාගැනීම, රාජ්‍ය සම්පත් ඡන්ද විමසීම් කාලය තුළ අවභාවිත කිරීමකින් තොරව මහජන සුභසිද්ධිය සඳහා පමණක් යෙදවීමේ අවශ්‍යතාව පිළිබඳ අදාළ ආයතන වෙත උපදෙස් දීම.

- නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා වන පරිසරය නිර්මාණය කිරීම හා සියලුම තරගකරුවන්ට සමබිමක් නිර්මාණය පිණිස නිරන්තර අධ්‍යයනය කිරීම හා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

- මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකක වෙත ලැබෙන පැමිණිලි පිළිබඳව අප්‍රමාදව සොයා බලා මැදිහත් වීම හා අවශ්‍ය අවස්ථාවල දී ස්වකීය නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, මූලික විමර්ශන කටයුතු කිරීම හා අදාළ පාර්ශ්ව මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවා කරුණු විමසීමට සැලැස්වීම.

- සමාජ මාධ්‍ය ඔස්සේ මැතිවරණ නීති උල්ලංඝනය වීම් පිළිබඳ ලැබෙන පැමිණිලි කළමනාකරණය සඳහා සමාජ මාධ්‍ය පරිපාලකයන් සමග එකඟතාවන්ට එළඹීම හා එවැනි ක්‍රියා අවම කිරීම පිණිස සමාජ මාධ්‍ය ජාලා ක්‍රියාකාරීන් සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.

- සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන, ශ්‍රී ලංකා පොලීසිය, දේශීය මැතිවරණ නිරීක්ෂණ

සංවිධාන, තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරු, බලයලත් නියෝජිතයින්, ස්වාධීන කණ්ඩායම් නායකයන් සමග මැතිවරණ පැමිණිලි කළමනාකරණය සම්බන්ධව මනා සම්බන්ධීකරණයක් පවත්වාගන යාම.

- මැතිවරණ නීති බලාත්මක කිරීමේ දී මතුවන නීතිමය ගැටළු හා ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය පසුවිපරම් සිදුකිරීම හා ඒ පිළිබඳ දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන්ට හා මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකක වෙත දැනුම් දීම.

මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය විසින් ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිණිස සකස් කරන ලද සංවිධාන සටහන ඇමුණුම 20 වශයෙන් යා කොට ඇත.

එම සංවිධාන සටහනට අනුව දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපිත කරනු ලබන පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කිරීමට සුදුසු සිවිල් නිලධාරීන් කල් ඇතිව හඳුනාගෙන ඔවුන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී. එසේම සියලුම පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන සඳහා පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ද අනුයුක්ත කිරීමට පොලිස්පතිවරයා පියවර ගෙන තිබූ අතර, මෙම කාර්යයට සම්බන්ධ කරවීමට අපේක්ෂිත ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, අනෙකුත් පොලිස් සම්බන්ධීකරණ නිලධාරීන් ඇතුළුව සියලු පොලිස් ස්ථානාධිපතිවරුන්, මැතිවරණ කටයුතු භාර පොලිස් නිලධාරීන් වෙනුවෙන් ද මැතිවරණ නීතිය හා පැමිණිලි කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම ජාතික හා දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථානවලට අමතරව දිස්ත්‍රික්කයේ විශාලත්වය, භූමියේ ස්වභාවය. ගමනාගමන දුෂ්කරතා හා පූර්ව අත්දැකීම් මත අවශ්‍යතාව හඳුනාගත් විශේෂ ප්‍රදේශවල ප්‍රාදේශීය පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කොට තිබුණි.

8.10 මැතිවරණ පැමිණිලි වාර්තා කිරීම

ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය මෙන්ම දිස්ත්‍රික් පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වාචිකව හෝ මතු දැක්වෙන පරිදි සාම්ප්‍රදායික ප්‍රධාන සන්නිවේදන මාර්ග වන දුරකථන පණිවුඩ, ෆැක්ස් පණිවුඩ, ලිපි හෝ ඊ-මේල් මගින් මෙන්ම වට්සැප්, වයිබර්, ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ලද පැමිණිලි භාරගන්නා ලදී. “Tell Commission” හා “Election Commission” ෆේස්බුක් පිටුහරහා ද පැමිණිලි ඉදිරිපත් කළ හැකි බවට නිවේදනය කර තිබුණි.

දිස්ත්‍රික් පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ද ඉහත සඳහන් ඕනෑම මාධ්‍යයක් ඔස්සේ පැමිණිලි යොමු කිරීමට හා විමසීම් කිරීමට අවස්ථාව සලසන ලදී. එයින් අපේක්ෂා කරන ලද්දේ උනන්දුවක් දක්වන සියලුම තැනැත්තන් හට පහසුවෙන් හා ක්ෂණිකව ඡන්ද විමසීමට අදාළ ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසාදීමය.

ඉහත සඳහන් මාර්ග ඔස්සේ මැතිවරණ ආරවුල් කළමනාකරණයේ දී සෘජුවම සම්බන්ධ පාර්ශ්ව වශයෙන් දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා තරග කරන අපේක්ෂකයින්ගේ නියෝජිතයින් හඳුන්වා දිය හැකිය. පැමිණිලි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ජනමාධ්‍යය විසින් ද ඉටු කරනු ලබන කාර්යභාරය මෙහි දී අමතක නොකළ යුතුය. එබැවින් ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී අදාළ සියලු පාර්ශ්ව සමග සෘජු සම්බන්ධතා පවත්වාගෙන යමින්, මැතිවරණ ආරවුල් කළමනාකරණය කිරීම අභියෝගාත්මක වුවද, නිරන්තර හමුවීම් හා සාකච්ඡා පවත්වා පොදු එකගතාවන්ට පැමිණ මැතිවරණ නීති උල්ලංඝනය වීම් සිදුනොවන ආකාරයට, ප්‍රචාරණ කටයුතු කිරීම, රැස්වීම් පැවැත්වීම, දැනුවත් කිරීම් පැවැත්වීම වැනි කාර්යයන් තුළින් අදාළ පාර්ශ්ව මේ සඳහා පෙළඹවීමට මැතිවරණ කොමිෂන් සභාව උත්සාහ දරන ලදී.

8.11 ජාතික හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තර

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ අපේක්ෂාවෙන් මැතිවරණ කොමිෂන්

සභාව විසින් නීති උල්ලංඝනයවීම් වැළක්වීම සඳහා උපරිම උත්සාහයක් දරන ලදී. ඒ අනුව මැතිවරණ පැමිණිලි කළමනාකරණය සඳහා යාන්ත්‍රණයක් ද සකසා තිබිණි. දේශපාලන පක්ෂ නියෝජිතයින් ඇතුළු සාමාන්‍ය ජනතාව විසින් ඡන්ද විමසීම සම්බන්ධව පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන හරහා මැතිවරණ කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිලි පිළිබඳ තොරතුරු පහත සටහනෙහි දක්වා ඇත.

දිනය	දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන				ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය				එකතුව
	ලිඛිත පැමිණිලි	දුරකථන පැමිණිලි	වෙබ්අඩවි	එකතුව	ලිඛිත පැමිණිලි	දුරකථන පැමිණිලි	වෙබ්අඩවි	එකතුව	
2019.10.08	1	16	0	17	1	45		46	63
2019.10.09	0	42	0	42	1	50		51	93
2019.10.10	0	43	0	43	1	66	2	69	112
2019.10.1[illegible]	0	53	0	53		45	4	49	102
2019.10.12	0	42	0	42		31	9	40	82
2019.10.13	0	44	0	44	1	8	1	10	54
2019.10.14	1	51	1	53		22		22	75
2019.10.15	0	70	0	70		15		15	85
2019.10.16	0	60	6	66		23		23	89
2019.10.17	2	56	4	62		25	2	27	89
2019.10.18	0	55	0	55		31	1	32	87
2019.10.19	0	62	4	66		30		30	96
2019.10.20	0	78	5	78		22		22	100
2019.10.2[illegible]	1	63	4	68		34	1	35	103
2019.10.22	1	88	6	95		27		27	122
2019.10.23	0	92	11	103		23		23	126
2019.10.24	1	99	6	106	3	24		27	133
2019.10.25	2	117	11	130		18		18	148
2019.10.26	1	55	0	56		11	2	13	69
2019.10.27	0	58	0	58		30		30	88
2019.10.28	0	78	0	78		13		13	91
2019.10.29	2	79	1	82		38	4	42	124
2019.10.30	1	62	1	64		47	1	48	112
2019.10.3[illegible]	2	83	2	87		55	1	56	143
2019.11.0[illegible]	1	109	1	111		35	1	36	147
2019.11.02	1	92	3	96		36		36	132
2019.11.03	0	82	0	82		16		16	98
2019.11.04	0	73	0	73		24		24	97
2019.11.05	1	84	2	87		29		29	116
2019.11.06	0	84	2	86		14		14	100
2019.11.07	0	94	3	97		34		34	131
2019.11.08	0	85	1	86		17	2	19	105
2019.11.09	0	68	1	69		29		29	98
2019.11.10	0	79	0	79	1	22		23	102
2019.11.1[illegible]	0	81	0	81	1	26		27	108
2019.11.12	0	74	1	75		27		27	102
2019.11.13	0	68	1	69		23		23	92
2019.11.13 -2019.11.14	0	59	0	59		25		25	84
2019.11.14 2019.11.15	4	104	7	115		8		8	123
2019.11.15 2019.11.15	0	156	0	156	3	31		34	190
2019.11.15 2019.11.15		123		123		41		41	164
2019.11.15 2019.11.16	1	91		92		37		37	129
2019.11.16	1	385		386	7	151		158	544
2019.11.16		151	1	152		121		121	273
	24	3683	84	3792	19	1479	31	1529	5321

8.12 ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා වූ පැමිණිලි

මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජාතික මැතිවරණ මැතිවරණ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ සාරාංශයක් පහත සටහන මගින් දක්වා ඇත.

ජාතික මැතිවරණ පැමිණිලි කළමණාකරණ මධ්‍යස්ථානයට වාර්තා වූ පැමිණිලි - වර්ගීකරණයට අනුව

වගර්ය	අනු වගර්ය	සංඛ්‍යාව	එකතුව
ප්‍රචණ්ඩ ක්‍රියා	වැඩික බිය ගැන්වීම්	7	
	ආයුධ පෙන්වා බිය ගැන්වීම් / වෙඩි තබා මැරීමට තැත් කිරීම	1	
	පහරදීම් / මැර ප්‍රහාර එල්ල කිරීම	9	
	මැතිවරණ ප්‍රචාරක කාර්යාලවලට / පෝස්ටර් / බැනර් ආදියට හානි කිරීම	2	
	ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව		19
මැතිවරණ නීති උල්ලංඝනය	වංචල හා නිශ්චල පොදු දේපළ හා ගෙඩනැගිලි අයථා පරිහරණය	178	
	රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවලට යෙදීම් / යෙදවීම්	91	
	නිලධාරීන් පත් කිරීම් / උසස් කිරීම් / මාරු කිරීම්	161	
	මධ්‍ය අවභාවිතය	85	
	අසත්‍ය ප්‍රචාර / ව්‍යාජ ප්‍රවෘත්ති මැවීම් / වෛරී ප්‍රකාශ	44	
	මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලට බාධා කිරීම්	4	
	නීති විරෝධී පෝස්ටර් / බැනර් / කටවුටි ප්‍රදර්ශනය කිරීම්	330	
	ද්‍රව්‍ය බෙදාහැරීම් / පරිත්‍යාග කිරීම්	158	
	රැස්වීම් / පෙළපාලි පැවැත්වීම / නීති විරෝධී දේශපාලන කාර්යාල පවත්වාගෙන යාම	178	
	ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම / ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන හා උත්සව යොදා ගැනීම	34	
	තැපැල් ඡන්දවලට අදාළ පැමිණිලි	24	
	ඡන්දපොල / මැතිවරණ කාර්යමණ්ඩලය / මැතිවරණ ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ පැමිණිලි	9	
	ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම්	141	
	නීති විරෝධී උත්සව සංවිධානය	18	
	ඡන්ද දායකයින්ට සංග්‍රහ කිරීම්	21	
	මුළු මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව		1476
වෙනත්			
	එකතුව		

8.13 මැතිවරණ පැමිණිලි වර්ගීකරණය

මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ලැබෙන පැමිණිලි ප්‍රධාන වශයෙන් මතු දැක්වෙන පරිදි ප්‍රචණ්ඩ ක්‍රියා, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම, විමසීම් හා අනුමැතිය අපේක්ෂා කිරීම ලෙස ප්‍රධාන කොටස් හතරකට බෙදා වෙන් කරන ලදි.

8.13.1 ප්‍රචණ්ඩ ක්‍රියා

ප්‍රචණ්ඩ ක්‍රියා ඒවායේ ස්වරූපය අනුව පහත සඳහන් අන්දමට වර්ගීකරණය කරන ලදී.

- වාචික බිය ගැන්වීම්
- ආයුධ පෙන්වා බිය ගැන්වීම/ වෙඩි තබා මරණයට පත්කිරීමට තැත් කිරීම
- පහරදීම්/ මැර ප්‍රහාර එල්ල කිරීම
- බරපතල තුවාල සිදුකිරීම/ මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම
- මනුෂ්‍ය ඝාතන
- පුද්ගල පැහැරගෙන යෑම්
- වෙඩි තැබීම
- දේපළවලට ගිනි තැබීම
- කෝලහාල කිරීම
- දේපළ වලට හානි කිරීම/ දේපළ පැහැර ගෙන යාම
- මැතිවරණ ප්‍රචාරක කාර්යාල වලට බැනර්/ පෝස්ටර් ආදියට හානි කිරීම

මෙම ඡන්ද විමසීමට අදාළව ප්‍රචණ්ඩක්‍රියා ජාතික මැතිවරණ පැමිණිලි කළමණාකරණ මධ්‍යස්ථානයට 19ක් ද දිස්ත්‍රික් පැමිණිලි කළමණාකරණ මධ්‍යස්ථානවලට 24ක් ද වාර්තා වුවද ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ දී පහරදීම්, මනුෂ්‍ය ඝාතන, බියගැන්වීම් වැනි කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රචන්ඩක්‍රියා ප්‍රමාණය පෙර තත්ත්වයන් හා සසඳා බලන විට ඉතා සුළු ප්‍රමාණයකි. එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමේ දී අනාවරණය වූයේ එම සිදුවීම් පෞද්ගලික හේතු මත, පවුල් ආරවුල් හේතු මත සහ වාග් ප්‍රහාර මගින් සිදු වූ ඒවා බව ය. කෙසේ වුවද මෙම පැමිණිලි තුළින් ඡන්ද විමසීම් කටයුතුවලට හෝ ඡන්ද ප්‍රතිඵලයට බලපාන අන්දමින් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවී නැති බව නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය විමසීම සම්බන්ධයෙන් සලකන විට යහපත් ප්‍රවණතාවයක් සේ සැලකිය හැකිය.

8.13.2 නීති උල්ලංඝනය කිරීම්

ඡන්ද විමසීම් කාලසීමාව තුළදී බලපවත්නා මැතිවරණ නීති රීතිවලට හා විධාන ආදියට පටහැනි වන අන්දමින් සිදුකරන ලද කටයුතු ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම් ලෙස සැලකේ. එම නීති උල්ලංඝනය කිරීම් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරන ලදී.

- ♦ චංචල හා නිශ්චල පොදු දේපළ අයථා පරිහරණය
- ♦ රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවලට යෙදීම හෝ යෙදවීම
- ♦ දේශපාලන හේතු මත නිළධාරීන් පත්කිරීම/ උසස් කිරීම/ මාරු කිරීම
- ♦ මාධ්‍ය අවභාවිතාව
- ♦ අසත්‍ය ප්‍රචාර, ව්‍යාජ පුවත් නිර්මාණය හා ප්‍රචාරණය සහ වෛරී ප්‍රකාශ
- ♦ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට බාධා පැමිණවීම
- ♦ නීති විරෝධී අන්දමින් පෝස්ටර්, බැනර්, කටවුට් ප්‍රදර්ශනය කිරීම
- ♦ ද්‍රව්‍ය බෙදාහැරීම්, පරිත්‍යාග කිරීම් හා සංග්‍රහ කිරීම්
- ♦ රැස්වීම්, පෙළපාලි පැවැත්වීම, නීති විරෝධී කාර්යාල පවත්වාගෙන යාම
- ♦ ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම, ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන හා උත්සව යොදා ගැනීම
- ♦ නීති විරෝධී උත්සව සංවිධානය කිරීම හා පැවැත්වීම
- ♦ තැපැල් ඡන්දවලට අදාළ අක්‍රමිකතා
- ♦ ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම

8.13.3 විමසීම්

මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය වෙත නීති උල්ලංඝනය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලිවලට අමතරව ලැබුණු විමසීම් සංඛ්‍යාව අතිවිශාල ය. මෙම විමසීම්වලින් වැඩි ප්‍රමාණයක් නීතිය පිළිබඳ ගැටලු, නීති රීති ක්‍රියාත්මක වීම පිළිබඳ ගැටලු, ජනාධිපතිධුරය සඳහා අපේක්ෂකයින් ඉදිරිපත් කරන ලද පක්ෂවල ක්‍රියාකාරකම්, ජනාධිපතිධුර අපේක්ෂකයින්ගේ ක්‍රියාකාරකම් ආදියට සම්බන්ධව ඒවා විය. මෙම විමසීම් බොහොමයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී ගැටලුකාරී තත්ත්වයන් ඇතිවිය. ඊට අමතරව මැතිවරණ කටයුතු හා සම්බන්ධ නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධ මහජනයා තුළ ඇතිවූ සැක සංකා හේතුවෙන් විමසන ලද කරුණු ද විය. තවද මෙම විමසීම් අතර ද්‍රව්‍ය බෙදාදීම, උත්සව සංවිධානය, විවිධ වැඩසටහන් සඳහා අවසර ලබාගැනීම, බඳවා ගැනීම් හා උසස් කිරීම් ආදී කරුණු ද පදනම් කරගෙන ඉදිරිපත් කරන ලද ඒවා විය.

8.13.4 අනුමැතිය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම්

මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් යොමු කරන ලද ඉල්ලීම් අතුරින් බොහෝමයක් ඡන්ද විමසීම් කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන කාර්යයන්, රාජ්‍ය ආයතනවල තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ රජයේ නිලධාරීන්ගේ විදේශගමන් යන කාරණාවලට අදාළව කරන ලද ඒවා ය. මෙවැනි ඉල්ලීම්වලට කරුණු පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දීම සුදුසු බව තහවුරු වුවහොත් ඒ අනුව අනුමැතිය ලබාදීමත් එසේ නොවන අවස්ථාවල දී අනුමැතිය දීම ප්‍රතික්ෂේප කිරීම ද ඡන්ද විමසීම අවසන් වනතෙක් එම කටයුතු අත්හිටුවීමට ද ක්‍රියා කරන ලදී. සමහර ඉල්ලීම් වැඩිදුර විමර්ශන සඳහා යොමු කරන ලද අතර, නීති විරෝධීව සිදු කරන ලද බවට අනාවරණය වූ පැමිණිලි පිළිබඳව නීතිමය කටයුතු කිරීම පිණිස යොමු කරන ලදී.

8.14 රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104,(ආ) (4) (අ) යන ව්‍යවස්ථා අනුව ඡන්ද විමසීමක දී තරග කරනු ලබන යම් අපේක්ෂකයකු තෝරා පත් කරගැනීම ප්‍රවර්ධනය කිරීම හෝ වළක්වාලීමේ කාර්යය සඳහා රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් නිශ්චල හෝ චංචල දේපළක් භාවිත කිරීම වැළැක්වීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරී ඇත. මෙම ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින නිලධාරීන් බැඳී සිටී. මෙම නියමය සියලුම අමාත්‍යාංශ, කොමිෂන් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ පාසැල්, රාජ්‍ය විශ්ව විද්‍යාල යනා දී සියලුම රජයේ ආයතන සහ රජයට පවරාගෙන තිබෙන සමාගම්වලට ද බලපැවැත්වේ. අපේක්ෂකයින් ප්‍රවර්ධනය පිණිස රාජ්‍ය සම්පත් යොදා ගැනීම පිළිබඳව දැඩි අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත විධිවිධාන යටතේ අංක 2141/52 හා 2019.09.19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංසංථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධානවලට අමතරව අංක 2143/47 හා 2019.10.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තවත් විධාන ද ඊට ඇතුළත් කරන ලදී. මෙම විධාන ඇතුළත් ගැසට් නිවේදන **ඇමුණුම 22 හා ඇමුණුම 23** වශයෙන් යා කොට ඇත. තවද අංක EC/EDR/PRE-2019 හා 2019.09.18 දිනැති දිනැති චක්‍රලේඛ අංක 01 මගින් අවශ්‍ය උපදෙස් සියලුම

රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට ලබා දෙන ලදී. ඊට අමතරව එම චක්‍රලේඛය මගින් රජයට හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී අවභාවිතාව වැළක්වීමට පියවර ගැනීම හා එකී ආයතනවල නිලධාරීන්/ සේවකයන් අලුතෙන් බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් සීමා කොට ඇති බව දන්වා සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු සියලුම ස්වාධීන කොමිෂන් සභාවල ලේකම්වරුන්, සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු, සියලුම දිස්ත්‍රික් ලේකම්වරු, සියලුම පළාත් ආණ්ඩුකාරවරු, පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු, සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සියලුම රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්, සාමාන්‍යාධිකාරීවරුන් හා විධායක නිලධාරීන් දැනුම්වත් කරන ලදී.

මෙයට අමතරව පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නිල වාහන දේශපාලන ප්‍රචාරක රැස්වීම් සඳහා යෑම් ඒම් පිණිස භාවිත කිරීම සහ පළාත් පාලන ආයතන සතු වාහන හා වෙනත් උපකරණ, බඩුබාහිරාදිය සහ කාර්ය මණ්ඩලය, පෝස්ටර් ප්‍රවාහනය කිරීම, රැස්වීම් සංවිධානය කිරීම වැනි අපේක්ෂක ප්‍රවර්ධනය කටයුතු සඳහා යොදා ගැනීම තහනම් කරන ලදී. මෙම තහනම පිළිබඳව හා දේශපාලන පක්ෂ අපේක්ෂිකයන්ගේ රැස්වීම්, ප්‍රචාරක පෝස්ටර්, පා ගමන්, අත් පත්‍රිකා බෙදීම් යනාදියට අදාළ නීති උල්ලංඝනය කිරීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව ද අවධාරණය කරමින් මාධ්‍ය නිවේදන අංක 41 නිකුත් කරන ලදී. මෙය මැතිවරණ නීති නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාව ගත් පියවරක් ලෙස දැක්විය හැකි ය.

සාමාන්‍යයෙන් ඡන්ද විමසීමක් නිවේදනය හෝ ප්‍රකාශයට පත්කළ පසුව රජයේ අරමුදල් ප්‍රතිපාදන යොදවා උත්සව සංවිධානය, භාණ්ඩ හා ද්‍රව්‍ය ලබාදීම වැනි සහන ලබාදීමේ වැඩ සටහන් සංවිධානය කිරීම, නිලධාරීන් හා සේවකයන් බඳවාගැනීම, උසස් කිරීම, මාරු කිරීම පූර්වයේ දී සුලබ අත්දැකීමක් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැනවී ඇති මෙම විධාන නිකුත් කිරීමට ඇති බලය මැතිවරණ කොමිෂන් සභාවට පැවරීමත්, ඒ පිළිබඳව වගකිවයුතු පාර්ශ්ව දැනුවත් කිරීමත්, පසුගිය ඡන්ද විමසීම්වල දී එවැනි කාර්යයන් සංවිධානය කිරීමට දායක වූ නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි දඬුවම් ලබාදීම හා අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන තිබීමත් මත, මෙම ඡන්ද විමසීමේ දී එම තත්ත්වය බොහෝ දුරකට සමනය වී යහපත් වාතාවරණයක් පැවැති බව දක්නට ලැබුණි. මැතිවරණ කොමිෂන් සභාව විසින් ගෙන තිබූ එවැනි පූර්වෝපායන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම පමණක් නොව නිල කටයුතු හෝ පෞද්ගලික කටයුතු සඳහා විදේශ ගතවීම්වල දී පවා මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය මත පමණක් ඉදිරි කටයුතු කිරීමට අදාළ ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු වීම අගය කළ යුතු ය. තවද බඳවාගැනීම්, ස්ථාන මාරුවීම් හා උසස්වීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම් පිළිබඳව විමසා බලා කිසිදු පාර්ශ්වයකට අගතියක් සිදු නොවන බවට සෑහීමකට පත් වූ අවස්ථාවක දී පමණක් එවැනි ඉල්ලීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදී.

මීට අමතර වශයෙන් ඡන්ද විමසීම්වල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු අචාර ධර්ම පද්ධතිය ඇතුළත් අංක 2142/47 හා 2019.09.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලදී. මෙය **ඇමුණුම 24** වශයෙන් වාර්තාවට යාකොට ඇත. මෙහි අපේක්ෂාව වූයේ ද වඩා සාමකාමී හා නිදහස් ඡන්ද විමසීමකට අවශ්‍ය පසුබිම සකස් කිරීම විය.

8.15 ඡන්ද විමසීම හා සම්බන්ධ අධිකරණ කටයුතු

මෙම ඡන්ද විමසීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත තහනම් නියෝග ලබාගැනීම සඳහා ඉල්ලීම්

දෙකක් ද මූලික අයිතිවාසිකම් පෙත්සමක් ද ගොනු කර තිබුණි. SC/Writ/10/2019 මගින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධයෙන් තහනම් නියෝගයක් ලබාගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අතර අනෙක් ඉල්ලීම් මාධ්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඒවාය. ඒ පිළිබඳව විස්තර පහතින් දක්වා ඇත.

අනු අංකය	නඩු අංකය සහ අධිකරණය	පෙත්සම්කරු	ඉල්ලා ඇති සහනය	තීන්දුව/ වර්තමාන තත්වය
01	SC/ Writ/08/2019 ශ්‍රේෂ්ඨාධිකරණය	EMERGING MEDIA (PVT) LTD	ඡන්ද විමසීම් කාලයේදී අපේක්ෂකයින්ගේ ප්‍රචාරක දැන්වීම් LEDතිර සහ සිනමාහල්වල ප්‍රචාරය කිරීමට ඉඩ ලබා දෙන ලෙසට	මෙම නඩුව ගරු අධිකරනය විසින් 2019.11.21 දින නිෂ්ප්‍රභා කර ඇත.
02	SC/ Writ/10/2019 ශ්‍රේෂ්ඨාධිකරණය	චමින්ද්‍ර දයාන් ලේනව	2141/25 අතිවිශේෂ ගැසට් නිවේදනය අත්හිටුවන ලෙසට සහ ජනමතවිචාරණයක් පැවැත්වීම සම්බන්ධව	මෙම නඩුව ගරු අධිකරනය විසින් 2019.11.21 දින නිෂ්ප්‍රභා කර ඇත.
03	SC/ FR/440/2019 ශ්‍රේෂ්ඨාධිකරණය	තරිඳු ඉරංග ජයවර්ධන සහ කේ.වී. සඳුන් ප්‍රියංකර විතානගේ	පෞද්ගලික සහ රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය විසින් මැතිවරණ සමයේදී මාධ්‍ය උපමාන උල්ලංඝනය කිරීම සම්බන්ධව ක්‍රියා කරන ලෙසට	දැනට විභාග වෙමින් පවති.

8.16 ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීම

ඡන්ද විමසීමක දී ඒ පිළිබඳව නිරීක්ෂණයේ යෙදෙන දේශීය හෝ විදේශීය නිරීක්ෂණ සංවිධානවලට හෝ පුද්ගලයින්ට ඡන්ද විමසීම් නීති මගින් ඒ සඳහා ඉඩකඩ සලසා නැත. එසේ වූවද දීර්ඝ කාලයක් තුළ නිරීක්ෂණ කටයුතුවලට සම්බන්ධව ක්‍රියාකිරීමත්, ඒ සඳහා එම සංවිධාන ජාලය තුළ ඇති ශක්තියත්, අපක්ෂපාතිව කටයුතු කරන බව ඒත්තු ගන්වා ඇති බැවිනුත්, දේශපාලන පක්ෂ හා අදාළ වෙනත් පාර්ශවවල එකඟතාව මත ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා අවස්ථාව ලබා දී තිබේ. දේශීය මෙන්ම විදේශීය නිරීක්ෂකයින් යොදවා ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතුවල නියැලීම සඳහා අවස්ථාවෝචිතව අවසර දෙනු ලැබේ. නිරීක්ෂණයෙන් අනතුරුව ඡන්ද විමසීම් කටයුතු ස්වාධීනව, අපක්ෂපාතීව, විනිවිධභාවයෙන් යුතුව හා විශ්වසනීයත්වයෙන් යුතුව සිදුවුනේ ද යන්න පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මෙලෙස නිරීක්ෂණ කණ්ඩායම් යෙදවීම තුළින් අපේක්ෂා කෙරේ. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා 2019.11.16 වන දින පැවති ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා අවසර ඉල්ලා දේශීය මෙන්ම විදේශීය නිරීක්ෂණ සංවිධාන කිහිපයකින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. මෙම දේශීය නිරීක්ෂණ සංවිධානවලින් වැඩි සංඛ්‍යාවක් රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් ලියාපදිංචි වූ ඒවා වේ. පසුගිය දශක කීපය තුළ ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම තුළින් ලද අත්දැකීම් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන මෙම නිරීක්ෂණ සංවිධාන කිහිපයකට නිරීක්ෂණ කටයුතු සඳහා අවසර දෙන ලදී. ඒ වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව හෝ රජය විසින් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

මෙම ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා දේශීය නිරීක්ෂණ සංවිධානවලට අමතරව පොදු රාජ්‍ය මණ්ඩලය හා යුරෝපා සංගමයේ නිරීක්ෂණ කණ්ඩායම්වලට ද අවසර ලබා දෙන ලදී.

8.16.1 දේශීය නිරීක්ෂණ සංවිධාන

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ මෙම ඡන්ද විමසීමේ දී ද පූර්ව මැතිවරණවල දී මෙන්ම තරග කරනු ලබන අපේක්ෂකයින් දැනුම්වත් කර ඔවුන්ගේ එකඟතාව මත ඡන්ද විමසීම් නිරීක්ෂණය පිළිබඳ අත්දැකීම් සහිත නිරීක්ෂණ සංවිධානවලට ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා අවස්ථාව සලසන ලදී.

පසුගිය ඡන්ද විමසීම්වලට ඒ ඒ නිරීක්ෂණ සංවිධානවල ක්‍රියාකාරකම් සහ පැවැත්ම ද ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව ද සලකා බලා පහත සඳහන් දේශීය නිරීක්ෂණ සංවිධාන දෙකට ඡන්ද පොළ ඇතුළත ඡන්ද විමසීම් කටයුතු ස්ථානගත නිරීක්ෂකයින් යොදවා නිරීක්ෂණ කිරීමටත්, ඡන්ද

පොළට බැහැරින් ජංගම නිරීක්ෂණය සඳහාත් අවසර දෙන ලදී. එලෙස මැතිවරණ කොමිෂන් සභාවේ අවසරයලත් නිරීක්ෂණ සංවිධානවල තොරතුරු පහත සඳහන් පරිදි වේ.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
අංක 12/3, රොබට් ටෙරසය,
රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
අංක 6/1, ලේයාර්ඩ් පාර, කොළඹ 05

මෙම සංවිධාන දෙකෙහි ප්‍රධානීන් වන, විධායක අධ්‍යක්ෂ, සම කැඳවුම්කරු හා සම සම්බන්ධීකාරකවරු, ලේකම්, ජාතික සංවිධායක, ජ්‍යෙෂ්ඨ කළමණාකරු යන තනතුරු දරන තැනැත්තන්ට දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළු වී නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවසර ලබාදෙන ලද අතර, දිස්ත්‍රික් සංවිධායකවරුන්ට දිස්ත්‍රික්කය තුළ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළුවී නිරීක්ෂණ කටයුතු කිරීමට ද අවසර ලබාදීමට කටයුතු කරන ලදී.

ඉහත සඳහන් නිරීක්ෂණ සංවිධානවලට අමතරව නිරීක්ෂණ කටයුතු සඳහා මීට පෙර ඡන්ද විමසීම්වලදී සහභාගී වූ හා සක්‍රීයව ක්‍රියා කළ පහත සඳහන් නිරීක්ෂණ සංවිධාන හතරට ද, නිරීක්ෂණ කටයුත්ත සඳහා අවසර ඉල්ලා තිබූ දිස්ත්‍රික්කවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීම් කටයුතු ජංගම නිරීක්ෂණයන් යොදවා ඡන්ද පොළ පරිශ්‍රයට බැහැරින් සිට නිරීක්ෂණයට පමණක් අවසර ලබා දෙන ලදී. එලෙස බාහිර නිරීක්ෂණයට පමණක් අනුමැතිය ලද නිරීක්ෂණ සංවිධානවල තොරතුරු පහත දැක්වේ.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE)
අංක 100/19, වැලිකඩවත්ත, රාජගිරිය
ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL)
අංක 117, තලාහේන, මාලඹේ.
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL)
අංක 5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05
ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
195, කාර්ල්ෂු කෝර්ට්,
බෙස්ලයින් පාර, කොළඹ 09

නිරීක්ෂණයට අවසර ලබාදීමේදී දේශපාලන පක්ෂ ක්‍රියාකාරකම්වලට සම්බන්ධයක් නොමැති පුද්ගලයින් නිරීක්ෂණ කටයුතු සඳහා පත් කිරීමටත්, ස්වාධීනව නිරීක්ෂණ කටයුතු කිරීමටත් අවශ්‍ය උපදෙස් නිරීක්ෂණයේ යොදවනු ලබන පුද්ගලයන්ට ලබාදෙන ලෙසත්, නිරීක්ෂණ සංවිධානවල ප්‍රධානීන්ට දන්වන ලද අතර, එසේ ක්‍රියා කිරීමට අපොහොසත්වන සංවිධාන නිරීක්ෂණ කටයුතුවලින් ඉවත් කිරීමට සිදුවන බවද වැඩිදුරටත් අවධාරණය කරන ලදී. නිරීක්ෂණ කටයුතු සඳහා දිස්ත්‍රික් මට්ටමින් යෙදවීමට බලාපොරොත්තු වන නිරීක්ෂකයන්ගේ නම් ලැයිස්තු ඡන්ද විමසීම් දිනට අවම වශයෙන් සතියකට පෙර නිරීක්ෂණයේ යෙදෙන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමිෂන්සභා වෙත ලබාදෙන ලෙසත්, එසේ නොමැති වුවහොත් අදාළ නිරීක්ෂකයන්ගේ විස්තර ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත කල්වේලා ඇතිව ලබාදීමට නොහැකි වීමෙන් ගැටලු ඇතිවිය හැකි බවත් නිරීක්ෂණ සංවිධාන වෙත දන්වන ලදී. ඡන්ද විමසීම් දින ඡන්ද පොළ ස්ථානික නිරීක්ෂණ කටයුතුවලින් පසුව ඡන්ද විමසීමට අදාළව ඔවුන්ගේ නිරීක්ෂණ සටහන් තබා පවත්වා ගෙන යන ලද වාර්තාව ඡන්ද විමසීම අවසන් වූ වහාම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලබාගැනීමට කටයුතු කරන ලදි.

මීට අමතරව තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානවලට තම නිරීක්ෂකයන් යෙදවීමට නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය හා ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ

මධ්‍යස්ථානය යන සංවිධානවලට අවස්ථාව ලබාදෙන ලදී.

මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී ද, දේශීය නිරීක්ෂණ ආයතනවලට ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද අවස්ථාව සලසා දෙන ලදී. ඡන්ද ගණන් කිරීමේදී නොයෙකුත් දූෂණ අක්‍රමිකතා සිදුවන බවට දේශපාලන පක්ෂ හා වෙනත් සංවිධාන දරන දුර්මත දුරුකරලීම ද අරමුණු කර ගනිමින් ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණයෙහි යෙදුනු ආකාරයටම ඡන්ද ගණන් කිරීමේ කටයුතු ඡන්ද ගණන් කිරීමේ ශාලා තුළ ස්ථානගත නියෝජිතයින් රඳවමින් නිරීක්ෂණයට ද නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFEREL) හා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය. (CMEV) යන නිරීක්ෂණ සංවිධානවලට අවසරය ලබාදෙන ලදී.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) හා යන නිරීක්ෂණ සංවිධාන තම දේශීය නිරීක්ෂකයන්ට අමතරව, වෙනත් රටවල් කිහිපයක විදේශීය නිරීක්ෂකයන් ද යොදවමින් තම නිරීක්ෂණ කටයුතු පුළුල්ව සිදු කරන ලද අතර ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ද ලබාගෙන තිබුණි.

8.16.2 විදේශීය නිරීක්ෂණ සංවිධාන

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පිළිබඳ ප්‍රකාශය පළ කිරීමෙන් පසුව, ඡන්ද විමසීමේ දී තරග කිරීමට අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී 2019.10.09 වන දින පැවති රැස්වීමේ දී ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා විදේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වල සහාය ලබා ගැනීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබන බව දැනුම් දෙන ලදී. ඒ අනුව ආසියාතික මැතිවරණ බලධාරින්ගේ සංගමයේ (AAEA) සභාපතිවරයා වෙත ද, දකුණු ආසියාතික මැතිවරණ බලධාරින්ගේ සංසදයේ (FEMBoSA) සභාපතිවරයා වෙත සහ දකුණු අප්‍රිකානු මානව හිමිකම් පදනමට ද 2019.11.16 වන දින පැවැත්වෙන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයන් යොදවන ලෙස ආරාධනා කරන ලදී. එමෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයීය (The Commonwealth) මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් හා යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් සඳහා ද ඇරයුම් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. එම ආරාධනය අනුව අදාළ සංවිධානවල නිරීක්ෂක කණ්ඩායම් මෙම ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය සඳහා සහභාගී වන ලදී. මෙම නිරීක්ෂකයන් මුළු දිවයිනම ආවරණය වන පරිදි සියලුම දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය සඳහා කටයුතු කරන ලදී.

තවද භූතානය, බංග්ලාදේශය හා මාලදිවයින යන රටවල මැතිවරණ ආයතනවල ප්‍රධානියකු ද ඇතුළත් අධ්‍යයන කණ්ඩායමක් දිස්ත්‍රික්ක හතක දී ඡන්ද විමසීම් පැවැත්වීම පිළිබඳව අධ්‍යයන වැඩසටහනක් සඳහා සහභාගී වන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ආසියාතික මැතිවරණ බලධාරින්ගේ සංගමය (AAEA) සහ දකුණු ආසියාතික මැතිවරණ කළමණාකරණ ආයතන සංසදය (FEMBoSA) යන සංවිධානවල නිරීක්ෂකයන් සෘජුවම සම්බන්ධීකරණය කරන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය (Commonwealth) නිරීක්ෂණ කණ්ඩායම හා යුරෝපා සංගම් නිරීක්ෂණ කණ්ඩායම සෘජුවම ඒ ඒ දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කර ඔවුන්ගේ තොරතුරු තේරීම්භාර නිලධාරීන් වෙත දන්වන ලදී. නිරීක්ෂණ

කටයුතුවලදී ඔවුන්ට අවශ්‍ය වන තොරතුරු ලබාදීම සඳහා පමණක් මැතිවරණ කොමිෂන් සභාව මැදිහත් විය. තවද අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්ක තුළ ඡන්ද විමසීම් හා ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ඕනෑම ස්ථානයකට යාමට ද ඔවුන්ට අවසර දෙන ලදී. නාමයෝජනා භාරගැනීමේ කටයුතුවලින් පසුව 2019.11.16 වන දින දක්වා වූ කාලය තුළ ඉහත කී නිරීක්ෂණ සංවිධානවල විදේශීය නිරීක්ෂකයින් 50 දෙනෙක් පමණ විවිධ අවස්ථාවලදී දිවයිනට පැමිණ නිරීක්ෂණ කටයුතුවලට සහභාගී වූහ.

ඡන්ද විමසීමේ නිරීක්ෂණ කටයුතු සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක වෙත යොමු කරන ලද පොදු රාජ්‍ය මණ්ඩලයේ සහ යුරෝපා සංගමයේ නිරීක්ෂකයින් නොවන සෙසු විදේශීය නිරීක්ෂකයින්ට සහාය වීම සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් මෙන්ම අදාළ දිස්ත්‍රික්කවලින් ද සම්බන්ධීකරණ නිලධාරීන් පත්කළ අතර, ඔවුන් දිස්ත්‍රික්කය තුළ රැඳී සිටීමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන නිරීක්ෂකයන්ට හා සම්බන්ධීකරණ නිලධාරීන්ට නවාතැන් පහසුකම්ද සැලසීමට තේරීම්භාර නිලධාරීන් උපදෙස් දෙන ලදී. විදේශීය නිරීක්ෂකයන් ඒ ඒ දිස්ත්‍රික්කයන් හි තේරීම්භාර නිලධාරීන් වෙත වාර්තා කිරීමෙන් පසුව ඔවුන්ට නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හමුවී මැතිවරණ සංවිධාන කටයුතු ගැන සාකච්ඡා කර දේශපාලන පක්ෂ බලයලත් නියෝජිතයින්, දේශීය නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින් මෙන්ම පොලිසිය සමග සාකච්ඡා කිරීමටත් අවස්ථාව සලසා දෙන ලෙස තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලයේ හා යුරෝපා සංගමයේ නිරීක්ෂණ කණ්ඩායම්වලට මෙම නිරීක්ෂණ කටයුතු සඳහා වන සියලු වියදම් එම සංවිධාන විසින්ම දරන ලදී. එබැවින් එම නිරීක්ෂණ සංවිධාන මගින් කරන ලද ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය සඳහා අවශ්‍ය වූ සම්බන්ධීකරණ කාර්ය පමණක් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉටු කරන ලදී.

සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී 2019.10.31 දින හා 2019.11.01 යන දෙදින තුළ සිදු කරන ලද තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහාද විදේශීය නිරීක්ෂකයන් සහභාගි වූ අතර 2019.11.16 වන දින ඡන්ද පොළවල් තුළ ඡන්ද විමසීම සිදු කෙරෙන ආකාරය නිරීක්ෂණයට මෙන්ම ඡන්ද පත්‍රිකා ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහාද ඔවුන්ට අවස්ථාව සලසා දෙන ලදී.

දේශීය මෙන්ම විදේශීය නිරීක්ෂකයින්ගේ නිරීක්ෂණ වාර්තාවල පොදු මතය වූයේ 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සමස්තයක් වශයෙන් ගත්කළ සාමකාමී සහ සාධාරණ ඡන්ද විමසිමක් ලෙස පැවැත්වුන බවය. සුළු සිද්ධි කීපයක් වාර්තා වුවද පෙර ඡන්ද විමසීම් ද සමග සසඳා බලන විට 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම අගය කළ හැකි මට්ටමේ පැවති ඡන්ද විමසීමක් ලෙස වාර්තා කර තිබීම සතුටට කරුණකි.

නවවන පරිච්ඡේදය

ඡන්ද පත්‍රිකා ගණන් කිරීම හා ප්‍රතිඵල වගුගත කිරීම

9. ඡන්ද පත්‍රිකා ගණන් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ ඡන්ද ගණන් කිරීමේ කටයුතු පනතේ විධිවිධානවලට අනුකූලව 2019.11.16 වන දින ඡන්ද විමසීමේ කටයුතු අවසන් කර ඡන්ද පෙට්ටි ඒ ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටි පරිශ්‍රවලට ගෙන ඒමෙන් පසුව සිදු කරන ලදී. ඒ අනුව සියලුම දිස්ත්‍රික්කවල ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍ර 43 ක් ද මධ්‍යස්ථාන සංඛ්‍යාව 1550ක් ද විය. ඉන් 1179 ක් සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සඳහාද, 371 ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ සඳහා ද වෙන් කරන ලදී. එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද ගණන් කිරීමේ මධ්‍යස්ථාන හා ගණන් කිරීමේ පරිශ්‍ර පිළිබඳ විස්තරය පිළිවෙලින් සංඛ්‍යා සටහන් 05 සහ 06 වශයෙන් දක්වා ඇත. ගණන් කිරීම භාරව එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියෙකු (CCO), සහකාර තේරීම්භාර නිලධාරීන් හා ගණන් කිරීමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් ප්‍රමාණවත් පරිදි යොදවා තිබිණි. ගණන් කිරීමේ කටයුතුවල නිරවද්‍යතාව තහවුරු කරනු පිණිස පරීක්ෂණය, සුපරීක්ෂණය හා අභිඥ පරීක්ෂණය ද එම කටයුතු අධීක්ෂණය කිරීම ද එක් එක් නිලධාරී කණ්ඩායම් විසින් සිදු කරන ලදී. තවද මෙම කටයුතු අපේක්ෂකයින්ගේ ඉල්ලීම පරිදි පත්කරන ලද ගණන් කිරීමේ නියෝජිතයින්ගේ නිරීක්ෂණයට ද භාජනය කිරීම තුළින් ගණන් කිරීමේ කටයුතු සාධාරණව හා විධිමත්ව සිදු කළ බව තහවුරු කිරීමට හැකි විය.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ 1981 අංක 15 දරන පනතේ 47 සිට 59 දක්වා වන වගන්තිවල ඡන්ද පත්‍රිකා ගණන් කිරීමට අදාළව හා එම පනතේ දෙවන උපලේඛනයෙහි 18 සිට 28 දක්වා වූ නියෝගවල තැපැල් ඡන්ද ගණන් කිරීම පිළිබඳ කරුණු ද සඳහන් වේ. එම පනතේ 47 වන වගන්තියට අනුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීමෙන් පසු එහි ප්‍රතිඵලය, ඡන්ද විමසීමට අදාළ සමස්ත ප්‍රතිඵලය සකස් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු වේ.

9.1 ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන

තේරීම්භාර නිලධාරීන් විසින්, ඡන්ද ගණන් කිරීමේ කාර්ය සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම, ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය පත් කිරීමට අදාළ කටයුතු සිදු කිරීමත්, ඡන්ද ගණන් කිරීමේ දිනය සහ වේලාව, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල පිහිටීම හා ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටිය හැකි නියෝජිතයින් සම්බන්ධයෙන් තරග කරනු ලබන අපේක්ෂකයන් දැනුම්වත් කිරීම ද කළ යුතු වේ. එක් ඡන්ද ප්‍රදේශයකට අයත් ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක ඡන්ද පත්‍රිකා, එක් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයකදී ගණන් කිරීම සිදුකළ හැකි ආකාරයට එම මධ්‍යස්ථාන සැලසුම් කරනු ලැබේ. මෙම ඡන්ද විමසීමේ දී සාමාන්‍යයෙන් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් වෙනුවෙන් ලියාපදිංචි ඡන්ද හිමියන් 7,500 සිට 10,000ක් පමණ වන සේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සැලසුම් කරන ලදී. තැපැල් ඡන්ද පැකැට්ටු 1500 – 2500 පමණ දක්වා වූ ප්‍රමාණයකට, එක් තැපැල්ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් ද වන ලෙස ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට උපදෙස් ලබාදෙන ලදී. මැතිවරණ කොට්ඨාසයේ සියලුම ඡන්ද ප්‍රදේශවලට අයත් ඡන්ද මධ්‍යස්ථානවල දී ප්‍රකාශ කරන ලද ඡන්ද පත්‍රිකා අඩංගු ඡන්ද පෙට්ටි සහ මුද්‍රා තබා ආපසු භාරදෙන කවර ආදි අනෙකුත් බඩු බාහිරාදිය නිසි පරිදි භාරගැනීමෙන් පසු, එම ඡන්ද පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා සහ තැපැල් ඡන්ද කවර තුළ ඇති

තැපැල් ඡන්ද පත්‍රිකා ද ඒ ඒ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලදී අපේක්ෂකයින්ගේ නියෝජිතයින් ඉදිරියේ ගණන් කිරීම සිදුකොට එක් එක් අපේක්ෂකයා එක් එක් ඡන්ද ප්‍රදේශයෙන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව හා එක් එක් අපේක්ෂකයා මැතිවරණ කොට්ඨාසයෙන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම, තේරීම්භාර නිලධරයාගේ ප්‍රධාන කාර්යය විය.

ගණන් කිරීමේ මධ්‍යස්ථානවල වර්ග ප්‍රමාණය හා ඒවායේ ඇති පහසුකම් අනුව හා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස්වල දක්වා ඇති කරුණු හා මෙම ඡන්ද විමසීමේ දී ඡන්ද පත්‍රිකාව විශාල වීම යන කරුණු පිළිබඳව සැලකිලිමත් වී ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු කරන ලදී. එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් තුළ කාර්ය මණ්ඩලය 30 – 40 අතර වූ සංඛ්‍යාවකට හා පනතේ විධිවිධාන අනුව අපේක්ෂකයින්ගේ නියෝජිතයින් 70 කට පමණ පහසුකම් සැලසීමටත් සිදුවන බැවින්, ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍ර තුළ ප්‍රමාණවත් ඉඩපහසුකම් සහිත සුදුසු ශාලා නොමැතිවීම තේරීම්භාර නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් මුහුණපාන ලද ප්‍රධාන ගැටලුවක් විය. තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි ඇතුළු නිලධාරීන් 15 ක් පමණ යෙදවීමට ද උපදෙස් දෙන ලදි. ඉහත සඳහන් කරන ලද ප්‍රායෝගික ගැටලු හේතුවෙන් බොහෝ අවස්ථාවල දී මැතිවරණ කොට්ඨාසයක ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සියල්ල එක් පරිශ්‍රයක පිහිටුවීමට නොහැකි විය. එබැවින් එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා පරිශ්‍ර කිහිපයක දී ඡන්ද ගණන් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඡන්ද ගණන් කිරීමෙන් පසු ලැබෙන ප්‍රතිඵල වගුගත කිරීම සඳහා යොදාගන්නා මධ්‍යස්ථානය ද හැකි සෑම අවස්ථාවකදීම ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රය තුළ පිහිටුවීමට කටයුතු කරන ලද අතර, ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් සමහර දිස්ත්‍රික්කවල ප්‍රතිඵල වගුගත කිරීමේ කාර්යය ඒ සඳහා පමණක් තෝරාගත් වෙනත් ස්ථානයක දී සිදු කරන ලදී.

9.2 ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා නියෝජිතයින් පත්කිරීම

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ නියමයන්ට අනුව එක් එක් අපේක්ෂකයා වෙනුවෙන්, තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට නියෝජිතයින් දෙදෙනෙකු බැගින් හා සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට නියෝජිතයින් පස්දෙනෙකු බැගින් පත් කිරීමට අවස්ථාව සැලසිය යුතුය. ඒ අනුව ඡන්ද විමසීමට පෙර, අපේක්ෂකයින්ට තම ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් පත්කර ගැනීමට හැකිවන පරිදි තේරීම්භාර නිලධාරීන් විසින් ඒ ඒ දිස්ත්‍රික්කයට අදාළ ගණන් කිරීමේ මධ්‍යස්ථානවල පිහිටීම, ඒවාට ඡන්ද මධ්‍යස්ථාන (ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාවද සමග) අනුයුක්ත කර ඇති ආකාරය හා ඒවා වෙනුවෙන් පත්කළ හැකි නියෝජිත සංඛ්‍යාව ද ඇතුළු අදාළ විස්තර සියලුම ඡන්ද නියෝජිතයන් හා බලයලත් නියෝජිතයින් වෙත ලිපියකින් දන්වා යවන ලදී. එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පත් කිරීමට බලාපොරොත්තු වන නියෝජිතයින්ගේ විස්තර තේරීම්භාර නිලධාරි වෙත භාරදිය යුතු දිනය මෙන්ම ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට ඇතුළුවීමේ අවසර පත්‍ර හා පත්වීම් ලිපි ලබාගැනීම සඳහා පැමිණිය යුතු දිනය හා ඒවා නිකුත් කරනු ලබන ස්ථානය ද එම දැනුම් දීමේ ලිපියේම සඳහන් කර යවන ලදී. එම විධිමත් අවසරය ලබාගත් නියෝජිතයන්ට ඡන්ද විමසීම් දින පස්වරුවේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට සෘජුවම වාර්තා කිරීමට ද උපදෙස් දී තිබිණි. ඡන්ද ගණන් කිරීමේදී යම් යම් අක්‍රමිකතා සිදුවේයැයි යන උපකල්පනය මත අපේක්ෂකයින්ට නීතිය අනුව ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා පත්කළ හැකි නියෝජිත ප්‍රමාණයට වඩා තවත් නියෝජිතයින්

පත් කර ගැනීමට අවස්ථාව සැලසිය යුතු බවට දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමග පැවති රැස්වීම්වලදී මෙන්ම, පක්ෂවල නිත්‍ය නියෝජිත යින් සහභාගී වූ රැස්වීම්වලදී ද ඉල්ලීම් ඉදිරිපත් විය. එවැනි ඉල්ලීම් සලකා බලා, අපේක්ෂකයකු වෙනුවෙන් තවත් නියෝජිතයකුට ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටි පරිශ්‍රයට ඇතුළු වී පරිශ්‍රයේ සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවල කටයුතු ඒවායේ පිටත සිට නිරීක්ෂණයට අවස්ථාව සලසන ලදී. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මෙවර ද එක් එක් අපේක්ෂකයා නියෝජනය කරමින් එක් ගණන් කිරීමේ නියෝජිතයෙකුට ඡන්ද විමසීම් දින පස්වරු 3.00ට ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පැමිණ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් බඩු බාහිරාදිය ආපසු භාරදීමේ කටයුතු එහිම රැඳී සිට නිරීක්ෂණයට අවස්ථාව සලසන ලදී. ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ඉල්ලීමක් කරන එක් අපේක්ෂකයෙකුගේ එක් ඡන්ද පොළ නියෝජිතයකුට ඡන්ද මධ්‍යස්ථානයේ සිට ඡන්ද පෙට්ටි රැගෙන එන වාහනය පිටුපසින් ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රයට පිවිසෙන ස්ථානය දක්වා තමන්ගේ වාහනයකින් එම කාර්ය නිරීක්ෂණය කරමින් පැමිණීම සඳහා අවසර ලබාදෙන ලදී. තවද පරිශ්‍රයේ නියමිත ස්ථානයක සිට ගණන් කිරීමේ මධ්‍යස්ථානය දක්වාම එම කටයුතු නිරීක්ෂණය කරමින් රැඳී සිටීමට ද නියෝජිතයෙකුට අවස්ථාව සලසන ලදී. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන්ගේ කාර්ය භාරය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් උපදෙස් මාලාවක් ද නිකුත් කරන ලදී.

ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් රැගෙන එන ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ආරක්ෂිත දෑ මෙම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට භාර ගැනීමට ඒ ඒ පරිශ්‍රයට ගැළපෙන විධිමත් වැඩපිළිවෙලක් තේරීම්භාර නිලධාරීන් විසින් සූදානම් කොට තිබුණි. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙතින් භාරගනු ලබන බඩු බාහිරාදිය අතුරින්, ඡන්ද පත්‍රිකා අඩංගු ඡන්ද පෙට්ටිය හා ඡන්ද ගණන් කිරීම සඳහා අවශ්‍යවන ලිපි ලේඛන ඒ වන විටත් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පැමිණ සිටින ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරිට භාරදීමටත්, සෙසු දෑ මළුවල බහා ශාලාව තුළ ආරක්ෂිතව වෙන්කර තබා, ඡන්ද ගණන් කිරීම අවසන් වීමෙන් පසුව ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා ද ගණන් කිරීමට අදාළ ලේඛන ද සමග සුරක්ෂිතාගාරයේ තැන්පත් කිරීම සඳහා තේරීම්භාර නිලධාරි වෙත භාරදිය යුතු බවටත් බඩු බාහිරාදිය ආපසු භාරගැනීමේ කටයුතු භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දී තිබිණි. ඡන්ද පෙට්ටි සහ අනෙකුත් බඩු බාහිරාදිය භාරගන්නා මධ්‍යස්ථාන ගණන් කිරීමේ පරිශ්‍ර මෙන්ම ඉන් බැහැර ආසන්න ප්‍රදේශවල ආරක්ෂාව සහතික කිරීම, ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු විය.

9.3 ඡන්ද ගණන් කිරීම සඳහා කාර්ය මණ්ඩලය

ඡන්ද ගණන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී, සහකාර තේරීම්භාර නිලධාරී, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, ලිපිකරු හා සහායක කාර්ය මණ්ඩලය බොහෝ විට දිස්ත්‍රික්කයේ රජයේ සේවකයන්ගෙන් පත්කරන ලද අතර දිස්ත්‍රික්ක කිහිපයකට ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් මෙන්ම සහකාර තේරීම්භාර නිලධාරීන් ද මැතිවරණ මහලේකම් කාර්යාලයේ සංචිතයෙන් ලබාදෙන ලදී. එලෙස අනුයුක්ත කළ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුළු සෙසු සහකාර තේරීම්භාර නිලධාරීන්, සඳහා අදාළ රාජකාරි සම්බන්ධයෙන් වන පුහුණු සැසි රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රධාන ශ්‍රවනාගාරයේදී මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වන ලදී. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවලදී පැවැත්වූ පුහුණු පංතිවලදී ඡන්ද ගණන් කිරීමේ කාර්ය සම්බන්ධයෙන් ද ඔවුන් දැනුම්වත් කළ අතර, අනෙකුත් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි විසින් ඡන්ද ගණන් කිරීම, ආරම්භ කිරීමට පෙර කළ යුතු බවට උපදෙස් දෙන ලදී.

සෑම දිස්ත්‍රික්කයකම සුබසාධන කටයුතු භාර සහකාර තේරීම්භාර නිලධාරී ලෙස දිස්ත්‍රික්කයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබිණ. ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා සුබ සාධන පහසුකම් සැපයීමේ වගකීම ඒ ඒ තේරීම්භාර නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද පොදු උපදෙස් අනුව සුබසාධන කටයුතු භාර සහකාර තේරීම්භාර නිලධාරී විසින් සංවිධානය කරන ලදී.

9.4 ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ විය යුතු මූලික කොන්දේසි

ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ සියලුම ඡන්ද පෙට්ටි ලැබී ඇතිනම්, ඡන්ද පොළ භාරව කටයුතු කරන ලද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් භාරදී ඇති ඡන්ද පොළ කලබල පිළිබඳ වාර්තාව (Z - වාර්තාව) විවෘත කර එහි ඇතුළත් තොරතුරු ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි (ZCCO) වාර්තාවේ සටහන් කර තේරීම්භාර නිලධාරි වෙත දන්වා යවා, ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට අවසර ලබාගත යුතු විය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම Z වාර්තාව මගින් ඡන්ද මධ්‍යස්ථානය තුළ නිදහස්ව හා සාධාරණව ඡන්දය පැවැත්වීමට අවශ්‍ය වාතාවරණයක් නොවූ බව වාර්තා කර තිබුණේ නම්, එම මධ්‍යස්ථානයට අදාළව, ඡන්ද පොළ තුළ රැඳී සිටි පොලිස් නිලධාරීන්, ඡන්දපොළ නියෝජිතයින් හා ඡන්ද පොළ නිරීක්ෂකයින්ගේ වාර්තා මෙන්ම ඡන්දපොළට අදාළ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරියාගේ වාර්තාවද පරීක්ෂා කර බලා ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් කරුණු තවදුරටත් තහවුරු කර ගැනීමට උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අපේක්ෂකයින්ගේ නියෝජිතයින් පැමිණ නොසිටියේ නම්, ගණන් කිරීමේ ශාලාව අවට ඔවුන් රැඳී සිටින්නේදැයි විමසා බලන ලෙස උපදෙස් ලබා දී තිබූ අතර, ඡන්ද ගණන් කිරීම් ආරම්භ කිරීමට සූදානම්ව ඒ බව පරිශ්‍රයේ රැඳිසිටින සියලු දෙනාට ඇසෙන සේ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීමට වැඩපිළිවෙලක් යොදා තිබිණි. ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා පහත සඳහන් මූලික කොන්දේසි ඉටුවී තිබිය යුතුය.

- ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද පෙට්ටි හා අනෙකුත් රහස්‍ය ලේඛන භාර දී තිබීම.
- අපේක්ෂකයින් වෙත දන්වනු ලැබූ ඡන්ද ගණන් කිරීම ඇරඹීමේ වේලාව ඉක්ම ගොස් තිබීම.
- ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ ඡන්ද පොළවලදී ඡන්ද විමසීමට බාධා ඇති නොවූ බවට හා නීති විරෝධී ක්‍රියා සිදු වී නොමැති බවට සැහීමකට පත්වීමෙන් පසුව ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා තේරීම්භාර නිලධාරිගේ නියෝගය ලැබී තිබීම.

වාර්තා පරීක්ෂා කිරීමේදී හා ලැබී ඇති පැමිණිලි මගින් අදාළ ඡන්ද පොළේ කටයුතුවලට බාධාවක් සිදුවී ඇති බවට පෙනීගියහොත්, ඒ බව තේරීම්භාර නිලධාරි විසින් මැතිවරණ කොමිෂන් සභාවට වාර්තා කළ යුතු විය. අදාළ වාර්තා මෙන්ම මැතිවරණ කොමිෂන් සභාව වෙත ඒ සිද්ධීන් පිළිබඳව පැමිණිලි ලැබී ඇත්නම් ඒවා ද, ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, පොලිස් නිලධාරීන් හා කලාපභාර තේරීම්භාර නිලධාරිගෙන් වාර්තා ද ලබාගෙන ඒ අනුව ඡන්ද පොළේ ඡන්ද ගණන් කළ යුතු ද නැත්ද යන්න මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරනු ඇත. ඡන්ද පත්‍රිකා පැහැර ගැනීම, බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ලබාගෙන ඒවා ලකුණු කොට ඡන්ද පෙට්ටියට බහාලීම, නියමිත වෙලාවට ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වීම, නියමිත කාල සීමාවට පෙර ඡන්ද විමසීම අවසන් කිරීමට සිදුවීම,

නියෝජිතයින්ට හා කාර්ය මණ්ඩලයට බලපෑම් සිදු කිරීම වැනි බාධා සිදුව ඇති බව තහවුරු වුවහොත් එම ඡන්ද පොළේ ඡන්ද විමසීම ශූන්‍ය කොට නැවත ඡන්ද විමසීමක් පැවැත්වීමේ තීරණය ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට බලය ඇත. මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව දිවයිනේ කිසිදු ඡන්ද පොළකින් එවැනි තත්ත්වයක් වාර්තා නොවුණි.

9.5 ඡන්ද ගණන් කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමකදී ඡන්ද ගණන් කිරීම අදියර තුනකින් සමන්විත වේ. එම අදියර පහත සඳහන් පරිදි වේ.

පළමුවන අදියර - මේ යටතේ එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණනය කර නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව ඡන්ද පත්‍රිකා ධාරකයේ තැන්පත් කිරීම සිදු කෙරේ.

දෙවන අදියර - දෙවන අදියරේ කටයුතු උප අදියර දෙකකින් සමන්විත වේ. පළමුවන උප අදියර යටතේ ධාරකයේ ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මේසයට ගෙන, සම්පූර්ණ කාර්ය මණ්ඩලය යොදවා ඡන්ද පත්‍රිකා සලකුණු කොට ඇති ආකාරය අනුව, එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සලකුණු කොට ඇති ඡන්ද පත්‍රිකා ඒ ඒ අපේක්ෂකයාට අදාළ පෙට්ටි වලට බහාලීම හා අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි වෙත යොමු කිරීම සිදු කෙරේ.

දෙවන උප අදියර යටතේ ගණන් කිරීමේ මේසයේ නිලධාරීන්, තේරීමේ කණ්ඩායම, ගණන් කිරීමේ කණ්ඩායම, පරික්ෂා කිරීමේ කණ්ඩායම, නැවත පරික්ෂා කිරීමේ කණ්ඩායම හා අභියූ පරික්ෂණ කණ්ඩායම ලෙස කණ්ඩායම් පහක් වශයෙන් බෙදා අදාළ කටයුතු පැවරීම සිදු කෙරේ. නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන් ගන්වා ගණන් කිරීම හා පරික්ෂාව සිදුකරනු ලැබේ. මෙහිදී එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් දැනටමත් පළමුවන උප අදියර යටතේ තෝරා ඇති ඡන්ද පත්‍රිකා අඩංගු පෙට්ටිය රැගෙන ඒවා ඉහත කී කාණ්ඩ පහ යටතේ නැවත ගණන් කිරීම හා පරීක්ෂාව සිදු කරනු ලැබේ.

ඡන්ද ගණන් කිරීමේ දෙවන අදියර අවසානයේදී එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි විසින් තේරීම්භාර නිලධාරි වෙත වාර්තා කළ යුතු ය. මෙම ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් එක් එක් පක්ෂය නියෝජනය කරමින් ප්‍රතිඵල ලේඛනයේ අත්සන් කරනු ලැබූ නියෝජිතයා වෙත භාරදීමද සිදු කෙරේ. මේ නිසා තම නියෝජිතයා මගින් අපේක්ෂකයින්ට ද ප්‍රතිඵල සටහන් කර ගැනීමට අවස්ථාවක් උදාවූ අතර ඒවා තේරීම්භාර නිලධාරීගේ ප්‍රතිඵලය සමග සසඳා බැලීමට හැකිවීම නිසා ප්‍රතිඵල සම්බන්ධව නියෝජිතයින්ගේ හා අපේක්ෂකයින්ගේ විශ්වාසය තහවුරු කර ගැනීමට හැකි විය. එක් එක් ගණන් කිරීමේ පරිශ්‍රය තුළදී තම නියෝජිතයින් මාර්ගයෙන් ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ලැබෙන ප්‍රතිඵල ලේඛන අනුව ප්‍රතිඵලය සකස්කර ගැනීම සඳහා එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ලැප්ටොප් පරිගණකයක් ද සමග එක් ගණන් කිරීමේ පරිශ්‍රයක නියෝජිතයින් දෙදෙනකු රඳවා තැබීමට අවසරය ලබාදී තිබුණි. තේරීම්භාර නිලධාරින් විසින් ගණන් කිරීමේ පරිශ්‍ර තුළ ඒ සඳහා වෙන් කරන ලද ස්ථානයන්හි අවශ්‍ය පහසුකම් සූදානම් කර තිබුණි.

තුන්වන අදියර - මේ යටතේ අවශ්‍ය බහුතරය නොමැතිවීම හේතු කොටගෙන අවශ්‍යතාව පරිදි මනාප ගණන් කිරීම සිදුකරනු ලැබේ. දිවයිනේ ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% කට වැඩි සංඛ්‍යාවක් කිසිදු අපේක්ෂකයෙකු ලබාගෙන නොමැති විටක, වැඩිම හා ඊළඟට වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයින් දෙදෙනා හැර, සෙසු අපේක්ෂකයින්ට අදාළ ඡන්ද පත්‍රිකා වලින්

වැඩිම ඡන්ද ලබාගන්නා ලද අපේක්ෂකයින් දෙදෙනාගෙන් එක් අයෙකුගේ වාසියට සලකුණු කර ඇති දෙවන හෝ තුන්වන මනාප ගණන් බැලීම මෙහිදී සිදුවේ. වෙනත් ඡන්ද විමසීම්වල මනාප ගණන් කිරීම මෙන් ජනාධිපතිවරණයට අදාළ මනාප ගණන් කිරීම සංකීර්ණ නොවන අතර එම මනාප විස්තර වෙනත් ආකෘති පත්‍රවල සලකුණු කිරීමකින් තොරව ඡන්ද පත්‍රිකා අනුවම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් මෙතෙක් පවත්වනු ලැබූ කිසිදු ජනාධිපතිවරණ ඡන්ද විමසීමකදී ජනාධිපතිවරයා තෝරාගැනීම සඳහා මනාප ගණන් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගිණි. එසේ වුවද ඡන්ද විමසීමේදී දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා එක් අපේක්ෂකයකු ලබාගෙන ඇත්ද යන්න නිශ්චය කරගැනීමට හැකි වනුයේ, ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ප්‍රතිඵල තේරීම්භාර නිලධාරීන් වෙත ලැබීමෙන් පසු ඒ ඒ තේරීම්භාර නිලධාරීන් විසින් එම ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමෙන් පසුව පමණි. මේ සඳහා යම් කාලයක් ගතවන බැවින් ඡන්ද ගණන් කිරීමට අදාළ මුල් පියවරේ කටයුතු වේලාසනින් අවසන් කළ ගණන් කිරීමේ මධ්‍යස්ථානවල නිලධාරීන් වුවද රාජකාරියෙන් නිදහස් කිරීමට තේරීම්භාර නිලධාරීන්ට මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් ලැබෙන තෙක් සිටිය යුතු වේ.

9.6 ප්‍රතිඵල ගණනය කිරීම හා දිස්ත්‍රික් ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 55 වැනි වගන්තියට අනුව තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන ද ඇතුළුව එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිඵල ලේඛනවලින් ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව තේරීම්භාර නිලධාරි විසින් නිශ්චය කොට, ඒ බවට ප්‍රකාශයක් පිළියෙල කොට නොපමාව මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු විය. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී පනතේ විධිවිධාන අනුව ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම කෙරෙනුයේ එක් මැතිවරණ ප්‍රතිඵලයක් වශයෙනි. පනතේ 64 වැනි වගන්තියට අනුව ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු වේ. මෙම පනතේ ඒ අයුරින් සඳහන් වුවද අවසන් ප්‍රතිඵලය මැතිවරණ කොට්ඨාස ප්‍රතිඵලය මත තීරණය වන බැවින් මැතිවරණ කොට්ටාස මට්ටමින් ද ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරන ලදී.

9.7 ප්‍රතිඵල වගුගත කිරීම

ඡන්ද ගණන් කිරීමේ දී මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක් ප්‍රතිඵලයක් සකස් කර සහතික කිරීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට තේරීම්භාර නිලධාරීන් විසින් කටයුතු කළයුතු වේ. මෙම කාර්ය පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා එක් එක් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙන් ලැබෙන ප්‍රතිඵලය ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන සේ වගුගත කරනු ලැබේ. එලෙස ඡන්ද ප්‍රදේශ අනුව ලැබෙන ප්‍රතිඵල අනුසාරයෙන් මැතිවරණ කොට්ඨාසයේ ප්‍රතිඵලය ලබාගැනීමට හැකිවන පරිදි වගුගත කිරීම ද සිදුවේ. තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ප්‍රතිඵල ද වෙනම වගුගත කර මැතිවරණ කොට්ඨාසයේ සමස්ත තැපැල් ඡන්ද ප්‍රතිඵලය ලබාගනී. ඉන් අනතුරුව මැතිවරණ කොට්ඨාසයේ අවසන් ප්‍රතිඵලය සකස් කරනු ලැබේ. එම ප්‍රතිඵලය නැවත පරීක්ෂා කිරීම්වලින් පසුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ෆැක්ස් පණිවුඩයක් මගින් දන්වා දුරකථනයෙන් ද එම ප්‍රතිඵලය තහවුරු කිරීමට කටයුතු කරන ලදී.

දිස්ත්‍රික් මට්ටමේදී ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සඳහා ස්ථානය තෝරා ගැනීමේදී, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන

සියල්ලටම පහසුවෙන් ළඟාවිය හැකි ආසන්න ස්ථානයක් වීම, ගමනාගමන පහසුකම්, විදුලි ආලෝකය සැපයීම, ආරක්ෂක විධිවිධාන සැලසීම, දුරකථන හා ෆැක්ස් පහසුකම් සැපයීම, අන්තර්ජාල පහසුකම් සැපයීම හා සියලු කටයුතු නිරන්තර අධීක්ෂණයට ලක්කළ හැකි ස්ථානයක් තෝරා ගැනීම යන කරුණු කෙරෙහි තේරීම්භාර නිලධාරිගේ අවධානය යොමු කරවන ලදී. ඡන්ද ගණන් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉතා දුර බැහැර මධ්‍යස්ථාන තෝරා ගැනීමට සිදු වූ අවස්ථාවලදී හැර සෙසු සෑම අවස්ථාවකම ප්‍රතිඵල වගුගත කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව යොදා ගන්නා ලදී. ජාතික මට්ටමේ අවසන් ප්‍රතිඵලය වගුගත කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානය ලෙස පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම මෙවරද මැතිවරණ මහලේකම් කාර්යාලය තෝරාගන්නා ලදී.

මැතිවරණ කොට්ඨාස මට්ටමින් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවක් පිළිබඳව පනතේ සඳහනක් නොමැති බැවින්, ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශය සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරි විසින් තරග කරනු ලබන අපේක්ෂකයින් වෙත දැනුම්දීමක් සිදු කිරීමේ අවශ්‍යතාවක් නොමැති වුවද, මේ සඳහා අපේක්ෂකයින්ගේ නියෝජිතයින්ට සහභාගිවීමට අවස්ථාව අහුරා තැබීම වැරදි ආරංචි පැතිරයාමට හා විවිධ අනුමාන කිරිම්වලට හේතුවිය හැකි බැවින්, ප්‍රතිඵල වගුගත කිරීමේ හා ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානයට දිස්ත්‍රික් බලයලත් නියෝජිතට සහ ඔහු විසින් නම් කරන ලද තවත් එක් අයකුට පැමිණ සිටීමට හැකි බවට දැන්වීමක් කරන ලෙස තේරීම්භාර නිලධාරින්ට උපදෙස් දෙන ලදී. පෙර සඳහන් කළ පරිදිම පනතේ 64 වන වගන්තියට අනුව ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරෙන බැවින්, අවසන් ප්‍රතිඵල ප්‍රකාශ කෙරෙන දිනය, වේලාව, ස්ථානය සහ එම ස්ථානයට තරග කරනු ලබන අපේක්ෂකයන්ට, ඡන්ද නියෝජිතයින්ට සහ එක් එක් අපේක්ෂකයා විසින් තෝරාගත් තවත් එක් තැනැත්තකුට පැමිණිය හැකි බව දන්වමින්, දැන්වීමක් සියලුම අපේක්ෂකයින් හා ඡන්ද නියෝජිතයින් වෙත යවනු ලැබීය. මේ හැර පක්ෂ ලේකම්වරුන් හා පක්ෂ නිත්‍ය නියෝජිතයන් සමග පැවති රැස්වීම්වලදී පැමිණි එකඟතාවට අනුව, අවසන් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානය පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට තරග කරන ලද පක්ෂවල ලේකම්වරුන්ට සහ නිත්‍ය නියෝජිතයන්ගෙන් එක් තැනැත්තකුට පැමිණ සිටීමට ද අවසරය ලබාදෙන ලදී.

9.8 අවසන් ප්‍රතිඵලය ගණනය කිරීම

(අ) අවසන් ප්‍රතිඵලය ගණනය කිරීම මැතිවරණ මහලේකම් කාර්යාලයේදී සිදු කෙරෙන බැවින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රතිඵල වගුගත කිරීමේ කටයුතු නියෝජිතයින්ට වඩාත් ආසන්නව නිරීක්ෂණය කිරීමට හැකිවන ආකාරයේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. දිස්ත්‍රික් මට්ටමේදී ඒ ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ලැබෙන ප්‍රතිඵල වාර්තා වගුගත කිරීමේ සිට මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ ප්‍රතිඵල වගුගත කිරීම තෙක් වූ ක්‍රියාවලිය, සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ නියෝජිතයින් තුළ පැවති සැක සංකා හා වැරදි වැටහීම් දුරුකරලීම සඳහා මාධ්‍යවේදීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා ප්‍රමුඛ දේශපාලනඥයින් මෙම ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ සාකච්ඡාවක් පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවූ අතර, එමගින්, ඡන්ද ගණන් කිරීමේ සිට ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා, චේතනාත්මකව කිසිදු වෙනස්කමක් කළ නොහැකි බව පමණක් නොව, අත්වැරදීමකට හෝ ඉඩක් නොලැබෙන බවට ඒත්තු ගැන්වීමට හැකිවිය.

(ආ) අතින් ප්‍රතිඵල සැකසීමට අමතරව පරිගණකගතව ප්‍රතිඵල ගණනය කිරීම හා

වගුගත කිරීම ලංකා මෘදුකාංග පදනමේ සහාය ඇතිව මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරන ලදී. මේ සඳහා ලංකා මෘදුකාංග පදනමේ පූර්ණ සහයෝගය ලබාදීමට අමතරව තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් පුහුණු කිරීමෙන් ලබාදුන් සහාය ප්‍රතිඵල ගණනය කිරීමේ හා වගුගත කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව පවත්වා ගැනීමට උපකාරී විය. පරිගණක තාක්ෂණය අනුව ප්‍රතිඵල ගණනය කිරීමට අමතරව එක් එක් දිස්ත්‍රික්කයෙන් ලබාගත් ප්‍රතිඵල සාමාන්‍ය ක්‍රමයට (Manual) ගණනය කිරීම සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් යෙදවීම මැතිවරණ දෙපාර්තමේන්තුව පැවති අවධියේ සිටම සිදුවන්නකි. මෙවර ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී ද ප්‍රතිඵල අතින් ගණනය කිරීම සිදු කරන ලද අතර පරිගණක තාක්ෂණික අංශය මගින් ලබාගත් ප්‍රතිඵල අතින් ගණනය කිරීමෙන් ලබාගත් ප්‍රතිඵල සමග සසඳා බලා නිවැරදි බව තහවුරු කරගැනීමෙන් පසුව පමණක් ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරන ලදී.

9.9 අවසන් ප්‍රතිඵලය සැකසීම හා පරීක්ෂා කිරීම

අවසන් ප්‍රතිඵල සැකසුම් කාර්යයේදී, මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී වගුගත කර සකසන දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵල සහ තේරීම්භාර නිලධාරීන් විසින් යොමු කරන ලද ප්‍රතිඵලය ද සමග සංසන්දනය කොට නිරවද්‍යතාව තහවුරු කර ගෙන, මැතිවරණ කොට්ඨාස ප්‍රතිඵලය අනුමත කිරීම කෙරේ. ප්‍රතිඵලවල නිරවද්‍යතාව තවදුරටත් තහවුරු කරගැනීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයේ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් එක් එක් අපේක්ෂකයා ලබාගත් ප්‍රතිඵල දැක්වෙන ලේඛනය ෆැක්ස් පණිවුඩ මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ගෙන්වා ගෙන එය දුරකථනයෙන් ද විමසා නැවත තහවුරු කර ගැනීමට අමතරව, එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (Scan) කිරීමට ද වැඩපිළිවෙලක් ද මෙවර අලුතින් ඇති කරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්කවලින් ෆැක්ස් පණිවුඩ මගින් ලැබෙන එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත් දෙකක් රැගෙන එක් පිටපතක් නිලධාරීන් විසින් අතින් වගුගත කර ප්‍රතිඵල සැකසීමේ අංශයටත්, අනෙක් පිටපත මැතිවරණ මහලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ ඒකකය වෙත පරිගණක වැඩසටහන අනුව ප්‍රතිඵලය සැකසීම සඳහා යොමු කරන ලදී.

එක් එක් තේරීම්භාර නිලධාරීන් වෙත එක් එක් ඡන්ද ප්‍රදේශයේ ගණන් කිරීමේ මධ්‍යස්ථාන මට්ටමින් ලැබෙන එක් එක් අපේක්ෂකයාට දී ඇති ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵල ලේඛනය ප්‍රධාන කාර්යාලයට ෆැක්ස් පණිවුඩ මගින් සහ පරිලෝකනය කර විද්‍යුත් තැපෑල මගින් යොමු කිරීමෙන් අනතුරුව සකස් කරන ලද ඒ ඒ ඡන්ද ප්‍රදේශයට අදාළ ප්‍රතිඵලය තේරීම්භාර නිලධාරි විසින් මැතිවරණ කොට්ඨාසයේ ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථානයේ දී සකස් කර එවන ලද අදාළ ඒ ඒ ඡන්ද ප්‍රදේශ මට්ටමේ ප්‍රතිඵලය සමඟ සැසඳීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්ද ප්‍රදේශවල ප්‍රතිඵල හා මැතිවරණ කොට්ඨාසයේ ප්‍රතිඵලය සම්පූර්ණ වූ පසු ඡන්ද ප්‍රදේශය සඳහා සහ මැතිවරණ කොට්ඨාසය සඳහා එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලය ද ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ තැපැල් ඡන්ද ප්‍රතිඵලය ද මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදු කරන ලදී.

තේරීම්භාර නිලධාරීන්ගෙන් ලැබෙන ප්‍රතිඵලයත්, මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රතිඵල සැකසීමේ කාර්ය ඉටු කරන ලද අංශ තුනෙන්ම ලැබෙන ප්‍රතිඵලයත් එම අංශ භාර මාණ්ඩලික නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් සහ පළපුරුදු වෙනත් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීමේ කමිටුව වෙත

ඉදිරිපත් කරන ලදී. එම ප්‍රතිඵල නිවැරදි බවට සැහීමකට පත්වීමෙන් පසුව ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. කෙසේ වෙතත් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලද ප්‍රතිඵලය, නැවත සසඳා බැලීම සඳහා ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාවේ සහායට තවත් ජ්‍යෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් පිරිසක් යොදවනු ලැබූ අතර ඔවුන් විසින් සසඳා බැලීමෙන් පසුව ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව වෙත පිළිගැනීම පිණිස යොමු කරන ලදී.

9.10 නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කොට්ඨාසයේ අවසන් ප්‍රතිඵලය නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසුව, ප්‍රතිඵල සකස් කිරීම අවසන් වූ අනුපිළිවෙළට සහතික කර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත හා ජනමාධ්‍ය වෙත නිකුත් කිරීමට පියවර ගනු ලැබීය. මැතිවරණ කොමිෂන් සභාව විසින් සහතික කරන ලද ප්‍රතිඵලය ෆැක්ස් මගින් පළමුවෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි වෙත ද දෙවනුව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යවනු ලැබිණි. ඡන්ද විමසීමේ ප්‍රතිඵල ඡන්ද ප්‍රදේශ මට්ටමින් හා මැතිවරණ කොට්ඨාස මට්ටමින් නිකුත් කරන ලදී. තැපැල් ඡන්ද ප්‍රතිඵලය නිකුත් කරන ලද්දේ මැතිවරණ කොට්ඨාස මට්ටමිනි. සියලුම දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන වෙත නිල වශයෙන් ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරන ලද්දේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසිනි.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ ප්‍රතිඵල 2019.11.17 වන දින ප.ව. 2.00 ට රාජගිරිය මැතිවරණ මහ ලේකම් කාර්යාලයේදී ප්‍රකාශකරන බව සියලුම අපේක්ෂකයින් වෙත දැනුම් දෙන ලදී. එම අවස්ථාවේ දී පැමිණ සිටින ලෙස ඔවුන්ට ආරාධනා කරන ලදී.

දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22 හි අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් එවන ලද එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති මුළු ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රතිඵලය, මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී පිළියෙල කරන ලද ප්‍රතිඵල ලේඛන ද සමග සසඳා නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව සමස්ත මැතිවරණ කොට්ඨාසවලින් එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව හා ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වන අපේක්ෂකයා කවුරුන් ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කළ යුතු විය. ඒ අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී දෙන ලද මුළු වලංගු ඡන්ද සංඛ්‍යාව වූ 13,252,499යෙන් හරි අඩක් වූ 6,626,250 යන සංඛ්‍යාව ඉක්මවා ඡන්ද 298,005 ක්ද සමග මුළු ඡන්ද 6,924,255 ක් ලබාගෙන තිබූ බැවින්, 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමට අදාළව ද මනාප ගණන් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණ අතර ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 56(2) වගන්තිය යටතේ ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය කරන ලදී. ඒ අනුව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 64(2) වගන්තිය අනුව 2019.11.16 දින පවත්වන ලද ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ හත්වන ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගත් බවට 2019.11.17 දින පස්වරු 2.00 පමණ මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් සභාපතිවරයා විසින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අවස්ථාවට අපේක්ෂක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා මෙන්ම තවත් අපේක්ෂකයින් කිහිප දෙනෙකු සහභාගි විය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කරගත් බවට වූ නිවේදනය 2019.11.17 දින අංක 2149/34 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. මෙය **ඇමුණුම 25** වශයෙන් දක්වා ඇත. මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ ඡන්ද ප්‍රදේශ අනුව එක් එක් අපේක්ෂකයින් විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව අංක 07 දරන සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අතර එක් එක් අපේක්ෂකයා ලබාගන්නා ලද මුළු ඡන්ද සංඛ්‍යාව හා ප්‍රතිශතය අංක 08 දරන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

දහවන පරිච්ඡේදය

ඡන්ද විමසීම සඳහා වියදම් දැරීම

10. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා වියදම්

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම දීපව්‍යාප්තව එක් දිනයක දී සිදු කරන ඡන්ද විමසීමකි. මෙම ඡන්ද විමසීමේ දී ලියාපදිංචි ඡන්ද හිමියන් 15,992,096 දෙනෙකුට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතු විය. ඡන්ද විමසීමක දී මුදල් වැය කළ යුතු ප්‍රධාන කාර්යයන් රාශියකි. කාර්ය මණ්ඩල සඳහා වේතන හා දීමනා, ප්‍රවාහන කටයුතු, සුබ සාධන කටයුතු, මුද්‍රණ කටයුතු, ආරක්ෂක කටයුතු හා වෙනත් පොදු සේවා පවත්වා ගෙන යාම සඳහා ප්‍රමුඛත්වය දී ක්‍රියා කළ යුතුය. ඒ හැර අපේක්ෂකයින් හා ඔවුන්ගේ නියෝජිතයින් සඳහා ද සැලසිය යුතු පහසුකම් සඳහා ද වියදම් දැරීමට සිදුවේ. මෙම සියලු කටයුතු නියමිත පරිදි නිසි වේලාවට ඉටු කරවා ගැනීම සඳහා කටයුතු කිරීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල වියදම් කළමානාකරණය සම්බන්ධයෙන් ද, ගැටලු මතුවන අවස්ථා ද තිබිණි.

කෙසේ වුවද, 2019 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට දැරීමට සිදු වූ මුළු වියදම රුපියල් මිලියන 4,566.2 කි. ඒ අනුව 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අනුව එක් ලියාපදිංචි ඡන්ද හිමියකු වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 286.53 ක් පමණ වේ.

10.1 ඡන්ද විමසීම සඳහා වියදම් දැරීම

ඡන්ද විමසීම් කටයුතු සඳහා දැරිය යුතු වියදම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත සෘජුවම ප්‍රතිපාදන වශයෙන් වෙන්කර දෙනු ලැබේ. මෙලෙස වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් රුපියල් මිලියන 3,066ක් කොමිෂන් සභාව විසින් සෘජුවම දරන ලද වියදම් වූ අතර, සෙසු ප්‍රතිපාදන ඡන්ද විමසීමට අදාළ වියදම් දැරීමට හැකිවන පරිදි ඡන්ද විමසීමට අදාළ අත්‍යවශ්‍ය සේවා සපයන රාජ්‍ය ආයතන වෙත පවරා දෙන ලදී.

10.2 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා දරන ලද සමස්ත වියදමේ වර්ගීකරණය

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම - 2019 සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් දරණ ලද වියදම රු.4,566,224,424.69 කි. එම සමස්ත වියදම පහත සහන් පරිදි වියදමේ ස්වභාවය යටතේ වර්ගීකරණය කර දැක්විය හැකිය.

වියදමේ ස්වභාවය	වැය කළ මුදල රු.	ප්‍රතිශතය
කාර්ය මණ්ඩල වැටුප්, අතිකාල ගමන් වියදම් හා දීමනා ගෙවීම	2,631,006,992.01	57.62%
වාහන කුලී	249,112,817.90	5.46%
ලිපි ද්‍රව්‍ය / කාර්යාලයීය උපකරණ	274,148,233.90	6.00%
ඉන්ධන වියදම්	160,741,596.46	3.52%
ඉදිකිරීම් හා අළුත්වැඩියා වියදම්	104,356,667.28	2.28%
සුභසාධන වියදම්	228,083,081.95	4.99%
මුද්‍රණ වියදම්	397,299,599.35	8.70%
නීති විරෝධී ප්‍රදර්ශන ද්‍රව්‍ය ඉවත් කිරීම	42,215,520.74	0.92%
මුද්දර හා තැපැල් ගාස්තු	1,668,360.35	0.04%
විදුලිය	148,656,590.07	3.26%
ඡන්ද පොළ පහසුකම් හා සේවා සඳහා	195.211,344.48	4.28%
ජලය, දුරකථන ඇතුළු සේවා හා වෙනත් සේවා සඳහා	133,723,620.20	2.93%
එකතුව	**4,566,224,424.69**	**100%**

මේ අනුව ඡන්ද විමසීම සඳහා වියදම් වූ මුළු මුදලින් 57.62% ක ප්‍රමාණයක් වූ වැඩිම ප්‍රතිශතයක් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම් සඳහා දැරීමට සිදුවී ඇති බව පෙන්වා දිය හැකිය. එමෙන්ම සේවා හා වෙනත් වියදම් යටතේ දරා ඇති රුපියල් මිලියන 133.7 න්, රුපියල් මිලියන 17ක් ජලය සැපයීම සඳහා ද රුපියල් මිලියන 12ක් සන්නිවේදන කටයුතු සඳහා ද දරා ඇති වියදම් වේ.

10.3 වෙනත් ආයතන වෙත පවරා දෙන ලද ප්‍රතිපාදන

මෙම ජනාධිපතිවරණයේ දී ආරක්ෂක අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, පොලිස් විශේෂ කාර්ය බලකාය, සිවිල්ආරක්ෂක දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ වෙනත් ආයතන වෙත ප්‍රතිපාදන වෙන්කර දීමෙන් අනතුරුව එම ආයතන විසින් දරන ලද වියදම රුපියල් මිලියන 1500 කි. එය මෙම ඡන්ද විමසීම වෙනුවෙන් වැය කරන ලද සමස්ත වියදම වූ රුපියල් මිලියන 4566.2 න් ප්‍රතිශතයක් වශයෙන් 32.81% කි. ඡන්ද විමසීම් කටයුතු වෙනුවෙන් ඉටු කරනු ලැබූ සේවා සඳහා මැතිවරණ කොමිසන් සභාව විසින් මූල්‍ය ප්‍රතිපාදන පවරා දෙන ලද රජයේ ආයතන පිළිබඳව හා එම ප්‍රතිපාදන යටතේ අදාළ ආයතන විසින් වැය කරන ලද මුදල හා ඒවා සම්පූර්ණ වියදමේ ප්‍රතිශතයක් ලෙස පහත වගුවේ දක්වා ඇත.

මුදල් ප්‍රතිපාදන වෙන්කර දෙන ලද ආයතන	වැය කළ මුදල රු.	සම්පූර්ණ වියදමේ ප්‍රතිශතයක් ලෙස
පොලිස් දෙපාර්තමේන්තුව	659,804,681.73	14.44%
තැපැල් දෙපාර්තමේන්තුව	378,498,292.59	8.28%
මුද්‍රණ දෙපාර්තමේන්තුව	349,885,284.94	7.66%
විශේෂ කාර්ය බලකාය	39,959,462.00	0.87%
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	18,079,057.80	0.39%
පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	10,366,910.88	0.22%
ආරක්ෂක අමාත්‍යාංශය	5,025,771.28	0.11%
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	1,184,010.89	0.02%
වෙනත් ආයතන	37,582.240.69	0.82%
එකතුව	**1,500,385,712.80**	**32.81%**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද සේවා වෙනුවෙන් වියදම රුපියල් මිලියන 349.8කි. එම මුළු වියදමෙන් වැටිබදු සමඟ රුපියල් මිලියන 268ක් (76.6%) වැය වී ඇත්තේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා ය. ඉතිරි මුදල ආකෘති පත්, දැන්වීම්, පෝස්ටර්, පොත් පත් හා ලිපි කවර ආදිය මුද්‍රණය කිරීම සඳහා වූ මුද්‍රණ වියදම් වේ. නිල ඡන්ද දැන්වීම්පත් මුද්‍රණය කිරීම සඳහා පෞද්ගලික ආයතන වෙත රුපියල් මිලියන 36.8 ක් ගෙවා ඇත.

මෙම ඡන්ද විමසීමේ දී පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන් කර දෙන ලද ප්‍රතිපාදන යටතේ දරන ලද වියදම රුපියල් මිලියන 659.8 කි. එම වියදමෙන් රුපියල් මිලියන 341.5 ක් (51.75%) පොලිස් නිලධාරීන් වෙනුවෙන් අදාළ දීමනා ගෙවීම සඳහා ද, මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව මැතිවරණ රාජකාරී සඳහා අවශ්‍ය අමතර වාහන කුලී පදනම යටතේ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 130.1ක් (19.71%) ද, ඡන්ද විමසීම් රාජකාරිවල යෙදවූ වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් රුපියල් මිලියන 44.8ක් (6.78%) ද, නීති විරෝධී දැන්වීම් ඉවත් කිරීම සඳහා වූ වියදම් වශයෙන් රුපියල් මිලියන 42.2 ක් (6.39%) ද ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ සඳහා රුපියල් මිලියන 35.5ක් (5.38%) ද සුභසාධන කටයුතු සඳහා රුපියල් මිලියන 28.9ක් (4.35%) ද ජලය, දුරකථන හා වෙනත් සේවා සඳහා රුපියල් මිලියන 34.1ක් (5.16%) ද මුද්‍රණ වියදම් සඳහා රුපියල් මිලියන 2ක් (0.3%) ද වශයෙන් වැය කර තිබිණි.

ඡන්ද විමසීම් අවස්ථාවලදී තැපැල් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරවා ගතයුතු විශේෂ රාජකාරී කිහිපයක් ද විය. ඒ වෙනුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවට මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම ඡන්ද විමසීමට අදාළව මුදල් ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 378.5ක් පමණ දී තිබුණි. ඉන් රුපියල් මිලියන 365.6ක් (96.59%) සේවක අතිකාල වෙනුවෙන් ද, රුපියල් මිලියන 8.3ක් (2.19%) ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් ද, ඉන්ධන වෙනුවෙන් රුපියල් මිලියන 2.7ක් (0.71%) හා වෙනත් වියදම් සඳහා රුපියල් මිලියන 1.9ක් (0.5%) ද ලෙස ප්‍රධාන වියදම් වශයෙන් දරා ඇත.

ඡන්ද විමසීම සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති අතර ඉදිරි ඡන්ද විමසීම්වලදී වියදම් අවම කර ගැනීම සඳහා සුදුසු විකල්ප ක්‍රම හඳුනාගෙන ඒවා අනුව කටයුතු කළ යුතු බවට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.

එකොළොස්වන පරිච්ඡේදය

නිරීක්ෂණ හා නිර්දේශ

11. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019.11.16 වන දින පවත්වන ලද ඡන්ද විමසීමේ දී නිරීක්ෂණය කරන ලද කරුණු හා ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීම, අපේක්ෂක ඇප මුදල්, තැපැල් ඡන්ද පහසුකම්, මැතිවරණ නීති සංශෝධනය ආදී කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙහි ඇතුළත් වේ.

11.1 රාජ්‍ය නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීම

මැතිවරණ රාජකාරී සඳහා අනිවාර්යයෙන්ම යොදවා ගනු ලබන්නේ රාජ්‍ය නිලධාරීන් වේ. රාජකාරිවල යෙදවීමට බලාපොරොත්තුවන රාජ්‍ය නිලධාරීන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා විශාල වියදමක් දරා තැපැල් ඡන්ද පහසුකම් ලබා දී ඇත. එමෙන්ම මේ වන විට රාජකාරී සඳහා ගෙවන දීමනා ද ඉහළ දමා ඇත. එසේ වුවද පෞද්ගලික අපහසුතා ඉදිරිපත් කරමින් සහ විවිධ රෝගාබාධ ඇති බවට ව්‍යාජ වෛද්‍ය සහතික ඉදිරිපත් කරමින් ඡන්ද විමසීම් රාජකාරිවලින් බැහැරවීමට උත්සාහ දරන ලද අවස්ථා වාර්තා විය. මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වුවහොත් මැතිවරණ රාජකාරී සඳහා යෙදවීමට රාජ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නොවනු ඇත. තවදුරටත් රාජ්‍ය නිලධාරීන් විසින් ඡන්ද විමසීම් රාජකාරිවල නිරතවීම තම යුතුකමක් හා වගකීමක් ලෙස සළකා කටයුතු කිරීමට පසුබට වන්නේ නම්, මෙම රාජකාරිවල නියැලීම අනිවාර්ය සේවා අවශ්‍යතාවක් ලෙස සලකා ක්‍රියාකළ යුතුවේ. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ මැතිවරණ රාජකාරී පැහැර හරින තැනැත්තන් පිළිබඳව විනයානුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැන නැඟී ඇත.

ඇතැම් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය ආයතන ප්‍රධානීන් දේශපාලන ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම, අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමට හා වෙනත් අපේක්ෂකයින් අගතියට පත් කිරීමට හේතු වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීම සහ යම් දේශපාලන පක්ෂයක මතවාද පිළිබඳව ප්‍රකාශයන් කිරීම යනාදිය නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඉමහත් බාධාවකි. සෘජුවම දේශපාලනය හා සම්බන්ධ පුද්ගලයින් රාජ්‍ය ආයතන ප්‍රධානීන් ලෙස පත් කිරීමෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව පෙනී යයි. එබැවින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්මට බාධා වන ආකාරයේ ක්‍රියා සිදුවීම වැළැක්වීම පිණිස අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් හා විධායක නිලධාරීන් දේශපාලන කටයුතුවල යෙදීම තහනම් බවට පනවා ඇති නියමයන් තවදුරටත් බලගැන්වීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. තවද මෙම තත්වයන් වළක්වා ගැනීම සඳහා දේශපාලන කටයුතුවල නිරත වන හෝ දේශපාලන සබඳතා පවත්වන බවට වාර්තා වී ඇති තැනැත්තන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස හා විවිධ රාජ්‍ය ආයතන ප්‍රධානීන් ලෙස පත්කිරීමෙන් වැළකීමට අදාළ බලධාරීන් විසින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

එමෙන්ම ඡන්ද විමසීම් රාජකාරී සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ තොරතුරු එක්රැස් කිරීමේදී ද ගැටලු සහගත අවස්ථා නිරීක්ෂණය විය. අදාළ ආයතය යටතේ සේවයේ නියුතු මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනෙන සියලුම නිලධාරීන්ගේ

තොරතුරු ඉදිරිපත් කිරීමට උපදෙස් දෙනු ලැබුව ද සමහර ආයතනවලින් එම තොරතුරු ඉදිරිපත් නොකරන අවස්ථා පෙනී ගොස් ඇත. නිලධාරීන් විසින් සිය තොරතුරු ඇතුළත් දත්ත පත්‍රිකා ඉදිරිපත් නොකරන අවස්ථා ද පවතී. මෙය යහපත් නොවන ප්‍රවණතාවයක් බැවින් තොරතුරු ලබාගැනීමේ දී නිලධාරීන් පිළිබඳ සත්‍ය තොරතුරු අත්හැරීමකින් තොරව ලබාගැනීමට එහි වගකීම එක් එක් ආයතන ප්‍රධානීන්ට පැවරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීමට අවධානය යොමු කළ යුතුවේ.

11.2 අපේක්ෂක ඇප මුදල්

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම, පාර්ලිමේන්තු මැතිවරණය හා පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් යන සියලුම ඡන්ද විමසීම්වල දී අපේක්ෂකයින් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් ඡන්ද විමසීමට දරන වියදමට සරිලන ප්‍රමාණවත් එකක් නොවන බවට විවිධ පාර්ශ්ව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා ඇත. මෙම ඇප මුදල වර්තමාන තත්වයන්ට අනුව ඉතා සුළු අගයක් ගන්නා බැවින් වෙනත් අපේක්ෂකයින්ට සහාය වීම සඳහා අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත්වීම හේතුවෙන් වර්තමානයේ දී ඡන්ද විමසීම් කටයුතු සංවිධානය කිරීමේ ගැටලු ඇතිවී තිබෙන බව නිරීක්ෂණය වේ. මෙවර ජනාධිපතිවරණයට අපේක්ෂකයින් 41ක් දෙනෙකු සඳහා ඇප තැන්පත් කිරීම හා 35 දෙනෙකු පමණක් අපේක්ෂකයින් ලෙස නාම යෝජනා භාරදීමෙන් එය වඩාත් පැහැදිලි වේ. අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වීම හේතුවෙන් ඡන්ද විමසීම් කාල සීමාව තුළ ප්‍රචණ්ඩ ක්‍රියා ඉහළ යාම මෙන්ම පරිසරයට සිදුවන අහිතකර බලපෑම පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. කෙසේ වුව ද ඇප මුදල් වැඩි කිරීම සම්බන්ධයෙන් තවදුරටත් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර කටයුතු කිරීම සුදුසු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලැබේ.

11.3 තැපැල් ඡන්ද පහසුකම්

ඡන්ද විමසීමක දී තැපෑලෙන් ඡන්දය දීමට හිමිකම් නොලබන එහෙත් ස්වකීය රැකියාවේ අත්‍යවශ්‍ය ස්වභාවය නිසා තමන්ට වෙන්කර ඇති ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්ද විමසීම් දිනයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත බොහෝ පිරිස් විසින් කරුණු ඉදිරිපත් කර ඇත. ඡන්ද විමසීමේ දින අත්‍යවශ්‍යයෙන්ම සේවයේ නිරත විය යුතු සෞඛ්‍ය, පෞද්ගලික ආරක්ෂක සේවා, වරාය හා ගුවන් තොටුපළ, වෙළඳ කළාප, ජනමාධ්‍ය, ගුවන් සේවා, අධිවේගී මාර්ග කළමනාකරණ, සංචාරක හා හෝටල් කර්මාන්තය යනාදී ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු අයට ඒ ඒ සේවා ස්ථානවලට නුදුරින්ම වූ විකල්ප ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ සුදුසු පරිදි පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස අදාළ පාර්ශ්ව විසින් යෝජනා කර සිටී. මේ සඳහා ද නීති සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එමෙන්ම විදේශගත ඡන්ද හිමියන්ට ඡන්දය දීම සඳහා පහසුකම් සැලසීමේ ගැටලුව දීර්ඝ කාලයක සිට සාකච්ඡා කෙරෙන නමුදු ඒ සඳහා තවමත් අවශ්‍ය නීතිමය විධිවිධාන සංශෝධනය වී නොමැත. ඉහත සඳහන් කරුණු ව්‍යවස්ථා සම්පාදකයින්ගේ කඩිනම් අවධානය යොමු විය යුතු ඉතා වැදගත් කාලීන අවශ්‍යතාවක් වේ.

තවද ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයින්ට තැපැල් ඡන්ද පහසුකම් සලසනු ලැබීම පිණිස නීතිමය අවසරය ඇතත්, නාමයෝජනා දිනය වනවිට තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය අවසන් වේ. මේ අනුව ඉදිරිපත්වන අපේක්ෂකයින්ට තැපැල් ඡන්ද අයදුම් කිරීමට හැකිවන පරිදි එම අයදුම්පත් භාරගැනීමේ දිනය අදාළ ඡන්ද විමසීමේ නාමයෝජනා භාරගැනීමේ දිනට පසුව යෙදෙන දිනයක් වශයෙන් සංශෝධනය කිරීම අවශ්‍ය වේ.

11.4 විද්‍යුත් තාක්ෂණය යොදා ගැනීම

ඡන්ද විමසීම් ක්‍රියාවලියේ දී විද්‍යුත් ක්‍රමයට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වන යන්ත්‍රයක් (Electronic Voting Machine) භාවිත කිරීම පිළිබඳව වූ යෝජනාව 2000 දශකයේ මැද භාගයේ සිට සාකච්ඡා කෙරෙන කරුණකි. මේ සඳහා දේශපාලන පක්ෂ හා එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ ද මූලික සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා තිබේ. ඡන්ද දායකයන්ගේ මෙන්ම ඡන්ද විමසීම් රාජකාරීවල නියුක්ත වන නිලධාරීන්ගේ ද කාලය, ශ්‍රමය හා වියදම් අවම වන කාර්යක්ෂම හා ඵලදායී වූ මෙවැනි සාධනීය පියවර සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසුය. මේ සම්බන්ධයෙන් එවැනි ක්ෂේත්‍රවල ඇති තාක්ෂණික වෙනස්වීම්, ඒ සඳහා වැයවන අධික වියදම, ඡන්ද විමසීම හා ප්‍රතිඵලවල විශ්වසනීයත්වය පිළිබඳව ද විවිධ මතවාද පවත්නා බවද සැලකිල්ලට ගැනීම අවශ්‍ය වේ. කෙසේ වුවද ඡන්දය ප්‍රකාශ කිරීමේදී පවත්වාගතයුතු රහස්‍යභාවය සම්බන්ධයෙන් පැන නගී ඇති ගැටලු අනුව එය භාවිත කරන රටවල් වල මැතිවරණ බලධාරීන් විසින් එය අත්හැරීමට පෙළඹී ඇති බව පෙනෙන බැවින් අවම වශයෙන් ඡන්ද ගණන් කිරීම සඳහා හෝ නව තාක්ෂණ ක්‍රම යොදා ගැනීමේ අවශ්‍යතාව සලකා බැලීම සුදුසු ය.

11.5 මැතිවරණ නීති සංශෝධන

- ඡන්ද විමසීමකදී වලංගු නාම ලේඛනයේ නම ඇතුළත්ව නොමැති එහෙත් ඡන්ද විමසීම් දිනය වන විට වයස වූ 18 ඉක්මවා සෑහෙන කාලයක් පසු කරන ලද යෞවනයන් විසින් තමන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවෙන් විමසීම් කරන අවස්ථා නිරීක්ෂණය වේ. සුදුසුකම් ඇති සියලු දෙනාගේ සහභාගීත්වයෙන් යුතු නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා මෙය යහපත් තත්ත්වයක් නොවන බවත්, හැකි තරම් දුරට එම තත්ත්වය වළක්වාගත යුතු බවත්, මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වේ. අටළොස්විය සම්පූර්ණ වන සියලුම පුරවැසියනට වෙනත් නුසුදුසුකමකට යටත් නොවන්නේ නම් එම අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචි කර ගැනීමට අවස්ථාව ලබා දීම සඳහා 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කරමින් පරිපූරක නාමලේඛන පිළියෙල කොට ඒවා ඡන්ද හිමි නාමලේඛනයේ කොටසක් ලෙස සැලකීමට හැකිවන පරිදි නීතිමය විධි විධාන ඇතුළත් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ව්‍යවස්ථාදායකය විසින් එම පනත සම්මත කිරීමෙන් පසුව මෙම තත්වය නිරාකරණය කර ගැනීමට හැකි වනු ඇත.

- වර්තමාන තත්වයන්ට ගැළපෙන පරිදි දැනට බලාත්මකව පවතින මේ මැතිවරණ නීති සංශෝධන සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කිරීමටත් එහි යෝජනා හා නිර්දේශ අනුව සුදුසු පරිදි ඡන්ද විමසීම් පනත් හා අනෙකුත් නීති රීති සංශෝධනය සඳහා ව්‍යවස්ථාදායකය විසින් කඩිනමින් කටයුතු කළ යුතුව ඇති බව අපගේ නිරීක්ෂණය වේ.

- ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 36 වන වගන්තිය යටතේ ඡන්ද දායකයා නොමැකිය හැකි තීන්තෙන් සලකුණු කිරීම 1965 වර්ෂයේ සිට හඳුන්වා දී ඇත.මෙහි අරමුණ වූයේ ඡන්ද දායකයකු වරකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය ප්‍රකාශ කිරීම වැළැක්වීමය. ඒ වනවිට ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා හඳුනා ගැනීමේ පත්‍රයක් අනිවාර්ය කර නොතිබිණ. එහෙත් මේ වනවිට ජාතික හැඳුනුම්පත ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්ය කර ඇති අතර ඒ සඳහා වෙනත් පිළිගත් හැඳුනුම්පත් කිහිපයක් ද හඳුන්වා දී තිබේ. එම අනන්‍යතා පත්‍ර කිසිවක් නොමැති අයෙකුට වුවද මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත්

කරනු ලබන තාවකාලික හැඳුනුම්පතක් භාවිත කිරීමට අවසරය හිමි වේ. මේ නිසා මැකිය නොහැකි තීන්තෙන් සලකුණු කිරීම නීතිමය අවශ්‍යතාවක් වුවද වර්තමාන තත්ත්වයන් අනුව එය අවශ්‍යව පවතී ද යන ගැටලුව මතුවී ඇත. මේ සඳහා දැරිය යුතු වියදම, සෑම ඡන්ද පොළකටම තවත් නිලධාරියකු යෙදවීම හා එම කටයුතු සඳහා අමතර කාලයක් යෙදවීම යන කරුණු සැලකිල්ලට ගත්විට එය අනවශ්‍ය වියදමක්, ශ්‍රමය හා කාලය අපතේ යැවීමක් බැවින්, නොමැකිය හැකි තීන්තෙන් සලකුණු කිරීම අවශ්‍යතාවක් පවතී ද යන්න සලකා බැලිය යුතු බව නිර්දේශ කරන අතර ඒ සඳහා නීතිමය සංශෝධන ඉදිරිපත් වියයුතු බවට ද යෝජනා කරනු ලැබේ.

11.6 නිල ඡන්ද දැන්වීම්පත් බෙදීම

නිල ඡන්ද දැන්වීම්පත් බෙදීම පවත්නා නීති යටතේ තැපැල් දෙපාර්තමේන්තුව විසින් පමණක් සිදුකළ යුතුය. එහෙත් මේ සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයන් පවත්නා බැවින් හා ඒ සඳහා යොදාගත හැකි විකල්ප ක්‍රියා මාර්ග යෙදීමේ පහසුකම් පවතින හෙයින් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරෙන අතර අදාළ නීති සංශෝධනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

11.7 රාජ්‍ය දේපළ අවභාවිතය

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ රාජ්‍ය දේපළ සෘජුව හෝ වක්‍රාකාරයෙන් අයුතු ලෙස පරිහරණය කරමින් අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා නැතහොත් අනෙකුත් අපේක්ෂකයින් අගතියට පත් කිරීම සඳහා කටයුතු කරන ලද බවට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අනෙකුත් ඡන්ද විමසීම්වලට වඩා පහළ මට්ටමක තිබීම බෙහෙවින් සතුටුදායක ය. මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබුණු සුළු පැමිණිලි සම්බන්ධයෙන් ද නිසි පියවර ගැනීම තුළින් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම්වල දී රාජ්‍ය දේපළ අවභාවිතය අවම කර ගැනීමේ ප්‍රවණතාව තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

11.8 මාධ්‍ය භාවිතය කළමනාකරණය කිරීම

වර්තමානයේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන අතිමහත් වෙනස්කම් හා නව ප්‍රවණතා හේතුවෙන් සක්‍රීය ඡන්ද විමසීම් කාලසීමාව තුළ "මාධ්‍ය භාවිතය පිළිබඳව නියාමන සිදු කිරීම" කළ නොහැකි හෝ අනවශ්‍ය හෝ දෙයක් බව යමෙකුට පෙනී යා හැකි ය. එසේ වුවත් තවමත් අප සමාජයේ ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් තොරතුරු ලබා ගැනීමේ මුද්‍රිත මාධ්‍ය ලෙස පුවත්පත් ද විද්‍යුත් මාධ්‍ය ලෙස ගුවන් විදුලිය හා රූපවාහිනිය කෙරෙහි විශ්වාසයක් තබා ඇත. එහෙයින් අපේක්ෂකයන් තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා සහ තමන්ගේ දේශපාලන මතය ජනතාව අතරට ගෙන යෑම සඳහා පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනිය වැනි සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගැනීමට කැමැත්තක් දක්වයි. මෙහිදී එම ආයතනවලින් අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකර දෙනු ලැබේ. එබැවින් ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී සියලුම රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන අපේක්ෂකයන්ගේ ප්‍රචාරක කටයුතුවල දී මෙන්ම එදිනෙදා ප්‍රවෘත්ති විකාශවල දී හා වෙනත් වාර්තාකරණ කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. ඡන්ද විමසීම් කාල සීමාවේ අපේක්ෂකයකුට හෝ දේශපාලන පක්ෂයකට විශේෂ සැලකිල්ලක් දක්වන පෞද්ගලික මාධ්‍ය ආයතනවලට ඔවුන් විසින් ස්වේච්ඡාවෙන් ඒ බව ප්‍රකාශයට පත්කරන ලෙස දන්වා ඡන්ද විමසීම් හා සම්බන්ධිත වෙනත් කටයුතුවල දී හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කටයුතුවලට ඔවුන් සම්බන්ධ කරගත යුතු නොවන බවට යෝජනා ඉදිරිපත්වී ඇත. එම යෝජනා කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

සෘජුවම රජය සතු මාධ්‍ය ආයතන වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන්

විදුලි සංස්ථාව ද රජය සතු සමාගම් වූ ස්වාධීන රූපවාහිනී සේවය (ITN) හා එහි අනුබද්ධ ආයතන ද සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස් ආයතනය) ද ඡන්ද විමසීම් කාල සීමාව තුළ පමණක් නොව අන් කාල සීමාව තුළ ද ආණ්ඩු පක්ෂයේ ආයතන ලෙස නොව රාජ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කරනු ලැබීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බවට ප්‍රකාශිත මතය සමඟ මැතිවරණ කොමිෂන් සභාව ද පූර්ණ වශයෙන්ම එකඟවේ. විද්‍යුත් මාධ්‍ය සඳහා නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි සංශෝධනය කර සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවන විධාන හා මාධ්‍ය උපමාන අනුව ක්‍රියාකරන බවට එකඟ වීමෙන් පසුව එම බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය නීති සකස් කළ යුතුව ඇත. එසේම මාධ්‍ය උපමානවලට පටහැනිව කටයුතු කරන ආයතනවල විකාශන බලපත්‍ර ඡන්ද විමසීම් කාලය තුළ අත්හිටුවීමට හෝ මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිතයෙකු හෝ නිසි බලධාරියෙකු මගින් එකී කටයුතු අධීක්ෂණය කිරීමට හැකිවන සේ පෞද්ගලික මාධ්‍ය පිළිබඳ නීති සංශෝධනය විය යුතුව ඇත. විශේෂයෙන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් භාවිත කරන තරංග මාලා මහජන දේපළක් වන බැවින් මහජනතාවගේ නිදහස් කැමැත්ත ප්‍රකාශ කරනු ලබන ඡන්ද විමසීමක දී ඒවා අවභාවිතය වැළැක්වීමට සුදුසු නියාමනයක් කිරීම අවශ්‍යව පවතී.

11.9 සමාජ මාධ්‍ය ජාල

පෙර පැවති ඡන්ද විමසීම්වලට සාපේක්ෂව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වූ මෙම ඡන්ද විමසීමේ දී සමාජ මාධ්‍ය ජාල හරහා විශාල වශයෙන් ප්‍රචාරක කටයුතු සිදුවිය. අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම, දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය, වෛරී ප්‍රකාශන හා අසත්‍ය ප්‍රකාශ මුදා හැරීම, අශෝභන හා විකෘති කරන ලද ඡායාරූප ප්‍රසිද්ධ කිරීම මගින් අපේක්ෂකයින් අගතියට පත්කිරීම හා ඔවුන්ගේ කීර්තිනාමයට හානි කිරීම, අසත්‍ය හා පක්ෂග්‍රාහී මත විමසුම් පළ කිරීම වැනි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට බාධා වන අන්දමේ කටයුතු රැසක් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සිදු වූ බවට පැමිණිලි ලැබිණි. සමාජ මාධ්‍ය ජාලා මගින් සිදුවන මෙවැනි කටයුතු නියාමනය කිරීමට හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ඒවා විධිමත් අන්දමින් අධීක්ෂණය කිරීම පිළිබඳව කෙරෙන යෝජනා සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින් ඉදිරියේ දී කටයුතු කළ යුතු අතර, වෛරී ප්‍රකාශන, අසත්‍ය ප්‍රවෘත්ති හා මුදල් ලබා ගැනීම සඳහා පළ කෙරෙන ප්‍රවෘත්ති වැළැක්වීමට කිරීමට පවත්නා නීති රීති ප්‍රමාණවත් නොවන බැවින් ඒ වෙනුවෙන් නව නීති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ.

11.10 ආගමික සිද්ධස්ථාන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම

ආගමික කටයුතු ලෙස හුවාදක්වමින් පන්සල්, පල්ලි, කෝවිල් වැනි ආගමික මධ්‍යස්ථානවල අපේක්ෂකයින් ප්‍රවර්ධනය වන අන්දමින් කටයුතු සිදුවූ බවට මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි ලැබුණි. ශ්‍රී ලංකාවේ සංස්කෘතික පසුබිම හා ආගමික නිදහස මෙන්ම ආගම් පිළිබඳ ජනතාව තුළ පවත්නා ඉහළ පිළිගැනීම හා ගරුත්වය හේතු කොටගෙන සහ දිවයින පුරා විවිධ ආගම්වලට අයත් සිද්ධස්ථාන විශාල සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් පැමිණිලි විමර්ශනය කිරීම හා නීති මගින් ක්‍රියා කිරීම ඉතා අසීරු කාර්යයක් වී ඇත. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 78 වන වගන්තිය අනුව ආගමික සිද්ධස්ථානවල අපේක්ෂක ප්‍රවර්ධන රැස්වීම් පැවැත්වීම හා ආගමික කටයුතුවල දී අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීම නීති විරෝධී බවට සඳහන් නියමය බලාත්මක කිරීම පිණිස ඉදිරි ඡන්ද විමසීම්වලට පෙර සියලුම ආගමික නායකයන් සමඟ ද සාකච්ඡා කර සිද්ධස්ථාන භාර පූජ්‍ය පක්ෂය දැනුවත් කිරීමට විධිමත්

වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත් ඒ අනුව අනීතික ක්‍රියා වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමුව ඇත.

11.11 මැතිවරණ ප්‍රචාරක වියදම් පාලනය

ඡන්ද විමසීම්වල දී දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින් විසින් විශාල වියදමක් දරමින් කරන ප්‍රචාරක කටයුතු මඟින් ඡන්ද හිමියන්ගේ නිදහසට බාධා ඇතිවන බව නිරීක්ෂණය වේ. එමෙන්ම විශාල ලෙස මුදල් වැය කිරීමට නොහැකි ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයින්ට එය යහපත් තත්වයක් නොවන අතර ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයෙන් ඉවත්වීමට පවා ඉවහල්විය හැකි තත්වයකි. එහෙයින් ඡන්ද විමසීමක දී තරගකරුවන් සියලු දෙනා සම බිමක තරගයක යෙදවීම සඳහා ඡන්ද විමසීමක දී දැරිය හැකි වියදම් පාලනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය වී තිබේ. මේ පිළිබඳව දැනටමත් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු සිවිල් ක්‍රියාකාරීන් විසින් යෝජනා ඉදිරිපත් කර ඇත. එම යෝජනා ද සැලකිල්ලට ගනිමින් දැනටමත් අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති වියදම් පාලනය පිළිබඳ පනත් කෙටුම්පත නීතිගත කිරීමේ ඉදිරි කටයුතු කඩිනම් කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

11.12 අපේක්ෂකයින් සඳහා ගුවන් විදුලි හා රූපවාහිනී ප්‍රචාරණය සඳහා කාලය ලබාදීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත බලාත්මක වූ 80 දශකයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විද්‍යුත් මාධ්‍ය ආයතන වූයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 117 වගන්තිය අනුව රාජ්‍ය මාධ්‍ය ආයතන වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් අපේක්ෂකයින් සඳහා මෙම ප්‍රචාරක පහසුකම් ලබා දෙනු ලබන්නේ කිසිදු ගාස්තු අය කිරීමකින් තොරවය. එසේ නුමුදු වර්තමානය වන විට රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතන රාශියක් රට තුළ ක්‍රියාත්මක වේ. ඒ අනුව පවත්නා තරගකාරීත්වය හේතුවෙන් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් රාජ්‍ය මාධ්‍ය ආයතනවලට වඩා වැඩි ජනප්‍රියතාවකින් යුත් පෞද්ගලික මාධ්‍ය මඟින් හා වෙනත් රටවල සිට මෙහෙය වන කේබල් රූපවාහිනී නාලිකා මඟින් ස්වකීය ප්‍රචාරක කටයුතු සලසා ගැනීමට පෙළඹී සිටින බව ද නිරීක්ෂණය වේ. භාණ්ඩාගාර අරමුදල් මත යැපෙන රාජ්‍ය මාධ්‍ය ආයතනවල ඉහළම වානිජ වටිනාකමක් සහිත ගුවන් කාලය නොමිලයේ දේශපාලන ප්‍රචාරක පහසුකම් සඳහා ලබා දීමට සිදු වීම තුළින් එම ආයතනවලට සිදුවන මුල්‍යමය පාඩුව පියවා ගැනීම වෙනුවෙන් රජයට අමතර වැය බරක් දැරීමට ද සිදුව ඇත. තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට අයත් අපේක්ෂකයින් සහ ස්වාධීන අපේක්ෂකයින් සංඛ්‍යාව ද ක්‍රමයෙන් වැඩි වීම නිසා ඔවුන් සියලු දෙනා සඳහා සමාන අවස්ථා ලබා දීමේ අවශ්‍යතාව අනුව ඒ සඳහා වෙන් කළ යුතු ගුවන් කාල ප්‍රමාණය මෙන්ම ඒ වෙනුවෙන් රජයට දැරීමට සිදුවී ඇති වැය බර ද වැඩි වී ඇත. එබැවින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ එකී වගන්තිය මෙම සියලු තත්ත්වයන් හා කරුණු සැලකිල්ලට ගනිමින් අවස්ථාවෝචිතව යාවත්කාලීන විය යුතු බවට යෝජනා කරනු ලැබේ.

දොළොස්වන පරිච්ඡේදය

ඇගයීම හා සමාප්තිය

12. ඇගයීම

ශ්‍රී ලංකාවේ මෙයට පෙර පැවැති ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම්වල දී, පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් බොහොමයක දී, බරපතල ලෙස වර්ගීකරණය කළ යුතු ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ අතර, ඉන් සමහරක දී මනුෂ්‍ය ඝාතන පවා වාර්තා වී ඇති නමුත් 2019 නොවැම්බර් මස 16 වන දින පැවැති මෙම ඡන්ද විමසීමේ දී බරපතල ලෙස සැලකිය යුතු ප්‍රචණ්ඩ ක්‍රියාවක් මුළු ඡන්ද විමසීම් කාලය තුළම එනම්, නාමයෝජනා දැන්වීම නිකුත් කළ 2019 සැප්තැම්බර් මස 18 වන දින සිට ප්‍රතිඵල නිකුත් කර සතියක් ගතවන තෙක් වූ කාල සීමාව තුළ සිදු නොවීම සමස්ත ශ්‍රී ලාංකීය ප්‍රජාව ලද ජයග්‍රහණයකි. මෙම ඡන්ද විමසීම සාමකාමී හා සාධාරණව පැවති බවට ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා සහභාගි වූ පොදු රාජ්‍ය මණ්ඩලයීය නිරීක්ෂකයන් ඇතුළු දේශීය හා විදේශීය නිරීක්ෂකයන් විසින් ද තහවුරු කර ඇත. එසේ කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් ඇති නොවන අයුරින් කටයුතු කළ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ධුරය දැරූ, ඡන්ද විමසීම් කාල සීමාව තුළ නිර්පාක්ෂිකව කටයුතු කළ ගරු ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු කථානායකවරයා, ගරු විපක්ෂනායකවරයා ඇතුළු සියලුම දේශපාලන පක්ෂවල නායකයින් ද, ඒවායේ ප්‍රමුඛ ක්‍රියාකාරීන් හා සාමාජිකයින් ද, සියලුම ජනාධිපති ධුර අපේක්ෂකයින් ද ඔවුන්ගේ ඡන්ද නියෝජිතයින් අනෙකුත් නියෝජිතයින් හා ආධාරකරුවන් ද ඇතුළු සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත මැතිවරණ කොමිෂන් සභාවේ ගෞරවනීය ස්තුතිය මෙයින් ප්‍රකාශ කර සිටිමු.

ඡන්ද විමසීමේ දිනට පෙර දින ද ඇතුළුව ඡන්ද විමසීමේ දිනයේ දී කිසිදු ඡන්ද මධ්‍යස්ථානයක දී හෝ ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියේ දී, කිසිදු ගණන් කිරීමේ මධ්‍යස්ථානයක හෝ ප්‍රතිඵල වගුගත කර ප්‍රකාශ කිරීමේ පරිශ්‍රයක හෝ කිසිම ආකාරයක අනීතික ක්‍රියාවක් සිදු නොවීම හේතුකොට ගෙන ඡන්ද විමසීමේ, ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කාර්යයට සුළු හෝ බාධාවක් ඇති නොවීම ප්‍රශංසනීය තත්වයකි. සමස්ත දිවයිනෙහිම ඡන්ද දායකයන්ට ඡන්ද පොළට පැමිණීමේ දී හා නියමිත ඡන්ද පොළේ දී ස්වකීය කැමැත්ත පරිදි නිදහස්ව හා රහසාව තම ඡන්දය ප්‍රකාශ කිරීමට කිසිදු බාධාවක් වූ බවට පැමිණිලි නොලැබීම ද කොමිෂන් සභාවේ සතුටට හේතු වේ.

ඡන්ද විමසීමක් නිසි ලෙස පැවැත්වීම සඳහා ප්‍රමාණවත් නීති රීති හා බලතල සියල්ලක්ම පැවතිය ද, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා දේශපාලන පක්ෂ නායකයන්, පක්ෂ ලේකම්වරුන්, අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා ඡන්ද හිමියන් සහ සිවිල් ක්‍රියාකාරීන් ඒ සඳහා කැපවීම් කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මෙම ඡන්ද විමසීම නිදහස්ව හා සාධාරණ ලෙස සාර්ථකව පැවැත්වීම පිළිබඳව ලැබෙන ගෞරවයෙන් වැඩි කොටසක් නීති ගරුකව ක්‍රියා කළ දේශපාලනඥයින්ට හිමි වේ. තවද ලියාපදිංචි ඡන්ද හිමියන්ගෙන් 82% කට අධික ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කර තිබීම ඕනෑම තත්ත්වයක් යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ඉහළම ප්‍රතිශතයක් ලෙස සැලකිය හැකි ය. එබැවින් ස්වකීය ඡන්ද අයිතිය භාවිත කළ සියලුම ශ්‍රී ලාංකික ඡන්ද

දායකයින්ට මැතිවරණ කොමිෂන් සභාවේ ගෞරවය, ස්තුතිය හා ප්‍රණාමය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ඡන්ද විමසීම් දින පුත්තලම සිට මන්නාරම දක්වා අවතැන් ඡන්ද දායකයන් ගමන් ගත් බස් රථයක් ඉලක්ක කරමින් තන්තිරිමලේ ප්‍රදේශයේ දී වෙඩි ප්‍රහාරයක් එල්ල වූ බවටත්, එමෙන්ම එදිනම මන්නාරමේ සිට ආපසු පැමිණෙමින් තිබූ එම ඡන්ද දායකයන් රැගත් බස් රථයක් ඉලක්ක කරමින් මැදවච්චියේ දී ප්‍රහාරයක් සිදුකළ බවට සහ දැරණියගල ප්‍රදේශයේ දී නොහික්මුණු තරුණයකු විසින් තියුණු අවියකින් තවත් තරුණයන් තිදෙනෙකුට සුළු තුවාල සිදු කළ බවටත් පැමිණිලි ලැබුණි. එම සිද්ධීන් ඡන්ද විමසීමට පෙර දින දක්වා පැවති පූර්ණ සාමකාමී වාතාවරණයට යම් බලපෑමක් එල්ල කරන ලදී. එකී සිද්ධි හේතුවෙන් කිසිදු ජීවිත හානියක් හෝ කිසිවෙකුට බරපතල තුවාල සිදු නොවීම මැතිවරණ කොමිෂන් සභාවේ සැනසිල්ලට හේතු වේ. මේ සිද්ධි හේතුවෙන් පීඩාවට පත් වූ සියලුම දෙනා වෙත මැතිවරණ කොමිෂන් සභාව සිය කණගාටුව ප්‍රකාශ කරනු ලබයි. මෙම සිද්ධීන් විමර්ශනය කර නීතිමය පියවර ගන්නා ලෙස පොලීසියට දන්වා ඇති අතර, ඒ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගන්නා බව වාර්තා කර තිබේ. එම කටයුතු කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාව නිරන්තර අවධානයෙන් පසුවේ. කෙසේ වුව ද මෙවැනි සිදුවීමක් හෝ ඉදිරියේ දී ඇති නොවීමට මැතිවරණ කොමිෂන් සභාව දරන උත්සාහයට දේශපාලනඥයින් ඇතුළු සියලුම පුරවැසියන්ගේ සහාය ලබා දීම ඔවුන්ගේ අත්හැරිය නොහැකි වගකීමකි.

සාමකාමීව හා නීතිගරුකව තම ප්‍රචාරණ කටයුතුවල දී යහපත් හැසිරීමෙන් කටයුතු කළ සියලුම අපේක්ෂකයින් සහ එම අපේක්ෂකයින් අයත් පක්ෂවල ලේකම්වරුන් හා ක්‍රියාකාරී ආධාරකරුවන් ද පැමිණිලි විමර්ශන කමිටුවේ කාර්යයන්හි දී සහාය දුන් දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයින් ද මෙම ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීම සඳහා දක්වන ලද සහයෝගය පිළිබඳව ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.

අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ඒ හා සමාන වෙනත් තනතුරු දරන රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ගේ සිට අනියම් සහායකයන් දක්වා වූ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන්ගේ, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ සහ සෙසු රාජ්‍ය සේවකයන්ගේ ද සහාය නොමැති වූයේ නම් ඡන්ද විමසීමට අදාළ කාර්යයන් නිසි ලෙස ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත. රාජ්‍ය සේවයේ ගෞරවය හා කීර්තිය ආරක්ෂා කරමින් ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීමට සහාය දුන් ඒ සියලුම දෙනා කොමිෂන් සභාවේ ස්තූතියට හිමිකම් ලබති.

මෙම ඡන්ද විමසීම පැවැත්වීමේ දී මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් ක්ෂෙත්‍රයේදී ඡන්ද විමසීම් හා සබැඳි කාර්යයන්හි වගකීමෙන් වැඩි කොටසක් තේරීම්භාර නිලධාරීන් ලෙස කටයුතු කළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලට පැවරිණි. පෙර පැවති ඡන්ද විමසීම්වල දී මෙන්ම එම වගකීම් මැතිවරණ කොමිෂන් සභාව බලාපොරොත්තු වූ අයුරින්ම ලබා දීම පිළිබඳව ඔවුනට ප්‍රශංසා කරනු කැමැත්තෙමු.

එමෙන්ම තේරීම්භාර නිලධාරීන්ගේ සහ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගෙන් උපදෙස් අනුව ඔවුන්ට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සලසා දීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල විසින් කරන ලද සේවාව මැතිවරණ කොමිෂන් සභාවේ ඇගයීමට ලක් වේ. නියමිත

කෙටි කාලයක් තුළ යම් යම් දුෂ්කරතා මැද බාධාවකින් තොරව ඡන්ද මධ්‍යස්ථානයන්හි කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම ඡන්ද විමසීම් කාර්යය මණ්ඩල සඳහා සුභ සාධන පහසුකම් සැපයීම සඳහා විවිධ දුෂ්කරතා මැද වගකීමකින් යුතුව කටයුතු කළ සියලුම ග්‍රාම නිලධාරීන්ට ද ප්‍රශංසාව හිමි වේ.

ඡන්දය ප්‍රකාශකිරීමේ දී වලංගු අනන්‍යතා පත්‍රයක් මගින් සිය අනන්‍යතාව සනාථ කළ යුතු බවට වන නීතිමය තත්ත්වය නියම ආකාරයෙන් ආරක්ෂා කරමින් ජනතාවගේ ඡන්ද බලය සුරක්ෂිත කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානවල කටයුතු නියමානුකූලව පවත්වාගෙන යමින්, අත්‍යාවශ්‍යම පෞද්ගලික පහසුකම් පවා අසීරුවෙන් සපයා ගැනීමට සිදුවූ දුෂ්කර ඡන්ද මධ්‍යස්ථානවල දී වුවද කිසිදු මැසිවිලි නැගීමකින් තොරව, සතුටින් හා ප්‍රියමනාපව සේවයේ යෙදෙමින් ස්වකීය රාජකාරි ඉටු කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළු ඡන්ද මධ්‍යස්ථානවල සේවය කළ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සේවය මිල කළ නොහැකිය. මෙම ඡන්ද විමසීමේ දී ඔවුන් ඉටුකළ සේවය ඉතා ඉහළින් අගයනු ලැබේ.

තවද අතිශයින් වෙහෙසකර කාර්යයක් වූ ඡන්ද විමසීමේ උච්චතම අවස්ථාව වන ඡන්ද ගණන් කිරීමෙහි නිරත වූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන්ට හා ඔවුන්ගේ සහායකයන්ට මෙන්ම ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන තුළ නීතිගරුකව හා ඉවසිලිමත්ව කටයුතු කළ අපේක්ෂකයින්ගේ නියෝජිතයින්ට ද කොමිෂන් සභාවේ ස්තුතිය හිමිවේ. ඉහත සඳහන් සියලුදෙනා විසින් කාර්යක්ෂමව, නිවැරදිව හා කඩිනමින් තම රාජකාරි ඉටු කිරීම නිසා තේරීම්භාර නිලධාරීන්ට වෙනත් ඡන්ද විමසීම්වලට වඩා පහසුවක් ඇතිවිය. ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි, බඩුබාහිරාදිය නිකුත් කිරීම හා භාර ගැනීම හා ඡන්ද ගණන් කිරීම යන සෘජුවම ඡන්ද විමසීම් ක්‍රියාවලිය හා බැඳි කාර්යයන්ට අමතරව සුභසාධන, ප්‍රවාහන, ශාලා පහසුකම්, පොදු පහසුකම්, තැපැල් ඡන්ද කටයුතු, කාර්ය මණ්ඩල පත් කිරීම් හා ප්‍රතිඵල වගුගත කිරීම යනාදි සෙසු කාර්යයන් භාරව ක්‍රියා කළ හා ඔවුනට සහාය වූ නිලධාරීන් වෙත පවරනු ලැබූ වගකීම් නිසි ලෙස ඉටු කිරීම මෙම ඡන්ද විමසීම සාර්ථකත්වයට හේතු වූ කරුණු අතර ප්‍රමුඛ වේ. එම කටයුතු සඳහා සහාය දැක්වූ ඒ සියලුම නිලධාරීන්ට කොමිෂන් සභාවේ කෘතඥතාවහිමි වේ.

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ලෙස කාන්තා නිලධාරිනියන් සැලකිය යුතු ප්‍රමාණයක් සේවයෙහි යෙදීමත්, ඡන්ද මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලවල හා නිකුත් කිරීම් සහ භාර ගැනීමේ කාර්ය මණ්ඩලවල, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල නිලධාරීන්ගෙන් බහුතරය කාන්තා නිලධාරීන් වීමත් ඒ සඳහා ඔවුන්ගේ ඉදිරිපත්වීමත් විදේශීය නිරීක්ෂකයන්ගේ විශේෂ පැසසුමට ලක්වූ බව සඳහන් කළ යුතු ය. අත්‍යාවශ්‍ය මූලික පහසුකම් පමණක් ඇති ඡන්ද මධ්‍යස්ථානවල පවා සේවය සඳහා නොපැකිළිව ඉදිරිපත් වූ කාන්තා නිලධාරීන්ගේ සේවය අතිශයින් අගය කොට සැලකේ.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමෙන් පසු රාජ්‍ය සේවයේ විවිධ සේවාවල වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා වැඩ වර්ජන මාලාවක් ඇති වූ අතර වැඩ වර්ජන කිහිපයක් නාමයෝජනා දැන්වීමට පෙර සිටම ආරම්භ වී තිබුණි. මෙම වෘත්තීය ක්‍රියාමාර්ග අතුරින් කිහිපයක් ඉදිරිපත් කරන ලද ගැටලු විසඳා ගැනීමෙන් හෝ ජනාධිපතිවරණ රාජකාරීවල සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගැනීමෙන් හෝ අවසන් කර තිබිණි. එසේ වුවද තවත් අත්‍යාවශ්‍ය සේවාවන්හි නිරත රාජ්‍ය සේවයේ වෘත්තීය සමිති කිහිපයක් සිය

ඉල්ලීම් දිනා ගැනීමේ අරමුණින් වැඩ වර්ජනවලට එළඹීමේ අපේක්ෂාවෙන් සිටින බවක් ඡන්ද විමසීම් කාල සීමාව ආරම්භයේ දී නිරීක්ෂණය විය. රාජ්‍ය සේවයේ සියලුම සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් යුත් යාන්ත්‍රණයක් මගින් ඡන්ද විමසීම් කටයුතු ක්‍රියාත්මක නොවුවහොත් හෝ ජනතාවගේ පරමාධිපත්‍ය තහවුරු කිරීම සඳහා අනිවාර්යයෙන් පැවැත්විය යුතු ඡන්ද විමසීම් රාජ්‍ය සේවකයින් නොමැතිව පවත්වනු ලැබීමට සිදු වුවහොත් එම ඡන්ද විමසීම නිසි ලෙස හා සාධාරණව පැවැත්වීමට බාධා ඇතිවීම වැළැක්විය නොහැකිය. නිදහස් හා සාධාරණ එමෙන්ම විනිවිද බවින් යුතු, විශ්වසනීය ඡන්ද විමසීමක් පැවැත්විය හැකි වනුයේ රාජ්‍ය සේවකයින්ගේ උපරිම සහාය ලද හොත් පමණක් බැවින්, වැඩ වර්ජන කිරීම්වලින් වැළකී ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස සියලුම රාජ්‍ය සේවකයන්ගෙන් ද රාජ්‍ය සේවකයන්ට බාධාවකින් තොරව සතුටින් සේවයේ යෙදීමට හැකි වාතාවරණයක් සැකසීම පිණිස සාකච්ඡා කර අපහසුතාවකින් තොරව ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග හා තීරණවලට කඩිනමින් එළඹෙන ලෙස නිසි බලධාරීන්ගෙන් ද වෘත්තීය සංගම් වෙතින් ද මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටින ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ එම ඉල්ලීමට ඉතාම යහපත් ප්‍රතිචාරයක් දක්වමින් ඔවුන් විසින් වැඩ වර්ජන සියල්ල අත්හිටුවන ලදී. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම උදෙසා රට තුළ යහපත් කාර්මික සමගියක් ඇතිකර ගැනීමට එකඟතාවලට පැමිණීමට සහාය දුන් සෞඛ්‍ය, දුම්රිය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල වෘත්තීය සමිති ඇතුළු අනෙකුත් වෘත්තීය සංගම්වල ප්‍රමුඛ ක්‍රියාකාරීන්ට හා ඒවායේ සාමාජිකයන්ට ද මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය හිමිවේ. එසේමන්ම එකී වෘත්තීය සමිති ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාර දැක්වූ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු බලධාරීන්ට ද කෘතඥතාව හිමිවන අතර, මෙම වෘත්තීය ක්‍රියාමාර්ගවලට හේතු වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරියේ දී යහපත් ප්‍රතිචාර දැක්වීමට අදාළ පාර්ශව විසින් ක්‍රියා කරනු ඇතැයි විශ්වාස කරමු.

ඡන්ද විමසීම් කාල සීමාවේ මුල් සති කිහිපය තුළ ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා ක්‍රියා කිරීමට සිදු වූයේ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය වූ වෙනත් ආයතනවල සේවයේ නියුතු සිවිල් නිලධාරීන් සහ තේරීම්භාර නිලධාරීන් වෙත අනුයුක්ත කර තිබූ සීමිත පොලිස් නිලධාරීන් පිරිසකට ය. ඡන්ද විමසීම ප්‍රකාශයට පත්වූ වහාම එකී නිලධාරීන් විසින් පෝස්ටර්, කටවුට් හා බැනර් ඉවත් කිරීම ඇතුළු නීති විරෝධී ක්‍රියා වැළැක්වීමට උපරිම උත්සහ දරා ක්‍රියා කිරීම හේතුවෙන් එම කටයුතුවලින් ප්‍රයෝජනයක් නොවන බව දේශපාලන ක්‍රියාකාරීන් විසින් අවබෝධ කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස නීතිවිරෝධී ප්‍රචාරණ කටයුතු අවම විය. එමගින් සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම පිළිබඳව ජනතා විශ්වාසය බොහෝ දුරට තහවුරු කිරීමට හැකිවිය. එම කටයුතුවල නිරත වූ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ඇතුළු සියලුම සිවිල් නිලධාරීන්ට, පොලිස් නිලධාරීන්ට, රියැදුරන්ට හා සහායකයින්ට විශේෂ ස්තුතිය හිමි වේ. ඒ අනුව පොස්ටර්, බැනර්, කටවුට්වලින් තොර පරිසර හිතකාමී මෙන්ම සාමකාමී වාතාවරණයක් මධ්‍යයේ ඡන්ද විමසීම පවත්වන්නට හැකිවීම පිළිබඳව බෙහෙවින් සතුටු වෙමු. පෝස්ටර්, කටවුට් හා බැනර් නොමැතිව ඡන්ද ප්‍රචාරක කටයුතු සිදු කිරීමට ජනාධිපතිධුර අපේක්ෂකයින් හා ඡන්ද නියෝජිතයන්ගේ ක්‍රියා කිරීම ද විශේෂයෙන් අගය කළ යුතු වේ.

ඡන්ද විමසීම ආරම්භයේ සිටම මැතිවරණ කොමිෂන් සභාව වෙත සහාය දක්වමින් පොලිස්පතිවරයා සහ මැතිවරණ විෂයභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ද අවශ්‍ය අවස්ථාවල දී ස්වකීය සහාය ලබා දුනි. පළාත් භාර ජ්‍යෙෂ්ඨ

නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන්, සෙසු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් ඇතුළුව මෙම ඡන්ද විමසීම සාමකාමීව හා සාර්ථකව පැවැත්වීම සඳහා දායක වූ එමෙන්ම ඒ සඳහා කැපවී ක්‍රියා කළ සෙසු සියලුම පොලිස් නිලධාරීන් හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන්ගේ රාජකාරීමය සහයෝගය බෙහෙවින් අගය කරන අතර ඒ සියලුම දෙනා වෙත කෘතඥතාව පළ කරනු ලැබේ. ඡන්ද විමසීම් දිනයේ දී මෙන්ම එයට පෙර ද ක්‍රියාත්මක වූ ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථානවල කටයුතු කළ සියලුම පොලිස් නිලධාරීන්ගෙන් ඉටු වූ සේවය ද ඉතා ප්‍රසංසනීය තත්ත්වයක තිබිණි.

මැතිවරණ කොමිෂන් සභාවේ හා තේරීම්භාර නිලධාරීන්ගේ ඉල්ලීම මත ඡන්ද විමසීමට පෙර දින, ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද මධ්‍යස්ථානවල හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විවිධ දුෂ්කරතා ඉවසා ගනිමින් වෙහෙස නොතකා සේවයේ යෙදුණු සියලුම පොලිස් නිලධාරීන්ට හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ට මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ ස්තුතිය හිමි වේ. ආරක්ෂක සේවා සපයන අතර නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය සහායක සේවා සැපයීම සහ තේරීම්භාර නිලධාරීන් විසින් ඉල්ලා සිටි අවස්ථාවන්හි දී ඡන්ද විමසීම් හා සම්බන්ධ සේවා සඳහා අවශ්‍ය සහාය ලබාදීම පිළිබඳව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු ප්‍රධානි ඇතුළු කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය හිමිවිය යුතුය. තවද අවශ්‍ය ඕනෑම විටක පොලිස් දෙපාර්තමේන්තුවට සහාය වීමට අපේක්ෂාවෙන් සුදානම්ව සිටි ත්‍රිවිධ හමුදාපතිවරු ඇතුළු සියලුම නිලධාරීන්ට ද මැතිවරණ කොමිෂන් සභාවේ කෘතඥතාව හිමි වේ. එමෙන්ම විශේෂයෙන් උතුරු පළාතේ හා අවශ්‍ය වූ වෙනත් ඡන්ද මධ්‍යස්ථානවලට මුහුදු මාර්ගයෙන් ප්‍රවාහන පහසුකම් සපයාදීම වෙනුවෙන් නාවික හමුදාපතිවරයාට ද ඒ සඳහා සහාය වූ ඔහුගේ කාර්යය මණ්ඩලයට ද ස්තුතිවන්ත වෙමු.

ඡන්ද විමසීමට අදාළ මුද්‍රණ කටයුතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ඉටුකිරීම රජයේ මුද්‍රණාලය වෙත පවරන ලදී. ඒ අනුව විශේෂ ආරක්ෂාවක් යටතේ රජයේ මුද්‍රණාලයේ රහස් අංශයේ දී ඡන්ද පත්‍රිකා මුද්‍රණය කරනු ලැබූ අතර, අනෙකුත් අවශ්‍ය ලියකියවිලි විශාල ප්‍රමාණයක් ද මුද්‍රණය කර දීමට ඔවුන් කටයුතු කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් අපේක්ෂා කළ පිරිවිතර අනුව හා කාලවකවානුව තුළ එම මුද්‍රණ කටයුතු ඉටු කර දීම පිළිබඳව හා ඉතා මිත්‍රශීලිව සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳව රජයේ මුද්‍රණාලයාධිපතිණියටත් ඇයගේ කාර්ය මණ්ඩලයටත් විශේෂ ප්‍රශංසාවක් හිමි වේ.

ඡන්ද හිමියන්ගේ ගෘහයන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම, තැපැල් ඡන්ද පිළිබඳව ක්‍රියා කිරීම හා හදිසි මැතිවරණ ලිපි බෙදා හැරීම යන කාර්යයන් නිසිලෙස ඉටු කරනු ලැබූ තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පතිවරයා ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට ද, මැතිවරණ කොමිෂන් සභාවේ කෘතඥතාව පළකර සිටිමු.

ඡන්ද විමසීම් අවස්ථාව වනවිට තමා සතුව ජාතික හැඳුනුම්පතක් නොමැති බැවින් ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අයදුම්කරුවන් වෙත ජාතික හැඳුනුම්පතේ සඳහන් වන තොරතුරු ඇතුළත් විශේෂිත කඩදාසියක මුද්‍රිත සහතිකයක් තාවකාලිකව හැඳුනුම්පතක් ලෙස පාවිච්චි කිරීමට හැකිවන ලෙස ඉතාම කෙටි කාල සීමාවක් තුළ දී ලබාදීමට ක්‍රියාකර තිබූ අතර, එය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වූ වලංගු අනන්‍යතා ලේඛනයක් ලෙස

පිළිගන්නා ලදී. මේ සඳහා ක්‍රියාකළ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යමණ්ඩලය වෙත ද මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය හිමිවේ. වලංගු හැඳුනුම්පතක් නොමැති වූ ඡන්ද හිමියන් වෙත තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමේදී දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට සියලුම ග්‍රාම නිලධාරීන් සහ වතු අධිකාරීවරුන් ද සහාය දක්වන ලදී. එම කටයුතුවල දී සහාය වූ නිරීක්ෂණ සංවිධානවලට ද මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය පළකරනු ලැබේ.

ඡන්ද විමසීම් කාර්යය ජාතික අවශ්‍යතාවක් සේ සලකා ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මෙන්ම පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගම් හා පළාත් බද මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය විසින් ඡන්දදායකයන්ට ඡන්ද පොළ කරා යාමේ පහසුකම් ඇතුළු ඡන්ද විමසීමට අදාළ සියලු ප්‍රවාහන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට සහය දෙන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් හා කොන්දේසි යටතේ ඔවුන් විසින් දක්වන ලද සහය පිළිබඳ එම ආයතන ප්‍රධානීන්ටත් රාජකාරි වල නිරත වූ සියලු දෙනාටත් ප්‍රශංසා කරනු ලැබේ.

තවද, ප්‍රවාහන කටයුතු සඳහා රජයේ වාහන වලට අමතරව වාහන අවශ්‍ය වූ විට මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මිළ ගණන් යටතේ කුළී පදනමින් වාහන ලබා දුන් වාහන හිමිකරුවන්ට ද, ස්තුතිය ප්‍රකාශ කරනු ලැබේ. පෙර පැවති ඡන්ද විමසීම් වලදී මෙන්ම ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රවලට අවශ්‍ය අමතර විදුලිය සැපයීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් ද අවශ්‍ය දුරකථන සම්බන්ධතා සහ අන්තර්ජාල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ද අමතර ජල පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ද ඉටු කර දෙන ලදී. සපයන ලද සේවාවන් වෙනුවෙන් එම ආයතනවල කාර්ය මණ්ඩලයට කෘතඥතාව පුද කෙරේ.

ඡන්ද විමසීමේදී ඡන්ද මධ්‍යස්ථාන ලෙස හා ඡන්ද ගණන් කිරීමේ කටයුතු සඳහා රජයේ පාසල් ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රමුඛ නිලධාරීන්ට ද සියලුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ට ද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල ලේකම්වරුන්ට ද එකී පාසල්වල තිබූ පහසුකම් පරිහරණයට අවස්ථාව ලබා දීමට එකඟතාව දැක්වූ පාසල් ප්‍රධානීන්ට ද විශේෂ ස්තුතියක් පිරිනමනු කැමැත්තෙමු. එමෙන්ම ඡන්ද ගණන් කිරීම සඳහා කාර්මික විද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ ඇතුළු වෙනත් ස්ථාන ලබා දුන් එම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ට ද අපගේ ස්තුතිය හිමවේ. ඡන්ද මධ්‍යස්ථාන සඳහා ස්වකීය භාරකාරීත්වයේ ඇති විහාරස්ථාන හා ආගමික ස්ථාන ලබා දුන් විහාරාධිපති ස්වාමීන් වහන්සේලාට හා අන්‍යාගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලා වෙත ද ගෞරව පූර්වකව ස්තුතිවන්ත වෙමු. තවද ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ස්වකීය පෞද්ගලික ගොඩනැගිලි හා ඉඩම් ලබා දුන් එකී දේපළ හිමිකරුවන්ට ද මැතිවරණ කොමිෂන් සභාවේ කෘතඥතාව හිමිවේ.

නාමයෝජනා භාරගත් දිනයේ සිට ඡන්ද විමසීම අවසන් වන දිනය තෙක් දිවයින තුළ පැවතියේ යහපත් කාලගුණ තත්ත්වයක් නොවේ. ඒ හේතුව නිසාම දිවයිනේ බොහෝ ප්‍රදේශවල දී කඳු නායයාම්, මාර්ග අවහිරතා, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ගංවතුර, අකුණු සැර වැදීම් වැනි ස්වාභාවික විපත්වලට මුහුණ දීමට සිදුවිය. එසේ වුවද මෙම සියළු දුෂ්කරතා මධ්‍යයේ ඡන්ද විමසීම බාධාවකින් තොරව නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවැසි පූර්වෝපායන් යෙදීම පිළිබඳව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්, ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකවල නිලධාරීන් හා කාර්ය

මණ්ඩල වෙත ද කෘතඥතාව පිරිනමනු ලැබේ. මෙම වැඩ පිළිවෙල සඳහා අවශ්‍ය සහාය ලබාදුන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන්, යුද, නාවික, ගුවන් හමුදාපතිවරුන් හා පොලිස්පති වෙත ද ඔවුන්ගේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා ඒ සඳහා සහාය වූ සියලුම ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වෙත ද පොලිස් නිලධාරීන් වෙත ද මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය හිමිවේ. වර්ෂයේ නොවැම්බර් - දෙසැම්බර් කාල සීමාව තුළ ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවන බැවින් ඒ වකවානුවේ දී ඇතිවිය හැකි ස්වාභාවික විපත් හා හදිසි ආපදාවල දී ක්‍රියාකිරීමේ පූර්ව සූදානමක් සැකසීමේ අවශ්‍යතාව පිළිබඳ නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමට පෙර සිටම එවකට නාවික හමුදාපතිවරයා විසින් මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනු ලැබූ අතර ඒ පිළිබඳව ඔහුට අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

මැතිවරණ කොමිෂන් සභාවේ සියලුම නිවේදන හා නිල ප්‍රතිඵල මාධ්‍යවලට මුදාහැරීමේ දී ද මාධ්‍ය උපමාන බලාත්මක කිරීමේ දී ද අවශ්‍ය සෑම විටම ජනමාධ්‍ය සම්බන්ධීකරණයේ දී ද අමිල කාර්ය භාරයක් ඉටු කළ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය සහ නාම යෝජනා දැන්වීම පළ කළ දින සිට මැතිවරණ කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී නිවැරදි තොරතුරු මහජනතාවට ලබා දීමට හා ඡන්ද හිමියන් දැනුම්වත් කිරීමට කටයුතු කළ මාධ්‍ය ආයතන සහ එම මාධ්‍ය ආයතන නියෝජනය කරනු ලබන මාධ්‍යවේදීන් දැක්වූ සහයෝගය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. එමෙන්ම මාධ්‍ය උපමානවලට අනුව ක්‍රියාකිරීම සඳහා කැපවූ මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ප්‍රධාන විධායකවරුන්, ප්‍රවෘත්ති සංස්කාරකවරුන්, ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන් හා පුවත්පත්වල ප්‍රධාන කර්තෘවරුන්ට ද මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය පිරිනමමු.

ජනාධිපතිවරා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් කාල සීමාව තුළ සමාජ මාධ්‍ය ජාලා විශේෂයෙන්ම මුහුණු පොත (Facebook) ඔස්සේ අසත්‍ය ප්‍රකාශ, වෛරී ප්‍රකාශ සිදුවන බවට වූ පැමිණිලි සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමෙන් අනතුරුව එවැනි දෑ අන්තර්ජාලයෙන් ඉවත් කිරීමට ක්‍රියාකිරීම පිළිබඳව ඒවායේ පරිපාලකවරුන්ට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරමු.

20.	බත්තරමුල්ලේ සීලරතන හිමි, අංක 185/5/B, දේවාල පාර, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.	ජනසෙත පෙරමුණ		දේමුණි ධනුජ සම්පත් මහතා, අංක 185/5/B, දේවාල පාර, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.
21.	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා, අංක 68/2, කැකුණගහවත්ත, මාකන්දන, මඩපාත.	නව සමසමාජ පක්ෂය		බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා, අංක 68/2, කැකුණගහවත්ත, මාකන්දන, මඩපාත.
22.	සරත් මනමේන්ද්‍ර මහතා, අංක 75/5/බී, යූ. එල්. එල්. පෙරේරා මාවත, කුරුඳුවත්ත, තුඩැල්ල, ජා ඇල.	නව සිහළ උරුමය		සරත් මනමේන්ද්‍ර මහතා, අංක 75/5/බී, යූ. එල්. එල්. පෙරේරා මාවත, කුරුඳුවත්ත, තුඩැල්ල, ජා ඇල.
23.	එම්. කේ. සිවාජිලිංගම් මහතා, අංක 08, අම්මාන් කෝවිලාඩි, වෙල්වැටිතුරෙයි.	සසිදරන් අනන්දි මහත්මිය		සසිදරන් අනන්දි මහත්මිය, පන්නාගම්, සුලිපුරම්.
24.	එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08.	මොහමඩ් සහාබ්දීන් මොහමඩ් ඉක්රාම් මහතා		අහමඩ් හිරාස් හිස්බුල්ලාහ් මහතා, අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08.

උපලේඛනය (සම්බන්ධිතයි)

අනු අංකය	*අපේක්ෂකගේ නම සහ ලිපිනය*	*පිළිගත් දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ නාමයෝජනා කළ ඡන්ද හිමියාගේ නම*	*ලකුණ*	*ඡන්ද නියෝජිතගේ නම සහ ලිපිනය*
25.	ගෝඨාභය රාජපක්ෂ මහතා, අංක 26/A, පැගිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.	ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ		හපුතන්ත්‍රි ගමගේ සාගර කාරියවසම් මහතා, අංක 11/08, රොබට් අල්විස් මාවත, බොරලැස්ගමුව.
26.	නාමල් රාජපක්ෂ මහතා, අංගොඩ විලේජ්, 44/48, නුවර පාර, පැලියගොඩ.	ජාතික සමගි පෙරමුණ		හේමන්ත වික්‍රමසිංහ මහතා, අංක 2/2, කහවිට මාවත, අත්තිඩිය, දෙහිවල.
27.	ඒ. එස්. පී. ලියනගේ මහතා, අංක 07, සම්නර් පෙදෙස, කොළඹ 08.	ශ්‍රී ලංකා කම්කරු පක්ෂය		ඒ. එස්. පී. ලියනගේ මහතා, අංක 07, සම්නර් පෙදෙස, කොළඹ 08.
28.	අශෝක වඩිගමංගාව මහතා, අංක 59/1, පුත්තලම් පාර, ආණමඩුව.	වීරවන්නි මුදියන්සේලාගේ සුමුදු ජයමාලි වීරවන්නි මෙනවිය		තිසත් දේවප්‍රිය බණ්ඩාර විජයගුණවර්ධන මහතා, අංක 31/2, ගිල්ෆර්ඩ් වන්ද්‍රවංකය, කොළඹ 07.
29.	පියසිරි විජේනායක මහතා, අංක 3/7, සෙන්ට්‍රාපාක්, ගම්පහ පාර, යක්කල.	වනසිංහ ආරච්චිල්ලාගේ රංජිත් වනසිංහ මහතා		ජේ. එම්. කේ. චරිත් ජයසුන්දර මහතා, අංක 2/16, සියඹලාපේ දකුණ, සියඹලාපේ.
30.	අජන්තා පෙරේරා මහත්මිය, අංක 16, පන්සල පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.	ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය		මහින්ද දේවගේ මහතා, අඟුරුවාමුල්ල පාර, ඇහැලියගොඩ.
31.	රාජීව විජේසිංහ මහතා, අංක 08, ඇල්ෆ්‍රඩ් නිවාස පාර, කොළඹ 03.	බණ්ඩාරගේ සරත් බුද්ධදාස මහතා		රාජීව විජේසිංහ මහතා, අංක 08, ඇල්ෆ්‍රඩ් නිවාස පාර, කොළඹ 03.
32.	පානි විජේසිරිවර්ධන මහතා, අංක 716 1/1, කෝට්ටේ පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.	සමාජවාදී සමානතා පක්ෂය		ඩබ්ලිව්. ඒ. සුනිල් මහතා, අංක 716/1/1, කෝට්ටේ පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.

උපලේඛනය (සම්බන්ධිතයි)

අනු අංකය	*අපේක්ෂකගේ නම සහ ලිපිනය*	*පිළිගත් දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ නාමයෝජනා කළ ඡන්ද හිමියාගේ නම*	*ලකුණ*	*ඡන්ද නියෝජිතගේ නම සහ ලිපිනය*
33.	සමරවීර වීරවන්නි මහතා, කහන්තේවෙල, බණ්ඩාරවෙල.	කුමාරසිංහ විදානේලාගේ දොන් නාලනී පද්මලතා මහත්මිය		මොහොමඩ් ෆර්මාන් ජෙහාන් කාසීම් මහතා, අංක 7/2, කාර්ල්ශු උද්‍යානය, කොළඹ 10.
34.	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා, අංක 134/C/22, ස්ටේස් පුර, 2 අදියර, විහාර පෙදෙස, කොළඹ 14.	අපේ ජාතික පෙරමුණ		සේනක හරිප්‍රිය අර්නොල්ඩ් ද සිල්වා මහතා, අංක 347/A, කෝට්ටේ පාර, මිරිහාන, නුගේගොඩ.
35.	මහේෂ් සේනානායක මහතා, අංක 40/24, රිවර් සයිඩ් පාර්ක් රෙසිඩන්සීස්, කඳුරුදූව, ගොරකාන, මොරටුව.	ජාතික ජනතා පක්ෂය		ඇන්ටනි ශ්‍රීනාත් මනෝහන් පෙරේරා මහතා, අංක 428/5, සුනේත්‍රා දේවී පාර, පැපිලියාන, නුගේගොඩ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ඇමුණුම අංක 09



මැතිවරණ කොට්ඨාස
කොළඹ දිස්ත්‍රික්කය
1 උතුරු කොළඹ
2 මැද කොළඹ
3 බොරැල්ල
4 නැගෙනහිර කොළඹ
5 බටහිර කොළඹ
6 දෙහිවල
7 රත්මලාන
8 කොලොන්නාව
9 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
10 කඩුවෙල
11 අවිස්සාවේල්ල
12 හෝමාගම
13 මහරගම
14 කැස්බෑව
15 මොරටුව
ගම්පහ දිස්ත්‍රික්කය
16 වත්තල
17 මීගමුව
18 කටාන
19 දිවුලපිටිය
20 මිරිගම
21 මිනුවන්ගොඩ
22 අත්තනගල්ල
23 ගම්පහ
24 ජා ඇල
25 මහර
26 දොම්පෙ
27 බියගම
28 කැලණිය
කළුතර දිස්ත්‍රික්කය
29 පානදුර
30 බණ්ඩාරගම
31 හොරණ
32 බුලත්සිංහල
33 මතුගම
34 කළුතර
35 බේරුවල
36 අගලවත්ත
මාතලේ දිස්ත්‍රික්කය
37 දඹුල්ල
38 ලග්ගල
39 මාතලේ
40 රත්තොට
මහනුවර දිස්ත්‍රික්කය
41 ගලගෙදර
42 හාරිස්පත්තුව
43 පාතදුම්බර
44 උඩදුම්බර
45 තෙල්දෙණිය
46 කුණ්ඩසාලේ
47 හේවාහැට
48 සෙංකඩගල
49 මහනුවර
50 යටිනුවර
51 උඩුනුවර
52 ගම්පොල
53 නාවලපිටිය
නුවරඑළිය දිස්ත්‍රික්කය
54 නුවරඑළිය - මස්කෙළිය
55 කොත්මලේ
56 හඟුරන්කෙත
57 වලපනේ
ගාල්ල දිස්ත්‍රික්කය
58 බලපිටිය
59 අම්බලන්ගොඩ
60 කරන්දෙණිය
61 බෙන්තර-ඇල්පිටිය
62 හිනිදුම
63 බද්දේගම
64 රත්ගම
65 ගාල්ල
66 අක්මීමන
67 හබරාදුව
මාතර දිස්ත්‍රික්කය
68 දෙණියාය
69 හක්මන
70 අකුරැස්ස
71 කඹුරුපිටිය
72 දෙවිනුවර
73 මාතර
74 වැලිගම
හම්බන්තොට දිස්ත්‍රික්කය
75 මුල්කිරිගල
76 බෙලිඅත්ත
77 තංගල්ල
78 තිස්සමහාරාමය
යාපනය දිස්ත්‍රික්කය
79 කයිට්ස්
80 වඩිඩුක්කොඩෙයි
81 කන්කසන්තුරේ
82 මනිපායි
83 කෝපායි
84 උඩුප්පිඩිවි
85 පේදුරුතුඩුව
86 චාවකච්චේරි
87 නල්ලූර්
88 යාපනය
89 කිලිනොච්චිය
වන්නි දිස්ත්‍රික්කය
90 මන්නාරම
91 මුලතිව්
92 වවුනියාව
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය
93 සේරුවිල
94 ත්‍රිකුණාමලය
95 මුතූර්
මඩකලපුව දිස්ත්‍රික්කය
96 කල්කුඩා
97 මඩකලපුව
98 පද්දිරුප්පු
දිගමඩුල්ල දිස්ත්‍රික්කය
99 අම්පාර
100 සමන්තුරේ
101 කල්මුනේ
102 පොතුවිල්
පුත්තලම දිස්ත්‍රික්කය
103 පුත්තලම
104 ආනමඩුව
105 හලාවත
106 නාත්තන්ඩිය
107 වෙන්නප්පුව
කුරුණෑගල දිස්ත්‍රික්කය
108 ගල්ගමුව
109 නිකවැරටිය
110 යාපහුව
111 හිරියාල
112 වාරියපොල
113 පඩුවස්නුවර
114 බිංගිරිය
115 කටුගම්පොල
116 කුලියාපිටිය
117 දඹදෙනිය
118 පොල්ගහවෙල
119 කුරුණෑගල
120 මාවතගම
121 දොඩම්ගස්ලන්ද
අනුරාධපුර දිස්ත්‍රික්කය
122 මැදවච්චිය
123 හොරොව්පොතාන
124 අනුරාධපුර නැගෙනහිර
125 අනුරාධපුර බටහිර
126 කලාවැව
127 මිහින්තලේ
128 කැකිරාව
පොලොන්නරුව දිස්ත්‍රික්කය
129 මින්නේරිය
130 මැදිරිගිරිය
131 පොලොන්නරුව
බදුල්ල දිස්ත්‍රික්කය
132 මහියංගනය
133 වියලුව
134 පස්සර
135 බදුල්ල
136 හාලි-ඇල
137 උඩ පරණගම
138 වැලිමඩ
139 බණ්ඩාරවෙල
140 හපුතලේ
මොණරාගල දිස්ත්‍රික්කය
141 බිබිල
142 මොණරාගල
143 වැල්ලවාය
කෑගල්ල දිස්ත්‍රික්කය
144 දදිගම
145 ගලිගමුව
146 කෑගල්ල
147 රඹුක්කන
148 මාවනැල්ල
149 අරනායක
150 යටියන්තොට
151 රුවන්වැල්ල
152 දරණියගල
රත්නපුර දිස්ත්‍රික්කය
153 ඇහැලියගොඩ
154 රත්නපුර
155 පැල්මඩුල්ල
156 බලන්ගොඩ
157 රක්වාන
158 නිවිතිගල
159 කලවාන
160 කොලොන්න
අතුරු සිතියම බලන්න
අතුරු සිතියම
නිර්මාණය - ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
විශේෂ සිතියම් ඒකකය

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ රැස්වීම - 2019.11.16

ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ යොදාගත් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	ඡන්ද කොට්ඨාස ගණන	ඡන්ද දායිකාවන් සඳහා වෙන් වූ මධ්‍යස්ථාන ගණන	රජයේ පාසල් ගොඩනැගිලි සංඛ්‍යාව	රජයේ වෙනත් ගොඩනැගිලි සංඛ්‍යාව	වෙනත් පොදු ගොඩනැගිලි සංඛ්‍යාව	ආගමික ස්ථාන	තාවකාලික / වෙනත් ඡන්ද මධ්‍යස්ථාන ගොඩනැගිලි සංඛ්‍යාව	ඡන්ද මධ්‍යස්ථාන ගණන
කොළඹ නාගරික	1166	9	1043	72	102	363	95	1175
ගම්පහ	1,171	13	746	91	64	271	12	1,184
කළුතර	540	105	386	35	21	148	15	710
මහනුවර	825	8	584	47	80	123	1	835
මාතලේ	324	4	270	16	12	29	-	327
නුවරඑළිය	485	3	417	21	21	22	4	488
ගාල්ල	712	-	367	74	42	229	-	712
මාතර	445	-	326	24	7	101	-	458
හම්බන්තොට	413	-	260	72	25	56	-	413
යාපනය	531	-	476	19	34	2	-	531
කිළිනොච්චිය	100	-	71	29	-	-	-	100
මන්නාරම	75	1	75	1	-	-	-	76
වවුනියාව	142	-	123	17	-	17	-	142
මුලතිව්	134	-	102	33	-	-	-	135
මඩකලපුව	416	12	379	30	12	7	-	428
දිගාමඩුල්ල	523	-	450	44	8	21	-	523
ත්‍රිකුණාමලය	307	-	275	4	15	13	-	307
කුරුණෑගල	950	9	686	46	52	168	2	959
පුත්තලම	387	24	272	25	13	23	-	411
අනුරාධපුර	634	-	425	26	73	101	9	634
පොළොන්නරුව	287	1	204	46	-	38	-	288
බදුල්ල	523	-	445	42	4	32	-	523
මොණරාගල	351	-	267	9	46	29	-	351
රත්නපුර	627	-	466	-	30	118	13	627
කෑගල්ල	573	1	408	12	57	95	-	574
එකතුව	12,641	190	9,023	835	718	2,006	151	12,911

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2141/87 - 2019 සැප්තැම්බර් මස 21 වැනි සෙනසුරාදා - 2019.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(5)(අ), (ආ), (ඇ) (i) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන මාධ්‍ය උපමාන.

මහින්ද දේශප්‍රිය	එන්. ජේ. අබේසේකර	එස්. රත්නජීවන් එච්. හූල්
සභාපති	සාමාජික	සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

01. සෑම මාධ්‍ය ආයතනයක්ම සිය ප්‍රවෘත්ති සංග්‍රහය සහ දේශපාලන කටයුතු හා සම්බන්ධ වෙනත් වැඩසටහන් ප්‍රචාරය හෝ විකාශය කිරීමේ දී හෝ ප්‍රසිද්ධියට පත් කිරීමේ දී නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාති තොරතුරු ලබා දිය යුතු වේ. මැතිවරණ පැමිණිලි පිළිබඳ නිත්‍ය නියෝජිත කමිටුව සහ මාධ්‍ය උපමාන පිළිබඳ නිත්‍ය නියෝජිත කමිටුව, මාධ්‍යවල මධ්‍යස්ථ හා අපක්ෂපාතීත්වය පිළිබඳව නිරන්තරයෙන් නිරීක්ෂණය කළ යුතු ය.

02. සෑම රූපවාහිනී මාධ්‍යයක්ම, ගුවන්විදුලි මාධ්‍යයක්ම සහ මුද්‍රිත මාධ්‍යයක්ම යම් මැතිවරණයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී මධ්‍යස්ථ සහ අපක්ෂපාතී විය යුතු වන අතර, තරග කරනු ලබන යම් දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට අසාධාරණයක් සිදු නොවන පරිදි හා විශේෂ වාසියක් ඇති නොවන පරිදි දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට ගුවන්විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ගුවන් කාලය ලබා දීම හෝ ප්‍රවෘත්ති පත්‍රයක ඉඩ වෙන්කර දීම කළ යුතු වේ.

03. ප්‍රවෘත්ති පත්‍රවල කර්තෘ වාක්‍ය පිළිබඳ විද්‍යුත් මාධ්‍ය මගින් අදහස් දැක්වීමේ දී ව්‍යාකුල සහ පක්ෂපාති වීමට ඉඩ ඇති බැවින් ප්‍රවෘත්ති පත්‍රවල කර්තෘ වාක්‍ය පිළිබඳ අදහස් නොදැක්විය යුතු ය. කර්තෘ මතයක් ප්‍රචාරය කිරීම, විකාශය කිරීම හෝ පළ කිරීම කරනු ලබන කවර හෝ අවස්ථාවක දී ඉන් අගතියට පත් පාර්ශ්වයට හා එම මතයට විරුද්ධව ඉදිරිපත් කරන කරුණු ප්‍රචාරය කිරීමට, විකාශය කිරීමට හෝ පළ කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

1A - PG 4661 — 757 (2019/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04. රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකාවක වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන හෝ නිවේදනය කරනු ලබන සෑම තැනැත්තකුම, පුවත්පත් වැඩසටහන්වල දී පුවත්පත් සිරස්තල සහ කාටුන් විස්තර ඉදිරිපත් කිරීමේ දී එක් පාර්ශ්වයක් ප්‍රවර්ධනය කරන හෝ තවත් පාර්ශ්වයකට අගතියක් ගෙන දෙන අයුරින් සිය පුද්ගලික අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතු වේ.

05. යම් වැඩසටහනක්, අතිරේකයක් හෝ ප්‍රවෘත්ති අංගයක් මැතිවරණ නීති සහ මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමානවලට අනුකූල නොවන්නේ නම් මැතිවරණ කාල සීමාව තුළ දී එවැනි පක්ෂග්‍රාහී වැඩසටහනක් හෝ අතිරේකයක් ප්‍රචාරය, විකාශය හෝ පළ නොකිරීම සියලු විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති සහ කාලීන පුවත් අංශවල වගකීම වන්නේ ය.

06. මැතිවරණ කාලසීමාව තුළ දී යම් සිද්ධියක් හෝ සිදුවීමක් ආවරණය කරමින් ඒ පිළිබඳව කරුණු එක් අපේක්ෂකයකු විසින් සිදු කරන අදහස් දැක්වීම් සහිතව ප්‍රචාරය කිරීමේ දී, විකාශය කිරීමේ දී හෝ පළ කිරීමේ දී එම සිද්ධිය ගැන උනන්දුවක් හෝ සැලකිල්ලක් දක්වන හෝ එම කරුණු මගින් බලපෑමට ලක්විය හැකි වෙනත් යම් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද එම සිද්ධිය හෝ සිදුවීම පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

07. යම් මැතිවරණ කාලසීමාවක් තුළ ප්‍රචාරය හෝ විකාශය කරනු ලබන මැතිවරණයට සෘජුවම සම්බන්ධ වන යම් වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩසටහනක් ප්‍රචාරය හෝ විකාශය කිරීමේ දී පිටපත් රචක, නිවේදක හා සංස්කාරකවරයාගේ නම් හෙළිදරව් කළ යුතු ය. එම තොරතුරු හෙළිදරව් නොකිරීමේ අයිතිය යම් මාධ්‍ය ආයතනයක් විසින් රඳවා තබා ගන්නේ නම්, එම අවස්ථාවේ දී එම වැඩසටහන භාරව සිටින නිලධරයා එම වැඩසටහනේ අන්තර්ගතය පිළිබඳ වගකීම භාරගත යුතු ය.

08. යම් මැතිවරණයක් තරග කරන අපේක්ෂකයකුට විරුද්ධව තහවුරු කළ නොහැකි නම් සහ නිරවද්‍යතාව ඔප්පු කළ නොහැකි චෝදනා, යම් වැඩසටහනක දී හෝ ප්‍රවෘත්ති විකාශය අතරවාරයේ දී ප්‍රචාරය හෝ විකාශය කිරීමෙන් සියලු මාධ්‍ය ආයතන වැළකී සිටිය යුතු ය. තමන් සම්බන්ධයෙන් වෙනත් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් කරන ලද ප්‍රකාශයක් අසත්‍ය හෝ අගතිදායක බවට යම් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු කියා සිටින්නේ නම් එම ප්‍රකාශයට විරුද්ධව කරුණු දැක්වීමට එකී පක්ෂයට, ස්වාධීන කණ්ඩායමට හෝ අපේක්ෂකයාට අවස්ථාවක් ලබා දිය යුතු ය.

09. යම් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කරන හෝ අගතියට පත් විය හැකි ආකාරයේ යම් රාජකාරී උත්සවයක් හෝ අවස්ථාවක් ආවරණය කරමින් අපරාධයකට සම්බන්ධ වන්නා වූ යම් ප්‍රවෘත්තියක් හෝ වැඩසටහනක්, එම ප්‍රවෘත්තිය හෝ වැඩසටහන මැතිවරණයකට සම්බන්ධ නොවූව ද, සෑම මාධ්‍ය ආයතනයක්ම එම ප්‍රවෘත්තිය හෝ වැඩසටහන පළ කරනු ලබන්නේ නම්, එහි නිරවද්‍යතාව තහවුරු කරගැනීම සඳහා අදාළ අනෙකුත් පාර්ශ්වයන්ගෙන් ද කරුණු විමසා සිටිය යුතු ය.

10. ඡන්ද විමසීම් කාලසීමාව තුළ ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ යම් අමාත්‍යවරයකු විසින් මත හෝ අදහස් ප්‍රකාශ කරන අවස්ථාවක් ගුවන්විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ආවරණය කරන ලද අවස්ථාවක, එය එම තැනැත්තා අයත්වන දේශපාලන පක්ෂයට දෙන ලද ආවරණයක් ලෙස සැලකිය යුතු ය. එහෙයින් එම මැතිවරණය තරග කරන යම් ප්‍රතිවාදී දේශපාලන පක්ෂයක නායකයකුට ද වැඩසටහන්වල දී ඒ හා සමාන අවස්ථාවක් ලබා දිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය ද ඒ අයුරින් ම විශේෂ සාකච්ඡා පළ කිරීමේ දී සහ ප්‍රචාරක රැස්වීම් වාර්තා පළ කිරීමේ දී සියලු දේශපාලන පක්ෂවලට, ස්වාධීන කණ්ඩායම්වලට හා අපේක්ෂකයින්ට සමාන ඉඩක් හා ප්‍රමුඛතාවක් ලබා දිය යුතු ය.

11. යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයකු හට අගතියක් වන අයුරින් යම් අපේක්ෂකයකු වෙත විශේෂ හා වාසිදායක සැලකිල්ලක් දක්වා ගුවන්විදුලියේ හෝ රූපවාහිනියේ ගුවන් කාලය හෝ ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතු ය.

12. මැතිවරණයක තරඟ වදින යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන අයුරින් හෝ වෙනත් යම් අපේක්ෂකයකු අගතියට පත්වන අයුරින් රාජ්‍ය නිලධාරීන් සමග පවත්වනු ලබන දේශන, සම්මුඛ සාකච්ඡා හා වෙනත් වැඩසටහන් ප්‍රසිද්ධියට පත් කිරීම හෝ පළ කිරීම හෝ විකාශය කිරීම ඡන්ද විමසීම් කාලසීමාවේ දී නොකළ යුතු ය.

13. කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගිවන්නන් තෝරාගැනීමේ දී සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන සහභාගිවන්නන්ගේ සංයුතිය තුලනය වන ආකාරයෙන් සාධාරණ ලෙස කටයුතු කළ යුතු ය. වැඩසටහනකට සහභාගි වන යම් තැනැත්තකු ප්‍රවීණත්වයක් නොදක්වන යම් භාෂාවක් යොදා ගනිමින් එම සහභාගිවන්නාට අගතියක්වන ආකාරයට වැඩසටහන මෙහෙයවීමෙන් යම් මාධ්‍ය ආයතනයක් වැළකිය යුතු ය. සහභාගිවන්නන්ගේ සම්මුඛ සාකච්ඡා පළ කිරීමේ දී ද ඒවා එම තැනැත්තා ප්‍රවීණත්වය දක්වන භාෂාවෙන් පළ කළ යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබා ගන්නා තොරතුරු පළ නොකළ යුතු අතර, එවැනි ප්‍රශ්න කිසිවිටෙකත් නොඇසිය යුතු ය. සදාචාර විරෝධී හෝ ආගමික සංහිඳියාවට හෝ වාර්ගික සමගියට හානි වන ආකාරයේ ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙසට සහභාගිවන්නන්ට වැඩසටහනක් ආරම්භයේ දී ම දැන්විය යුතු අතර, සාකච්ඡාව අතරතුර දී එවැනි ප්‍රකාශ කරනු ලැබුවහොත් වැඩසටහන වහාම නැවැත්විය යුතු ය.

14. දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න හා තොරතුරු ලබා ගනිමින් පවත්වනු ලබන යම් වැඩසටහනක දී සියලුම අමතන්නන්ට, සදාචාර විරෝධී හෝ ආගමික සංහිදියාවට හෝ වාර්ගික සමගියට හානිදායක නොවන අයුරින් හා මැතිවරණ නීතිවලට අනුකූලව ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න හා යෝජනාවලට සමාන අවස්ථා ලබා දිය යුතු ය. එවැනි වැඩසටහනක් මෙහෙයවනු ලබන සෑම තැනැත්තෙකුම සමබර නොවන්නා වූ එවැනි යම් වැඩසටහනක් සම්බන්ධයෙන් වගකිව යුතු ය.

15. යම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂවරයකු හෝ මාධ්‍යවේදියකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටී නම් සහ සමබර ප්‍රවෘත්ති. ප්‍රචාරයට හෝ පළ කිරීමට එමගින් බැඳියාවන් අතර ගැටීමක් ඇතිවන අවස්ථාවක, එකී තැනැත්තා විසින් පහත සඳහන් කරුණු ආයතනයේ කළමනාකාරීත්වයට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(අ) එම පුද්ගලයාගේ දේශපාලන ක්‍රියාවල මැදිහත්වීමේ ස්වභාවය ;
(ආ) ආයතනයෙහි එම පුද්ගලයා දරන තනතුරු, සහ ;
(ඇ) වැඩසටහන් සංවිධානය කිරීමේ දී හෝ මෙහෙයවීමේ දී එම පුද්ගලයාගේ මැදිහත්වීමේ ප්‍රමාණය.

16. යම් පිළිගත් දේශපාලන පක්ෂයකට කිසියම් නිලයක් දරන යම් තැනැත්තකු මාධ්‍ය ආයතනයක සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක හෝ ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විට දී එකී තැනැත්තා යම් මැතිවරණයක අපේක්ෂකයකු වන්නේ නම් හෝ ඔහුගේ පක්ෂය යටතේ සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් හෝ මැතිවරණයේ දී තරඟ කරයි නම් හෝ එම තැනැත්තා මාධ්‍ය ආයතනයේ තමාට පැවරී ඇති කටයුතු ක්‍රියාකාරීව කිරීමෙන් වැළකී සිටිය යුතු ය. තව ද, එකී තැනැත්තා මැතිවරණ අපේක්ෂකයකු වන්නේ නම් හෝ මැතිවරණයක දී තරඟ කරන පක්ෂයක ප්‍රධාන නිලයක් දරන තැනැත්තකු වන්නේ නම් ඔහු රූපවාහිනී හෝ ගුවන්විදුලි නාලිකාවක දේශපාලනමය ස්වභාවයේ වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකී සිටිය යුතු අතර, මුද්‍රිත මාධ්‍යයක් සම්බන්ධයෙන්වන විට, එකී මාධ්‍ය හරහා දේශපාලනමය ලිපිලේඛන පළකිරීමෙන් වැළකී සිටිය යුතු ය.

17. යම් මාධ්‍ය ආයතනයක් විසින් කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගිවීම, දේශපාලන පක්ෂයක යම් තැනැත්තකු විසින් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එසේ සහභාගී නොවීම තහවුරු කිරීම සඳහා එම මාධ්‍ය ආයතනය විසින් හිස් පුටුවක් ප්‍රදර්ශනය කිරීම හෝ එවැනි ජවනිකාමය තත්ත්වයක් නිර්මාණය කිරීම නොකළ යුතු ය. සහභාගීවන්නා නොපැමිණීම සම්බන්ධව සෘජු හා සරල නිවේදනයක් කිරීම යෝග්‍ය වේ.

18. ඡන්දයක මත විමසුමක ප්‍රතිඵල විකාශය කරන විද්‍යුත් මාධ්‍යයක් හෝ එය පළ කරන මුද්‍රිත මාධ්‍යයක් එම මත විමසුම පවත්වන ලද සංවිධානයේ නම හෝ එම කාර්යය පවරන ලද හා ඒ සඳහා මුදලින් ප්‍රතිපාදන ලබාදුන් ආයතන හෝ තැනැත්තාගේ නම ඒ සඳහා යොදා ගන්නා ලද ක්‍රමය, නියදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ සමීක්ෂණය කළ කාලසීමාව සඳහන් කළ යුතු ය. තව ද, එම මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් එයින් පිළිබිඹුවන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතුය.

19. යම් අපේක්ෂකයකු විසින්, තමා අයත් නොවන වෙනත් යම් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා යම් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක එම ප්‍රකාශ විකාශය කිරීම මගින් ඒවාට ප්‍රසිද්ධියක් ලබා නොදිය යුතු ය.

20. මැතිවරණ කොමිෂන් සභාව විසින් ලිඛිත අවසරයක් නොමැතිව යම් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ ඡායාරූප ගැනීම, වීඩියෝගත කිරීමෙන් වැළකී සිටීමට මාධ්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම තැනැත්තන් ක්‍රියා කළ යුතු ය. අනවසරයෙන් ලබා ගන්නා යම් ඡායාරූපයක් හෝ වීඩියෝ දර්ශනයක් පුවත්පත්වල පළ කිරීම, විකාශය කිරීම හෝ කවර හෝ මාධ්‍යයකින් ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය. මැතිවරණ කොමිෂන් සභාවේ අවසර ලබා ගැනීමෙන් පසුව ලබා ගන්නා ලද ඡායාරූප සහ දර්ශන පවා පළ කිරීම හෝ විකාශය කිරීම කළ යුත්තේ ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ය.

21. මැතිවරණ දිනයට පෙරාතුව විකාශය කරන ලද, ප්‍රචාරය කරන ලද හෝ පළ කරන ලද යම් අපේක්ෂකයකු විසින් මෙහෙයවනු ලැබූ හෝ අපේක්ෂකයකු පෙනී සිටි, යම් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කරන හෝ අගතියට පත් කරන යම් වෙළඳ දැන්වීමක්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්, විනෝදාත්මක වැඩසටහනක්, සංවර්ධන කටයුතු හෝ එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධ වැඩසටහනක්, චිත්‍රපටයක්, ටෙලි නාට්‍යයක්, සංගීත ප්‍රසංගයක් හෝ එවැනි ස්වභාවයක වෙනත් යම් වැඩසටහනක් ඡන්ද විමසීමේ දිනට පෙරාතුවම පවතින නිහඬ කාලසීමාව තුළ දී විකාශය කිරීම, ප්‍රචාරය කිරීම හෝ පළ කිරීම නොකළ යුතු ය. ප්‍රචාරක කටයුතු අතරවාරයේ දී දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති සහ ලබා දුන් පොරොන්දුවල හොඳ නරක පිළිබඳව කල්පනා කර බැලීමට හා සලකා බැලීමට ඡන්ද දායකයාට හැකිවන පරිදි නිහඬ වාතාවරණයක් ඡන්ද විමසීම් දිනයට පෙර පැවතීම වැදගත් ලෙස සැලකෙන බැවිනි.

22. සෑම මාධ්‍ය ආයතනයක්ම ආගමික විශ්වාස, ඇදහිලි, කථන භාෂා, වාර්ගිකත්වය, වාරිත්‍ර හා කුල ගෝත්‍ර ඇතුළු විවිධ හේතු පදනම් කර ගනිමින් ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරය හා නොඉවසනසුලු බව ඇති වන හෝ ඇති කරවන ආකාරයට ප්‍රචාරක කටයුතු විකාශය කිරීම, ප්‍රචාරය කිරීම හෝ පළ කිරීමෙන් වැළකිය යුතු ය.

23. සෑම මාධ්‍ය ආයතනයක්ම, සමාජය තුළ හෝ දේශපාලන ක්‍රියාකාරීන් අතර වෛරී සහගත දේශපාලනයක් ප්‍රවර්ධනය වන ආකාරයේ කටයුතු විකාශය කිරීමෙන් , ප්‍රචාරය කිරීමෙන් හෝ පළ කිරීමෙන් වැළකිය යුතු ය.

24. සෑම මාධ්‍ය ආයතනයක්ම, යම් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් වෙනත් පක්ෂයක අපේක්ෂකයකු සම්බන්ධයෙන් අතීතයේ දී කරන ලද ප්‍රකාශයක් එම ප්‍රකාශය කරනු ලැබූ තැනැත්තාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නැවත පළ කිරීමෙන් හෝ නැවත විකාශය කිරීමෙන් වැළකිය යුතු අතර, තමා විසින් පෙර දී කරන ලද ප්‍රකාශය නැවත ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටින ලෙස අදාළ ප්‍රකාශක විසින් කරනු ලබන ඉල්ලීමකට ගරු කළ යුතු ය.

25. කවර හෝ මාධ්‍ය ආයතනයක් නිර්නාමික දැන්වීම් හෝ ප්‍රචාරණ හෝ ව්‍යාජ තැනැත්තන් හෝ සංවිධානවල නම් යටතේ කරනු ලබන දැන්වීම් හෝ ප්‍රචාරණ ආවරණය නොකළ යුතු ය. ඒ සම්බන්ධයෙන් වන වගකීම අදාළ මාධ්‍ය ආයතන වෙත පැවරේ.

26. අවස්ථාවෝචිත පරිදි යම් ප්‍රකාශ හෝ ප්‍රවෘත්ති පළකරන, විකාශය කරන හෝ ප්‍රචාරය කරන යම් මාධ්‍ය ආයතනයකට සහ එම ප්‍රවෘත්ති හෝ ප්‍රකාශ කියවනු ලබන යම් තැනැත්තකුට යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ ප්‍රවෘත්තියක් පළ කිරීම , විකාශය කිරීම හෝ ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් සමාන වගකීමක් පැවරෙන අතර, ඒ සම්බන්ධයෙන් වන නීති කෘත්‍යවලට ද ඔවුන් යටත් විය යුතු ය.

27. මාධ්‍ය ආචාර ධර්මවලට අනුකූල වීම සහ ඒවායින් බැඳී ක්‍රියා කිරීම සෑම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනයකම වගකීම වන්නේ ය.

28. සියලු රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය මාධ්‍ය ආයතන විසින් යම් දේශපාලන පක්ෂයක්, කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කරනු පිණිස රාජ්‍ය දේපළ හා අරමුදල් යොදා ගැනීමෙන් සහ රාජ්‍ය ආදායමට අලාභ සිදුවන හෝ යම් ආයතනයකට හානි වන ක්‍රියාවකින් වැළකිය යුතුය. මධ්‍ය උපමාන කඩකිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති දඬුවම්වලට අතිරේකව වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත හැකි ය.

29. සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හිමිකරුවන් මෙම මාධ්‍ය උපමානවලින් බැඳී ක්‍රියා කළ යුතුවන අතර, අදාළ ආයතන එම උපමානවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට වගබලාගත යුතු ය.

30. යම් මැතිවරණ කාලසීමාවක් තුළ දී, මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව කටයුතු කිරීම සමාජ වෙබ් අඩවි හිමිකරුවන් හා සමාජ වෙබ් අඩවි පරිපාලකවරුන්ගේ ද කේබල් රූපවාහිනී නාලිකා හිමිකරුවන්ගේද වගකීම වන්නේ ය.

31. මෙම මාධ්‍ය උපමානවලින් බැඳී සිටීම මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ හා සමාජ වෙබ් අඩවි පරිපාලකවරුන් හා භාවිත කරන්නන්ගේ ද යුතුකමක් පමණක් නොව වගකීමක් ද වන්නේ ය. මක් නිසාද යත්, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වන හෙයිනි.

32. මෙම මාධ්‍ය උපමානවල ''ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව'' යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් හෝ පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, ඒ ජනමත විචාරණයේ හෝ ඡන්ද විමසීමේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වන්නේ ය.

33. මෙම මාධ්‍ය උපමානවලින් ආවරණය වන හෝ ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මුද්‍රිත, ගුවන්විදුලි, රූපවාහිනී හෝ අන්තර්ජාල/සමාජ ජාලා යන ඕනෑම මාධ්‍යයක් හරහා සිදු කෙරෙන ප්‍රකාශ, වාර්තා හෝ ප්‍රචාර මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ දිවයිනේ බලපැවැත්වෙන මැතිවරණ නීති හෝ වෙනත් ඕනෑම නීතියක් හෝ උල්ලංඝනය වේ නම් එවැනි ප්‍රකාශ, වාර්තා, හෝ ප්‍රචාර පළකිරීමෙන් හෝ විකාශය කිරීමෙන් වැලකී සිටිය යුතු ය.

34. අංක 2008/28 සහ 2017.03.03 වැනි දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* හා අංක 2048/1 හා 2017.12.04 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10 - 529

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2146/39 - 2019 ඔක්තෝබර් මස 27 වැනි ඉරිදා - 2019.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2141/87 දරන 2019.09.21 දිනැතිව *අති විශෙෂ* ගැසට් පත්‍රයෙන් නිකුත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන හා සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන

1. දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරීන්ගේ හා සක්‍රීය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරීන්ගේ මෙන්ම විශ්‍රාමික ආරක්ෂක හමුදා නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන් සේවයේ යෙදී සිටියදී ලබාගන්නා හෝ නිල ඇඳුමෙන් සැරසී ලබාගන්නා ඡායාරූප හෝ ප්‍රකාශ, පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත්වන ආකාරයට විද්‍යුත්, මුද්‍රිත හෝ වෙනත් මාධ්‍ය හෝ ප්‍රචාරක මාධ්‍යයක් තුළින් ප්‍රකාශ කිරීම, විකාශය කිරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීම නොකළ යුතු වේ.

2. ඡන්ද මධ්‍යස්ථාන තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ හෝ ඡායාරූප ගැනීම හෝ වීඩියෝගත කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ නිසි ලිඛිත අවසරයක් රහිතව නොකළ යුත්තේ ය. යම් හෙයකින් ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානය තුළ නිසි බලයක් රහිතව ලබාගන්නා ඡායාරූප හෝ වීඩියෝ දර්ශන විද්‍යුත්, මුද්‍රිත හෝ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ නොකළ යුත්තේ ය.

3. යම් ඡන්ද විමසීමක ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව විසින් නිල වශයෙන් ප්‍රකාශ කෙරෙන තෙක් ඡන්ද විමසීමේ නිල නොවන ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුත්තේ ය..

මහින්ද දේශප්‍රිය,	එන්. ජේ. අබේසේකර,	එස්. රත්නජීවන් එච්. හූල්,
සභාපති,	සාමාජික,	සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.	මැතිවරණ කොමිෂන් සභාව.	මැතිවරණ කොමිෂන් සභාව.

2019 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දිය.

11 - 1032

1A - PG 4723— 267 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2148/21 - 2019 නොවැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2019.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2141/87, 2019.09.21 දිනැතිව හා අංක 2146/39, 2019.10.27 දිනැතිව නිකුත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන හා සම්බන්ධිතව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන

මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් ''නිහඬ කාලය'' යනු ඡන්ද විමසීම පැවැත්වීමට නියම කරන ලද දිනයට පැය 48 කට පූර්වයෙන් ආරම්භ වී ප්‍රතිඵල ප්‍රකාශ කරන තෙක් කාලය යි. මෙම කාලය තුළ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකු, ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන පරිදි කිසිදු ආකාරයක ප්‍රචාරක කටයුත්තක් හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රසිද්ධ කිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

කෙසේ වතුදු නිහඬ කාලය ආරම්භ වීමට පූර්වයෙන් වූ දිනයේ දී දේශපාලන පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලබන ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳව වාර්තා, එකී රැස්වීම පැවැත් වූ දිනයට පසු දින ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති විකාශය කෙරෙන එක් අවස්ථාවක දී පමණක් තරග කරන පක්ෂවලට හෝ අපේක්ෂකයන්ට සමාන කාලසීමාවක් ලැබෙන පරිදි ප්‍රචාරය කළ හැකි ය. එමෙන්ම අදාළ අවසන් මහා රැස්වීම් පැවැත් වූ දිනට පසු දින ප්‍රකාශයට පත් කරන පුවත්පත්වල ද අවසන් දින රැස්වීම්වල වාර්තා කිසිදු පක්ෂයකට හෝ අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක් නොලැබෙන පරිදි ප්‍රසිද්ධ කළ හැකිය.

මහින්ද දේශප්‍රිය සභාපති මැතිවරණ කොමිෂන් සභාව	එන්. ජේ. අබේසේකර සාමාජික මැතිවරණ කොමිෂන් සභාව	එස්. රත්නජීවන් එච්. හූල් සාමාජික මැතිවරණ කොමිෂන් සභාව

2019 නොවැම්බර් මස 05 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

11 - 1407

1A - PG 4742 — 167 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඇමුණුම අංක 14

මාධ්‍ය නිවේදන
ජනාධිපතිවරණය - 2019

අංකය	කාරණය	දිනය
01.	නාමයෝජනා පත්‍ර භාර ගැනීම, ඇප තැන්පත් කිරීම සහ ඡන්ද විමසීම	2019.09.18
02.	තැපැල් ඡන්දදායකයින්ගේ පහසුව සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම	2019.09.18
03.	තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති අයට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්දය දීම සඳහා වූ පහසුකම	2019.09.18
04.	තැපැල් ඡන්ද හිමියන්ගේ සහ සහතික කිරීමේ නිලධාරීන්ගේ අවධානය සඳහා	2019.09.18
05.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.19
06.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.20
07.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.23
08.	මිය ගිය හා විදේශගත ඡන්දදායකයන්ගේ තොරතුරු ලබාගැනීම	2019.09.23
09.	අපේක්ෂක නාමලේඛන ගැසට් කිරීම පිළිබඳව	2019.09.24
10.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.24
11.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.25
12.	ඇල්පිටිය ප්‍රදේශීය සභා ඡන්ද විමසීමට අදාළ මාධ්‍ය නිවේදනයකි	-
13.	ඇල්පිටිය ප්‍රදේශීය සභා ඡන්ද විමසීමට අදාළ මාධ්‍ය නිවේදනයකි	-
14.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.26
15.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.27
16.	තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම්	2019.09.30
17.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.09.30
18.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.10.01
19.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.10.02
20.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.10.03
21.	නාමයෝජනා භාරගැනීමේ වැඩපිළිවෙල	2019.10.04
22.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.10.04
23.	රාජ්‍ය සේවයේ වැඩ වර්ජන හේතුවෙන් අත්‍යාවශ්‍ය සේවාවල බිඳ වැටීම සම්බන්ධව	2019.10.06
24.	ඇප තැන්පත් භාර ගැනීම දෛනික සාරාංශය	2019.10.06
25.	නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම් දීමේ නිවේදනය	2019.10.07
26.	ජනාධිපතිවරණයට අදාළව ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි සම්බන්ධව	2019.10.08
27.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.09
28.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.10
29.	1981 අංක 15දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත 21 වැනි වගන්තිය යටතේ දැන්වීම	2019.10.10
30.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.11

අංකය	කාරණය	දිනය
31.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.12
32.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.13
33.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.14
34.	ඡන්ද පොළේ දී ඡන්දදායකයින්ගේ අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්යයි	2019.10.14
35.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.15
36.	තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සහ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම	2019.10.15
37.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.16
38.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.17
39.	කායික දුබලතාවෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම	2019.10.17
40.	රජයේ කාර්යාල හෝ ආයතන තුළ ඡන්ද ආයාචනා කිරීමෙන් අත් පත්‍රිකා බෙදීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව	2019.10.17
41.	තැපැල් ඡන්ද සලකුණු කිරීම පිළිබඳ දැනුම් දීම	2019.10.17
42.	මැතිවරණ පැමිණිලි නිරාකරණ ඒකක දුරකථන අංක	2019.10.19
43.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.18
44.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.19
45.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.20
46.	වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිදු අයකුට තැපෑලෙන් ඡන්දය දීම සඳහා අවකාශ ලබා නොදීම	2019.10.19
47.	අශක්තානුවට පත් ඡන්ද හිමියෙකුට සහායකයකු කැටුව යාම	2019.10.22
48.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.21
49.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.22
50.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.23
51.	සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම	2019.10.23
52.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.24
53.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.25
54.	රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු තැනැත්තන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම	2019.10.26
55.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.26
56.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.27
57.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.28
58.	පළාත් පාලන ආයතනවල රාජ්‍ය දේපළ අයුතු පරිහරණය වැළැක්වීම	2019.10.27
59.	සියලුම වාහන හා ත්‍රීරෝද රථවල අලවා ඇති ස්ටිකර් ඉවත් කිරීම	2019.10.27
60.	විදේශගත වී සිටි පැමිණි ඡන්ද හිමියන් විදේශ ගමන් බලපත්‍රය රැගෙන ඒමේ අවශ්‍යතාව	2019.10.27

අංකය	කාරණය	දිනය
61.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.29
62.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.30
63.	ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 78,80 සහ 90 වගන්ති අනුව ඡන්ද හිමියන් සඳහා අයුතු බලපෑම් කිරීමෙන් වැළැක්වීම	2019.10.30
64.	ඡන්දය ප්‍රකාශ කිරීමේ පිළිවෙල	2019.10.30
65.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.10.31
66.	මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබාදීම. (තොරතුරු තාක්ෂණ අංශය)	2019.11.02
67.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.01
68.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.02
69.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.03
70.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.04
71.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.05
72.	තෑපැල් ඡන්දවලින් ස්වකීය අපේක්ෂකයා ජයග්‍රහණය කර ඇති බවට දේශපාලනඥයින් හා ආධාරකරුවන් කරනු ලබන සත්‍ය නොවන ප්‍රකාශ	2019.11.05
73.	ඡන්ද කොට්ඨාස මට්ටමින් දැනට පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල ඉවත් කිරීම	අත්සන් කර නැත.
74.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.06
75.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.07
76.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.08
77.	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත වලංගු ලියවිල්ලක් ලෙස පිළිගැනීම	2019.11.08
78.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.09
79.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.10
80.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.11
81.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.12
82.	ඡන්ද කොට්ඨාස මට්ටමින් දැනට පිහිටුවා ඇති අවසරලත් නිවේදිත කාර්යාල ඉවත් කිරීම	2019.11.12
83.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.13
84.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.14
85.	මැතිවරණ රාජකාරි සඳහා පත්කර ඇති රාජ්‍ය නිලධාරීන් වෙත මැතිවරණ කොමිෂන් සභාවේ පණිවුඩය	2019.11.14
86.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.15
87.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.15
88.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.15
89.	දෛනික මැතිවරණ පැමිණිලි සාරාංශය	2019.11.15
90.	මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය	2019.12.02

2019 ජනාධිපතිවරණ අපේක්ෂකයින් සඳහා ගුවන් කාලය වෙන් කිරීම
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

දිනය	කාලය				
	රාත්‍රී 19.45 – 20.00	රාත්‍රී 20.00 - 20.15	රාත්‍රී 20.15 - 20.30	රාත්‍රී 20.30 - 20.45	රාත්‍රී 20.45 - 21.00
2019.10.16	-	අනුරුද්ධ පොල්ගම්පල මහතා	අජන්ත ද සොයිසා මහතා	රොහාන් පල්ලේවත්ත මහතා	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා
2019.10.17	-	සමන් පෙරේරා මහතා	ඒ.එස්.පී.ලියනගේ මහතා	පී.එම්.එදිරිසිංහ මහතා	චන්ද්‍ර සේකර හේරත් හිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා
2019.10.18	-	ආරියවංශ දිසානායක මහතා	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා	සරත් කීර්තිරත්න මහතා	සමරවීර වීරවන්නි මහතා
2019.10.19	එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා	අනුර කුමාර දිසානායක මහතා	බත්තරමුල්ලේ සීලරතන හිමි	දුමින්ද නාගමුව මහතා	අජන්ත ද සොයිසා මහතා
2019.10.20	ඒ.එච්.එම්.අලවි මහතා	ගෝඨාභය රාජපක්ෂ මහතා	පානි විජේසිරිවර්ධන මහතා	කැටගොඩ ජයන්ත මහතා	අශෝක වඩිගමංගාව මහතා
2019.10.21	-	මහේෂ් සේනානායක මහතා	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා	සරත් මනමේන්ද්‍ර මහතා	රාජීව විජේසිංහ මහතා
2019.10.22	-	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි	පියසිරි විජේනායක මහතා	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	සිරිතුංග ජයසූරිය මහතා
2019.10.23	-	සජිත් ප්‍රේමදාස මහතා	බත්තරමුල්ලේ සීලරතන හිමි	එස්.අමරසිංහ මහතා	නාමල් රාජපක්ෂ මහතා
2019.10.24	-	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා	රාජීව විජේසිංහ මහතා	පියසිරි විජේනායක මහතා
2019.10.25	-	පී.එම්.එදිරිසිංහ මහතා	සමන් පෙරේරා මහතා	ඒ.එච්.එම්.අලවි මහතා	එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලාහ් මහතා
2019.10.26	අජන්තා පෙරේරා මහත්මිය	සජිත් ප්‍රේමදාස මහතා	නාමල් රාජපක්ෂ මහතා	ඒ.එස්.පී.ලියනගේ මහතා	අනුර කුමාර දිසානායක මහතා
2019.10.28	-	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා	අරුණ ද සොයිසා මහතා	සරත් මනමේන්ද්‍ර මහතා
2019.10.29	-	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි	පානි විජේසිරිවර්ධන මහතා	අශෝක වඩිගමංගාව මහතා	කැටගොඩ ජයන්ත මහතා
2019.10.31	-	එස්.අමරසිංහ මහතා	සරත් කීර්තිරත්න මහතා	ආරියවංශ දිසානායක මහතා	මහේෂ් සේනානායක මහතා
2019.11.02	ගෝඨාභය රාජපක්ෂ මහතා	සිරිතුංග ජයසූරිය මහතා	අරුණ ද සොයිසා මහතා	එම්.කේ.සිවාජිලිංගම් මහතා	සමරවීර වීරවන්නි මහතා
2019.11.03	දුමින්ද නාගමුව මහතා	ඒ.එස්.පී.ලියනගේ මහතා	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි	සරත් කීර්තිරත්න මහතා	සමරවීර වීරවන්නි මහතා
2019.11.04	-	රාජීව විජේසිංහ මහතා	අජන්තා පෙරේරා මහත්මිය	එස්.අමරසිංහ මහතා	අනුර කුමාර දිසානායක මහතා
2019.11.05	-	නාමල් රාජපක්ෂ මහතා	රොහාන් පල්ලේවත්ත මහතා	ආරියවංශ දිසානායක මහතා	සරත් මනමේන්ද්‍ර මහතා
2019.11.06	-	-	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා	එම්.කේ.සිවාජිලිංගම් මහතා	අනුරුද්ධ පොල්ගම්පල මහතා
2019.11.07	-	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා	අශෝක වඩිගමංගාව මහතා	රොහාන් පල්ලේවත්ත මහතා	අනුරුද්ධ පොල්ගම්පල මහතා

දිනය	කාලය				
	රාත්‍රී 19.45 – 20.00	රාත්‍රී 20.00 - 20.15	රාත්‍රී 20.15 - 20.30	රාත්‍රී 20.30 - 20.45	රාත්‍රී 20.45 - 21.00
2019.11.08	-	අජන්තා ද සොයිසා මහතා	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා	චන්ද්‍රසේකර හේරත් නිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා	එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලාහ් මහතා
2019.11.09	පියසිරි විජේනායක මහතා	මහේෂ් සේනානායක මහතා	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	සිරිකුංග ජයසූරිය මහතා	ගෝඨාභය රාජපක්ෂ මහතා
2019.11.10	සජිත් ප්‍රේමදාස මහතා	ඒ.එච්.එම්.අලවි මහතා	දුමින්ද නාගමුව මහතා	පානි විජේසිරිවර්ධන මහතා	පී.එම්.එදිරිසිංහ මහතා
2019.11.11	-	කැටගොඩ ජයන්ත මහතා	අරුණ ද සොයිසා මහතා	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා	සමන් පෙරේරා මහතා
2019.11.12	-	-	අජන්තා පෙරේරා මහත්මිය	බත්තරමුල්ලේ සීලරතන හිමි	එම්.කේ.සිවාජිලිංගම් මහතා

ඇමුණුම අංක 16

අපේක්ෂකයින් සඳහා ගුවන් කාලය වෙන් කිරීම
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

දිනය	කාලය			
	පෙ.ව. 11.00 – 11.15	පෙ.ව. 11.15 – 11.30	පෙ.ව. 11.30 – 11.45	පෙ.ව. 11.45 – 12.00
2019.10.15	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	සරත් මනමේන්ද්‍ර මහතා	අජන්ත ද සොයිසා මහතා	පියසිරි විජේනායක මහතා
2019.10.16	කැටගොඩ ජයන්ත මහතා	ආරියවංශ දිසානායක මහතා	නාමල් රාජපක්ෂ මහතා	අරුණ ද සොයිසා මහතා
2019.10.17	අනුර කුමාර දිසානායක මහතා	සිරිතුංග ජයසූරිය මහතා	ඒ.එස්.පී.ලියනගේ මහතා	සජිත් ප්‍රේමදාස මහතා
2019.10.18	අශෝක වඩිගමංගාව මහතා	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා	පානි විජේසිරිවර්ධන මහතා	එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලාහ් මහතා
2019.10.19	චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා	රාජීව විජේසිංහ මහතා	එස්.අමරසිංහ මහතා	ගෝඨාභය රාජපක්ෂ මහතා
2019.10.20	සමරවීර වීරවන්නි මහතා	අනුරුද්ධ පොල්ගම්පල මහතා	අජන්තා පෙරේරා මහත්මිය	දුමින්ද නාගමුව මහතා
2019.10.21	බත්තරමුල්ලේ සීලරතන හිමි	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි	ඒ.එච්.එම්.අලවි මහතා
2019.10.22	මහේෂ් සේනානායක මහතා	පී.එම්.එදිරිසිංහ මහතා	සමන් පෙරේරා මහතා	එම්.කේ.සිවාජිලිංගම් මහතා
2019.10.23	සරත් කීර්තිරත්න මහතා	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා	රොහාන් පල්ලේවත්ත මහතා	-
2019.10.24	ගෝඨාභය රාජපක්ෂ මහතා	පී.එම්.එදිරිසිංහ මහතා	බත්තරමුල්ලේ සීලරතන හිමි	නාමල් රාජපක්ෂ මහතා
2019.10.25	පානි විජේසිරිවර්ධන මහතා	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	සරත් කීර්තිරත්න මහතා	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි
2019.10.26	දුමින්ද නාගමුව මහතා	එස්.අමරසිංහ මහතා	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා	පියසිරි විජේනායක මහතා
2019.10.28	සමන් පෙරේරා මහතා	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා	සරත් මනමේන්ද්‍ර මහතා	සිරිතුංග ජයසූරිය මහතා
2019.10.29	අශෝක වඩිගමංගාව මහතා	එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලාහ් මහතා	රාජීව විජේසිංහ මහතා	රොහාන් පල්ලේවත්ත මහතා
2019.10.30	අරුණ ද සොයිසා මහතා	සජිත් ප්‍රේමදාස මහතා	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා	ඒ.එස්.පී.ලියනගේ මහතා
2019.10.31	අජන්ත ද සොයිසා මහතා	සමරවීර වීරවන්නි මහතා	අජන්තා පෙරේරා මහත්මිය	චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා
2019.11.01	කැටගොඩ ජයන්ත මහතා	අනුර කුමාර දිසානායක මහතා	ඒ.එච්.එම්.අලවි මහතා	මහේෂ් සේනානායක මහතා

දිනය	කාලය			
	පෙ.ව. 11.00 – 11.15	පෙ.ව. 11.15 – 11.30	පෙ.ව. 11.30 – 11.45	පෙ.ව. 11.45 – 12.00
2019.11.01	කැටගොඩ ජයන්ත මහතා	අනුර කුමාර දිසානායක මහතා	ඒ.එච්.එම්.අලවි මහතා	මහේෂ් සේනානායක මහතා
2019.11.02	අනුරුද්ධ පොල්ගම්පල මහතා	එම්.කේ.සිවාජිලිංගම් මහතා	ආරියවංශ දිසානායක මහතා	-
2019.11.03	පානි විජේසිරිවර්ධන මහතා	අශෝක වඩිගමංගාව මහතා	දුමින්ද නාගමුව මහතා	අයිදුරුස් මොහමදු ඉල්ලියාස් මහතා
2019.11.04	වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු	සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා	සිරිතුංග ජයසූරිය මහතා	බත්තරමුල්ලේ සීලරතන හිමි
2019.11.05	අනුර කුමාර දිසානායක මහතා	සරත් මනමේන්ද්‍ර මහතා	රාජීව විජේසිංහ මහතා	ඒ.එච්.එම්.අලවි මහතා
2019.11.06	සමන් පෙරේරා මහතා	වන්දෙස්කර හේරත් හිටිහාමි කෝරාලලාගේ සමන්සිරි මහතා	සජිත් ප්‍රේමදාස මහතා	එස්.අමරසිංහ මහතා
2019.11.07	සමරවීර වීරවන්නි මහතා	අරුණ ද සොයිසා මහතා	අජන්ත ද සොයිසා මහතා	එම්.කේ.සිවාජිලිංගම් මහතා
2019.11.08	පී.එම්.එදිරිසිංහ මහතා	ආරියවංශ දිසානායක මහතා	සරත් කීර්තිරත්න මහතා	එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලාහ් මහතා
2019.11.09	රොහාන් පල්ලේවත්ත මහතා	ගෝඨාභය රාජපක්ෂ මහතා	මහේෂ් සේනානායක මහතා	පියසිරි විජේනායක මහතා
2019.11.11	අනුරුද්ධ පොල්ගම්පල මහතා	අජන්තා පෙරේරා මහත්මිය	නාමල් රාජපක්ෂ මහතා	බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා
2019.11.12	කැටගොඩ ජයන්ත මහතා	අපරාක්කේ පුඤ්ඤානන්ද හිමි	ඒ.එස්.පී.ලියනගේ මහතා	-

ඇමුණුම අංක 17

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත්

දිස්ත්‍රික්කය	නියෝජ්‍ය සහකාර මැතිවරණ කොමසාරිස් අනු අත්සන සහිතව	ප්‍රාදේශීය ලේකම්/ ග්‍රාම නිලධාරි අනු අත්සන සහිතව	එකතුව
කොළඹ	01	8,748	8,749
ගම්පහ	-	16,728	16,728
කළුතර	-	13,408	13,408
මහනුවර	-	14,907	14,907
මාතලේ	202	6,702	6,904
නුවරඑළිය	13	8,795	8,808
ගාල්ල	5,780	4,823	10,603
මාතර	8,468	198	8,666
හම්බන්තොට	8,528	1,232	9,760
යාපනය	17	2,172	2,189
කිළිනොච්චිය	262	488	750
මන්නාරම	61	453	514
වවුනියාව	598	-	598
මුලතිව්	-	-	-
මඩකලපුව	2,148	-	2,148
දිගාමඩුල්ල	-	-	8,402
ත්‍රිකුණාමලය	4,009	-	4,009
කුරුණෑගල	-	18,008	18,008
පුත්තලම	2,397	4,747	7,144
අනුරාධපුර	15	12,731	12,746
පොළොන්නරුව	06	6,298	6,304
බදුල්ල	-	9,283	9,283
මොණරාගල	-	4,385	4,385
රත්නපුර	762	17,221	17,983
කෑගල්ල	**75**	12,029	12,104
එකතුව	**33,342**	**163,356**	**196,698**

ඇමුණුම අංක 18

මියගොස් ඇති සහ විදේශගතව සිටින බවට වාර්තාව ඡන්ද හිමියන් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	මියගිය බවට වාර්තා වූ ඡන්ද හිමියන් සංඛ්‍යාව	විදේශ ගත ව සිටින බවට වාර්තා වූ ඡන්ද හිමියන් සංඛ්‍යාව
කොළඹ	7,599	6,775
ගම්පහ	14,577	21,035
කළුතර	8,504	9,265
මහනුවර	9,244	16,428
මාතලේ	4,356	6,662
නුවරඑළිය	3,548	2,579
ගාල්ල	9,278	13,202
මාතර	6,501	7,728
හම්බන්තොට	4,263	5,655
යාපනය	4,559	6,684
කිළිනොච්චිය	605	1,422
මන්නාරම	675	1,344
වවුනියාව	808	892
මුලතිව්	499	969
මඩකලපුව	2,973	15,712
දිගාමඩුල්ල	4,375	7,063
ත්‍රිකුණාමලය	1,956	4,512
කුරුණෑගල	14,643	27,823
පුත්තලම	5,303	19,185
අනුරාධපුර	7,320	5,604
පොළොන්නරුව	2,823	5,246
බදුල්ල	5,558	3,600
මොණරාගල	2,524	1,780
රත්නපුර	7,901	5,275
කෑගල්ල	6,803	8,778
එකතුව	**137,195**	**205,218**

මාධ්‍ය නිවේදන අංක - 51

මැතිවරණ කොමිෂන් සභාව

ජනාධිපතිවරණය - 2019. 11. 16
සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

2019. 11. 16 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දී සේවා නියුක්තිකයින්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම සම්බන්ධයෙන්අදාළ වූ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 110 වන වගන්තියේ විධිවිධාන සේවා යෝජකයන්ගේ හා සේවා නියුක්තිකයන්ගේ දැන ගැනීම පිණිස මෙහි පහත දක්වනු ලැබේ.

" 110 (1), තෝරාපත්කර ගැනීමකදී පෞද්ගලිකව ඡන්දය දීමට හිමිකම් ඇති යම් තැනැත්තෙකුගේ සේවා යෝජකයෙකු වූ වෙනත් යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් කරන ඉල්ලීමක් අනුව ඒ තෝරාපත් කරගැනීමේදී ඒ තැනැත්තාට පෞද්ගලිකව ඡන්දය දීමට හැකි වන සේ ප්‍රමාණවත් යයි ඒ වෙනත් තැනැත්තා විසින් සලකනු ලැබිය හැකි (පැය හතරකට නොඅඩු) අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩුනොවන පරිදි ලියවිල්ලකින් වූ නිවාඩු දෙනු ලැබිය යුතුය. "

(1 අ) සෑම සේවා යෝජකයෙකු විසින්ම
(අ) (1) වන උපවගන්තිය යටතේ නිවාඩු සඳහා ඉල්ලුම් කරන තැනැත්තන්ගේ නම්; සහ
(ආ) ඒ උපවගන්තිය යටතේ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ඒ තැනැත්තන්ට ඒ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ කාල සීමාවන්

දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර, ඒ ප්‍රකාශය සේවා නියුක්ති ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ හෝ (1 අ) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකට පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාසයක් නොඉක්මවන කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය. "

02. ඉහත සඳහන් වගන්තියේ විධිවිධාන ප්‍රකාර ස්වකීය ඡන්දය දීමේ කාර්යය සඳහා නිවාඩු දෙන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටින සෑම සේවා නියුක්තිකයෙකුටම නිවාඩු ලබාදිය යුතුය. එසේ දෙනු ලබන නිවාඩු කාල සීමාව, අනියම් සේවා නියුක්තිකයන් ද ඇතුළුව සියලුම සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වැටුප් සහිත වන විශේෂ නිවාඩුවක් ලෙස සැලකිය යුතු අතර, එය සේවා නියුක්තිකයන්ගේ සාමාන්‍ය නිවාඩු හිමිකමෙන් පිටස්තර විය යුතුය.

03. සේවා නියුක්තිකයෙකුට මෙම කාර්යය සඳහා දෙනු ලබන නිවාඩු කාල සීමාව, එම සේවා නියුක්තිකයාගේ කාර්ය ස්ථානයේ සහ ඡන්ද පොළ අතර ඇති දුර ප්‍රමාණය මත සේවා යෝජකයා විසින් නිගමනය කළ යුතුය.

04. නීතිය අනුව නිවාඩු ලබාගැනීම පිළිබඳව මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී සේවා නියුක්තිකයින්ගෙන් පැමිණිලි ලැබී ඇති හෙයින් මෙම ඡන්ද විමසීමේදී ඡන්දය දීමට හිමිකම් ඇති ස්වකීය සේවා නියුක්තිකයන්ට, නීත්‍යානුකූලව හිමිවන එම නිවාඩුව ලබාදෙන ලෙස රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයේ සියලුම සේවා යෝජකයන්ගෙන් ඉල්ලා සිටිමි.

05. ඉහත සඳහන් ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ඡන්ද විමසීම, 2019 නොවැම්බර් මස 16 වන සෙනසුරාදා දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා පැවැත්වේ.

06. මේ සම්බන්ධයෙන් සියලුම සේවා යෝජකයින්ගෙන් ලැබෙන සහයෝගය පිළිබඳව අතිශයින් කෘතඥ වෙමි.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2019.10.23

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2147/46 - 2019 ඔක්තෝබර් මස 29 වැනි අඟහරුවාදා - 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත

30 වන වගන්තිය යටතේ දැන්වීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2144/6 දරන හා 2019.10.07 දිනැතිව අති විශෙෂ ගැසට් පත්‍රයෙන් නිකුත් කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 21 වැනි වගන්තිය යටතේ දැන්වීමේ II ඡේදයේ "පස්වරු 4.00 දක්වා" යන වචන හා ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට "පස්වරු 5.00 දක්වා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම දැන්වීම සංශෝධනය කරනු බව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 30 වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය	එන්.ජේ.අබේසේකර	එස්. රත්නජීවන් එච්.හූල්
සභාපති	සාමාජික	සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව

2019 ඔක්තෝබර් මස 29 වන දින,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

11 - 1100

1A - PG 4726 — 267 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඇමුණුම අංක 21

මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා වූ සංවිධාන සටහන



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2141/52 - 2019 සැප්තැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ(4)(අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන, රජයට හෝ සංස්ථාවකට හෝ මණ්ඩලයකට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ, ඡන්ද විමසීමේදී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයින් ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධාවන අයුරින් යොදා ගැනීම වැළැක්වීම සඳහා මතු සඳහන් විධාන මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව.	එන්.ජේ.අබේසේකර, සාමාජික, මැතිවරණ කොමිෂන් සභාව.	එස්.රත්නජීවන් එච්. හූල්, සාමාජික, මැතිවරණ කොමිෂන් සභාව.

2019 සැප්තැම්බර් මස 19 දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

1A - PG 4655 — 1517 (2019/09)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාව අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායම් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතුය. එම ව්‍යවස්ථාවේ (අ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී. එබැවින් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන් මෙම විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය. එමෙන්ම ස්වකීය පාලනය යටතේ ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම නියමයට අනුකූලව ක්‍රියාකරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මෙම නියම, සියලුම රජයේ අමාත්‍යාංශ, කොමිෂන් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්ව විද්‍යාල යනාදී සියලුම රජයේ ආයතනවලට හා රජයට පවරා ගෙන ඇති සමාගම්වලට ද බලපැවැත්වේ.

02. නිලධාරීන්

(I) රජයේ නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා ඔවුන්ගේ කාලය ද රාජ්‍ය දේපළක් වන හෙයින්, කිසිදු රාජ්‍ය නිලධරයකු ස්වකීය කාර්යාල වේලාව තුළ හෙවත් රාජකාරියට වාර්තා කර ඇති වේලාව තුළ හෝ රාජකාරී නිවාඩු ලබාගෙන ඇති විට හෝ කාර්යාලය තුළ හෝ කාර්යාලයෙන් බැහැරව දේශපාලනමය ප්‍රවර්ධන කටයුතුවල නොයෙදිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නිවාඩු ලබාගෙන හෝ දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්ට වුව ද කාර්යාල වේලාව තුළ දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු අතර එසේ නිරත වන්නේ නම් පූර්වයෙන් පෞද්ගලික හෝ විශේෂ නිවාඩු අනුමත කරගත යුතුවේ.

(II) කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දේශපාලනමය කටයුතු සඳහා රාජ්‍ය දේපළ එනම්, වෙනත් රජයේ නිලධාරීන්, වාහන, ප්‍රචාරක උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මාධ්‍ය උපකරණ, දූරකථන පහසුකම්, සංචාරක නිවාස යනාදී, රජය සතු කිසිවක් භාවිතා කිරීමේ හිමිකමක් නැත. එසේ කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

(III) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් පත්කර ඇති කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර මෙම කාල සීමාව තුළදී රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු ය.

(IV) ඡන්ද විමසීම් ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් හෝ අභ්‍යන්තර උසස් කිරීමේ වැඩපිළිවෙලක් කල් දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතු යයි අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ආයතන ප්‍රධානීන් අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් විධිමත් ව හා දේශපාලන මැදිහත්වීම්වලින් තොරව කෙරෙන බවට අදාළ බලධාරීන්ට නිසැක විය හැකි විටදී ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලබාදිය හැකි ය. එවැනි අවස්ථාවල දී ඒ සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය.

(V) සනීපාරක්ෂක, පිරිසිදු කිරීම් හා නඩත්තු කටයුතු බිඳවැටීම වැළැක්වීම සඳහා හා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑම සඳහා ප්‍රාදේශීයව හෝ පළාත්බදව හෝ රාජ්‍ය සේවයට සේවකයන් බඳවා ගැනීම සිදු කරන්නේ නම්, එවැනි බඳවා ගැනීම් වුව ද මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව මත සිදු කළ යුතු අතර කිසිදු දේශපාලනමය මැදිහත්වීමකින් තොරව විනිවිද බවින් යුතුව එවැනි කටයුතු සිදු කිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත පැවරේ.

(VI) ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත ප්‍රදේශවල ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් නාමයෝජනා දැන්වීම් දින සිට ඡන්ද විමසීම අවසන් වී සති දෙකක් යන තුරු අත්හිටුවිය යුතු ය. ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු නොකළ යුතු අතර එසේ සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීම සියලුම බලධාරීන්ගේ වගකීම වේ. විනය නියෝග මත සිදු කෙරෙන ස්ථාන මාරුවීම් සඳහා මෙම නියමය බල නොපැවැත්වෙන අතර විශේෂ අවස්ථාවල දී හෝ සේවා අවශ්‍යතා මත හෝ ස්ථාන මාරුකිරීම් සිදු කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී පූර්වයෙන් අනුමැතිය ලබාගත යුතු ය.

(VII) දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයෙකු තම පෞද්ගලික සමාජ ජාල ගිණුමක් හෝ වෙනත් ගිණුමක් භාවිතා කරමින් යම් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන කිසිදු ප්‍රචාරණයක් හෝ ප්‍රකාශයක් සිදු කිරීම වරදක් වන්නේය. දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරියෙකු වුව ද එම ප්‍රචාරණයන් හා ප්‍රකාශයන් රජයේ සම්පත් භාවිතා කරමින් සිදුකිරීම නොකළ යුතු අතර වෛරී ප්‍රකාශ මුදා හැරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීම වරදක් වේ.

03. උත්සව, ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන

(I) *උත්සව*

ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, ජනතා අයිතියට පැවරීම් වැනි උත්සව දේශපාලනඥයන්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අවස්ථාවලදී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වන බැවින් සහ මෙවැනි අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීම හරහා යම් පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමක් හෝ වෙනත් පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයකුට අගතියක් සිදු විය හැකි හෙයින්, මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව හා කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු ය. ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමට පෙර දින නියම කරන ලද එවැනි උත්සව අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නොමැති නම් එවැනි උත්සව පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබාගත යුතුවේ. යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි උත්සව පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී කිසියම් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදු වුවහොත් ඒ පිළිබඳව උත්සවය සංවිධානය කරන ලද නිලධාරීන් වග කිවයුතු ය. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි උත්සව සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුවත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළයුතු ය. මෙවැනි උත්සවයක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා හෝ අගතියට පත් කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදු කිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ උත්සව සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

(II) *ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන*

ජනතාවට සේවා සැපයීමේ අරමුණින් රාජ්‍ය මුදල් හා රාජ්‍ය දේපළ වැය කරමින් පැවැත්වෙන මෙවැනි ජංගම සේවා හා වෙළඳ ප්‍රදර්ශන හරහා ද පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන් සිදුකිරීමේ ප්‍රවණතාවක් පවතින හෙයින්, මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළී යනාදී කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතුය. ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමට පෙර සංවිධානය කරන ලද එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළී, අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නොමැති නම් පමණක් එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළී පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබා ගතයුතු වේ. යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්කිරීම් සිදුවුවහොත් ඒ පිළිබඳව අදාළ කාර්යය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව යුතු ය. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළී යනාදිය සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුවත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතුය. මෙවැනි කිසිදු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළියක දී හෝ එවැනි වෙනත් අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා නැතහොත් අගතියට පත්කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදුකිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන්ට වැළැක්වීමට අදාළ කාර්යය සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

04. *පහසුකම්, ප්‍රදාන ලබාදීමේ වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම*

(I) ජනතාවට පහසුකම් සැළසීම සඳහා හෝ රටේ සංවර්ධනය සඳහා සිදුකරන දීර්ඝකාලීන හෝ මධ්‍යකාලීන විශේෂ ව්‍යාපෘති හෝ පහසුකම් ලබාදීමේ අඛණ්ඩ වැඩ සටහන් ඡන්ද විමසීම හේතුවෙන් අත්හිටුවිය නොහැකි නමුත් ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමෙන් පසු මෙවැනි විශේෂ ව්‍යාපෘති හෝ අඛණ්ඩ වැඩ සටහන් හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම් හෝ අගතියට පත්කිරීම් සඳහා යොදා ගැනීමට ඉඩ නොදිය යුතුය.

(II) ඡන්ද විමසීම් කාලය තුළ සිදුකරන මෙවැනි අඛණ්ඩ වැඩසටහන් හා ව්‍යාපෘති හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදුකරන්නේ ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

(III) ඡන්ද විමසීම් කාල සීමාව තුළ රජයේ ඉඩම් බෙදාදීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, මුලුතැන්ගෙයි උපකරණ, ගෘහ උපකරණ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්යබල විදුලි

පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල් ප්‍රදානය කිරීම් යනාදී වැඩසටහන් ආරම්භ කිරීම අත්හිටුවිය යුතුය. එසේ අත්හිටුවීම නිසා ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීමට බාධාවක් ඇතිවන බව පෙනී යන්නේ නම්, ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා උපදෙස් ලබාගත යුතු ය. යම් හෙයකින් දැනටමත් ආරම්භ කර ඇති හෝ අනුමැතිය ලබාදෙන මෙවැනි වැඩසටහන් හෝ කාර්යයන් අඛණ්ඩව සිදුකිරීමට සිදුවුවහොත් එකී කාර්යයන් එම විෂයභාර නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් කිසිදු පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂකයන් ප්‍රවර්ධනයක් නැතහොත් අගතියට පත්කිරීමක් සිදු නොවන පරිදි ක්‍රියාත්මක කිරීම එම කාර්යයන් හා වැඩසටහන් භාර නිලධාරීන්ගේ වගකීම වේ.

05. වාහන

(I) රජය සතු මෝටර් රථ, ජීප් රථ, කැබ් රථ, බස් රථ ආදී සියලුම රජයේ වාහන සංචිත භාරව සිටින නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාලසීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම හා වෙන්කර දීම් විශේෂ අවධානයකින් යුතුව සිදු කළයුතු ය. නිලධාරීන්ට වෙන් කර ඇති (Assigned Vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන (Hired Vehicles) රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතු ය. මෙම කාලසීමාව තුළදී නිලධාරීන්ට වෙන් කර ඇති (Assigned Vehicles) වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනෙකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගතයුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂාකර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය. රාජකාරී කටයුතු සඳහා යෙද වූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් හෝ එවැනි අනීතික කාර්යයන් සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතු ය.

(II) ජනාධිපතිවරයාගේ ආරක්ෂක අංශය සඳහා වෙන්කර ඇති වාහන දෙකකට හැර වෙන කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන්කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට හෝ වෙනත් කිසිවෙකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකි ය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන, ගරාජ් අංක වලින් හෝ ව්‍යාජ අංක වලින් ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු වාහන සංචිත භාර නිලධාරීන් නිසැක විය යුතු ය.

(III) දේශපාලනමය ප්‍රචාරක කාර්යයන් සඳහා ගුවන් යානා හා හෙලිකොප්ටර් හෝ වෙනත් වාහන යොදා ගැනීම පිණිස රජයේ මුදල් වැය නොකරන බවට සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා ආයතන ප්‍රධානීන් නිසැක විය යුතු ය.

06. **රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය**

(I) රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතු ය. සාමාන්‍ය කාල සීමාව තුළදී ඕනෑම දේශපාලන පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට මුදල් ගෙවා වෙන්කර ගත හැකි ගොඩනැගිලි හා ශාලා, ඡන්ද විමසීම් කාල සීමාව තුළ නිසි පරිදි ගාස්තු අයකර කිසිදු පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට වෙනස්ව සැලකීමකින් තොරව ලබාදීමට මෙම විධාන වලින් බාධාවක් ඇති බව නොසැලකිය යුතු ය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිදු දේශපාලඥයෙකුට, නිලධරයෙකුට, වෙනත් පුද්ගලයෙකුට ඡන්ද විමසීම් කාලසීමාව තුළ පූර්ණ කාලීනව වෙන්කර දීමෙන් වැළකිය යුතු ය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරතවීමට ඉඩ නොදිය යුතු ය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර්, කටවුට් ආදිය ප්‍රදර්ශනය කිරීමට ද ඉඩ නොදිය යුතු ය.

(II) රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා පිටි හෝ හිස් ඉඩම් හා ශාලා හෝ එවැනි වෙනත් ගොඩනැගිලි එක් එක් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂක ප්‍රවර්ධන ප්‍රචාරක රැස්වීම් සඳහා වෙන් කිරීමේ දී කිසිදු පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ සැළකිල්ලක්, ප්‍රමුඛතාවක් හෝ අඩු සැලකිල්ලක් ලැබෙන පරිදි වෙන් කරදීම් නොකළ යුතු ය. එකී ස්ථාන, ගොඩනැගිලි වෙන්කර දීම විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතු ය. එවැනි ස්ථාන සෙසු පක්ෂයකට/ කණ්ඩායම්වලට/ අපේක්ෂකයෙකුට ලබාගැනීමට නොහැකි වන පරිදි, කිසිදු පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට හෝ වෙනත් කාර්යයක් සඳහා දිගින් දිගටම වෙන්කර තැබීම නොකළ යුතු ය.

07. පොදු කරුණු

(I) රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන, වාහන, බඩු බාහිරාදිය, ගොඩනැගිලි, ඉඩම් හා නිලධාරීන් ඡන්ද විමසීමට අදාළ පක්ෂ/ කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමට කිසිදු අවකාශයක් නොදිය යුතු ය. ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශවල හදිසි රාජකාරී කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා (නැතහොත් අගතියට පත්කිරීම සඳහා) රජයේ/ රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ/ රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන වෙනත් කාර්යාලවලට හා ආයතනවලට අනුයුක්ත කිරීම් හෝ මුදාහැරීම් හෝ වැනි අකටයුතුකම් සිදුකිරීමට කිසිදු නිලධරයෙකුට ඉඩ නොදිය යුතු ය. රජයේ, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල හෝ රාජ්‍ය සංස්ථා, මණ්ඩල, රාජ්‍ය බැංකු, ව්‍යාවස්ථාපිත වෙනත් ආයතන, රජයේ විශ්ව විද්‍යාල යනාදී කිසිදු රාජ්‍ය ආයතනයක් සතු මාධ්‍ය ඒකකවලට අයත් නිලධාරීන්, වාහන, උපකරණ කිසිදු පක්ෂයක්, කණ්ඩායමක්, අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය. සාමාන්‍ය තත්ත්වය යටතේ යම් රාජ්‍ය ආයතනයක් සතු වේදිකා, සැරසිලි කිරීම්, උපකරණ, වාහන, ගුවන් යානා, හෙලිකොප්ටර් යානා කුලී පදනම මත ලබා දෙන්නේ නම් ඡන්ද විමසීම් කාලය තුළ එවැනි කුලියට දීම් සියලුම පක්ෂ, කණ්ඩායම් සඳහා ලබා ගැනීමේ අවස්ථා සහිතව විනිවිදබාවයකින් යුතුව ඉටුකළ යුතු ය.

(II) රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව හෝ යම්කිසි සංවත්සර/ අනුස්මරණ උත්සව ආදිය සඳහා හෝ ප්‍රචාරක කටයුතු සිදුකිරීම පිණිස රාජ්‍ය මුදල් වැය කරමින් රූපවාහිනී, ගුවන්විදුලි, ප්‍රවෘත්ති පත්‍ර යනාදී මාධ්‍ය හරහා දැන්වීම් විකාශය කිරීම්/ පළකිරීම් මගින් හෝ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම මගින් හෝ කිසිදු පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙකු වෙනුවෙන් ප්‍රවර්ධන කටයුතු හෝ අගතියට පත්කිරීමේ කටයුතු සිදුනොකළ යුතු ය.

(III) සියලුම පෞද්ගලික කේබල් රූපවාහිනී නාලිකා, පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන, වෙබ් අඩවි, ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන ආයතන ඡන්ද විමසීම් කාලසීමාවේ දී මැතිවරණ නීති උල්ලංඝණය නොවන පරිදි සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති මාධ්‍ය උපමාන, විධාන හා උපදෙස් චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම උක්ත සන්නිවේදන ආයතන නියාමනය කරනු ලබන ආයතනවල වගකීමක් විය යුත්තේය.

(IV) පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන අයුරින් වීදි පහන් කණු හා දුරකථන රැහැන් කණුවල බැනර්, පෝස්ටර්, ධජ, පතාක ප්‍රදර්ශනය හා වෙනත් සැරසිලි කිරීම වැළැක්වීම මෙන් ම පොදු මහාමාර්ග මත සහ දෙපස පදික වේදිකා මත පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අයුරින් තීන්ත ආලේප මගින් හෝ වෙනත් ආකාරයකින් හෝ ප්‍රචාරක කටයුතු සිදු වීම වැළැක්වීමට අදාළ බල ප්‍රදේශයේ එම රාජ්‍ය දේපළ සන්තකය හෝ පාලනය හිමි රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ/පළාත් හෝ ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ හා පළාත් පාලන ආයතන බලධාරීන්ගේ වගකීම වේ.

(V) යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් මැතිවරණ කාලසීමාවට පෙර ඉදිකර ඇති හෝ ප්‍රදර්ශනය කරමින් පවතින පක්ෂ / කණ්ඩායම් / අපේක්ෂකයන් ප්‍රවර්ධනයට හේතුවිය හැකි අයුරින් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙන ඡායාරූප, ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීමට එම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ක්‍රියාකළ යුතු ය. ස්වකීය පළාත් පාලන බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානවල සිදුකර ඇති පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය ඉවත් කරවීමට පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා එකී ආයතනවල කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් ක්‍රියාකළ යුතු ය.

(VI) ඡන්ද විමසීමකදී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපළ භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළයුතු ය. ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා මණ්ඩල හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ක්‍රියා කළයුතු ය. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය ය.

(VII) ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම, ආදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය වියයුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ.

(VIII) මෙම විධානවල සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු, කැබිනට් නොවන අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය ඇමතිවරු සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බව ද පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් ප්‍රධාන අමාත්‍යවරුන් හා සෙසු අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම බව ද සැළකිය යුතු ය.

(IX) අදාළ වනවිට කොමිෂන් සභාවල ලේකම් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් මෙම විධාන පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියාකළ යුතු ය.

(X) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, අමාත්‍යාංශවල/ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන්, ප්‍රධාන ගණන්දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරීන් ද වන හෙයින් රජය සතු දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම අදාළ නිලධාරීන් වෙත පැවරුණු වගකීමක් වේ.

(XI) මෙම විධානවලට අනුකූලව කටයුතු නොකිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(උ) අනු ව්‍යවස්ථාව ප්‍රකාර දඩුවම් ලබාදිය හැකි වරදක් බවද සඳහන් කරනු ලැබේ.

මෙම විධානවල රජය යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකදී ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල, රජයට පවරා ගත් සමාගම් යන සියලුම ම ආයතන හා 50% කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතන ද අදහස් වේ.

රජයේ නිලධාරීන් හා සේවකයන් යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකම පෙර සඳහන් ආයතනවල සේවයේ නිරත හා සේවයේ යොදවා ගෙන සිටින වේතනයක් හෝ දීමනාවක් ලබන සියලුම තැනැත්තන් අදහස් වේ.

මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017.12.04 දිනැති 2048/12 අංක දරන අති විශේෂ ගැසට් නිවේදනය මෙයින් පරිවිඡින්න කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2143/47 - 2019 ඔක්තෝබර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 සැප්තැම්බර් මස 19 වන දිනැතිව අංක 2141/52 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් නිකුත් කරන ලද විධාන හා සම්බන්ධිතව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත් කරනු ලබන විධාන

ඡන්ද විමසීම හා සබැඳිව රාජ්‍ය දේපළ අවභාවිත කිරීම වැළැක්වීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇති විධානයක් හෝ විධාන කඩවී ඇති බවට කොමිෂන් සභාව වෙත ලැබී ඇති තොරතුරු හෝ පැමිණිලි හෝ පිළිබඳව වැඩිදුරටත් කරුණු විමසා බැලීම අවශ්‍ය බව මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරනු ලබන විටකදී ඒ සඳහා අවශ්‍ය වන මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ලිපි ලේඛන, සාකච්ඡා සටහන්, වාර්තා, බඳවා ගැනීම් හෝ පත්වීම් ලබාදීමට අදාළ වාර්තා යනාදී තොරතුරු කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන නිලධරයෙකුට හෝ ලබාදීමට නියෝග කළ විටකදී එකී තොරතුරු ලබාදීමට එම ලිපි ලේඛන භාරව සිටින නිලධාරීන් කටයුතු කළ යුත්තේය. එවැනි විටෙකදී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති යම් විධානයක් හෝ විධාන කඩකර ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු විමසා බැලීම සඳහා වාචික හෝ ලිඛිත හෝ ප්‍රකාශ ලබාදෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් බලය පැවරූ නිලධරයෙකු හෝ නියම කළ විටෙකදී සියලු කරුණු ඇතුළත් ප්‍රකාශ ලබාදීමට එකී කරුණු හා සම්බන්ධිත රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුත්තේය. එසේ කිරීමට බැඳී සිටින්නේය.

ඡන්ද විමසීම් හා සබැඳිව රාජ්‍ය දේපළ අයුතු පරිහරණය හා සම්බන්ධිත විධාන කඩ කිරීම් පිළිබඳව කරුණු විමසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් යම් රාජ්‍ය නිලධරයෙකු මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබූ විටදී ඒ සඳහා පැමිණ අවශ්‍ය සියලු කරුණු පැහැදිලි කරදීමට හා අවැසි ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට එම කැඳවීම ලද රාජ්‍ය නිලධරයා ක්‍රියා කළ යුත්තේය. එසේ කිරීමට එකී නිලධරයා බැඳී සිටින්නේය.

මෙම විධානවල රජය යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකදීම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල, රජයට පවරාගත් සමාගම් යන සියලුම ආයතන හා 50%කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතන ද අදහස් වේ.

1A - PG 4670 — 517 (2019/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

රජයේ නිලධාරීන් හා සේවකයන් යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකම පෙර සඳහන් ආයතනවල සේවයේ නිරත හා සේවයේ යොදවා ගෙන සිටින චේතනයක් හෝ දීමනාවක් ලබන සියලුම තැනැත්තන් අදහස් වේ.

මෙම විධානවල සඳහන් තොරතුරු යන්නට 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ තොරතුරු පිළිබඳ අර්ථ නිරූපණය අදාළ වන්නේය.

මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017.12.04 දිනැති 2048/02 අංක දරන අති විශෙෂ ගැසට් නිවේදනය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය	එන්.ජේ.අබේසේකර	එස්. රත්නජීවන් එච්.හූල්
සභාපති	සාමාජික	සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

10 - 631

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2142/47 - 2019 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2019.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ඡන්ද විමසීම්වලදී තරඟ කරනු ලබනු දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වැනි වගන්තිය අනුව නිකුත් කෙරෙන මෙම ආචාර ධර්ම පද්ධතිය ඕනෑම ඡන්ද විමසීමකට අදාළ නාමයෝජනා දැන්වීම පළකරනු ලබන දින සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා කාලයට අදාළ වේ.

මැතිවරණ නීතියට අනුව දේශපාලන පක්ෂ පිළිගැනීමට ප්‍රථම මෙරට ජනතාව තුළ සමාජගත වූ දේශපාලන පක්ෂ තිබූ අතර, ඒ පිළිබඳ ඉතිහාසය 1931 වර්ෂය දක්වා ඇතට දිවයයි. දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ නීති 1959 සිට විවිධ අවස්ථාවල සංශෝධනය වී ඇත. වත්මන් සමාජ ප්‍රගමනය වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් සිදු කරනු ලබන මෙහෙය, වඩාත් අර්ථවත් හා ඵලදායී වීමට නීති රීති මාර්ගයෙන් කළ හැකි දේ සීමාසහිත බැවින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීමේ වැඩි වගකීම දේශපාලන පක්ෂ වෙත පැවරේ.

එම වගකීම ද සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ පැවැත්වූ පළාත් සභා ඡන්ද විමසීම අරමුණු කරගෙන ප්‍රථම වරට මෙම ආචාර ධර්ම පද්ධතිය එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. තවද 2012 වර්ෂයේ සිට පැවැත්වූ සියලුම ඡන්ද විමසීම්වලට අදාළව පවත්වනු ලැබූ මැතිවරණ පැමිණිලි විමර්ශන සඳහා වූ කමිටු රැස්වීම් වලදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලදුව දේශපාලන පක්ෂ ලේකම්වරුන්, පක්ෂ නියෝජිතයන් සහ නිරීක්ෂණ කණ්ඩායම් නියෝජිතයන්ගේ එකඟතාවද මෙම ආචාර ධර්මවලට හිමිව තිබේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මෙම සංශෝධිත ආචාර ධර්ම පද්ධතිය සියලු මැතිවරණවලට තරඟ කරන අපේක්ෂකයින්, දේශපාලන පක්ෂවල නායකයන්, ලේකම්වරුන් ඇතුළු සියලුම ප්‍රමුඛ තනතුරුධාරීන්ට, පළාත් සභා හා පළාත් පාලන ආයතන නියෝජනය කරනු ලබන දේශපාලනඥයින්ට හා සියලුම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ට මෙන්ම අපේක්ෂකයන්ගේ ආධාරකරුවන්ට ද ස්වාධීන කණ්ඩායම් නායකයින්ට හා එම අපේක්ෂකයින්ට ද ආධාරකරුවන්ට ද අදාළ වන බව සැලකිය යුතු වේ.

එබැවින් මෙහි සඳහන් ආචාර ධර්මවලට අනුකූලව ක්‍රියා කරන ලෙස මැතිවරණවලට සම්බන්ධ වන සියලුම තැනැත්තන් වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

අ. නීතියේ ආධිපත්‍ය

01. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා අනෙකුත් නීතිවලින් සහතික කර ඇති පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි මැතිවරණ නීතිවලට අනුකූලව මහජන නියෝජිතයින් තෝරා ගැනීමට අදාළව පවත්වනු ලබන ඡන්ද විමසීම්වලදී හෝ ජනමත විචාරණයක දී ඡන්ද දායකයාට නිදහසේ සහ කිසිදු බලපෑමකින් තොරව සිය ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය සැලසීම හා ඊට අවශ්‍ය ආධාර හා අනුබල ලබාදීම.

02. ඡන්ද විමසීමක් වෙනුවෙන් ඉදිරිපත් වන සියලුම දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ට මැතිවරණ ක්‍රියාවලියේ දී හිමිවන සම අයිතිවාසිකම් සෑම පියවරක දීම ආරක්ෂා කිරීම.

03. සියලුම දේශපාලන පක්ෂවලට හා අපේක්ෂකයින්ට හිමිවන අයිතිවාසිකම් හා ඡන්ද දායකයින් දැනුවත් කිරීමට ඇති අයිතියට ගරු කරමින් විරුද්ධ මතධාරීන්ට ඔවුන්ගේ මතය දැරීමට හා ඒ වෙනුවෙන් නීත්‍යානුකූලව ප්‍රචාරක කටයුතු/ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට ඇති අයිතියට බාධා නොකිරීම.

04. ශ්‍රී ලංකාවේ බල පවත්නා නීතිවලට අනුකූලව පිහිටුවා ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් ආයතනවලට නීතියෙන් අපේක්ෂා කර ඇති නැතහොත් නියමකර ඇති ආකාරයට කටයුතු පවත්වාගෙන යාමට කිසිදු ආකාරයකින් බාධා හෝ බලපෑම් නොකිරීම.

05. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති ආයතනවලට හා එම කටයුතු පැවරී ඇති අයට අදාළ රාජකාරි ඉටු කිරීමේ දී බාධා හෝ බලපෑම් නොකිරීම.

06. සාමාන්‍ය ජන ජීවිතයට බාධා නොවන අයුරින් සහ පවත්නා නීති රීති උල්ලංඝණය නොවන අයුරින් ඡන්ද විමසීම් ප්‍රචාරක කටයුතු සිදු කිරීම පිළිබඳව සහතික කිරීම.

07. සෑම ඡන්ද විමසීමකටම අදාළ පනත්වල දැක්වෙන නීති රීති (වගන්ති) ගැන සියලු අපේක්ෂකයින්ට හා ප්‍රමුඛ ක්‍රියාකාරීන්ට අවබෝධයක් ලබා දීම සහ එම පනත්වල දැක්වෙන වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධී ක්‍රියාවලින් වළකින ලෙස උපදෙස් දීම.

08. ඡන්ද විමසීමට හෝ ඡන්ද ගණන් කිරීමට හේතු පාදක වන ද්‍රව්‍ය, උපකරණ, ලිපි ලේඛන නිසි බලධරයකුගේ අවසරයකින් තොරව ස්පර්ශ කිරීම හෝ ගබඩා කර ඇති ස්ථානයෙන් ඉවතට ගෙන යාමෙන් වැළකීම.

ආ. සාමාන්‍ය හැසිරීම

01. ශ්‍රී ලාංකිකයින් අදහන ආගම්, භාවිතා කරන භාෂාව, ඔවුන්ගේ වාර්ගිකත්වය, චාරිත්‍ර වාරිත්‍ර හා කුලගෝත්‍ර ආදී වෙනස්කම් සම්බන්ධයෙන් යම් ජන කොට්ඨාසයක හෝ යම් පුද්ගලයින් පිරිසකගේ හෝ වෛරය හෝ නොඉවසනසුලු බව උග්‍රවන ආකාරයට හෝ හැසිරීමෙන් වැළකීම සහ එවැනි හැඟීම් ඇතිවන අයුරින් අදහස් හෝ කරුණු ප්‍රකාශ නොකිරීම.

02. දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් සම්බන්ධයෙන් සිදු කරන විවේචන, ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට හා අතීත ක්‍රියාකාරකම්වලට සීමා කළ යුතු අතර විරුද්ධවාදී මෙන්ම ස්වකීය පාක්ෂිකයන්ගේ හෝ අපේක්ෂකයන්ගේ පොදු කටයුතුවලට සම්බන්ධයක් නොමැති ඔවුන්ගේ පෞද්ගලික කටයුතු විවේචනය කිරීමෙන් වැළකීම හා සනාථ කර නොගත් චෝදනා, සනාථ කළ නොහැකි කරුණු සහ විකෘති කළ අදහස් මත විවේචනය සිදු නොකිරීමට වග බලා ගැනීම.

03. තෝරා පත් කර ගැනීම මඟින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයේ අරමුණු ඉටුකරලීම මගින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ අනාගත අභිවෘද්ධිය සාක්ෂාත් කරලීමට ඇපකැපවිය හැකි අපේක්ෂකයින් තරඟයට ඉදිරිපත් කොට ඔවුන් ඡන්ද ව්‍යාපාරයේ දී විනයක් හා හික්මීමක් ඇතිව මෙහෙයවීම.

04. දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් අපේක්ෂකයන් තරඟය සඳහා තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පූර්ව කල් ක්‍රියාවල යහපත්භාවය, නීතියට ගරු කරමින් ක්‍රියා කිරීම, නීතිය ඉදිරියේදී වරදකරුවන්ව නොසිටීම, මහජන සේවයට කැපවී සිටීම, ධනබලය හෝ සමාජීය බලය නිසා ජන සමාජය පීඩාවට පත් නොකිරීම යනාදී ගුණාංග කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීම.

05. නාමයෝජනා භාරදෙන විට හෝ ඉන්පසු දින 30 ක් ඉකුත් වීමට පෙර සියළුම අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ තේරීම් භාරනිලධාරීට භාරදීම.

06. ඡන්ද පොළ පරිශ්‍රය තුළ හෝ ඡන්ද ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය තුළ දුම්බීම හෝ එම ස්ථානවලට මත්ද්‍රව්‍ය පාවිච්චි කර පැමිණීමෙන් වැළකී සිටිය යුතු බවට අපේක්ෂකයින්/නියෝජිතයින් දැනුවත් කිරීම.

07. නාමයෝජනා භාර ගන්නා ස්ථානයට හෝ ඡන්ද මධ්‍යස්ථානවලට මෙන්ම එහි පරිශ්‍රයට හෝ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානවලට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානවලට අවසර ඇති පුද්ගලයින් පමණක් ඇතුල්වීම හා එම ස්ථානවලට අවි ආයුධ රැගෙන නොආයුතු බවට වූ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

08. ඡන්ද විමසීමට අදාළ තහනම් ක්‍රියාවල යෙදීම හෝ තම ආධාරකරුවන් එම ක්‍රියාවන්ට පෙළඹවීම හෝ ඊට අනුබල දීම යන කටයුතුවල නොයෙදීම.

ඇ. මැතිවරණ ප්‍රචාරණ කටයුතු

01. ඡන්ද විමසීම් නීතියේ දැක්වෙන ආකාරයට මැතිවරණ ප්‍රචාරණ කටයුතු නීත්‍යානුකූලව ද නීතිය හා සාමය රැකෙන පරිදි ද සිදු කිරීම, විරුද්ධ පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල මැතිවරණ කටයුතු වලට බාධා නොකිරීම හා නීත්‍යානුකූල අන්දමින් ඡන්ද ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම.

02. මුද්‍රිත ලේඛන හෝ අත් පත්‍රිකා මඟින් ඡන්දදායකයින් දැනුවත් කිරීම සඳහා වූ ලේඛන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් මැතිවරණ නීතිය අනුව ක්‍රියා කිරීම.

i. මුද්‍රණකරුගේ/ප්‍රකාශකගේ තොරතුරු නොමැති අත් පත්‍රිකා බෙදා හැරීම, නීති විරෝධී දැන්වීම් මුද්‍රණය කරවීම යනාදී කරුණු වලින් වැළකී සිටීම.

ii. අත් පත්‍රිකා බෙදීමේ කාර්යයන් සඳහා හෝ ඡන්ද ආයාචනා කිරීම සඳහා ගෘහයෙන් ගෘහයට යාමේදී පෙරහැර, පෙළපාලි සේ විශාල ජන සමූහ හෝ සංගීත වාදන, ප්‍රදර්ශන පුවරු යොදා නොගැනීම හා නීතියෙන් තහනම් කර ඇත්නම් අපේක්ෂකයින් හා සමීපතම ඥාතීන් ඡන්ද ආයාචනය සඳහා ගෘහයෙන් ගෘහයට යාමෙන් වැළකී සිටීම.

03. තම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයන්ගේ හෝ ජයග්‍රහණය පතා හෝ වෙනත් පාර්ශ්වයක් පරාජය අපේක්ෂාවෙන් මැතිවරණ ප්‍රචාරණ දැන්වීම්, ප්‍රචාරක පුවරු එයට අදාළ ඡායාරූප, චිත්‍ර යනාදිය අවසරලත් නිවේදිත කාර්යාලවල හෝ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන දින රැස්වීම් භූමියේ හෝ හැර මහජනයාට ප්‍රදර්ශනය වන පරිදි රාජ්‍ය හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක, වාසස්ථානයක, හිස් භූමියක හෝ මහජනයාට ප්‍රවේශ වීමට අවසර ඇති මාර්ගවල හෝ පොදු ස්ථාන වල නීති විරෝධී ලෙස ප්‍රදර්ශනය කිරීමෙන් වැළකීම.

04. පක්ෂ/අපේක්ෂක භේදයකින් තොරව සාමාන්‍ය තත්ත්ව යටතේ දී කුලී පදනම මත ලබා දෙන රැස්වීම් ශාලා හෝ ක්‍රීඩා භූමි යනාදිය හෝ හැර රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවලට හෝ අයත් භූමි, ගොඩනැගිලි හෝ දේපළක් හෝ සේවාවක් මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

05. මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් කිසිදු ආගමික ස්ථානයක් හෝ ආගමික ස්ථානයකට අයත් භූමියක් හෝ දේපළක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

06. ඡන්ද විමසීමට අදාළ කොඩි හෝ දැන්වීම් හෝ ස්ටිකර් හෝ අපේක්ෂකයාගේ අංකය, නම, ඡායාරූප යනාදිය අපේක්ෂකයා ගමන් කරනු ලබන වාහනයේ පමණක් ප්‍රදර්ශනය කිරීම සහ ලියාපදිංචි නොකළ වාහන හෝ ගරාජ් අංක/ව්‍යාජ අංක සහිත වාහන ස්වකීය මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා නොගැනීම.

07. අවසරලත් ප්‍රචාරක රැස්වීම් භූමි තුළ මැතිවරණ ප්‍රචාරණය වෙනුවෙන් කරනු ලබන සැරසිලි පරිසරයට හානි නොවන පරිදි සිදු කිරීමටත් ප්‍රචාරක කටයුතු සඳහා පරිසරයට හානිකර ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වැළකී සිටීමටත් එබඳු රැස්වීම් කටයුතුවලින් පසු අප්‍රමාදව එම සැරසිලි ඉවත් කිරීමටත් ක්‍රියා කිරීම.

08. ඡන්ද විමසීම් කාල සීමාව තුළ මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතුවලට අදාළව පෙරහැර, මහජන පෙළපාලි හා රථ පෙළපාලි පැවැත්වීම මැතිවරණ නීති උල්ලංඝණය කිරීමක් බැවින් එවැනි මහජන පෙළපාලි, පෙරහැර, රථ පෙළපාලි, බයිසිකල් පෙළපාලි යනාදී කිසිවක් ඡන්ද විමසීම් කාල සීමාව තුළ නොපැවැත්වීම.

09. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසරලත් රැස්වීම් සඳහා පමණක් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම, එම ශබ්ද විකාශන කටයුතු රැස්වීම් පැවැත්වෙන කාලයට සහ එම රැස්වීම් භූමියට පමණක් සීමා කිරීම හා ධාවනයේ යෙදෙන වාහනවල සවිකල ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ප්‍රචාරක කටයුතු නොකිරීම.

10. මැතිවරණ දින ඡන්ද විමසීම ඇරඹීමට නියමිත වේලාවට පැය 48 කට පෙරාතුව අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව මැතිවරණ ප්‍රචාරණ කටයුතු නතර කිරීමට පියවර ගැනීම සහ එම නිහඬ කාල සීමාව තුළ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සංගීත සංදර්ශන වැනි දෑ පැවැත්වීම සහ මුද්‍රිත/විද්‍යුත් ජනමාධ්‍ය හරහා දැන්වීම් ප්‍රකාශයට පත්කිරීම යනාදි කාර්යයන් අත්හිටුවීම.

11. කිසිදු පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු වශයෙන් තනතුරක් දරමින් සිටින අයකු, යම් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ ඒවායේ අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීමට තමාට මහජන නියෝජිතයකු වශයෙන් ලැබී ඇති වරප්‍රසාද, බලතල, වාහන හා වෙනත් රාජ්‍ය දේපළ යොදා නොගැනීම.

12. මහජන නියෝජිතයකුගේ ආරක්ෂාව වෙනුවෙන් නීත්‍යානුකූලව සපයා ඇති ආරක්ෂක අංශ නිලධාරීන් හෝ ඔවුන්ගේ භාවිතයට දී ඇති ගිනි අවි හා අනෙකුත් ආරක්ෂිත උපකරණ හා මෙවලම් අපේක්ෂිත මහජන නියෝජිතයාගේ ආරක්ෂාව වෙනුවෙන් හැර කිසිදු නීත්‍යානුකූලව නොවන අන්දමේ කටයුත්තකට යොදවා ගැනීමෙන් වැළකී සිටීම.

13. යම් මැතිවරණ නීතියක් අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් ඡන්ද විමසීමක් සඳහා තරඟ කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණ නීතිය යටතේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ලබාදෙන ගුවන් කාල සීමා, අදාළ සංස්ථා ප්‍රධානීන් හා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන උපදෙස් හා කොන්දේසි අනුව භාවිතා කිරීම (පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

14. යම් මැතිවරණ නීතියක් අනුව ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන් ලියාපදිංචි සෑම ගෘහයක් වෙතම තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට සංදේශයක් යැවීමට ඇති අයිතිය, අදාළ පනතේ ප්‍රතිපාදන හා තැපැල්පතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයට භාවිතා කිරීම. (මෙම අවස්ථාව පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

15. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාග හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු වෙනත් ප්‍රසිද්ධ විභාග පැවැත්වෙන මෙන්ම එම විභාගවල ඇඟයීම් කෙරෙන විදුහල්වලට/විභාග මධ්‍යස්ථානවලට බාධාවන අයුරින් එම විදුහල් මධ්‍යස්ථාන අවට ඡන්ද ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකී සිටීම.

16. යම් අපේක්ෂකයකු විසින්, වෙනත් පක්ෂයක් හෝ අපේක්ෂකයෙකු සම්බන්ධව පූර්වයෙන් කරන ලද ප්‍රකාශ හෝ අදහස් දැක්වීම තවත් පක්ෂයක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත් කිරීම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් පූර්වයේදී එකී ප්‍රකාශ හෝ අදහස් දැක්වීම කරනු ලැබූ තැනැත්තා විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබුවහොත් එවැනි ප්‍රකාශ අදහස් දැක්වීම් යනාදිය භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

ඇ. ඡන්ද විමසීම් දින

01. ඡන්ද විමසීම් දිනයේ ඡන්ද පොළේ සිට මීටර් 500 ක් ඇතුළත, සීමාව තුළ සිදු කිරීමට තහනම් කර ඇති කිසිදු ක්‍රියාවක්, විශේෂයෙන් ඡන්දය ආයාචනා කිරීම් යනාදී මැතිවරණ නීතියේ සඳහන් වරදවල් සිදු නොකිරීම.

02. ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන හා ඡන්ද පොළේ දී ඡන්දය පාවිච්චි කරන ඡන්දදායකයින්ට කිසිදු බාධාවක් නොකිරීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා බලපෑම් කිරීමෙන් වැළකීම සහ ඡන්ද දායකයාට, ඡන්දය ස්වාධීනව නිදහස්ව හා රහස්ව පාවිච්චියට ඇති අයිතියට බාධා නොකිරීම.

03. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද හිමියන්, ඡන්ද පොළ නියෝජිතයින්, ඡන්ද අපේක්ෂකයින්, නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් කිසිදු බිය වැද්දීමකට ලක් කිරීමෙන්, ශාරීරික වධ හිංසාවලට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ දේපළ වලට හානි කිරීමෙන් වැළකීම සහ ඡන්දය දීමට පැමිණෙන හෝ ඡන්දය දී ආපසු යන ඡන්ද හිමියන් බිය ගැන්වීමෙන් ඔවුනට බාධා කිරීමෙන් හෝ වැළකීම, ඡන්ද පොළ නියෝජිතයින් ඡන්ද පොළෙන් පලවා හැරීමෙන් වැළකීම.

04. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළට ඇතුළු වීම සඳහා අවසරය ඇති අය පමණක් (තරඟ කරනු ලබන දේශපාලන පක්ෂයක ලේකම්, අපේක්ෂකයින් හා ඡන්ද පොළ නියෝජිතයින්) ඇතුළු විය යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සහාය දක්වා ක්‍රියා කිරීම හා ස්වකීය අනන්‍යතාව සනාථ කළයුතු වීම සහ ඡන්ද පොළ තුළට ආරක්ෂකයින් හෝ මාධ්‍යවේදීන්, ඡායාරූප ශිල්පීන් කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම.

05. මැතිවරණ නීතියේ සඳහන් කිසිදු වරදක් හෝ මැතිවරණ දූෂණ ක්‍රියාවක් කිරීමෙන් හා ඊට අනුබලදීමෙන් වැළකීම. (ඡන්ද පොළේ දී ඡන්ද පෙට්ටි බලෙන් පිරවීම, ඡන්ද පොළට කඩා වැදීම හෝ හොර ඡන්ද දැමීම ආදී වැරදි හා දූෂණ ක්‍රියා)

06. නීත්‍යානුකූල නොවන අන්දමින් ඡන්ද පොළ කරා ඡන්දදායකයින් ප්‍රවාහනය නොකිරීමට වග බලා ගැනීම.

07. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා එම කටයුතු හාරව ක්‍රියාකරන කාර්ය මණ්ඩලයට අපේක්ෂිත ආකාරයට සහාය වීම හා ඔවුන්ගේ කටයුතු වලට ඡන්ද පොළ නියෝජිතයින් බාධා නොකරන බවට වග බලා ගැනීම.

08. මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය මත ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කරන නියෝජිතයින්ට, නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ට බාධා නොකිරීම හා ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.

09. ඡන්ද පොළ පරිශ්‍රය තුළ ඡායාරූප ගැනීම, ජංගම දුරකථන භාවිතය යනාදී තහනම් ක්‍රියා නොකිරීම.

ඉහත සඳහන් කරුණු අදාළ වන විට තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනය සඳහා ද වලංගු වන ලෙස සැලකීම යෙහෙකි.

ඉ. ඡන්ද හා මනාප ගණන් කිරීම (තැපැල් ඡන්ද ඇතුළුව) හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

01. ඡන්ද හා මනාප ගණන් කිරීමේ (තැපැල් ඡන්ද ගණන් කිරීම ද ඇතුළුව) ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් ස්වකීය ගණන් කිරීමේ නියෝජිතයන් දැනුවත් කිරීම හා පැමිණිලි ඉදිරිපත් කිරීමේ නිසි ක්‍රමවේදය ගැන ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.

02. ගණන් කිරීමේ ශාලා හා ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය තුළ එම කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව, තේරීම්භාර නිලධාරී විසින් පනවා ඇති විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවට ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.

03. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් ලෙස විධිමත්ව පත්කර ඇත්නම් හෝ අපේක්ෂකයකු වන්නේ නම් මිස, නිසි අවසරයක් නොමැතිව රජයේ හෝ පළාත් සභා ඇමතිවරු, පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයන් හෝ වෙනත් දේශපාලන බලධාරීන් ගණන් කිරීමේ පරිශ්‍රයට ශාලාවට ඇතුළු නොවීමට වග බලා ගැනීම.

04. ඡන්ද ගණන් කිරීමේ හෝ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලාවල නියෝජිතයන් ලෙස පැමිණෙන කිසිදු දේශපාලනඥයකු විසින් අවි සහිත හෝ රහිත ආරක්ෂකයින් එකී ශාලා තුළට කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම හා ගණන් කිරීමේ ශාලා/ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලා පරිශ්‍රයට අනවසර පුද්ගලයින් කැඳවාගෙන පැමිණීමෙන් වැළකීම.

ඊ. වෛරී ප්‍රකාශ හෝ ජාතික සමගියට එරෙහි ප්‍රකාශ

01. කාන්තාවන්, විශේෂ අවශ්‍යතා ඇති නැතහොත් ආබාධිත පුද්ගලයින් වෙනස් වූ ලිංගික හැඩගැසීම් සහිත පුද්ගලයන් සහ වෙනත් ආගමික හෝ ජනවාර්ගික කණ්ඩායම් විශේෂ කොට එවැනි ප්‍රජා හෝ සමාජ කණ්ඩායම් බිය ගන්වන හෝ අපහාසයට ලක් කරන කවර හෝ ආකාරයේ වෛරී ප්‍රකාශ සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

02. දේශපාලනමය කටයුතුවල නිරතවන සියලුම තැනැත්තන් වෛරී ප්‍රකාශ සිදු කිරීමෙන් සියලු කල්හි වැළකී සිටිය යුතු ය. එතකුදු වුවත්, විශේෂයෙන් කවර හෝ ඡන්ද විමසීමක නාමයෝජනා කාලපරිච්ඡේදය ආරම්භ වන පළමු දින සිට එම ඡන්ද විමසීම පවත්වන දිනට පසු දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ එසේ කිරීමෙන් වැළකී සිටිය යුතුමය.

03. වෛරී ප්‍රකාශ වරදක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති බැවින් එවැනි ප්‍රකාශ කරනු ලබන තැනැත්තන් පිළිබඳව චෝදනා කරනු ලැබිය යුතු ය.

04. ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් අතර සුහදත්වය හා අන්‍යොන්‍ය විශ්වාසය පළුදු වන ආකාරයේ කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් හෝ කවර හෝ රූප ප්‍රදර්ශනය කිරීමෙන් වැළකිය යුතු ය.

05. ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම්වල සහ පුද්ගලයන්ගේ අභිමානය පළුදු වන හෝ ඊට හානිකර කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් වැළකිය යුතු අතර එවැනි ප්‍රකාශ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.

06. ආගමික, ජනවාර්ගික, භාෂාමය, කුල හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාව පිළිබඳ වෙනස්කම් පාදක කරගනිමින් කවර හෝ තැනැත්තෙකුට හෝ කණ්ඩායමකට අගතිදායක හෝ වෙනස්කොට සලකනු ලබන බවට සැලකිය හැකි කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවන් සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

07. කාන්තාවකගේ ශරීර අවයව පදනම් කරගනිමින් කාන්තාවන්ට අවමන් සහගත හෝ අපවාදාත්මක කවර හෝ ප්‍රකාශයක් කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවන් කිරීමෙන් වැළකිය යුතු ය. මෙම කරුණ කාන්තාවන් සම්බන්ධයෙන් විශේෂකොට දක්වා ඇත්තේ වුවද සියලුම පුරවැසියන්ටද අදාළ වන බැවින් එවැනි කරුණු වලින් වැළකී සිටිය යුතු ය.

08. කවර හෝ පුද්ගලයෙකුගේ යම් ආකාර අංගවිකලත්වයක් හෝ ආබාධිත බවක් පිළිබඳව අවමන් සහගත හෝ අපවාදාත්මක කවර හෝ ප්‍රකාශයක් කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

උ. වෙනත් විශේෂ කරුණු

01. ඡන්ද විමසීමේදී තරඟ කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්ති මාලාව හා යම් කාල සීමාවක් තුළ තම පක්ෂය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වැඩපිළිවෙළක් ඡන්ද දායකයන් වෙත ඉදිරිපත් කිරීම හා එහි පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත හා එමඟින් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම.

02. මැතිවරණ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් රජයේ දේපළ, නිල වාහන හෝ රජයේ නිලධාරීන් යොදා නොගැනීම, සහ රජයේ කාර්යාල, පාඨශාලා ආදී කිසිදු ආයතනයක් තුළ හෝ එම පරිශ්‍ර තුළ ඡන්ද ආයාචනා කිරීම, අත්පත්‍රිකා බෙදීම, ප්‍රදර්ශන පුවරු හෝ දැන්වීම් ප්‍රදර්ශනය කරවීම යනාදී ප්‍රචාරක කටයුතු නොකිරීම.

03. මහජන නියෝජිතයින් තම නිල රාජකාරී කටයුතු හරහා මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකීම.

04. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් නොමිලයේ රජයේ ගුවන්යානා හෝ වෙනත් වාහන භාවිතා කිරීමෙන් වැළකීම.

05. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පොදු ගොඩනැගිලි, ක්‍රීඩාභූමි, රජයේ සංචාරක නිවාස යොදා ගන්නේ නම්, නියමිත ගෙවීම් සිදුකොට ඒවා භාවිතා කිරීම හා එවැනි අවස්ථා එම ආකාරයටම සියලුම අවශ්‍ය පාර්ශ්වවලට ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියා කිරීම.

06. මැතිවරණ සමයේදී දේශපාලන පුවත් හා ලිපි හෝ දැන්වීම් යනාදිය අතිරේක රජයේ හෝ රාජ්‍ය ආයතනවල වියදමින් පළ නොකිරීම.

07. ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද හිමියන් හෝ රජයේ නිලධාරීන් තනිවම හෝ සමූහ වශයෙන් හෝ ස්වකීය පෞද්ගලික හෝ නිල නිවාසවලට කැඳවා සංග්‍රහ කිරීමෙන් වැළකීම.

08. කිසියම් ආකාරයෙන් මූල්‍ය ප්‍රදාන කිරීම හෝ පොරොන්දු දීම්, ව්‍යාපෘති හෝ යෝජනා සඳහා මුල්ගල් තැබීම්, මාර්ග, ජල හා විදුලි ආදිය පහසුකම් සැපයීම සඳහා පොරොන්දු දීම හා තම පක්ෂයට වාසිවන ආකාරයට නම්මවාගත හැකි ඡන්ද දායකයින් වෙනුවෙන් ක්‍රමානුකූල නොවන ආකාරයට හදිසියේ රාජ්‍ය අංශයේ තනතුරු හා පත්වීම් ප්‍රදානය කිරීමෙන් වැළකීම.

09. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, මැතිවරණ කටයුතු වලට බාධා කිරීම, මැතිවරණ දූෂණ හා වැරදි සිදු කිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන අංශ විසින් සිදුකරන පරීක්ෂණ වලට බාධා නොකිරීම හා එම අංශවලට ස්වාධීනව ක්‍රියා කිරීමට අවශ්‍ය පසුබිම සැලසීම.

10. මැතිවරණ සමය තුළ විරුද්ධ පාර්ශවවලට හා ඒවායේ ක්‍රියාකාරීන්ට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් සනාථ කළ නොහැකි හෝ වැරදි චෝදනා ඉදිරිපත් කරමින් හා අදාළ පාර්ශ්වයන්ට එබදු අවස්ථාවල දී පිළිතුරු දීමට පවා අවකාශ ලබානොදී ඉදිරිපත් කරන වැඩසටහන් ප්‍රචාරණය කිරීමට මාධ්‍ය යොදා ගැනීමෙන් වැළකී සිටීම.

11. දේශපාලන පක්ෂයක් හෝ දේශපාලනඥයන් සම්බන්ධයෙන් කරනු ලබන විවේචන හා චෝදනාවලට ප්‍රතිචාර දැක්වීමේදී කවර හෝ ආකාරයේ මැතිවරණ ප්‍රචාරයන්ගෙන් (විශ්වාස කටයුතු නොවන මැතිවරණ ප්‍රවර්ධන තොරතුරු ප්‍රචාරය කිරීමෙන්) වැළකී ප්‍රචණ්ඩකාරී නොවන නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයෙන් පමණක් පිළිතුරු සැපයීම.

12. මහජන නියෝජිතයින්ගේ නීත්‍යානුකූල රැකවලුන් වශයෙන් කටයුතු කරනු ලබන පොලිසියේ හා අනෙකුත් ආරක්ෂක අංශවල නිලධාරීන් නිල නොවන ආකාරයට දේශපාලන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට යොදාගැනීම හා විරුද්ධ පාක්ෂිකයින්ගේ මැතිවරණ කටයුතු මැඩලීමට යොදවා ගැනීමෙන් වැළකීම, එවැනි කාර්යයන් ප්‍රසිද්ධියේ හෙළා දැකීම.

13. කුමන දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සංවිධානයක් තම මැතිවරණ කටයුතු වලදී නීත්‍යානුකූල නොවන ආකාරයට අවි ආයුධ සහිත පුද්ගලයින් සම්බන්ධ කරගෙන කටයුතු කරන්නේ නම්, එවැනි ක්‍රියා ප්‍රසිද්ධියේ හෙලාදැකීම හා ඒවා මැඩලීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීම.

14. ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී පවත්වනු ලබන රාජ්‍ය උත්සවවලදී අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂවල ප්‍රමුඛ ක්‍රියාකාරීන් හෝ සහභාගී නොවීම හා එවැනි උත්සව පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා භාවිතා නොකිරීම.

15. දේශපාලන නැඹුරුවක් සහිත පත්වීම් ලබාදීම, උසස්වීම් සහ ස්ථානමාරු කිරීම සඳහා සෘජු හෝ වක්‍ර දායකත්වයක් සැපයීමෙන් වැළකීම.

16. ඡන්ද විමසීම් පැවැත්වෙන ප්‍රදේශයක රජය විසින් හෝ රජයේ අනුග්‍රහයෙන් සැණකෙළි, සංදර්ශන හෝ ප්‍රදර්ශන හෝ ක්‍රීඩා තරඟ ආදිය පවත්වන්නේ නම් එම අවස්ථා ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින්ගේ හා පක්ෂවල ජයග්‍රහණය පිණිස දේශපාලන ප්‍රචාරණ කටයුතුවලට සම්බන්ධ කර ගැනීමට ක්‍රියා නොකිරීම.

17. ප්‍රසිද්ධ විභාග හා ශිෂ්‍යත්ව විභාගයට අදාළව පවත්වනු ලබන අධ්‍යාපනික සම්මන්ත්‍රණ හරහා පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සිදු නොකිරීම.

වෙනත් කරුණු

1. ජාතික ගීය, ජාතික ධජය, ආගමික සංකේත, ආගමික ධජ, ආගමික ශාස්තෘවරුන්ගේ හෝ ආගමික නායකයන්ගේ සිතුවම් හෝ ඡායාරූපය යනාදිය පළකිරීම නැතහොත් ප්‍රචාරය කිරීම හරහා කිසිම දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීම සඳහා යොදා නොගත යුතු ය.

2. තවද පෙර සඳහන් දෑ පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධන රැළි, රැස්වීම් යනාදියෙහි දී හෝ දැන්වීම්, ප්‍රචාරක පුවරු යනාදියෙහි ප්‍රදර්ශනය නොකළ යුතු ය. තවද පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා කිසිදු රාජ්‍ය නිලධරයෙකු ඡායාරූප හෝ සිතුවම් කුමන ආකාරයකින් හෝ භාවිතා නොකළ යුතු ය.

3. දේශපාලන පක්ෂවල ස්වාධීන කණ්ඩායම්වල ප්‍රචාරණ කටයුතු සඳහා සාමාන්‍යයෙන් ලබාදෙන රජයේ ස්ථාන එක් පක්ෂයක හෝ අපේක්ෂකයෙකුගේ ප්‍රචාරණ කටයුතු සඳහා පමණක් වෙන්කර ගැනීමට ක්‍රියා නොකළ යුතු අතර වෙනත් පක්ෂ/කණ්ඩායම් අපේක්ෂක ප්‍රචාරණ කටයුතු සඳහා එවැනි ස්ථාන ලබා ගැනීමට සම අවස්ථා ලබාදිය යුතු ය.

4. පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා භූමි හෝ ශාලා පහසුකම් වෙන්කරවා ගැනීමේදී ඇතිවන ගැටළු අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් ඒ ඒ තේරීම්භාර නිලධාරී විසින් පවත්වනු ලබන දිස්ත්‍රික් කමිටුවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම දේශපාලනඥයින් කටයුතු කළ යුතු ය.

5. කවර හෝ ආගමික රැස්වීමකදී යම් ඡන්ද විමසීමක මැතිවරණයක ප්‍රතිඵලයට බලපෑමක් සිදුකිරීම පිණිස හෝ එම ඡන්ද විමසීමේදී මැතිවරණයේදී කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයෙකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට ඡන්ද හිමියෙකු පොළඹවන ආකාරයේ කවර හෝ ප්‍රකාශයක් සිදු නොකළ යුතු ය.

6. යම් ඡන්ද විමසීමකදී මැතිවරණයකදී කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයෙකු තෝරාපත්කර ගැනීම හෝ ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම පිණිස කුමන හෝ ආගමික සිද්ධස්ථානයකදී යම් අත්පත්‍රිකා, පුවරු, පෝස්ටර්, චිත්‍ර, දැන්වීම්, අපේක්ෂකයාගේ ඡායාරූප, සළකුණු, සංඥා, කොඩි හෝ බැනර් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ කවර හෝ මහජන රැස්වීම් පැවැත්වීම නොකළ යුතු ය.

ඕනෑම මැතිවරණයකදී/ඡන්ද විමසීමකදී ඉදිරිපත් වන අපේක්ෂකයන් හා අදාළ වන විට ඔවුන් නියෝජනය කරන දේශපාලන පක්ෂ ලේකම්වරුන්, අපේක්ෂකයින්ගේ නියෝජිතයින් හා ආධාරකරුවන් ඉහත සඳහන් කරුණුවලට අනුකූලව ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙම ආචාර ධර්ම පද්ධතියේ ඇතුළත් දෑ ස්වකීය නියෝජිතයින්, පාක්ෂිකයින් හා ආධාරකරුවන් අනුගමනය කරනු ලබන බවට සැහීමකට පත්විය හැකි ආකාරයේ යාන්ත්‍රණයක් අපේක්ෂකයන් හා අදාළ වන විට පක්ෂ ලේකම්වරුන් ක්‍රියාත්මක කරනු ඇතැයි වැඩිදුරටත් අපේක්ෂා කෙරේ.

මහින්ද දේශප්‍රිය සභාපති මැතිවරණ කොමිෂන් සභාව	එන්. ජේ. අබේසේකර සාමාජික මැතිවරණ කොමිෂන් සභාව	එස්. රත්නජීවන් එච්. හූල් සාමාජික මැතිවරණ කොමිෂන් සභාව

2019 සැප්තැම්බර් මස 25 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

10 - 630

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ඇමුණුම අංක 25

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2149/34 - 2019 නොවැම්බර් මස 17 වැනි ඉරිදා - 2019.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත

64 (2) වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනතේ 56 වැනි වගන්තිය යටතේ ගෝඨාභය රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තෝරාපත්කර ගත් ලෙස ප්‍රකාශයට පත්කළ බව මැතිවරණ කොමිෂන් සභාව, එම පනතේ 64 (2) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමු.

මහින්ද දේශප්‍රිය සභාපති මැතිවරණ කොමිෂන් සභාව	එන්. ජේ. අබේසේකර සාමාජික මැතිවරණ කොමිෂන් සභාව	එස්. රත්නජීවන් එච්. හූල් සාමාජික මැතිවරණ කොමිෂන් සභාව

2019 නොවැම්බර් මස 17 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

1A - PG 004692 — 912 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කාර්ය මණ්ඩල අවශ්‍යතා (යොදවන ලද නිලධාරීන් සංඛ්‍යාව)

දිස්ත්‍රික්කය	කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරි	සම්බන්ධීකරණ කාර්යාල සහකාර	ඒකාබද්ධ කලාප සහකාර	වෙනත් සහකාර තේරීම්භාර නිලධාරී	ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති	අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති	කණිෂ්ඨ ඡන්දස්ථානාධිපති	ලිපිකරු	කාර්යාල කාර්ය සහායක	එකතුව
කොළඹ දිස්ත්‍රික්කය	144	14	-	-	665	223	2,093	5,749	672	9,560
කොළඹ නාගරික	90	9	12	530	869	168	830	4,916	807	8,231
ගම්පහ	150	26	13	-	1,184	462	4,207	10,718	1,684	18,444
කළුතර	125	28	19	-	844	252	1,455	4,707	196	7,626
මහනුවර	151	-	-	555	835	219	2,408	6,678	835	11,681
මාතලේ	52	13	17	264	327	35	398	2,444	327	3,877
නුවරඑළිය	58	10	5	-	488	80	1,279	3,453	488	5,861
ගාල්ල	178	35	10	295	1,060	112	2,056	4,476	712	8,934
මාතර	81	32	2	556	458	318	1,367	3,716	458	6,988
හම්බන්තොට	68	12	15	166	474	62	1,197	2,972	478	5,444
යාපනය	71	30	12	-	531	55	1,213	2,970	531	5,413
කිලිනොච්චිය	23	4	1	9	100	10	235	577	100	1,059
මන්නාරම	25	5	6	-	76	16	207	538	76	949
වවුනියාව	28	-	-	-	142	5	315	762	-	1,252
මුලතිව්	28	6	7	-	149	3	160	681	135	1,169
මඩකලපුව	70	16	-	42	428	54	976	2,477	440	4,503
දිගාමඩුල්ල	89	4	2	-	523	11	1,170	3,043	-	4,842
ත්‍රිකුණාමලය	50	11	11	-	307	8	694	1,778	307	3,166
කුරුණෑගල	170	7	-	785	959	18	2,866	7,833	400	13,038
පුත්තලම	87	17	-	31	411	178	768	3,008	656	5,156
අනුරාධපුර	119	-	-	-	634	20	1,518	4,203	-	6,494
පොළොන්නරුව	69	-	14	-	288	34	727	2,002	288	3,422
බදුල්ල	139	7	32	645	1,279	120	1,431	4,549	841	9,043
මොණරාගල	62	11	22	-	351	28	947	1,900	351	3,672
රත්නපුර	111	17	26	-	627	203	1,858	5,541	17	8,400
කෑගල්ල	97	11	2	-	574	86	1,507	4,088	574	6,939
එකතුව	**2,335**	**325**	**228**	**3,878**	**14,583**	**2,780**	**33,882**	**95,779**	**11,373**	**165.163**

මැතිවරණ මහලේකම් කාර්යාල නිලධාරී සංචිතයෙන් ඒ ඒ දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	දිස්ත්‍රික්කය	සහකාර තේරීම්භාර නිලධාරී	ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති	එකතුව
1	කොළඹ	818	1,379	2,197
2	ගම්පහ	534	369	903
3	කළුතර	707	75	782
4	මහනුවර	-	-	-
5	මාතලේ	114	-	114
6	නුවරඑළිය	168	-	168
7	ගාල්ල	40	-	40
8	මාතර	102	-	102
9	හම්බන්තොට	89	10	99
10	යාපනය	35	-	35
11	මන්නාරම	6	-	6
12	වවුනියාව	12	-	12
13	මුලතිව්	7	-	7
14	කිලිනොච්චිය	5	-	5
15	මඩකලපුව	48	-	48
16	අම්පාර	57	-	57
17	ත්‍රිකුණාමලය	10	-	10
18	කුරුණෑගල	5	-	5
19	පුත්තලම	193	100	293
20	අනුරාධපුර	30	55	85
21	පොළොන්නරුව	52	-	52
22	බදුල්ල	30	-	30
23	මොණරාගල	139	-	139
24	රත්නපුර	119	-	119
25	කෑගල්ල	52	-	52
එකතුව		3,372	1,988	5,360

ඒ ඒ දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගනු ලැබූ වාහන පිළිබඳ තොරතුරු

අනු අංකය	දිස්ත්‍රික්කය	කාර්	වෑන්	ජීප්	කැබ්	බස්	කෘකැබ්	ලොරි	ත්‍රීවීල්	පෙ වීල්	ට්‍රැක්ටර්	ගිලන් රථ	බවිසර්	ගලි බවිසර්
1	කොළඹ	130	135	25	225	360	10	5						
2	ගම්පහ	13	447	25	225	194	15	18	8		3	2		
3	කළුතර	30	260	50	260	77	10	10						
4	ගාල්ල	25	255	25	180	156	4	8						
5	මාතර		165	160		90	11	5						
6	හම්බන්තොට		242	24	158	42	4	5						
7	මහනුවර		545	100	250	49	15	5						
8	මාතලේ		200	50	130	62		3						
9	නුවරඑළිය		300	13	93	62	9	5		35				
10	අනුරාධපුර		650		150	20	2	2			1			
11	පොළොන්නරුව	50	171	40	140	43	3	3						
12	මොනරාගල		122	40	275	38	8	9						
13	බදුල්ල		310	30	250	69	15	10						
14	යාපනය	173				212	7	5						
15	මන්නාරම	2	30	5	75	49		2						
16	වව්නියාව	1	11	6	72	1	3	1						
17	කිළිනොච්චි	1	26	3	38	47		1						
18	මුලතිව්	3	14	1	39	49	9	2						
19	අම්පාර		224	32	190	103	6	5						
20	මඩකලපුව	2	39	20	160	91	10	4						
21	ත්‍රිකුණාමලය		37		127	55	7	7						
22	කුරුණෑගල	40	530	50	240	150	30	10						
23	පුත්තලම		495		215	15	10	5			1		3	1
24	කෑගල්ල	5	100	28	100	220	8	2						
25	රත්නපුර	6	157	19	198	112	5	10						

ඒ ඒ දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගනු ලැබූ වාහන පිළිබඳ තොරතුරු

